## 1996 අංක2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත පරිච්චින්න කර ඒ වෙනුවට ස්ථාපනය කරනු ලබන්නාවූ පනතකි.

ශ්‍රී ලාංකික ජනතාවගේ ප්‍රයෝජනය පිණිස ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය, සංවර්ධනය සහ තිරසාර ලෙස භාවිතයට ගැනීම උදෙසා විධිවිධාන සැලැස්වීම පිණිසද; ජාත්‍යාන්තර සහ කලාපීය ධීවර ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට බලාත්මක භාවයක් ලබාදීම පිණිසද;1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත පරිච්චින්න කොට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-**

### වගන්ති පෙළගැස්ම

### හඳුන්වාදීමේ විධිවිධාන

1 වන වගන්තිය – ලුහුඬු නාමය සහ ආරම්භය
2 වන වගන්තිය – විෂය පථය සහ අදාළත්වය
3 වන වගන්තිය– පරමාර්ථ

### I වන කොටස - පරිපාලනය

4 වන වගන්තිය– ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (ධී.ජ.දෙ)
5 වන වගන්තිය– අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෙසු නිලධරයන් පත්කිරීම
6 වන වගන්තිය– අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යයන් සහ වගකීම්
7 වන වගන්තිය – ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව
8 වන වගන්තිය– ජාතික ධීවර සම්මේලනය, දිස්ත්‍රික් සහ ග්‍රාමීය ධීවර සංවිධාන
9 වන වගන්තිය – වාර්ෂික පාලන වාර්තාව

### IIවන කොටස – ලියාපදිංචිය

### 1 වන පරිච්ඡේදය –ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම

10 වන වගන්තිය – ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනය
11 වන වගන්තිය– ලියාපදිංචි කිරීම
12 වන වගන්තිය – ආනයනික ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම
13 වන වගන්තිය– ලියාපදිංචි සහතිකය යාත්‍රාවේ රැගෙන යාමට ඇති පොදු වගකීම
14 වන වගන්තිය– ධීවර යාත්‍රා ලකුණු කිරීම හා හඳුනා ගැනීම
15 වන වගන්තිය – පළාත් අරමුදලට ගාස්තු ගෙවීම
16 වන වගන්තිය – පළාත වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීම
17 වන වගන්තිය– ලේඛනයේ තොරතුරු වෙනස්වීම්
18 වන වගන්තිය – ධීවර යාත්‍රා ලියාපදිංචිය අත්හිටුවීම සහ අවලංගු කිරීම
19 වන වගන්තිය – ධීවර යාත්‍රා ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත් කිරීම

20 වන වගන්තිය – උකස් සාධන පත්‍ර ලියාපදිංචි කිරීම
21 වන වගන්තිය – උකස් සාධන පත්‍ර පිළිබඳ ප්‍රමුඛතාව
22 වන වගන්තිය – ධීවර යාත්‍රාව ලියාපදිංචි කරන ලද උකස බලපැවැත්විය යුතු බව
23 වන වගන්තිය – උකස නිදහස් කිරීම සටහන් කිරීම
24 වන වගන්තිය – වස්තු භංගත්වය උකස කෙරෙහි බල නොපාන බව
25 වන වගන්තිය – උකස් පැවරීම සහ ලියාපදිංචි කිරීම
26 වන වගන්තිය – වස්තු භංගත්වය යනාදී අවස්ථාවකදී උකසක සම්බන්ධතාව ප්‍රේෂණය වීම
27 වන වගන්තිය – ප්‍රසිද්ධ කිරීම
28 වන වගන්තිය – සෝදිසි කිරීම් සහ පිටපත්
29 වන වගන්තිය – සාක්ෂි
30 වන වගන්තිය – වෙනත් ලිඛිත නීති අදාළ නොවිය යුතු බව

## 2 වන පරිච්ඡේදය – ධීවරයන් සහ ධීවර ආශ්‍රිත කටයුතු කරන තැනැත්තන් ලියාපදිංචි කිරීම

31 වන වගන්තිය – **ධීවරයින් සහ ධීවර ආශ්‍රිත කටයුතු කරන තැනැත්තන් ලියාපදිංචි කිරීම**

## 3 වන පරිච්ඡේදය – බෝට්ටු අංගන ,ධීවරආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම

32 වන වගන්තිය –බෝට්ටු අංගන, ධීවර ආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම

## 4වන පරිච්ඡේදය- අභියාචනා

33 වන වගන්තිය - අභියාචනා

## III වන කොටස – බලපත්‍ර දීම

## 1 වන පරිච්ඡේදය – ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර

34 වන වගන්තිය - ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර ලබා දීම
35 වන වගන්තිය – ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ සාමාන්‍ය මූලධර්ම
36 වන වගන්තිය – ධීවර මෙහෙයුම් බලපත්‍රයක කාල සීමාව
37 වන වගන්තිය – ධීවර මෙහෙයුම් බලපත්‍ර පැවරීම
38 වන වගන්තිය– විදේශීය ධීවර යාත්‍රා මගින් ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදුකිරීම තහනම් කිරීම
39 වන වගන්තිය – බලපත්‍ර දීමේ බලධරයා
40 වන වගන්තිය – ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම
41 වන වගන්තිය – ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීමේ බලපත්‍රය අළුත් කිරීම
42 වන වගන්තිය – මහ මුහුදෙහි ධීවර මෙහෙයුම්වල යෙදීම සඳහා ධීවර බලපත්‍රයක් ඉල්ලුම් කිරීම
43 වන වගන්තිය– වෙනත් රාජ්‍යයකට අයත් ජල තීරයන්හි ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම
44 වන වගන්තිය – මහ මුහුදේ හෝ වෙනත් රාජ්‍යයකට අයත් ජල තීරයක ධීවර මෙහෙයුම් සිදුකිරීම සඳහා වන බලපත්‍රයක් අළුත් කිරීම
45 වන වගන්තිය – ධීවර මෙහෙයුම් බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම

46 වන වගන්තිය – පළාත් සමග තොරතුරු සම්ප්‍රේෂණය කර ගැනීම

## 2 වන පරිච්ඡේදය – ධීවර යාත්‍රා බලපත්‍රලාභීන් සඳහා වන බැඳියාවන්

47 වන වගන්තිය– පනතට අනුකූලව කටයුතු කිරීම
48 වන වගන්තිය– ධීවර බලපත්‍ර මත වූ බැඳියාවන්
49 වන වගන්තිය– බලපත්‍රය යාත්‍රාවෙහි රැගෙන යා යුතු බව
50 වන වගන්තිය– පිටත්වීම සහ පැමිණීම
51 වන වගන්තිය– ධීවර දත්ත සටහන
52 වන වගන්තිය – මසුන් ගොඩබෑම සහ වාර්තා කිරීම
53 වන වගන්තිය – ධීවර ආම්පන්න සලකුණු කිරීම
54 වන වගන්තිය – යාත්‍රාවේ ගමන් ගන්නා නිරීක්ෂකයන්
55 වන වගන්තිය –නිරීක්ෂකයන්ගේ පිරිවැය

## 3 වන පරිච්ඡේදය– යාත්‍රාවක් නොමැතිව ධීවර කටයුතු සිදුකරන ධීවරයන් සඳහා ධීවර බලපත්‍ර

56 වන වගන්තිය– යාත්‍රාවක් නොමැතිව ධීවර කටයුතු සිදුකරන ධීවරයන් සඳහා ධීවර බලපත්‍ර
57 වන වගන්තිය– විදේශීය යාත්‍රාවක ධීවර මෙහෙයුම්වල නිරත වීම සඳහා ධීවරයන්ට ධීවර බලපත්‍ර

## 4 වන පරිච්ඡේදය– යාත්‍රාධිපතියන් සඳහා බලපත්‍ර

58 වන වගන්තිය- යාත්‍රාධිපතියන් සඳහා බලපත්‍ර

## 5 වන පරිච්ඡේදය - විනෝදය සඳහා මසුන් ඇල්ලීම

59 වන වගන්තිය– විනෝදය සඳහා මසුන් ඇල්ලීම

## 6 වන පරිච්ඡේදය–බලපත්‍ර ලේඛනය

60 වන වගන්තිය–බලපත්‍ර ලේඛනය

## 7 වන පරිච්ඡේදය- අභියාචනා

61 වන වගන්තිය– අභියාචනා

## IV වනකොටස– දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශවල ධීවර මෙහෙයුම්

62 වන වගන්තිය– නියාමනය නොකළ මහ මුහුදේ මත්ස්‍ය විශේෂ
63 වන වගන්තිය– කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන විසින් නියාමනය කරනු ලබන මත්ස්‍ය විශේෂ
64 වන වගන්තිය– වෙනත් රාජ්‍යයකට අයත් ජල තීරයක ප්‍රවේශ ගිවිසුම සහිතව ධීවර කටයුතු සිදු කිරීම
65 වන වගන්තිය– සිය රටට නැවත ගෙන්වා ගනු ලැබීමට ඇති අයිතිය

## V වන කොටස – ධීවර සහ අනෙකුත් ජලජ සම්පත් කළමනාකරණය

66 වන වගන්තිය – ධීවර කළමනාකරණයේ පොදු මූලධර්ම
67 වන වගන්තිය – ධීවර කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා විද්‍යාත්මක උපදේශ

68 වන වගන්තිය – ජාතික ධීවර ප්‍රතිපත්තිය
69 වන වගන්තිය – ධීවර කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග
70 වන වගන්තිය – කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග

## 1 වන පරිච්ඡේදය – ධීවර සහ - සහභාගීත්වය

71 වන වගන්තිය – නම් කළ ධීවර කටයුතු
72 වන වගන්තිය – ධීවර කමිටු
73 වන වගන්තිය – ධීවර කළමනාකරණ ප්‍රදේශ
74 වන වගන්තිය – ධීවර කළමනාකරණ සහ - සහභාගීත්වය කමිටු
75 වන වගන්තිය –ධීවර කළමනාකරණ සැලැස්ම
76 වන වගන්තිය –වෙරළබඩ ප්‍රජාවන් සහ යැපුම් ධීවර කර්මාන්තය ආරක්ෂා කිරීම

## 2 වන පරිච්ඡේදය – මත්ස්‍ය අස්වැන්න වෙන් කිරීමට සමානුපාතික ලෙස ධීවර යෙදවුම් යොදා ගැනීම

77 වන වගන්තිය – මත්ස්‍ය අස්වැන්න වෙන් කිරීමට සමානුපාතික ලෙස ධීවර යෙදවුම් යොදා ගැනීම
78 වන වගන්තිය – මසුන් ඇල්ලීමේ ධාරිතාව කළමනාකරණය කිරීම

## 3 වන පරිච්ඡේදය – ධීවර ආම්පන්න සහ මසුන් ඇල්ලීමේ පන්න ක්‍රම විධිමත් කිරීම

79 වන වගන්තිය– ධීවර ආම්පන්න සහ පන්න ක්‍රම විධිමත් කිරීමේ අරමුණු
80 වන වගන්තිය– ධීවර ආම්පන්න සහ ධීවර පන්න ක්‍රම භාවිතය තහනම් කිරීම
81 වන වගන්තිය– කිමිදුම් මෙහෙයුම්
82 වන වගන්තිය– සීන් දැල්, කරමල් දැල් සහ වෙනත් වර්ගයේ නියමිත දැල් භාවිතය පිළිබඳ නියෝග
83 වන වගන්තිය – මසුන් ඇල්ලීම සඳහා විෂ සහිත හෝ පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීම තහනම් කිරීම
84 වන වගන්තිය – පතුළේ අදින ට්‍රෝල් දැල් දමා මසුන් ඇල්ලීමේ නිරත වීම තහනම් කිරීම

## VI වනකොටස - සංරක්ෂණ ක්‍රම සහ විධි

85 වන වගන්තිය – සමුද්‍ර පරිසර පද්ධතීන්හි දූෂණය පාලනය කිරීම
86 වන වගන්තිය – අතහැර දැමූ, නැතිවූ හෝ ඉවත දැමූ ධීවර ආම්පන්න සමද්‍රධරණය කිරීම
87 වන වගන්තිය – අවකාශීය වසා දැමීම්,විවෘත සහ සංවෘත වාර
88 වන වගන්තිය – ධීවර රක්ෂිත
89 වන වගන්තිය – ආරක්ෂිත / තහනම් මත්ස්‍ය විශේෂ

## VII වන කොටස – විද්‍යාත්මක පර්යේෂණ සහ දත්ත රැස් කිරීම

90 වන වගන්තිය – ධීවර යාත්‍රා මගින් කෙරෙන විද්‍යාත්මක පර්යේෂණ
91 වන වගන්තිය – විදේශීය පර්යේෂණ සංවිධානයක් හෝ වෙනත් රාජ්‍යයක් විසින් කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ
92 වන වගන්තිය – ධීවර දත්ත රැස් කිරීමේ වැඩසටහන්
93 වන වගන්තිය – දත්ත රැස් කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ සත්‍යාපනය කිරීම

**VIII වනකොටස– මත්ස්‍ය ගුණාත්මකභාවය, ආහාර සුරක්ෂිතතාව සහ මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන වෙළඳාම**

94 වන වගන්තිය – පොදු පරමාර්ථය සහ එය යොදා ගැනීම
95 වන වගන්තිය – මත්ස්‍ය ගුණාත්මකභාවය, ආහාර සෞඛ්‍යාරක්ෂිතාවය සහ ආහාර සුරක්ෂිතතාව
96 වන වගන්තිය - නීති විරෝධී ලෙස ලබාගත් ධීවර නිෂ්පාදන සන්තකයේ තබා ගැනීම සහ එහි වෙළඳාම කිරීම තහනම් කිරීම
97 වන වගන්තිය – ඇතැම් මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම
98 වන වගන්තිය – අන්වේෂණීය හැකියාව සහ මසුන් අල්ලා ගැනීමේ සහතිකය
99 වන වගන්තිය- මසුන් පිරිසැකසුම් කිරීමේ ආයතන ලියාපදිංචි කිරීම
100 වන වගන්තිය - මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන පිරිසැකසුම් කිරීම , අපනයනය, ආනයනය හෝ ප්‍රති අපනයනය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම
101 වන වගන්තිය – ලියාපදිංචි කිරීමේ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම
102 වන වගන්තිය – අභියාචනා
103 වන වගන්තිය – ගබඩා සහ මත්ස්‍ය පිරිසැකසුම් ආයතන පරීක්ෂා කිරීම

104 වනවගන්තිය – නිසි බලධරයා
105 වන වගන්තිය – පරීක්ෂා කරන ලද මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදනවලට මැදිහත් වීම

106 වන වගන්තිය – ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන මත සෙස් බද්දක් පැනවීම

**IX වන කොටස –** ධීවර අරමුදල සහ ධීවර සහනාධාර

107 වන වගන්තිය – ධීවර අරමුදල

108 වන වගන්තිය – ධීවර සහනාධාර සහ ආධාර

**X වන කොටස – අධීක්ෂණය ,පාලනය, සෝදිසි මෙහෙයුම් සහ බලාත්මක කිරීම**

**1 වන පරිච්ඡේදය – අධීක්ෂණය ,පාලනය සහ සෝදිසි මෙහෙයුම්**

109 වන වගන්තිය – වරාය ප්‍රවේශය
110 වන වගන්තිය – යාත්‍රා අධීක්ෂණ පද්ධතිය
111 වන වගන්තිය – ප්‍රතිනැව්ගත කිරීම්
112 වන වගන්තිය– **මසුන් ගොඩබෑම**
113 වන වගන්තිය– **විදේශීය යාත්‍රා සඳහා වරාය රාජ්‍ය පිලිබඳ ක්‍රියාමාර්ග**

114 වන වගන්තිය - නිරීක්ෂක වැඩසටහන
115 වන වගන්තිය – නිරීක්ෂකයින් පත් කිරීම සහ හඳුනා ගැනීම
116 වන වගන්තිය – නිරීක්ෂකයන්ගේ කර්තව්‍යයන්

## 2 වන පරිච්ඡේදය – බලයලත් නිලධාරීන්

117 වන වගන්තිය – **අධීක්ෂණ, පාලන සහ සෝදිසි මෙහෙයුම් (MCS) කාර්යයන් සඳහා බලයලත් නිලධාරීන් සහ වෙනත් නිලධාරීන් පත් කිරීම**

118 වන වගන්තිය – බලයලත් නිලධාරීන් හඳුනා ගැනීම
119 වන වගන්තිය – බලයලත් නිලධාරීන්ගේ සාමාන්‍ය බලතල
120 වන වගන්තිය – සම්පස්ථව ලුහුබැඳයාමේ බලය
121 වන වගන්තිය – යාත්‍රාවට ගොඩවීමේ සහ එය පරීක්ෂා කිරීමේ ප්‍රකාශය
122 වන වගන්තිය – ඇතුළුවීමේ සහ සෝදිසි කිරීමේ බලය
123 වන වගන්තිය – තොරතුරු සහ සාක්ෂි සුරක්ෂිතව ලබා ගැනීමේ බලය
124 වන වගන්තිය- ධීවර යාත්‍රාවක් නැවැත්වීමේ සහ
පාලනයට නතු කරගැනීමේ බලය
125 වන වගන්තිය –ධීවර යාත්‍රාවක් නිශ්චාලනය කිරීමේ බලය
126 වන වගන්තිය- විදේශ ගමන් බලපත්‍ර, යාත්‍රාධිපති බලපත්‍ර සහ නාවිකයින්ගේ පොත් රාජසන්තක කිරීමේ බලය

127 වන වගන්තිය – රඳවා ගැනීමේ බලය
128 වන වගන්තිය – අත්හැර දැමූ ධීවර යාත්‍රා, ආම්පන්න සහ ධීවර නිෂ්පාදන සම්බන්ධයෙන් වූ බලය
129 වන වගන්තිය – බලයලත් තැනැත්තන්ගේ **රාජකාරී**

## XI වන කොටස –සමථකරණය, පරිපාලනමය සහ අධිකරණමය ක්‍රියා පටිපාටිය

## 1 වන පරිච්ඡේදය – සමථකරණය

130 වන වගන්තිය – ධීවර ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය
131 වන වගන්තිය – ධීවර ආරවුලක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම

## 2 වන පරිච්ඡේදය – පරිපාලනමය කාර්යය පටිපාටිය

132 වනවගන්තිය – විශේෂඥ මණ්ඩලය
133 වනවගන්තිය– සමථයට පත් කිරීම

## 3 වන පරිච්ඡේදය – අධිකරණ ක්‍රියා පටිපාටිය සහ වැරදි දණ්ඩන

134 වන වගන්තිය – අධිකරණ බලය සහ නඩු පැවරීමේ හිමිකම
135 වන වගන්තිය - ක්‍රියාපටිපාටිය
136 වන වගන්තිය – සාමාන්‍ය වරද
137 වන වගන්තිය – දණ්ඩන මට්ටම්
138 වන වගන්තිය – අඛණ්ඩව සිදුකරන වැරදි
139 වන වගන්තිය – පුනරාගත වැරදිකරුවන්
140 වන වගන්තිය – රජය විසින් දරනු ලබන පිරිවැය
141 වන වගන්තිය – තහනම් නියෝගය
142 වන වගන්තිය – ගෙවීම පැහැර හැරීම
143 වන වගන්තිය – දඩ නොගෙවීම සම්බන්ධව ඇති බැඳියාව
144 වන වගන්තිය – අලාභයක් හෝ හානියක් සඳහා වන බැඳියාව
145 වන වගන්තිය – සමාගම්වල නිලධාරීන්ගේ සහ යාත්‍රාධිපතියන්ගේ බැඳියාව

146 වන වගන්තිය – ක්‍රියාකරුවන්ගේ බැඳියාව
147 වන වගන්තිය - පුරවැසියා විසින් නඩු පැවරීම සහ සිවිල් බලාත්මකභාවය
148 වන වගන්තිය – ඉන්ජන්ෂන් තහනම
149 වන වගන්තිය – නොපමාව නිදහස් කිරීම
150 වන වගන්තිය – ඇප ලබාදීම
151 වන වගන්තිය – රාජසන්තක කිරීම
152 වන වගන්තිය – තහනම් කළ හෝ රාජසන්තක කළ දේපල බැහැරකිරීම

## 4 වන පරිච්ඡේදය – සාක්ෂි සහ පූර්වනිගමන

153 වන වගන්තිය – සාක්ෂි සහතිකය
154 වන වගන්තිය – සහතිකවල වලංගුභාවය සහ එහි ක්‍රියා පටිපාටි
155 වන වගන්තිය – යාත්‍රාවක ස්ථානීය පිහිටීම පිළිබඳ සහතිකය
156 වන වගන්තිය – ස්වයංක්‍රීය පිහිටීම් ස්ථාන පද්ධතිය, පූර්ව නිගමනය සහ සහතිකය
157වන වගන්තිය - ඡායාරූපමය සාක්ෂි
158 වන වගන්තිය - විශේෂඥ සාක්ෂි
159 වන වගන්තිය – පූර්ව නිගමන
160 වන වගන්තිය –ඔප්පු කිරීමේ භාරය
161 වන වගන්තිය – සාක්ෂිවලට මැදිහත් වීම හෝ වෙනස්කම් සිදු කිරීම
162 වන වගන්තිය – පළාත් සභා වෙතින් විමසීම

## XII වන කොටස – සාමාන්‍ය

163 වන වගන්තිය – නිවේදන
164 වන වගන්තිය – රහස්‍ය තොරතුරු නම් කිරීම
165 වන වගන්තිය – තොරතුරුවල අයිතිය
166 වන වගන්තිය – ධීවරයින් සඳහා අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
167 වන වගන්තිය – නියෝග
168 වන වගන්තිය – අර්ථ නිරූපණය
169 වන වගන්තිය – පනත බලපැවැත්විය යුතුබව
170 වන වගන්තිය – පරිච්ඡින්න කිරීම්
171 වන වගන්තිය - නිදහස් කිරීම්
172 වන වගන්තිය – සිංහල භාෂාව බලපැවැත්විය යුතුබව

| | හඳුන්වාදීමේ විධි විධාන |
|---|---|
| **ලුහුඬු නාමය සහ ආරම්භය**<br><br>**1 වන වගන්තිය** | 1.මේ පනත 2024 අංක xxx දරන ධීවර හා ජලජ සම්පත් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.<br><br>2. මේ පනත අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මගින් නියම කරනු ලබන දිනයකදී බලාත්මක වියයුතු වන්නේය. (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් හැඳින්වේ.) |
| **විෂය පථය සහ අදාළත්වය**<br><br>**2 වන වගන්තිය** | 1. සමුද්‍රීය සහ අභ්‍යන්තර ජලාශ වල මසුන් ඇල්ලීම, ජලජ සම්පත් සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කරුණක් හෝ ක්‍රියාකාරකමක්,<br><br>අ) ශ්‍රී ලංකා භූමියෙහි හෝ ශ්‍රී ලංකා ජල තීරයෙහි;<br>ආ) වෙනත් රටක ධජය සහිත හෝ ශ්‍රී ලාංකික ධීවර යාත්‍රා මගින් ශ්‍රී ලංකා ජල තීරයෙහි ;<br>ඇ) ශ්‍රී ලාංකික ධජය දරමින් ප්‍රවේශ ගිවිසුමක් සහිතව වෙනත් රටක ලියාපදිංචි කර ඇති ධීවර යාත්‍රා ;<br>ඈ) ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ ධජය සහිත යාත්‍රා මගින් කෙරෙන; හෝ<br>ඉ) ධජ රාජ්‍යයේ මූලික වගකීමට අගතියක් නොවන පරිදි, ශ්‍රී ලාංකිකයින් විසින් කරනු ලබන අවස්ථාවේ දී;<br>ඊ) ශ්‍රී ලංකා ජල තීරයට ඇතුළුවන විදේශීය ධීවර යාත්‍රා සම්බන්ධයෙන් කටයුතු කිරීම;<br>මේ පනතේ විධිවිධාන අදාළ විය යුත්තේ ය.<br><br>2. (1) ජලජීවී වගා කටයුතු මෙම පනතේ විෂය පථයෙන් බැහැරකරනු ලැබේ.එසේවුවද, සමුද්‍රීය, කලපු සහ මෝයවල්හි සිදු කරන සමුද්‍රීය ජලජ ජීවී වගා ක්‍රියාකාරකම් මඟින් ධීවර සහ ජලජ සම්පත් කටයුතු වලට බලපෑමක් සිදුවන අවස්ථාවකදී මේ පනත අදාළ විය යුත්තේ ය.<br>(2) ඉහත (1) වන උප වගන්තියේ සඳහන් සමුද්‍රීය ජල ජීවී වගාවන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එකඟතාවය ලබා ගත යුතුය . |
| **පරමාර්ථ**<br><br>**3 වන වගන්තිය** | ධීවර හා ජලජ සම්පත් දිර්ඝ කාලීන සංරක්ෂණය සහ තිරසාර භාවිතය සහතික කිරීම සහ ශ්‍රී ලාංකීය ජනතාවගේ යහපත උදෙසා ධීවර ක්ෂේත්‍රයේ කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ සංවර්ධනය සහතික කිරීමේ පරමාර්ථ වන අතර එයට :<br><br>අ) ධීවර කළමනාකරණ සහ සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී සහ අදාළ ධීවර ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේදී පවත්නා ප්‍රශස්ත විද්‍යාත්මක හා සමාජ ආර්ථික සාක්ෂි භාවිතා කිරීම, සහ විද්‍යාත්මක දත්ත රැස් කිරීමේදී දායකත්වය ලබා දීම ;<br><br>ආ) පමණ ඉක්මවා සමුද්‍රීය ජලජ සම්පත් නෙලා ගැනීමෙන් තොරව ආර්ථික වශයෙන් ඵලදායීවන පරිදි උපරිම තිරසාර භාවිතය තහවුරු කරමින් මසුන් ඇල්ලීමේ ධීවර යෙදවුම් හා යාත්‍රා ප්‍රමාණයක් පවත්වා ගැනීම සහතික කිරීම; |

| | |
|---|---|
| | ඇ) මත්ස්‍ය අස්වැන්න නෙළාගැනීම හරහා උපරිම තිරසාර අස්වැන්නක් ලබා දෙන මට්ටමින් අල්ලාගත් විශේෂවල මත්ස්‍ය ගහනය ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ නඩත්තු කිරීම සහතික කිරීම වස් ධීවර කළමනාකරණය සඳහා පූර්ව නිවාරණ ප්‍රවේශය යොදා ගැනීම;<br><br>ඈ) සමුද්‍රීය ජලජ සම්පත් ආශ්‍රිත මත්ස්‍ය වාසභූමි සහ පරිසර පද්ධතිවල ජෛව විවිධත්වය ආරක්ෂා වන පරිදි සහ සමුද්‍රීය පරිසර පද්ධතියට ධීවර කටයුතු මගින් සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සහතික කිරීම සඳහා ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති ප්‍රවේශය යොදා ගැනීම;<br><br>ඉ) වරණීය , පරිසර හිතකාමී සහ පිරිවැය සඵලදායී ධීවර ආම්පන්න සහ තාක්ෂණික ක්‍රම භාවිතය සංවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම;<br><br>ඊ)මසුන් ඇල්ලීම සහ ඉවතලන ද්‍රව්‍ය මඟින් සිදුවන සමුද්‍ර දූෂණය සහ අතහැර දැමූ ධීවර ආම්පන්නවලට මසුන් හසුවීම අවම කිරීම;<br><br>උ) ධීවර ප්‍රජාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා සහ ඔවුන්ට සාධාරණ ජීවන තත්ත්වයක් ඇති කිරීමට දායක වන පරිදි යැපුම් මට්ටමේ කර්මාන්තයක් වශයෙන් වෙරළබඩ ධීවර කර්මාන්තයේ වැදගත්කම හඳුනා ගැනීම.<br><br>ඌ) ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව කටයුතු කරමින්, නීතිවිරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ('IUU') ධීවර කටයුතු, සඳහා දායකවන ආර්ථික සහන සැලසීම ඇතුළුව කිසිදු ආකාරයේ දිරිගැන්වීම් නොකළ යුතු ය.<br><br>එ)මසුන් ඇල්ලීම සහ මසුන් ඇල්ලීම සම්බන්ධව ක්‍රියාකාරකම් ඵලදායි ලෙස අධීක්ෂණය, පාලනය සහ සෝදිසි මෙහෙයුම් සිදු කිරීම සහ නීතිය බලාත්මක කිරීම<br><br>ඒ) අදාළ කලාපීය හෝ ජාත්‍යන්තර බැඳීම් සහ ජාත්‍යන්තර නීතියේ පවත්නා අදාල රීති අනුගමනය කිරීම;<br><br>ඔ)ධීවරයින්ගේ සහ ධීවර කටයුතුවල නිරතවන සේවකයින්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සහතික කිරීම;<br><br>ඕ) රැකියා නියුක්තිය, සමාජ දායකත්වයක්, නියෝජනය වන පරිදි සහ ධීවර ක්ෂේත්‍රයේ තීරණගැනීමේ ක්‍රියාවලීන්හි සහභාගීත්වය තුළ හැකිතාක් දුරට ස්ත්‍රී පුරුෂ සමතුලනයක් පවත්වාගැනීම;<br><br>ක)මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම්, ආනයනය සහ අපනයනය සඳහා ඍජු විදේශ ආයෝජන සහ තරඟකාරී ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා උචිත පරිසරයක් නිර්මාණය කිරීම; සහ<br><br>ග)මත්ස්‍ය ගුණාත්මකභාවය සහ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සහ පසු අස්වනු හානි අවම කිරීම<br><br>ඇතුළත් විය යුත්තේ ය. |
| | **I වනකොටස - පරිපාලනය** |
| **ධීවර හා ජලජ සම්පත්** | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (ධී .ජ.දෙ. ) මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ වගකීම පැවරෙන රාජ්‍ය ආයතනය විය |

| | |
|---|---|
| දෙපාර්තමේන්තුව<br><br>(ධී .ජ.දෙ. )<br><br>**4** වන වගන්තිය | යුත්තේ ය. |
| අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෙසු නිලධරයන් පත්කිරීම<br><br>**5** වන වගන්තිය | 1. ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා (අධ්‍යක්ෂ ජනරාල්වරයා) ලෙස හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නීති මගින් අවශ්‍යයැයි නියමකර ඇති යම් කාර්ය පටිපාටිවලට අනුකූලව යම් තැනැත්තෙකු:<br><br>ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කර්තව්‍ය සහ වගකීම් විෂයයෙහි සහය වනු පිණිස ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ('අධ්‍යක්ෂ') ලෙස හෝ වශයෙන් කටයුතු කිරීම සඳහා එක් තැනැත්තෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක්; සහ<br><br>ඇ) බලපත්‍ර දීමේ නිලධාරීන්, බලයලත් නිලධාරීන් සහ ආරවුල් බේරුම්කිරීමේ නිලධාරීන් ඇතුළු, මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි අනෙකුත් නිලධාරීන් පත්කරනු ලැබිය යුත්තේ ය.<br><br>2. (1) වන උපවගන්තියට අනුව මෙම පනත යටතේ බලතල ක්‍රියාත්මක කරන හෝ කර්තව්‍යයන් සිදු කිරීම සඳහා පත්කරන ලද තැනැත්තන් හෝ මේ පනත වෙනුවෙන් හෝ මේ පනත යටතේ ක්‍රියාකරන වෙනත් තැනැත්තෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු නීත්‍යානුකූලව කරන, හෝ ක්‍රියාකිරීමට වැළකී සිටින හෝ මෙම පනත මගින් හෝ යටතේ ලබාදී ඇති යම් කාර්යයන්, බලතල හෝ රාජකාරි අපේක්ෂාවෙන් ක්‍රියාත්මක කිරීම, අධිකරණබලය නොමැතිකම, නීතියේ වැරැද්ද හෝ සත්‍ය යන හේතුමත, හෝ වෙනත් කිසියම් හේතුවක් මත, එම ක්‍රියාව හෝ ක්‍රියාකිරීම අතපසු කිරීම සාධාරණ හේතුවක් නොමැතිව අසද්භාවයෙන් දැඩි නොසැලකිලිමත් කමින් හෝ අනවධානයෙන් සිදුකර ඇත්නම් මිස,එවැනි ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයකට හෝ සිවිල් හෝ අපරාධ වගකීමකට යටත් නොවිය යුත්තේ ය. |
| අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යයන් සහ වගකීම්<br><br>**6** වන වගන්තිය | 1. අමාත්‍යවරයාගේ පාලනයන්ට සහ නියමයන්ට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා , මේ පනත පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දැරිය යුතුය.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම පනත යටතේ සිය රාජකාරී ඉටු කිරීමේදී වෙනත් කරුණු අතර පහත සඳහන් කාර්යයන් ද ඉටු කල යුතුය. එනම්,<br><br>අ) ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත පිණිස ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය 10 සංවර්ධනය සහ තිරසාර ලෙස භාවිතයට ගැනීම උදෙසා මෙම පනතේ අරමුණු ඉටු කර ගැනීමට විධිවිධාන සැලැස්වීම පිණිස;<br><br>ආ) ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය , සංවර්ධනය සහ තිරසාර භාවිතය පිණිස ධීවර ක්ෂේත්‍රයේ ස්වෛරී අයිතිවාසිකම් තහවුරු වන පරිදි, ජාතික ධීවර ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා ලේකම්වරයා වෙත සහය වීමට සහ පනතේ පරිපාලනය හා ක්‍රියාත්මක කිරීමට මඟ පෙන්වීම උදෙසා උපාය මාර්ග වැඩිදියුණු කිරීම;<br><br>ඇ) ද්විපාර්ශ්වික, උපකලාපීය, කලාපීය සහ ජාත්‍යන්තර ක්‍රියාවලීන් සහ සංවිධාන තුළ මේ පනතේ විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අභිලාෂයන් සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාවේ බැඳීම්වලට අනුගත වන පරිදි ඉටුකිරීම; සහ<br><br>ඇ) ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය සඳහා |

| | |
|---|---|
| | පාරදෘශ්‍යවූද,වගවන්නාවූද ක්‍රියාවලින් සංවර්ධනය කිරීම සහ ඉහත කාර්යයන් ඉටු කිරීමේදී, උපදේශක සභාව,ඇතුළුව මේ පනත ප්‍රකාරව ස්ථාපිත කළ හැකි ආයතනවල උපදෙස් සහ නිර්දේශයන් යෝග්‍ය පරිදි සැලකිල්ලට ගත යුත්තේ ය.<br><br>3.මේ පනතේ විධිවිධානවලට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉහත වගන්තිවල අඩංගු රාජකාරි යම් අධ්‍යක්ෂවරයෙකුට හෝ සිය කළමනාකාරීත්වය යටතේ සිටින්නාවූ වෙනත් නිලධාරියෙකුට ලිඛිතව පැවරිය හැකිය.<br><br>4.මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිය අභිමතය පරිදි කරණු ලබන යම් නියමයක් හෝ තීරණයක් ඒ සම්බන්ධව සිදුකරනු ලබන අභියාචනයක් හෝ වෙනත් යම් ආකාරයක් මත අවලංගු කිරීමට සංශෝධනය කිරීමට වෙනස් කිරීමට නීත්‍යානුකූලව අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.<br><br>5.එවැනි සෑම අවස්ථාවකදීම අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ එමඟින් බලපෑමට ලක් වූ අනෙකුත් සියලුම තැනැත්තන් එකී තීරණයට එකඟ විය යුතුය. |
| **ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාව**<br>**7 වන වගන්තිය** | 1. ධීවර සහ ජලජ සම්පත් උපදේශක සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ.<br><br>2. උපදේශක සභාවේ කාර්යයන් හා වගකීම් වනුයේ;එනම්,<br>අ) ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය ,සංවර්ධනය සහ තිරසාර භාවිතය සම්බන්ධ සියලු කාරණාවල දී මෙන්ම සහ අමාත්‍යවරයා විසින් උපදේශක සභාවේ උපදෙස් පතා යොමු කළ හැකි වෙනත් කරුණු සම්බන්ධයෙන්; සහ,<br><br>ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උපදෙස් පතා උපදේශක සභාව වෙත යොමු කරනු ලැබිය හැකි මේ පනතේ පරිපාලනයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම විය යුතුය.<br><br>3.උපදේශක සභාව, I වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ස්ථිර සාමාජිකයින් එකොලොස් දෙනෙකුගෙන්(11) සහ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන තත්කාර්යය සාමාජිකයින් අට දෙනෙකුගෙන්(08) සමන්විත විය යුතු ය.<br><br>4. සාමාජිකත්වය සහ රැස්වීම් සඳහා සහභාගිත්වය සම්බන්ධයෙන් පහත සඳහන් රීති අදාළ වේ:<br><br>අ.) සභාවේ සභාපති ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විය යුතු ය.<br>ආ.) උපදේශක සභාවේ සාමාජිකයින්ගේ ලැයිස්තුව මෙම පනතේ I වන උපලේඛනයෙහි දක්වා ඇත. මෙම සාමාජිකයින්ගේ ලැයිස්තුවට අමතරව, නිරීක්ෂකයින් ලෙස සිය රැස්වීම්වලට සහභාගී වන ලෙස වෙනත් එවැනි තැනැත්තන්ට උපදේශක සභාවට ආරාධනා කළ හැකි ය.<br><br>ඇ.) උපදේශක සභාවේ ගණපූරණය ඕනෑම රැස්වීමක දී දහතුන් දෙනෙකු (13) විය යුතු ය;<br>ඇ.) යම් සාමාජිකයෙකු:<br>i) ඔහු / ඇය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව සිටී නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු බවට පත් වේ නම්; හෝ<br><br>ii) ඔහු / ඇය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ |

| | |
|---|---|
| | පුරවැසියෙකු වීම අවසන් වේ නම්;<br><br>ඒ තැනැත්තා උපදේශක සභාවේ පත් කළ සාමාජිකයෙකු වීමට නුසුදුස්සෙක් වන්නේ ය.<br><br>ඉ.) අමාත්‍යවරයාට ඔහුගේ හෝ ඇයගේ සිය අභිමතය පරිදි උපදේශක සභාවට පත් කරන ලද ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය ඉවත් කළ හැකි ය.<br>ඊ.) අමාත්‍යවරයා විසින් පහත සඳහන් අවස්ථාවල දී අදාළ තනතුර දැරීම සඳහා ආදේශක සාමාජිකයෙකු පත් කරනු ලැබිය යුතු ය.;එනම්,<br>i.) පත් කරන ලද යම් සාමාජිකයෙකු සිය ධූරය අතහැර ගිය විට;<br>ii) (4) වන උප වගන්තියේ (ඇ) අනුව සාමාජිකයා ධූරයෙන් ඉවත් කර ඇති විට; හෝ<br><br>iii) රෝගීව සිටීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක දී එලෙස නොපැමිණ සිටින කාලයක් දක්වා<br><br>5.උපදේශක සභාවේ සැම පත් කළ සාමාජිකයෙකු ම සිය ධූරය නියමිත කාලයට පෙර හැර ගියහොත් හෝ අමාත්‍යවරයා විසින් 4 වන උප වගන්තියේ (ඉ) අයිතමය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස වසර තුනක කාලයක් තම ධූරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීමට ද සුදුසුකම් ලබයි.<br><br>6.උපදේශක සභාවට තම රැස්වීම් පැවැත්වීම සඳහා තමන්ගේම ක්‍රියාපටිපාටික රීති අනුගමනය කළ හැකි අතර එසේ නියම කර ගනු ලබන පරිදි අදාළ රෙගුලාසි පිළිපැදිය යුතු ය. උපදේශක සභාවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ උපදේශක සභාවේ සාමාජිකයෙකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් උපදේශක සභාවේ කිසිදු ක්‍රියාවක් හෝ රැස්වීම් කටයුතු කිරීමක් හෝ අවලංගු නොවිය යුත්තේ ය.<br><br>7. ධීවර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා උපදේශක සභාව සමඟ සාකච්ඡා කර ජාතික ධීවර කළමනාකරණ සහ සංවර්ධන සැලැස්ම සකස් කිරීමට සැලැස්විය යුතු ය. |
| **ජාතික ධීවර සම්මේලනය, දිස්ත්‍රික් සහ ග්‍රාමීය ධීවර සංවිධාන**<br><br>**8 වන වගන්තිය** | 1. මෙම පනතේ කාර්යය සඳහා (මෙහි මින්මතු සම්මේලනය යනුවෙන් හඳුන්වන)ජාතික ධීවර සම්මේලනය ජාතික මට්ටමින්,දිස්ත්‍රික් ධීවර සංවිධාන දිස්ත්‍රික් මට්ටමින් සහ ග්‍රාමීය ධීවර සංවිධාන ග්‍රාමීය මට්ටමින් පිහිටුවිය යුතු ය.<br><br>2. ධීවර අමාත්‍යවරයා විසින් ජාතික ධීවර සම්මේලනයේ සහ ධීවර සංවිධානයන්හි ක්‍රියාකාරිත්වය,මුල්‍යමය සහ විගණනයට අදාල නියෝග සකස් කරනු ලැබිය හැකි ය. |
| **වාර්ෂික පාලන වාර්තාව**<br><br>**9 වන වගන්තිය** | අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්ෂිකව පාලන වාර්තාවක් පිළියෙළ කර එය අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. |
| | **II වන කොටස ලියාපදිංචිය** |
| | **1 වන පරිච්ඡේදය – ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම** |
| **ධීවර යාත්‍රා** | 1. ඵලදායි පාලනයක් ක්‍රියාවට නැංවීම සඳහා ධීවර යාත්‍රා යෙදවුමේ ධාරිතාව |

| | |
|---|---|
| ලියාපදිංචි කිරීමේ ලේඛනය<br>10 වන වගන්තිය | කළමනාකරණය කිරීම සහ මෙම පනත යටතේ ස්ථාපිත කාර්යයන් සඳහා යාත්‍රාවේ ලියාපදිංචි අංකය, එහි හිමිකරුගේ / හිමිකරුවන්ගේ නම හා ලිපිනය සහ යාත්‍රාවේ විස්තරය ද ඇතුළුව යාත්‍රාවේ නිෂ්පාදිත පිරිවිතරයන් සහ එහි ක්‍රියාකාරකම පිළිබඳව අවම තොරතුරු සහිත වූ ලියාපදිංචි ධීවර යාත්‍රා ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යාත්‍රාව පිළිබඳ තොරතුරු, යාත්‍රා ලියාපදිංචි අංකය, නම සහ හිමිකරුගේ ලිපිනය ඇතුළු විනෝදය සඳහා මසුන් ඇල්ලීමට භාවිතා කරන ලියාපදිංචි ධීවර යාත්‍රා ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, (1) සහ (2) යන උප වගන්තිවල සඳහන් ලේඛනයේ අඩංගු තොරතුරු මත පදනම්ව, අවශ්‍ය වෙතැයි තමා විසින් සලකනු ලැබිය හැකි ප්‍රමාණයකට හෝ මෙම පනත යටතේ, එවැනි යාත්‍රා මැනවින් කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම, ඊට අදාළ කිසියම් නියෝග හෝ ශ්‍රී ලංකාව වග වීමට බැඳී ඇති යම් ජාත්‍යන්තර ගිවිසුම්ගත කාර්යයන් සඳහා නියමිත විය හැකි පහත සඳහන් යාත්‍රා<br><br>අ) විද්‍යාත්මක අරමුණු සඳහා මසුන් ඇල්ලීම;<br><br>ආ) ඉන්දියන් සාගර ටූනා කොමිසම ඇතුළුව කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන විසින් විධිමත් කරනු ලබන මත්ස්‍ය විශේෂ ඇල්ලීම;<br><br>ඇ) මෙම පනතේ විධිවිධාන වලට අනුකූලව වෙනත් රටක ජල තීරයේ මසුන් ඇල්ලීම;<br><br>ඈ) දත්ත රැස් කිරීමේ වැඩසටහන් යටතේ මසුන් ඇල්ලීම; සහ,<br><br>ඉ) විනෝදය සඳහා මසුන් ඇල්ලීම පිළිබඳ වාර්තා ද ඇතුළුව,<br><br>තමාට අවශ්‍ය යැයි හැඟෙන යාත්‍රා යෙදවුම් පිළිබඳ වාර්තා පවත්වාගන යා හැකිය.<br><br>4. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචි ධීවර යාත්‍රා ලේඛනයේ ඇති තොරතුරු සහ මෙම පනත යටතේ පිහිටුවා ඇති කිසියම් යාත්‍රා පිළිබඳ වාර්තාවක සපයා ඇති තොරතුරු යාවත්කාලීනව සහ අනුරූපීව පවත්නා බව තහවුරු කළ යුතු ය. |
| ලියාපදිංචි කිරීම<br><br>11 වන වගන්තිය | 1. මේ වගන්තියේ සහ 12 වන වගන්තියේ නිශ්චිතවම දක්වා ඇති ක්‍රියා පටිපාටින්ට අනුකූලව විධිමත්ව ධීවර යාත්‍රාව ලියාපදිංචි කර ඇත්නම් නම් මිස ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක හිමිකරු හෝ ක්‍රියාකරු විසින් කිසිම ධීවර කටයුත්තක් සිදු නොකළ යුත්තේය.<br><br>2. යාත්‍රාවක් ධීවර යාත්‍රාවක් ලෙස ලියාපදිංචි කිරීමට අදහස් කරන හිමිකරු හෝ ක්‍රියාකරු ඒම ලියාපදිංචි සහතිකය ලබා ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු වෙත නියමිත ආකෘතිය අනුව සිදු කළ යුතු අතර, නියමිත ගාස්තුව ඒ සමඟ ඉදිරිපත් කළ යුතුය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කරනු ලැබිය යුත්තේ බලයලත් නිලධාරියෙකු ලවා එම යාත්‍රාව පරීක්ෂා කරවා, (2) වන උප වගන්තියේ සඳහන් ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රයට අමුණනු ලැබීමට නියමිත එම යාත්‍රාවේ මුහුදු යාමේ යෝග්‍යතාවය පිළිබඳ වාර්තාවක් එකී බලයලත් නිලධාරියා විසින් නිකුත් කරනු ලැබීමෙන් පසුව විය යුතුය. ඊට අමතරව, |

අ) නියමිත ආකෘති පත්‍රය යටතේ ස්ථාපිත නියමයන්ට අනුව ධීවර යාත්‍රාව පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ලැබී ඇති බව;

ආ) වලංගු රක්ෂණ සහතිකය;

ඇ) යාත්‍රාව සතුව ජීවිතාරක්ෂක කබා ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇති බව;

ඇ)ධීවර යාත්‍රාව කිසිදු කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක නීති විරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතුවල නියැලීමේ යාත්‍රා ලැයිස්තුවේ ලැයිස්තුගත කර නොමැති බව;

ඉ) ධීවර යාත්‍රාවට හෝ ක්‍රියාකරුට එරෙහිව ධජය හිමි යම් රාජ්‍යයක් විසින් පවරන ලද නඩුවක් විභාග වෙමින් නොපවත්නා බව ;

ඊ) ධීවර යාත්‍රාව වෙනත් රාජ්‍යයක ලියාපදිංචි කර නොමැති බව; සහ,

උ) මේ වගන්තිය යටතේ සකස් කර ඇති නියෝගවල නියම කර ඇති වෙනත් යම් අවශ්‍යතාවක් යන,

නියමයන් සහ කොන්දේසි සපුරා ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සනාථ කර ගනු ලැබිය යුතු ය.

4.ආනයනික ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීම (12) වන වගන්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව ආනයනික ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ තාක්ෂණික කමිටුවේ පූර්ව අනුමැතියට යටත් විය යුතුය.

5.(2) වන උපවගන්තිය යටතේ අයදුම්පතක් ලැබීමෙන් පසු, ධීවර යාත්‍රාවේ අයිතිය තහවුරු කිරීම සඳහා අමතර ලියකියවිලි හෝ තොරතුරු ලබා දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයදුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

6. ධීවර යාත්‍රා ලේඛනයේ නම සඳහන් වන තැනැත්තා එම යාත්‍රාවේ හිමිකරු ලෙස සැලකිය යුතුය.

7. ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවකදී,එකී ප්‍රතික්ෂේප කිරීමට හේතු නියමිත පරිදි ලිඛිතව අයදුම්කරුට දැනුම් දිය යුතුය. එවැනි ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ තීරණය ලියාපදිංචි තැපැලෙන් අයදුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් මගින් යොමු කළ දින සිට දින තිහක් (30) ඉකුත් වූ පසු දැනුම් දුන් බව සලකනු ලැබේ.



8. ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ අයදුම්කරුට නියමිත ආකෘතිය මගින් ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතුය.

9.ලියාපදිංචිය ප්‍රත්‍යාදිෂ්ට,අවලංගු හෝ අත්හිටුවන තෙක් ලියාපදිංචි කිරීමේ සහතිකව වලංගු වන්නේ ය.

10.දේශීයව නිපදවන ලද නව යාත්‍රා සඳහා, මූලිකව ලියාපදිංචිය සඳහා අයදුම්පතක් ලැබුණු පසු, ලියාපදිංචි සහතිකය නිකුත් කරන තෙක් තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ යුතුය.

11.(1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හිමිකරුවෙකු හෝ ක්‍රියාකරුවෙකු වරදක් සිදුකරන අතර වරදකට වරදකරු වූ පසු, උපලේඛන IIIහි අදාළ දණ්ඩනයට යටත් විය යුතුය.

| | |
|---|---|
| | 12. ධීවර යාත්‍රා සලකුණු කිරීම සහ යාත්‍රා ලියාපදිංචියට අදාළ වෙනත් ඕනෑම කරුණක් ඇතුළු මේ පනතේ විෂය පථය තුළට ගැනෙන ඉල්ලුම්පත්‍ර ආකෘතිය, ගෙවිය යුතු ගාස්තු, ඒ සමඟ ඇති සහතික, ලියාපදිංචි අංකය සහ යාත්‍රාවල නම තීරණය කිරීම උදෙසා අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. |
| **ආනයනික ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම**<br><br>**12 වන වගන්තිය** | 1. ආනයනික ධීවර යාත්‍රා ධීවර මෙහෙයුම් සඳහා යොදා ගන්නේ නම්, ඒ සඳහා ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිහිටුවනු ලබන තාක්ෂණික කමිටුවක් පැවැතිය යුත්තේ ය.<br><br>2. තාක්ෂණික කමිටුව පහත සඳහන් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත විය යුතු ය.<br><br>අ) ධීවර අමාත්‍යාංශය;<br>ආ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව;<br>ඇ) ආයෝජන මණ්ඩලය;<br>ඈ) වාණිජ දෙපාර්තමේන්තුව;<br>ඉ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව;<br>ඊ) රේගු දෙපාර්තමේන්තුව; සහ,<br>එ) ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව.<br><br>3.ආනයනය කරන ලද ධීවර යාත්‍රාවක් 11 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට පෙර, අදාළ වන පරිදි 4 සහ 5 වන උපවගන්ති යටතේ සපයා ඇති ලේඛන තක්සේරු කිරීම සහ 6 වන උපවගන්තිය යටතේ වූ කොන්දේසිවලට අනුකූල වීම මත තාක්ෂණික කමිටුව සිය අනුමැතිය ලබා දිය යුතු ය.<br><br>4.විදේශීය ධීවර යාත්‍රාවක් ආනයනය කිරීමට අදහස් කරන යම් තැනැත්තෙකු එම යාත්‍රාව මිලදී ගැනීම සඳහා උපයෝගත් ආදායම් මූලාශ්‍රය හෙළිදරව් කළ යුතු අතර, පහත සඳහන් ලේඛන ඇගයීම සඳහා තාක්ෂණික කමිටුව වෙත යොමු කරනු ලැබීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දිය යුතු ය.<br>අ) ධජ රාජ්‍යය විසින් නිකුත් කරන ලද නවතම ධීවර බලපත්‍රයේ මුල් පිටපත;<br>ආ)අඛණ්ඩව පසුගිය වසර තුන සඳහා යාත්‍රාවේ පූර්ව හිමිකරුවන් හඳුනාගැනීමට හැකි පෙර විකුණුම් බිල්පත; සහ,<br>ඇ) පෙර හිමිකරුට හෝ නියමුවාට ධීවර යාත්‍රාව සම්බන්ධයෙන් තවදුරටත් නීත්‍යානුකූල, වාසිදායක හෝ මූල්‍ය අවශ්‍යතාවක් හෝ පාලනයක් නොමැති බව සනාථ කිරීම සඳහා වන අදාළ ලේඛන<br><br>5.එසේ වුවද, අලුතින් නිපදවන ලද ධීවර යාත්‍රාවක් ආනයනය කිරීමේ දී (4)(අ), (ආ), (ඇ) දක්වා උපවගන්තියේ වූ විධිවිධාන අදාළ නොවන අතර, ඒ වෙනුවට, අලුතින් නිපදවන ලද යාත්‍රා සඳහා යාත්‍රා නිෂ්පාදකයාගේ මුල්ම සහතිකය සැපයිය යුතුය.<br><br>6.විදේශ රටක නිෂ්පාදිත ධීවර යාත්‍රාවක් ආනයනය කිරීමේ දී පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වීම අනිවාර්ය වේ.<br><br>අ) ආනයනය කිරීමට නියමිත ධීවර යාත්‍රාව කිසියම් කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක නීති විරෝධී,වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතුවල (IUU ) නිරත වූ යාත්‍රා ලැයිස්තුවේ ලැයිස්තුගත කර නොතිබිය යුතු |

| | |
|---|---|
| | අතර;<br><br>ආ) කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන මගින් නියාමනය කරනු ලබන මත්ස්‍ය විශේෂ ඇල්ලීම සඳහා ක්‍රියාත්මක කරන ලද ධීවර යාත්‍රාවක අපනයන රාජ්‍ය එම සංවිධානයේ පාර්ශවකරුවෙකු විය යුතුය<br><br>7. තාක්ෂණික කමිටුවේ පූර්ව අනුමැතිය මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර යාත්‍රාව ලියාපදිංචි කිරීමට, යාත්‍රාව ආනයනික මුහුදු ගමන් කාල සීමාව සඳහා සහ අදාළ ශ්‍රී ලංකා රේගුව , ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය නියෝගවලට යටත්ව යාත්‍රා හිමිකරුට තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. |
| ලියාපදිංචි සහතිකය යාත්‍රාවේ රැගෙන යාමට ඇති පොදු වගකීම<br><br>13 වන වගන්තිය | 1. ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත හෝ සහතික කළ පිටපතක් සෑම විටම යාත්‍රාවේ රැගෙන යන බවට ධීවර යාත්‍රාවේ හිමිකරු ,යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු තහවුරු කල යුතු අතර, 117 වන වගන්තිය ප්‍රකාරව නිසි පරිදි බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවේදී එකී සහතිකය ඉදිරිපත් කල යුතුය.<br><br>2. (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හිමිකරුවෙකු , යාත්‍රාධිපති හෝ ක්‍රියාකරුවෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට උපලේඛන IIIහි අදාළ දණ්ඩනයට යටත් විය යුතුය. |
| ධීවර යාත්‍රා ලකුණු කිරීම හා හඳුනා ගැනීම<br><br>14 වන වගන්තිය | 1. ලියාපදිංචි ධීවර යාත්‍රාවක හිමිකරු, යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු විසින් නියමිත කොන්දේසි ප්‍රකාරව ලියාපදිංචිය සිදුකරන මොහොතේ වෙන් කරවා ගත් අංකය සහ අකුරු ධීවර යාත්‍රාවේ සෑම පැත්තකම සහ නියමු මැදිරියේ වහළය මත මනාව දිස්වන ලෙස සළකුණු කර ගනු ලැබිය යුත්තේ ය.<br><br>2. (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හිමිකරුවෙකු යාත්‍රාධිපතියෙකු හෝ ක්‍රියාකරුවෙකු බරපතල වරදක් සිදුකරන, අතර අධ්‍යක්ෂ ජනරාල්වරයාට තමාට සුදුසු යැයි හැඟෙන කාලයක් සඳහා එකී බලපත්‍රය අත්හිටුවීමට බලය ඇති අතර වරදකරු වූ පසු, උපලේඛන III හි අදාළ දණ්ඩනයට යටත් විය යුතුය.<br><br>3. මේ පනතේ විෂය පථය තුළ ධීවර යාත්‍රා සළකුණු කිරීම සඳහා කොන්දේසි පැනවීමට අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකිය. |
| පළාත් අරමුදලට ගාස්තු ගෙවීම<br><br>15 වන වගන්තිය | එක් එක් වර්ෂය අවසානයේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (11) සහ (12) වන වගන්තිවල සඳහන් එක් එක් පළාතේ පදිංචි තැනැත්තන්ට අයත් ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම සඳහා එම වර්ෂය තුළ ලැබුණු ගාස්තුවලින් එවැනි ප්‍රතිශතයක් නියමිත පරිදි ඒ පළාතේ පළාත් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. |
| පළාත වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීම<br><br>16 වන වගන්තිය | අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (11) සහ (12) යන වගන්ති යටතේ ලබා ගත් එක් එක් පළාතේ පදිංචි තැනැත්තන්ට අයත් ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම පිළිබඳ තොරතුරු, නිත්‍ය පදනමක් මත සහ අවම වශයෙන් වසරකට වරක් වත්, අදාළ පළාත් ධීවර අමාත්‍යාංශ ලේකම් වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | |
| ලේඛනයේ තොරතුරු වෙනස්වීම්<br><br>17 වන වගන්තිය | 1.ධීවර යාත්‍රාවක හිමිකරු හෝ ක්‍රියාකරු විසින් එම යාත්‍රාව ලියාපදිංචි කිරීම සඳහා සපයා ඇති තොරතුරුවල කිසියම් වෙනස් කිරීමක් පිළිබඳව නියම කර ඇති කාල සීමාව තුළ සහ නියම කර ඇති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.එහිදී විශේෂයෙන්ම පහත සඳහන් තොරතුරු සම්ප්‍රේෂණය කළ යුතු ය.<br>අ) ලියාපදිංචි ධීවර යාත්‍රාවක හිමිකාරිත්වය හෝ සන්තකයෙහි යම් පැවරීමක් එවැනි වෙනස් වීමෙන් දින විසිඑකක් (21) ඇතුළත වාර්තා කළ යුතු ය; සහ,<br><br>ආ) ලියාපදිංචි කළ ධීවර යාත්‍රාවක් කැඩීබිඳී ගිය හෝ නැති වූ හෝ අවස්ථාවක දී, ඒ කැඩීබිඳී යාම හෝ නැතිවීම සිදු වී දින දාහතරකට (14) ඉක්මයාමට මත්තෙන් වහාම වාර්තා කළ යුතු ය.<br><br>2. ලියාපදිංචි කරන ලද යාන්ත්‍රික නොවන ධීවර යාත්‍රාවකට එන්ජිමක් සවි කරනු ලැබුවහොත් නියමිත ආකෘතිය භාවිතා කරමින් එම යාත්‍රාව නැවත ලියාපදිංචි කිරීම සඳහා හිමිකරු විසින් ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.<br><br>3.(1) වන උපවගන්තිය යටතේ සපයා ඇති නව තොරතුරු සත්‍යාපනය කිරීමෙන් සහ නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (11) වන වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනයේ නව තොරතුරු ලියාපදිංචි කරනු ලැබිය යුතුය.<br><br>4.හිමිකරු හෝ නියමුවා විසින් නියමිත කාල සීමාව තුළ (1) වන උපවගන්තියේ තොරතුරු වාර්තා කිරීමට අපොහොසත් වීම වරදක් වේ. අධ්‍යක්ෂ ජනරාල් විසින් එක් එක් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් දඩයක් නියම කළ යුතු අතර අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (133) වන වගන්තිය අදාළ කර ගත යුතු ය. |
| ධීවර යාත්‍රා ලියාපදිංචිය අත්හිටුවීම සහ අවලංගු කිරීම<br><br>18 වන වගන්තිය | 1.ලියාපදිංචි ධීවර යාත්‍රාවක හිමිකරු විසින් පහත සඳහන් අවස්ථාවන්හි දී ධීවර යාත්‍රා ලේඛනයෙන් සිය නමින් ඇති ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා නියමිත ආකෘතිය භාවිතා කරමින්<br><br>අ) ධීවර හෝ ධීවර ආශ්‍රිත කටයුතු සඳහා තවදුරටත් භාවිතා නොකරන අවස්ථාවක;<br>ආ) යාත්‍රාව පසුගිය වසර තුන තුළ අඛණ්ඩව ක්‍රියාත්මක නොකර තිබීම මත;<br>ඇ) යාත්‍රාව සම්පූර්ණයෙන්ම විනාශ වී, නැති වී හෝ අලුත් වැඩියා කළ නොහැකි තත්ත්වයක ඇතැයි තාක්ෂණික වශයෙන් තහවුරු කර ඇති විට අවශ්‍ය තහවුරු කිරීමේ ලේඛණ සමඟ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉල්ලුම් කළ යුතු ය.<br><br>2.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ,<br>අ) අවලංගු කිරීම ආරම්භ කර ඇති ධීවර යාත්‍රාව තවදුරටත් ශ්‍රී ලංකා ධජය යටතේ වාණිජ මසුන් ඇල්ලීම සඳහා භාවිතා නොකරන බව; සහ,<br>ආ) යාත්‍රා හිමිකරුට හෝ ධීවර යාත්‍රාවට කිසිදු දණ්ඩනයක් පැනවීමක් සිදුවීමට නොමැති බව<br>යන කරුණු පිළිබඳව තමා සෑහීමට පත්වීමෙන් පසු (1) වන උප වගන්තිය යටතේ ධීවර යාත්‍රාවක ලියාපදිංචිය අවලංගු කළ යුතු ය.<br><br>3.අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ලියාපදිංචි ධීවර යාත්‍රාවක්;<br>අ) තවදුරටත් මුහුදු යෝග්‍යතාවක් නොමැති බව;<br>ආ) අතහැර දමා ඇති බව සහ / හෝ යාත්‍රාවේ හිමිකරු වසර තුනක් (3) |

| | |
|---|---|
| | මුළුල්ලේ සොයාගත නොහැකි බව;<br>ඇ) වෙනත් රාජ්‍යයක ලියාපදිංචි වී ඇති අවස්ථාවකදී;<br>ඈ) ධීවර යාත්‍රාවේ ලියාපදිංචිය අවලංගු කිරීමට හේතු වන්නා වූ නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර කටයුතු සඳහා වරදකරු වී තිබීම;<br>ඉ) අවශ්‍ය සියලුම පරීක්ෂණ පැවැත්වීමෙන් පසු යාත්‍රාව සොයාගත නොහැකි වෙනත් ඕනෑම අවස්ථාවක;සහ<br>ඊ) ධීවර මෙහෙයුම් බලපත්‍රය අවලංගු කළ විට ධීවර යාත්‍රාවේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තීරණය කළ හැකිවීම,<br>මත ධීවර යාත්‍රාවක ලියාපදිංචිය අවලංගු කිරීමට අදාලව ඉදිරි කටයුතු සිදු කළ හැකිය.<br><br>4.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) සහ (3) යන උප වගන්ති යටතේ අවලංගු කිරීම බලපැවැත්වෙන දිනය ලිඛිතව හිමිකරුට දැනුම් දෙනු ලැබිය යුතු අතර එයට අදාළ අවලංගු කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය.<br><br>5.අධ්‍යක්ෂ ජනරාල්වරයාට,<br>අ)අයදුම්කරු විසින් සපයන ලද සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි තොරතුරු මත පදනම්ව ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇති බව තහවුරු වන අවස්ථාවකදී ; හෝ<br>ආ)යාත්‍රා හිමිකරු හෝ ක්‍රියාකරු පූර්ව අනුමැතියකින් තොරව මුල් ව්‍යුහය, එන්ජිම සහ උපකරණවල වෙනස්කම් වාර්තා කර නොමැති අවස්ථාවක ;<br>ධීවර යාත්‍රාවක ලියාපදිංචිය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට අදාලව ඉදිරි කටයුතු කිරීමට හැකිය. |
| **ධීවර යාත්‍රා ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත් කිරීම**<br><br>**19 වන වගන්තිය** | 1.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර යාත්‍රාවක ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත්කිරීමට මත්තෙන් එකී ධීවර යාත්‍රාව සම්බන්ධව නීති විරෝධී වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර කටයුතුවල නිරත වීමට එරෙහිව කිසියම් නඩු කටයුත්තක් විභාග වෙමින් නොපවත්නා බව තහවුරු කළ යුතුය.<br><br>2.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තියේ තොරතුරු තහවුරු කර ගැනීම පිළිබඳව සෑහීමකට පත් වීමෙන් පසු පහත කොන්දේසි:<br>අ)යාත්‍රා නිරීක්ෂන පද්ධතිය හෝ කිසියම් වෙනත් නිරීක්ෂණ උපකරණයක් යාත්‍රාවෙන් විසන්ධි කර ඇති විට සහ එකී උපකරණය රාජ්‍ය දේපළක් වන අවස්ථාවක බලයලත් නිළධාරියෙකු වෙත යොමු කළ යුතු වේ.<br><br>ආ)ශ්‍රී ලංකා කේත අංකයට වෙනස් කරන ලද කිසියම් ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතිය හෝ කිසියම් වෙනත් විද්‍යුත් උපකරණයක් විසන්ධි කර තිබිය යුතු වීම.<br><br>ඇ)ස්ථිර ලෙස සළකුණු කරන ලද යාත්‍රා ලියාපදිංචි අංකය බලයලත් නිළධාරියෙකු ඉදිරියේ සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබිය යුතු වීම.<br><br>සපුරා ඇති අවස්ථාවන්හිදී 11 වන වගන්තියෙහි සඳහන් ලේඛනයෙන් ධීවර යාත්‍රා ලියාපදිංචිය ඉවත් කරනු ලැබිය යුතුය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත් කිරීම |

| | |
|---|---|
| | ක්‍රියාත්මක වන දිනය යාත්‍රා හිමිකරුවන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර එයට අදාල ලියාපදිංචිය ඉවත් කිරිමේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය. |
| **උකස් සාධන පත්‍ර ලියාපදිංචි කිරිම**<br><br>**20 වන වගන්තිය** | 1.ධීවර යාත්‍රා පිළිබඳ ලේඛනයේ ලියාපදිංචි ධීවර යාත්‍රාවක හිමිකරු, එම ධීවර යාත්‍රාවට සම්බන්ධ සෑම උකස් සාධන පත්‍රයක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය.<br><br>2.(1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු ලැබීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී උකස් සාධන පත්‍රය (11) වන වගන්තියේ සඳහන් ධීවර යාත්‍රා පිළිබඳ ලේඛනයේ එය ඉදිරිපත් කර ඇති අනුපිළිවෙලට ලියාපදිංචි කළ යුතු ය. |
| **උකස් සාධන පත්‍ර පිළිබඳ ප්‍රමුඛතාව**<br><br>**21 වන වගන්තිය** | එකම ධීවර යාත්‍රාවක් සම්බන්ධයෙන් එකකට වඩා වැඩි උකස් සාධන සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇති අවස්ථාවක, ඒ සාධන පත්‍ර , ලියා අත්සන් කරන ලද දිනය අනුව නොව, ඒවා ලියාපදිංචි කරන ලද දිනය අනුව එක් සාධන පත්‍රයක් වෙනත් සාධන පත්‍රයක් අභිබවා ප්‍රමුඛතාව ලබාදිය යුතුය.එසේ වුවද,යම් උකස් සාධන පත්‍රයක් පූර්වයෙන් ලියාපදිංචි කරවා ගැනීමෙහිලා වංචාවක් හෝ වංක සහයෝගයක් සිදුකර ඇත්නම් ඒ් උකස් සාධන පත්‍රය යටතේ හිමිකම් පාන තැනැත්තාගේ ප්‍රමුඛතාව ඉන් අහෝසි වන්නේ ය. |
| **ධීවර යාත්‍රාව ලියාපදිංචි කරන ලද උකස බලපැවැත්විය යුතු බව**<br><br>**22 වන වගන්තිය** | වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, ධීවර යාත්‍රාවක් පිළිබඳ උකස් සාධන පත්‍රයක් ලියාපදිංචි කර ඇති අවස්ථාවක දී, උකස්කරු විසින් හෝ ඔහුට එරෙහිව හෝ ඒ දේශීය ධිවර යාත්‍රාව විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම මගින්,උකස බලපවත්නා තාක් ,ඒ ධිවර යාත්‍රාවේ උකස අහෝසි නොවන අතර ,එය අහෝසි වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.තවද, ඒ ධිවර යාත්‍රාවේ පැවරුම්ලාභී හෝ ඒ බැහැර කිරීම කරනු ලැබූ වෙනත් තැනැත්තා හෝ වෙත ඒ උකසට යටත්ව තිබිය යුතු ය. |
| **උකස නිදහස් කිරීම සටහන් කිරීම**<br>**23 වන වගන්තිය** | දේශීය ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කරන ලද උකසක් නිදහස් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ උකස නිදහස් කළ බවට වූ සහතිකය උකස් සාධන පත්‍රයේ සටහන් කොට, යථා පරිදි අත්සන් කොට සහ සහතික කෝ්ට ඒ සාධන පත්‍රය ද, ලැබුණු මුදල වෙනුවෙන් උකස් ලාභී විසින් නිකුත් කරන ලද ලදු පත ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ උකස නිදහස් කර ඇති බවට සටහනක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දේශීය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය. |
| **වස්තු භංගත්වය උකස කෙරෙහි බල නොපාන බව**<br><br>**24 වන වගන්තිය** | ධීවර යාත්‍රාවක් සම්බන්ධයෙන් වූ ලියාපදිංචි කරන ලද යම් උකසක් එය ලියාපදිංචි කළ දිනයෙන් පසු ඒ උකස්කරු විසින් යම් වස්තු භංගත්ව ක්‍රියාවක් කරනු ලබන අවස්ථාවක ඒ ධීවර යාත්‍රාව උකස්කරුගේ වස්තු භංගත්වය ආරම්භ වන අවස්ථාවේ දී ඔහුගේ සන්තකයෙහි ඔහුගේ අණට යටත්ව හෝ ඔහු විසින් බැහැර කරනු ලැබීමට යටත්ව තිබුණේ වුව ද, නැතහොත් ඔහු එහි ප්‍රකට අයිතිකරුව සිටියේ වුව ද ඒ වස්තු භංගත්ව ක්‍රියාව ඒ උකස කෙරෙහි බල නොපෑ යුතු අතර, වස්තු භංගත්වයට පත් තැනැත්තාගේ අනෙකුත් ණය හිමියන්ගේ හෝ ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ යම් භාරකරුවෙකුගේ නැතහොත් පැවරුම් ලාභියෙකුගේ ඒ පිළිබඳ අයිතිවාසිකමක්, හිමිකම්පෑමක් හෝ සම්බන්ධතාවක් අභිබවා එම උකසට ප්‍රමුඛතාව ලැබිය යුතු ය. |

| | |
|---|---|
| **උකස් පැවරීම සහ ලියාපදිංචි කිරීම**<br><br>**25 වන වගන්තිය** | 1.දේශීය ධීවර යාත්‍රාවක ලියාපදිංචි කළ උකසක් යම් තැනැත්තෙකුට පවරනු ලැබිය හැකි අතර එම පැවරීම කරන්නා වූ සාධන පත්‍රය ('පැවරීමේ සාධන පත්‍රය') නියමිත ආකෘති පත්‍රයට අනුකූල විය යුතු ය. සෑම පැවරීමේ සාධන පත්‍රයක් ම ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.<br><br>2.උකසක් පිළිබඳ සෑම පැවරීමේ සාධන පත්‍රයක් ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දේශීය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.<br><br>3.එකී පැවරීම දේශීය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි යථා පරිදි ලියාපදිංචි කර තිබේ නම්, පැවරුම්කරු විසින් දරන ලද ප්‍රමුඛතාව ම ඒ උකස පවරනු ලැබූ තැනැත්තා විසින් දරනු ලැබිය යුතු ය. |
| **වස්තු භංගත්වය යනාදී අවස්ථාවකදී උකසක සම්බන්ධතාව ප්‍රේෂණය වීම**<br><br>**26 වන වගන්තිය** | 1.දේශීය ධීවර යාත්‍රාවක උකසක සම්බන්ධතාව, (25) වන වගන්තිය යටතේ කරනු ලැබූ පැවරුමක් මගින් නොව, වස්තු භංගත්වය නිසා හෝ මරණය නිසා හෝ වෙනත් යම් නීත්‍යානුකූල ආකාරයකින් හෝ ප්‍රේෂණය වන අවස්ථාවක ඒ සම්බන්ධතාව ලබන තැනැත්තා විසින්:<br>අ) තම නම, ලිපිනය සහ ඒ උකසේ සම්බන්ධතාව තමාට ප්‍රේෂණය වූයේ කවර ආකාරයකින් ද යන්න සඳහන් ප්‍රකාශයක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට කරනු ලැබිය යුතු ය; තවද<br>ආ) ඒ දේශීය ධීවර යාත්‍රාවේ උකසේ සම්බන්ධතාව ප්‍රේෂණය වීම පිළිබඳ සාක්ෂි අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.<br><br>2.(1) වන උප වගන්තියෙහි සඳහන් ප්‍රකාශය ලැබීම මත සහ එහි සඳහන් සාක්ෂි ඉදිරිපත් කරනු ලැබීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ ධීවර යාත්‍රාවේ උකස් හිමියා වශයෙන් එකී සම්බන්ධතාව ලැබ සිටින තැනැත්තාගේ නම සහ ලිපිනය ඒ උකස ලියාපදිංචි කර ඇති දේශීය ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනයේ ඇතුළත් කළ යුතු ය.<br><br>3.උකසක සම්බන්ධතාව, (25) වන වගන්තිය යටතේ වූ පැවරුමක් මගින් නොව, වස්තු භංගත්වය නිසා හෝ මරණය නිසා හෝ වෙනත් යම් නීත්‍යානුකූල ආකාරයකින් හෝ තමාට ප්‍රේෂණය වී ඇත්තා වූ තැනැත්තා විසින්, ඒ උකස්ලාභියා දැරූ ප්‍රමුඛතාව ම දැරිය යුතු ය. |
| **ප්‍රසිද්ධ කිරීම**<br>**27 වන වගන්තිය** | 10 වන වගන්තිය යටතේ ගැනෙන ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීමේ ලේඛනයේ ඇති තොරතුරු සහ 31 වන වගන්තිය යටතේ ගැනෙන ධීවරයින් ලියාපදිංචි කිරීමේ ලේඛනයේ තොරතුරුවල රහස්‍යභාවය සම්බන්ධයෙන් අදාළ වන යම් නීතියකට යටත්ව සහ මෙම පනතේ විධිවිධාන සමග, විශේෂයෙන්, 163 සහ 164 යන වගන්ති වලට අනුකූල වන පරිදි හැකිතාක් දුරට ප්‍රසිද්ධ කළ යුතුය |
| **සෝදිසි කිරීම් සහ පිටපත්**<br><br>**28 වන වගන්තිය** | මේ පනත යටතේ පවත්වා ගෙන යනු ලබන සියලුම ලේඛන සහ ලියවිලි ඒ සඳහා සම්බන්ධතාවක් ඇතැයි හිමිකම් කියන යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ නීතිඥවරයා විසින් හෝ ලියවිල්ලකින් යථා පරිදි බලය දෙන ලද ඔහුගේ නියෝජිතයෙකු විසින් සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම කළ හැකි අතර, නියමිත ගාස්තුව ගෙවීමෙන්, එවැනි යම් ලේඛනයක හෝ ලියවිල්ලක සහතික කළ පිටපත් හෝ උධෘත අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබා ගත හැකි ය. |
| **සාක්ෂි**<br><br>**29 වන වගන්තිය** | මේ කොටස ප්‍රකාරව පවත්වා ගෙන යනු ලබන යම් ලේඛනයක හෝ ලියවිල්ලක් සත්‍ය පිටපතක් හෝ උධෘතයක් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන යටතේ සහතික කරන ලද්දක් යයි සලකනු ලබන පිටපතක් හෝ උධෘතයක් , අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන හෝ ඔහුගේ පත්වීම ඔප්පු කිරීමෙන් තොරව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය |

| | |
|---|---|
| | කරනු ලැබිය යුතු අතර සියලුම සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී සියලු කාර්යය සඳහා, ඒ ලේඛනයේ හෝ ලියවිල්ලේ අඩංගු කරුණු සම්බන්ධයෙන් 154 වන වගන්තියට අනුකූලව බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය. |
| **වෙනත් ලිඛිත නීති අදාළ නොවිය යුතු බව**<br><br>**30 වන වගන්තිය** | චංචල දේපළ පිළිබඳව උකසක් ඇති කරන යම් සාධන පත්‍රයක් මේ පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කිරීමට නියම කරන්නා වූ යම් ලිඛිත නීතියක විධිවිධාන මෙම පනත යටතේ ලියාපදිංචි කරන ලද උකස් සාධන පත්‍රයකට අදාළ නොවිය යුතු ය. |
| | **2 වන පරිච්ඡේදය – ධීවරයන් සහ ධීවර ආශ්‍රිත කටයුතු කරන තැනැත්තන් ලියාපදිංචි කිරීම** |
| **ධීවරයින් සහ ධීවර ආශ්‍රිත කටයුතු කරන තැනැත්තන් ලියාපදිංචි කිරීම**<br><br>**31 වන වගන්තිය** | 1. ධීවරයින්ගේ සහ ධීවර ආශ්‍රිත කටයුතුවල නිරත වන තැනැත්තන්ගේ ලේඛනයක් සහ පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර , එම එක් එක් තැනැත්තාට නියම කර ඇති පරිදි හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබිය යුතු ය.<br><br>2. ධීවර හෝ ධීවර ආශ්‍රිත කටයුතුවල නිරත වීමට අදහස් කරන යම් තැනැත්තෙකු නියමිත පරිදි ලියාපදිංචිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතුය.<br><br>3. (2) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>4. (2) වන උපවගන්තිය යටතේ ධීවර හැඳුනුම්පතක් ලබා ගැනීමට අදාළ කොන්දේසි සහ අයදුම්පත් පටිපාටිය සම්බන්ධ නියෝගමාලාවන් සහ (1) වන උපවගන්තියේ සඳහන් ධීවරයින්ගේ සහ ධීවර ආශ්‍රිත කටයුතු නිරක වන තැනැත්තන්ගේ ලේඛනය සැකසීමේදී සහ ප්‍රතිශෝධනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටියට අදාළ නියෝගමාලා අමාත්‍යවරයාට සෑදිය හැකිය. |
| | **3 වන පරිච්ඡේදය - බෝට්ටු අංගන , ධීවර ආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම** |
| **බෝට්ටු අංගන ,ධීවර ආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් ලියාපදිංචි කිරීම**<br><br>**32 වන වගන්තිය** | 1.කිසිම තැනැත්තෙකු විසින් නියමිත පටිපාටියට සහ ආකෘතියට අනුකූලව ලියාපදිංචි වීමකින් තොරව බෝට්ටු අංගන තුල ධීවර බෝට්ටු ඉදිකිරීම,ධීවර ආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදනය කිරීමේ සහ ආනයනය කිරීමේ කටයුතුවල නිරත නොවිය යුතුය.<br><br>2.අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර ආම්පන්න, නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත උපාංග නිෂ්පාදකයින්ගේ සහ ආනයනකරුවන්ගේ ලේඛනයක් නියමිත පරිදි පවත්වා ගත යුතුය.<br><br>3.(1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| | **4 වන පරිච්ඡේදය - අභියාචනා** |

| | |
|---|---|
| **අභියාචනා**<br><br>**33 වන වගන්තිය** | 1. ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් 11 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, 18 වන වගන්තිය යටතේ අත්හිටුවීමකදී හෝ අවලංගු කිරීමකදී එබඳු තීරණයකින් අතෘප්තියට පත් අයදුම්කරු හෝ බලපත්‍රලාභියා විසින් එකී තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් (30) ඇතුළත, නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටිය යටතේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.<br><br>2. ධීවරයෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් 31 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එබඳු තීරණයකින් අතෘප්තියට පත් අයදුම්කරු විසින් එකී තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් (30) ඇතුළත, නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටිය යටතේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.<br><br>3. නිෂ්පාදකයින් ලෙස හෝ ආනයනකරුවන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීමක් 32 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එබඳු තීරණයකින් අතෘප්තියට පත් අයදුම්කරු හෝ බලපත්‍රලාභියා විසින් එකී තීරණය තමා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් (30) ඇතුළත, නියම කරනු ලැබිය හැකි ක්‍රියාපටිපාටිය යටතේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.<br><br>4. ලේකම්වරයා විසින්,උපවගන්ති 1 සිට 3 යටතේ වන අභියාචනයක් සැලකිල්ලට ගනිමින් අදාළ අභියාචකගේ හෝ බලපත්‍රලාභියාගේ නිවේදනය ලැබීමෙන් දින තිහක් (30) ඇතුළත, අදාළ අභියාචන තීරණය ඒ සම්බන්ධ හේතුද සමඟ ලිඛිතව අභියාචක වෙත දැනුම් දිය යුතුය.<br><br>5. ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තෙකුට, එකී තීරණය ලැබීමෙන් දින තිහක් (30) ඇතුළත, නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකිය. |
| | **III වන කොටස - බලපත්‍ර දීම** |
| | **1 වන පරිච්ඡේදය – ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර** |
| **ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම**<br><br>**34 වන වගන්තිය** | 1. ධීවර යාත්‍රා සහ ඒවායේ ක්‍රියාකාරකම් සඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා සහ (3)(ඌ) සහ (එ) වන වගන්තිවලට අනුකූලව නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර කටයුතුවලට ප්‍රමාණවත් ලෙස ඊට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක් , මෙම කොටසෙහි නිශ්චිතව දක්වා ඇති ක්‍රියාපටිපාටි යටතේ ලබා දී ඇති ධීවර මෙහෙයුම් බලපත්‍රයක බලය යටතේ සහ නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව මිස, ශ්‍රී ලංකා ජල තීරයේ හෝ දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත වූ ප්‍රදේශවල ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.<br><br>2. මේ කොටස යටතේ ධීවර මෙහෙයුම් සිදුකිරීමට ධීවර යාත්‍රා සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අදාළ ඉල්ලුම් කිරීමේ ආකෘතිය,ගෙවිය යුතු ගාස්තු සහ අනෙකුත් කරුණු නිශ්චය කිරීම සම්බන්ධව අමාත්‍යවරයාට නියෝගමාලා සෑදිය හැකිය. |
| **ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ සාමාන්‍ය මූලධර්ම**<br><br>**35 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා 40 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන ධීවර බලපත්‍ර සංඛ්‍යාව, 3 (ආ) වන වගන්තියෙහි දක්වා ඇති පරමාර්ථයට අනුකූලව, ධීවර සම්පත්වල විද්‍යාත්මක සාක්ෂි හා ඒවායේ තිරසාර භාවිතය මත පදනම් විය යුතු ය.<br><br>2. 1 වන උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදුකරනු ලබන ඉල්ලීමක් මත ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (නාරා) හෝ නාරා ආයතනයේ සාකච්ඡා කිරීමෙන් පසුව වෙනත් බලයලත් නියෝජිතායතනයක් ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් හි |

| | |
|---|---|
| | තත්ත්වය පිළිබඳව වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ධීවර කටයුතු කළමනාකරණ සහ සංවර්ධන සැලැස්මට හා අදාළ වන අවස්ථාවල දී, ජාතික ධීවර යාත්‍රා ඇණිය සංවර්ධන සැලැස්මට අනුකූලව (2) වන උපවගන්තියේ සඳහන් වාර්තාව පදනම් කර ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සිදු කිරීම සඳහා වාර්ෂිකව නිකුත් කළ යුතු මුළු ධීවර බලපත්‍ර සංඛ්‍යාව තීරණය කළ යුතු ය.<br><br>4. මෙම පනත පැනවීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ධීවර කළමනාකරණ හා සංවර්ධන සැලැස්මක් සහ ජාතික යාත්‍රා ඇණි සංවර්ධන සැලැස්මක් සකසා ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීමට නිකුත් කරනු ලබන සමස්ත ධීවර බලපත්‍ර සංඛ්‍යාව තීරණය කිරීමේදී එම සැලසුම් උපයෝගී කර ගත යුතුය . |
| **ධීවර මෙහෙයුම් බලපත්‍රයක කාල සීමාව**<br><br>**36 වන වගන්තිය** | කලින් අත්හිටුවනු හෝ අවලංගු කරනු ලැබුවහොත් මිස, බලපත්‍රය නිකුත් කළ දින සිට එක් වර්ෂයක කාල සීමාවක් සඳහා බලපත්‍රය වලංගු විය යුතු ය. |
| **ධීවර මෙහෙයුම් බලපත්‍ර පැවරීම**<br><br>**37 වන වගන්තිය** | 1. මෙම කොටස යටතේ ප්‍රදානය කරන ලද කිසිම බලපත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ බලපත්‍ර දීමේ නිලධාරියාගේ ලිඛිත අනුමැතියකින් තොරව පවරනු ලැබිය නොහැකි ය:<br><br>2. (1) වන උපවගන්තිය යටතේ ධීවර බලපත්‍රයක් පවරනු ලබන අවස්ථාවක දී,<br><br>(අ) 40 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා වූ බලපත්‍රය මත පිටසන් කරනු ලැබිය යුතු ය.<br><br>(ආ) 42 සහ 43 යන වගන්ති යටතේ දේශී අධිකරණ බල සීමාවෙන් එපිට ප්‍රදේශවල ධීවර මෙහෙයුම් සිදු කිරීමට වූ ධීවර බලපත්‍ර සම්බන්ධයෙන් වන විට එවැනි බලපත්‍රයක් මත පිටසන් කරනු ලැබිය යුතු ය.<br><br>3. (2) වන උප වගන්තිය යටතේ කරනු ලබන පැවරීමක් කරනු ලැබුවහොත්, ධීවර යාත්‍රාවේ ලියාපදිංචිය පැවරුම්ලාභියාගේ නමින් පවරනු ලැබිය යුතු ය.<br><br>4. 45 වන වගන්තිය යටතේ සිය බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති කිසිදු තැනැත්තෙකුට සිය නමින් බලපත්‍රයක් පවරා ගනු ලැබීමට හිමිකමක් නොලැබිය යුතුය.<br><br>5. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **විදේශීය ධීවර යාත්‍රා මගින් ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදුකිරීම තහනම් කිරීම**<br><br>**38 වන වගන්තිය** | 1. විදේශීය ධීවර යාත්‍රා මගින් ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදුකිරීම තහනම් වේ.<br><br>2. විදේශීය ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු, කුලියට ගත් තැනැත්තා, බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තෙකු හෝ ශ්‍රී ලංකා ජල තීරයට ඇතුළු වීමේදී ධීවර ආම්පන්න පහසුවෙන් භාවිත කළ නොහැකි වන පරිදි, නියමිත කොන්දේසිවලට අනුව තදින් බැඳ අසුරා ඇති බව තහවුරු කරනු ලැබිය යුතු |

| | |
|---|---|
| | ය.<br><br>3. නීති බලාත්මක කරන යාත්‍රාවක් මඟින් විදේශීය ධීවර යාත්‍රාවක් අත්අඩංගුවට ගනු ලැබීමෙන් පසු මෙම පනත යටතේ කරන ලද යම් නඩු පැවරීමක දී යම් සිදු වීමක් සිදු වූ බව කියන ස්ථානය ගැටලුකාරී වන අවස්ථාවක, එම බලාත්මක කිරීමේ යාත්‍රාවේ ලොග් පොතෙහි හෝ එහි වෙනත් යම් නිල වාර්තාවක එවැනි සිදු වීමක් සිදු වූ ස්ථානය වශයෙන් අදාළ සටහනෙහි සහතික කළ පිටපතක සඳහන් කර ඇති ස්ථානය, ඊට පටහැනිව කිසිවක් ඔප්පු වන තෙක්, එම සිද්ධිය සිදු වූ ස්ථානය ලෙස උපකල්පනය කළ යුතු ය.<br><br>4. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන විදේශීය ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු, කුලියට ගත් තැනැත්තා, බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතු අතර යාත්‍රාව සහ එහි ඇති ධීවර ආම්පන්න, උපකරණ, ගබඩාගත භාණ්ඩ හෝ යාත්‍රා භාණ්ඩ සහ මසුන් සහ ජලජ ශාක 151 සහ 152 වගන්තිවල විධිවිධාන වලට අනුව රාජසන්තක විය යුතුය. |
| **බලපත්‍ර දීමේ බලධරයා**<br><br>**39** වන වගන්තිය | 1. මේ පනත යටතේ නියම කරන්නා වූ ශ්‍රී ලංකා ජල තීරයේ, මහ මුහුදේ සහ වෙනත් රාජ්‍යයන්හි ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට හෝ අලුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.<br><br>2. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති ධීවර යාත්‍රාවකට වෙනත් රටක ධීවර මෙහෙයුම් සිදුකිරීම සඳහා නිර්දේශ ලබා දීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.<br><br>3. බලපත්‍ර දීමේ බලය, මේ වගන්තිය යටතේ පත් කරනු ලබන බලපත්‍ර දීමේ නිලධරයෙකු වෙත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව පවරනු ලැබිය හැකි අතර මේ කාර්ය සඳහා එක් එක් පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් බලපත්‍ර දීමේ නිලධරයෙකු හෝ නිලධාරීන් වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැකිය.<br><br>4. ධීවර පරීක්ෂකවරයෙකුගේ නිලයට පහල නොවූ නිලයක් දරන කිසිදු නිලධරයෙකු බලපත්‍ර දීමේ නිලධරයෙකු වශයෙන් පත් නොකරනු ලැබිය යුතුය. |
| **ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම**<br><br>**40** වන වගන්තිය | 1.ධීවර යාත්‍රාවක හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීමට බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නියමිත ආකෘතිය භාවිතා කර නියමිත ගාස්තුව සමඟ ධීවර මෙහෙයුම් සිදු කිරීමට අපේක්ෂිත පරිපාලන දිස්ත්‍රික්කයේ බලපත්‍ර දීමේ නිලධරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.<br><br>2.යෝජිත ධීවර මෙහෙයුම සිදු කිරීමට නියමිත පරිපාලන දිස්ත්‍රික්කය සඳහා බලපත්‍ර දීමේ නිලධාරියෙකු පත් කර නොමැති නම්, එවන් ඉල්ලීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සිදු කළ යුතුය.<br><br>3.ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා ඉල්ලීමක් ලැබුණු පසු, අවස්ථාවෝචිත පරිදි බලපත්‍ර දීමේ නිලධාරියා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,බලය ලත් නිලධාරියෙකු විසින් යාත්‍රාව පරීක්ෂා කර පහත කොන්දේසි ;එනම්,<br><br>(අ)නියමිත ආකෘතියෙන් නිශ්චිත දක්වා ඇති නියමයන්ට අනුකූලව ධීවර යාත්‍රාව සහ හිමිකරු ,ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ලැබී තිබීම;<br>(ආ)මෙම පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ධීවර |

| | |
|---|---|
| | යාත්‍රාවට, හිමිකරුට ,ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් විභාග වෙමින් නොපවත්නා බව;<br>(ඇ) ධීවර යාත්‍රාවට ලියාපදිංචි අංකයක් ඇති බව සහ එය පැහැදිලි ලෙස නිසි පරිදි බාහිරව සලකුණු කර තිබීම;<br>(ඈ) නියමිත කොන්දේසිවලට අනුකූලව ධීවර ආම්පන්න නිසි ලෙස සලකුණු කර තිබීම;<br>(ඉ) නියමිත කොන්දේසිවලට අනුකූලව නාවික සහ ආරක්ෂක උපකරණ යාත්‍රාව තුළ නිසි ලෙස සවිකර ඇති බව;<br>(ඊ) බලයලත් නිලධාරීන්ට යාත්‍රාව සමඟ සන්නිවේදනය කිරීමට හැකි වන පරිදි සන්නිවේදන උපකරණ නිසි පරිදි සවි කර තිබීම යන්න සපුරා තිබේ නම් ධීවර බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.<br><br>4.(3) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, සංක්‍රමණික ධීවරයින් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලපත්‍ර දීමේ නිලධාරියා විසින් බලපත්‍ර නිකුත් කිරීම අදාළ ධීවර නිලධාරියාගේ නිර්දේශ මත ලබා දිය යුතුය, එසේ වූවද, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ බලපත්‍ර දීමේ නිලධාරියා විසින් මෙම පනතේ 72 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ධීවර කමිටු වල එකඟතාවය ද ලබාගත යුතුය.<br><br>5. (4) වන උපවගන්තියේ එකඟතාවය සඳහා වන අවශ්‍යතාවයන් පාරම්පරික සංක්‍රමණික ධීවරයන් සඳහා අදාළ නොවේ.<br><br>6.අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තිය යටතේ ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍ර දීමේ නිලධාරියා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුත්තේ ය. එවැනි යම් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් පිළිබඳ නිවේදනය ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවන් තීරණයක් යවන ලද දින සිට සති දෙකක් ඇතුළත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.<br><br>7.(3) වන උපවගන්තියට අනුකූලව ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම අනුමත කරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධාරියා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඉල්ලුම්කරුට නියමිත ආකෘතියට අනුකූලව බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය. ධීවර මෙහෙයුම් බලපත්‍රයේ පහත තොරතුරු:<br><br>අ) ධීවර මෙහෙයුම් බලපත්‍රය නිකුත් කරන යාත්‍රාවේ ලියාපදිංචි අංකය;<br>ආ) බලපත්‍රය යටතේ අවසර දී ඇති ධීවර ආම්පන්න/ පන්න ක්‍රම;<br>ඇ) ධීවර මෙහෙයුම් සිදුකරන ප්‍රදේශය;<br>ඈ) නම් කරන ලද තොටුපලවල්;<br>ඉ) මසුන් ඇල්ලීමේ කාල සීමාව (සීමාවන්) අදාළ වේ නම්;<br>ඊ) ධීවර මෙහෙයුම් සිදුකරන වේලාව (වේලාවන්) අදාළ වේ නම්;<br>උ) බලපත්‍රය යටතේ අල්ලා ගැනීමට අවසර ලබා දී ඇති ඉලක්ක ගත මත්ස්‍ය විශේෂ ; සහ,<br>ඌ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැනවිය හැකි වෙනත් කොන්දේසි අන්තර්ගත විය යුතු ය.<br><br>8.මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |

| | |
|---|---|
| **ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීමේ බලපත්‍රය අළුත් කිරීම**<br><br>**41** වන වගන්තිය | 1. ධීවර යාත්‍රාවක හිමිකරුට, ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට ධීවර යාත්‍රාවක බලපත්‍රය අළුත් කිරීම සඳහා බලපත්‍ර දීමේ නිලධාරියාට ඉල්ලුම් කළ හැකි ය. අළුත් කිරීම සඳහා වන අයදුම්පත මෙම වගන්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව, ධීවර බලපත්‍රයේ කල් ඉකුත් වීමේ දිනට දින හැටකට (60) පෙර, ඉදිරිපත් කළ යුතු ය.<br><br>2.මසුන් ඇල්ලීමේ මෙහෙයුම සඳහා බලපත්‍රයෙන් අවසර දී ඇති පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් පත් කළ බලපත්‍ර දීමේ නිලධාරියෙකු නොමැති නම්, අළුත් කිරීම සඳහා වන ඉල්ලුම් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.<br><br>3.අවස්ථාවෝචිත පරිදි, බලපත්‍ර දීමේ නිලධාරියා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (1) වැනි උපවගන්තිය යටතේ ඉල්ලීම ලැබුණු දින සිට දින දහහතරක් (14) ඇතුළත :<br><br>ආ) ධීවර යාත්‍රාව සහ හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා ධීවර බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසිදු නඩු කටයුත්තක් විභාග වෙමින් නොපවතින බව;<br>ආ) බලපත්‍රලාභියා ධීවර බලපත්‍රය අළුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා ඇති බව; සහ,<br>ඇ) බලපත්‍රය අළුත් කිරීම මගින් මේ පනත හෝ එහි කිසියම් ක්‍රියාත්මක කිරීමේ නියෝග යටතේ වන සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ගවල සඵලතාවයට හානියක් සිදු නොවනු ඇති බව පිළිබඳව තමා සෑහීමකට පත්වන්නේ නම්, නියමිත ආකෘතියට අනුකූලව අයදුම්කරුට නව ධීවර බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>4.අවස්ථාවෝචිත පරිදි,අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලපත්‍ර දීමේ නිලධාරියා විසින්, ධීවර බලපත්‍රය අලුත් නොකිරීමේ තීරණය අයිතිකරුට ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එවැනි යම් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් පිළිබඳ නිවේදනය ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවැනි තීරණයක් යවන ලද දින සිට සති දෙකක් ඇතුළත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය. |

**මහ මුහුදෙහි ධීවර මෙහෙයුම්වල යෙදීම සඳහා ධීවර බලපත්‍රයක් ඉල්ලුම් කිරීම**

**42 වන වගන්තිය**

1.ධීවර යාත්‍රාවක හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් මහ මුහුදෙහි මසුන් ඇල්ලීමේ මෙහෙයුම් සිදු කිරීම පිණිස වන ධීවර බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඊට නියමිත ආකෘති පත්‍රය භාවිතා කර නියමිත ගාස්තුව සහ දිවුරුම් ප්‍රකාශය ද සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

2.වෙනත් රාජ්‍යයක් විසින් මහ මුහුදේ මසුන් ඇල්ලීම සඳහා වලංගු ධීවර බලපත්‍රයක් අයදුම්කරු වෙත නිකුත් කර නොමැති බව දිවුරුම් ප්‍රකාශයකින් දැක්විය යුතුය.

3.(1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, බලයලත් නිලධාරියෙකු විසින් යාත්‍රාව පරීක්ෂා කර පහත සඳහන් කොන්දේසි: එනම්,

අ) පිළිගත් නියමිත ආකෘතියේ දක්වා ඇති නියමයන්ට අනුකූලව යාත්‍රාව සහ හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ලැබී ඇති බව;

ආ) ධීවර යාත්‍රාව, හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා මෙම පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් කිසිදු නඩු කටයුත්තක් විභාග වෙමින් නොපවතින බව;

ඇ)ධීවර යාත්‍රාවට ලියාපදිංචි අංකයක් ඇති බව එය පැහැදිලි ලෙස නිසි පරිදි බාහිරව සලකුණු කර තිබීම;

ඈ) හිමිකරු හඳුනා ගැනීමට ඉඩ සැලසෙන පරිදි නියමිත කොන්දේසිවලට අනුකූලව ධීවර ආම්පන්න නිසි ලෙස සලකුණු කර තිබීම;

ඉ) නාවික, සන්නිවේදන සහ ආරක්ෂක උපකරණ නියමිත කොන්දේසිවලට අනුකූලව යාත්‍රාව තුළ නිසි ලෙස සවිකර ඇති බව;

ඊ)ධීවර යාත්‍රාව මෙම පනත යටතේ ක්‍රියාත්මක ධීවර යාත්‍රා ඉදි කිරීම සම්බන්ධ නියෝගවලට අනුකූලවීම;

උ) ධීවර යාත්‍රාව යාත්‍රා අධීක්ෂණ පද්ධතියකින් සමන්විත වීම; සහ

ඌ)අවශ්‍ය විය හැකි ඒ ඒ අවස්ථාවලදී, ශ්‍රී ලංකාවට අදාළ වන ජාතික හෝ කලාපීය රීතින් මඟින් හෝ ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු ලෙස ගිවිසුම්ගත ජාත්‍යන්තර ධීවර කළමනාකරණ සංවිධානයේ බැඳීම් මගින් නියම කරන යම් වෙනත් නිශ්චිත කොන්දේසියක් සපුරා ඇත්නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබිය යුතුය.

4.අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තිය යටතේ27ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍ර දීමේ නිලධාරියා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුත්තේ ය.

5.එවැනි යම් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් පිළිබඳ නිවේදනය ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවැනි තීරණයක් යවන ලද දින සිට සති දෙකක් ඇතුළත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

6.(3) වන උපවගන්තියට අනුකූලව ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම අනුමත කරන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,

| | |
|---|---|
| | ඉල්ලුම්කරුට නියමිත ආකෘතියට අනුකූලව බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය. ධීවර මෙහෙයුම් බලපත්‍රයේ පහත කොන්දේසි:<br><br>අ) ධීවර මෙහෙයුම් බලපත්‍රය නිකුත් කරන යාත්‍රාවේ ලියාපදිංචි අංකය;<br>ආ)ධීවර මෙහෙයුම් සිදුකරන කාල සීමාව;<br>ඇ) බලපත්‍රය යටතේ අවසර දී ඇති ධීවර ආම්පන්න/ පන්න ක්‍රම;<br>ඈ) ධීවර මෙහෙයුම් සිදුකරන ප්‍රදේශය;<br>ඉ) අවසර ලත් තොටුපලවල්;<br>ඊ) බලපත්‍රය යටතේ අල්ලා ගැනීමට අවසර දී ඇති මත්ස්‍ය විශේෂ;<br>උ)ඕනෑම ගෝලීය ස්ථාන පද්ධති (GPS) උපාංගයක් සහ ගැඹුරු මාපකය (Echo sounder) යාත්‍රාවේ රැගෙන යන්නේද යන වග; සහ,<br>ඌ)අධ්‍යක්ෂ ජනරාල්වයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වෙනත් කොන්දේසියක් අන්තර්ගත විය යුතුයි.<br><br>7. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **වෙනත් රටකට අයත් ජල තීරයන්හි ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම**<br><br>**43** වන වගන්තිය | 1.වෙනත් රටකට අයත් ජල තීරයන්හි ධීවර මෙහෙයුම් සිදු කිරීමට අදහස් කරන ධීවර යාත්‍රාවක හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින්, එම බලපත්‍රය සඳහා ප්‍රථමයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නියමිත ආකෘතිය භාවිතා කර නියමිත ගාස්තුව සමඟ ඉල්ලුම් කරනු ලැබිය යුතු ය. බලයලත් නිලධාරියෙකු විසින් යාත්‍රාව පරීක්ෂා කරනු ලදුව (42) වන වගන්තියේ කොන්දේසි සපුරා ඇත්නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ මත ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුත්තේ ය.<br><br>2.(1) වන උපවගන්තියේ සඳහන් ධීවර මෙහෙයුම් බලපත්‍රය ලැබීමෙන් පසු, වෙනත් රටක ජල තීරයේ ධීවර මෙහෙයුම් සිදු කිරීමට අදහස් කරන ධීවර යාත්‍රාවේ හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින්, වෙරළබඩ රටේ ක්‍රියා පටිපාටි, සහ (64) වන වගන්තියේ දක්වා ඇති කිසියම් ධීවර ගිවිසුමක හෝ වෙනත් විධිවිධානයක නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා එම වෙරළබඩ රටකට ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.<br><br>3.(1) වන උපවගන්තිය යටතේ ධීවර මෙහෙයුම් බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුත්තේ ය. එවැනි යම් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් පිළිබඳ නිවේදනය ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවැනි තීරණයක් යවන ලද දින සිට දින දාහතර (14)ක් ඇතුළත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.<br><br>4.මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **මහ මුහුදේ හෝ වෙනත් රටකට අයත්** | 1. මහ මුහුදේ හෝ වෙනත් රටකට අයත් ජල තීරයක ධීවර මෙහෙයුම් අඛණ්ඩව සිදුකිරීමට අදහස් කරන ධීවර යාත්‍රාවක හිමිකරුට,ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට ධීවර මෙහෙයුම් බලපත්‍රය අළුත් කිරීම සඳහා |

| | |
|---|---|
| **ජල තීරයක ධීවර මෙහෙයුම් සිදුකිරීම සඳහා වන බලපත්‍රයක් අළුත් කිරීම**<br><br>**44 වන වගන්තිය** | අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ හැකිය. අළුත් කිරීම සඳහා වන ඉල්ලීම මෙම වගන්තියේ දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව, ධීවර මෙහෙයුම් බලපත්‍රය කල් ඉකුත් වීමේ දිනට දින හතලිස් පහකට (45) පෙර, ආරම්භ කළ යුතු ය.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත කරුණු සම්බන්ධව : එනම්,<br>අ)ධීවර බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසිවලට පටහැනිව කටයුතු කර තිබීම මත ධීවර යාත්‍රාවට, හිමිකරුට, ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට එරෙහිව නඩු කටයුත්තක් විභාග වෙමින් නොපවත්නා බව;<br>ආ)බලපත්‍රලාභියා ධීවර මෙහෙයුම් බලපත්‍රය අළුත් කිරීම සඳහා නියමිත ගාස්තුව ගෙවා ඇති බව ;<br>ඇ) බලපත්‍රය අළුත් කිරීම මඟින් සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ගවල සඵලතාවය යටපත් නොවන බව<br>පිළිබඳව තමා සෑහීමකට පත් වන්නේනම් (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම ලැබී දින දාහතර (14) ක් ඇතුළත ධීවර මෙහෙයුම් බලපත්‍රය අළුත් කළ යුතුය.<br><br>3.ධීවර මෙහෙයුම් බලපත්‍රය අළුත් කිරීමෙන් පසුව, නියමිත ආකෘතියට අනුකූලව අයදුම්කරු වෙත නව ධීවර මෙහෙයුම් බලපත්‍රයක් නිකුත් කළ යුතුය.<br><br>4.(1) වන උපවගන්තිය යටතේ ධීවර මෙහෙයුම් බලපත්‍රය අළුත් කිරීම සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන්නේ නම්, එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුත්තේ ය. එවැනි යම් ප්‍රතික්ෂේප කිරීමේ තීරණයක් පිළිබඳ නිවේදනය ලියාපදිංචි තැපෑලෙන් ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති ලිපිනයට හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවැනි තීරණයක් යවන ලද දින සිට දින දාහතර (14)ක් ඇතුළත දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය. |
| **ධීවර මෙහෙයුම් බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම**<br><br>**45 වන වගන්තිය** | 1.අවස්ථාවෝචිත පරිදි, (40) වන වගන්තියේ සඳහන් ධීවර මෙහෙයුම් බලපත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධාරියා විසින්, සහ (42) හා (43) වන වගන්තිවල සඳහන් ධීවර මෙහෙයුම් බලපත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්ද :<br>අ) 18 වන වගන්තිය යටතේ ධීවර යාත්‍රාව ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම මත,<br>ආ) මෙහෙයුම් බලපත්‍රය අදාළ වන ධීවර යාත්‍රාව ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක් වීම අවසන් වීම,<br>ඇ) ධීවර යාත්‍රාව, හිමිකරු, ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා වෙනත් රටකට අයත් ජල තීරයේ හෝ මහ මුහුදේ අනවසර මසුන් ඇල්ලීම සිදු කර ඇති බවට අදාළ සාක්ෂි මඟින් තහවුරු වීම, හෝ;<br>ඈ) ධීවර මෙහෙයුම් බලපත්‍රය අවලංගු කිරීමට බලපාන්නා වූ වරදක් සඳහා ධීවර යාත්‍රවට, හිමිකරුට, ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තාට දඬුවම් පමුණුවා තිබීම,<br>යන අවස්ථාවන්හි දී අවලංගු කරනු ලැබිය යුතු ය.<br><br>2. අවස්ථාවෝචිත පරිදි, (40) වන වගන්තියේ සඳහන් ධීවර මෙහෙයුම් බලපත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධාරියා විසින්, සහ (42) හා (43) වන වගන්තිවල සඳහන් ධීවර මෙහෙයුම් බලපත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්ද ;<br>අ) ධීවර යාත්‍රාව, හිමිකරු ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් ධීවර මෙහෙයුම් බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසිවලට පටහැනිව කටයුතු කර ඇති බව,<br>ආ) ඉල්ලුම්කරු විසින් සපයන ලද සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි තොරතුරු මත පදනම්ව බලපත්‍රය නිකුත් කර තිබෙන බව, හෝ;<br>ඇ) ධීවර මෙහෙයුම් බලපත්‍රය අත්හිටුවීමට බලපාන්නා වූ වරදක් සඳහා |

| | |
|---|---|
| | ධීවර යාත්‍රාවට, හිමිකරුට, ක්‍රියාකරුට හෝ කුලියට ගත් තැනැත්තා දඬුවම් පමුණුවා තිබීම පිළිබඳව<br>තමා සෑහීමට පත්වන අවස්ථාවකදී, අත්හිටුවනු ලැබිය යුතු ය.<br><br>3.ඉහත (1) හා (2) වන උපවගන්ති යටතේ ධීවර මෙහෙයුම් බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම ලියාපදිංචි තැපෑලෙන් හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් හිමිකරුට හෝ ක්‍රියාකරුට සන්නිවේදනය කළ යුතුය.<br><br>4.එම තීරණය සඳහා හේතු අයදුම්පතෙහි සපයා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ වෙනත් විද්‍යුත් මාධ්‍යයකින් එවැනි තීරණයක් යවන ලද දින සිට දින දාහතරක් (14) ඇතුළත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබ ඇතැයි සැළකිය යුතුය. |
| **පළාත් සමග තොරතුරු සම්ප්‍රේෂණය කර ගැනීම**<br><br>**46** වන වගන්තිය | යම් පළාතක පදිංචි තැනැත්තන්ට අයත් ධීවර යාත්‍රා සම්බන්ධයෙන් මෙම කොටසේ විධිවිධාන අනුව ප්‍රදානය කරන ලද, අලුත් කරන ලද, අවලංගු කරන ලද, අත්හිටුවන ලද හෝ පවරන ලද සියලු බලපත්‍ර පිළිබඳ විස්තර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අදාළ පළාතේ ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සපයනු ලැබිය යුතු ය. |
| | **2 වන පරිච්ඡේදය – ධීවර යාත්‍රා බලපත්‍රලාභීන් සඳහා වන බැඳියාවන්** |
| **පනතට අනුකූලව කටයුතු කිරීම**<br><br>**47** වන වගන්තිය | 1. කිසිදු තැනැත්තෙකු විසින් මේ පනතට අනුව සහ එවැනි අදාළ විය හැකි ප්‍රවේශ හෝ වෙනත් ගිවිසුමක අනුව නියම කරනු ලබන ආකාරයකට මිස, මේ පනතේ නිශ්චිතව දක්වා ඇති කිසිදු ක්‍රියාකාරකමක නිරතවීම, හෝ ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක් හෝ වෙනත් යාත්‍රාවක් භාවිතා කිරීම නොකළ යුතු ය.<br><br>2. ධීවර යාත්‍රාවක හිමිකරුවෙකු, යාත්‍රාධිපතියෙකු, ක්‍රියාකරුවෙකු, කුලියට ගත් තැනැත්තෙකු හෝ ගැනියෙකු වශයෙන් ඇතුළුව ශ්‍රී ලාංකික ජාතිකයින් විසින් මේ පනතේ විධිවිධානවලට පටහැනිව කිසිම ධීවර කටයුත්තකට සහාය දැක්වීම හෝ ධීවර කටයුත්තක නිරත නොවිය යුත්තේ ය<br><br>3. නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් (IUU) ධීවර කටයුතුවලට සහාය දක්වන සහ / හෝ නියැලෙන ජාතිකයන් හඳුනා ගැනීමට සහ එම ජාතිකයන්ට එරෙහිව සුදුසු පියවර ගනු ලැබීම පිණිස ධජ රාජ්‍යයන්හි මූලික වගකීමට අගතියක් නොවන ලෙස, (2) වන උපවගන්තියෙහි සඳහන් වන ශ්‍රී ලාංකික පුරවැසියන් සම්බන්ධ කර ගන්නා අනෙකුත් රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හැකි සෑම උත්සාහයක්ම ගනු ලැබිය යුතු ය. |
| **ධීවර බලපත්‍ර මත වූ බැඳියාවන්**<br><br>**48** වන වගන්තිය | 1. ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක හිමිකරු, යාත්‍රාධිපතියෙකු,ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා මේ පනත මගින් නියම කරනු ලැබ ඇති පරිදි වලංගු සහ අදාළ කර ගත හැකි ධීවර බලපත්‍රයක බලය යටතේ හැර, ශ්‍රී ලංකා ජල තීරයෙහි හෝ දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශවල තම ධීවර යාත්‍රාව ධීවර කටයුතුවල නොයෙදෙන බවට මෙන්ම මෙම කොටසෙහි නිශ්චිතව දක්වා ඇති පටිපාටින් යටතේ ප්‍රදානය කර ඇති එවැනි ධීවර බලපත්‍රයක නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික විය යුතු ය.<br><br>2. (1) උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **බලපත්‍රය යාත්‍රාවෙහි** | 1. මේ පනත යටතේ නිකුත් කරන ලද ධීවර බලපත්‍රයක මුල් පිටපත හෝ |

| | |
|---|---|
| රැගෙන යා යුතු බව<br><br>**49** වන වගන්තිය | සහතිකකළ පිටපතක් සියලු අවස්ථාවලදී යාත්‍රාවේ රැගෙන යන බව සහ බලයලත් නිළධාරියෙකු විසින් එම බලපත්‍රය පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවකදී ඉදිරිපත් කරන බවට ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති සහතික විය යුතුය.<br><br>2. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය |
| පිටත් වීම සහ පැමිණීම<br><br>**50** වන වගන්තිය | 1. ඇතුළත එන්ජිම සහිත ධීවර යාත්‍රාවක් පිටත්වීම හෝ පැමිණීම නියමිත ධීවර වරායකින් හෝ නැංගුරම් පොළකින් පමණක් සිදු කළ යුතු ය.<br><br>2. ඇතුළත එන්ජිම සහිත ධීවර යාත්‍රාවක හිමිකරුවෙකු, යාත්‍රාධිපතියෙකු, ක්‍රියාකරුවෙකු හෝ කුලියට ගත් තැනැත්තෙකු විසින් පිටත්වීමට පෙර හෝ නියමිත ධීවර වරායකට හෝ නැංගුරම් පොළකට පැමිණීමට පෙර, බලයලත් නිලධාරියෙකු වෙතින් පිටත්වීම හෝ පැමිණීම සඳහා අනුමැතිය ලබා ගත යුතු ය.<br><br>3. ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති සහ ගැනියන් විසින් පිටත්ව යාමට පෙර සහ පැමිණීමේදී බලයලත් නිලධාරියාට තම අනන්‍යතාවය සනාථ කරනු ලැබිය යුතු ය.<br><br>4. ධීවර යාත්‍රාවක් පිටත්වීම සහ පැමිණීම අතර කාලසීමාව තුළ වාර්තා වූ කිසියම් සිදුවීමක් සම්බන්ධයෙන්, එම යාත්‍රාවේ යාත්‍රාධිපති සහ ගැනියන් වගකිව යුතු ය.<br><br>5. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හිමිකරුවෙකු, යාත්‍රාධිපතියෙකු, ක්‍රියාකරුවෙකු, කුලියට ගත් තැනැත්තෙකු හෝ ගැනියෙකු විසින් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතු ය. |
| ධීවර දත්ත සටහන<br><br>**51** වන වගන්තිය | 1. ශ්‍රී ලංකා ජල තීරයෙහි හෝ මහ මුහුදෙහි ක්‍රියාත්මක වන යම් යාන්ත්‍රික ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ලොග් සටහන්පොතක් සිය යාත්‍රාවෙහි රැගෙන යා යුතු අතර ධීවර මෙහෙයුම්වල යෙදෙන එක් එක් ගමන් වාරයක් සඳහා, ධීවර බලපත්‍රයේ දක්වා ඇති පරිදි, එම ලොග් සටහන් පොතෙහි ධීවර දත්ත පිළිබඳ වාර්තාවක්, මසුන් අල්ලා ගැනීම් සහ වෙනත් අතුරු අල්ලා ගැනීම් සම්බන්ධ විස්තර ද ඇතුළුව පවත්වාගෙන යාමට හෝ පවත්වාගෙන යාමට කටයුතු සැලැස්වීම කළ යුතු ය.<br><br>2. යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු, යම් බලයලත් නිලධාරියෙකු විසින් එම ලොග් සටහන් පොත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.<br><br>3. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යාත්‍රාධිපතියෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| මසුන් ගොඩබෑම සහ වාර්තා කිරීම<br><br>**52** වන වගන්තිය | 1. ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු විසින් සිය ධීවර යාත්‍රාව මගින් අල්ලා ගන්නා ලද මසුන් ගොඩබෑම ධීවර බලපත්‍රයේ නම් කර ඇති වරායකදී, නැංගුරම් පොළකදී හෝ තොටුපලක දී සහ (112) වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව පමණක් සිදුකරනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | 2. වරායකට හෝ නැංගුරම් පොළකට ළඟා වූ විට යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු විසින් ඉල්ලා සිටින පරිදි බලයලත් නිලධාරියෙකුට එවැනි තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.<br><br>3. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යාත්‍රාධිපතියෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **ධීවර ආම්පන්න සලකුණු කිරීම**<br><br>**53 වන වගන්තිය** | 1. බහුදින ධීවර යාත්‍රාවක හිමිකරු හෝ ක්‍රියාකරු විසින් නියමිත නියෝගවලට අනුකූලව යාත්‍රාවේ ඇති සියලුම ධීවර ආම්පන්න සලකුණු කරනු ලැබිය යුතු ය.<br><br>2. ධීවර ආම්පන්න සලකුණු කිරීමේ නියෝගවල විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හිමිකරුවෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>3. ධීවර ආම්පන්න සලකුණු කිරීමට අදාලව කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකිය. |
| **යාත්‍රාවේ ගමන් ගන්නා නිරීක්ෂකයන්**<br><br>**54 වන වගන්තිය** | 1. නිරීක්ෂකයෙකු යොදවා ඇති යම් යාත්‍රාවක හිමිකරු , යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු සහ සෑම ගැනියෙකු විසින්ම, (114) වන වගන්තියේ අවශ්‍යතාවලට අමතරව, එවැනි නිරීක්ෂකයෙකුට හෝ (117) වන වගන්තියට අනුව පත් කරන ලද වෙනත් තැනැත්තෙකුට:<br><br>අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය විය හැකි වේලාවක සහ ස්ථානයකදී එවැනි යාත්‍රාවකට ගොඩ වීම;<br><br>ආ) යාත්‍රාවේ සන්නිවේදන උපකරණ මගින් පණිවිඩ ලබා ගැනීම සහ සම්ප්‍රේෂණය කිරීම සහ වෙරළ සහ අනෙකුත් යාත්‍රා සමඟ සන්නිවේදනය කිරීම;<br><br>ඇ) සිය රාජකාරි සහ මේ පනතේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ධීවර කර්මාන්තයට අදාළ තොරතුරු රැස් කිරීම;<br><br>ඈ) යාත්‍රාවේ ආරක්ෂිත ක්‍රියාකාරිත්වයට අනුකූල වන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන පරිදි හෝ අදාළ ප්‍රවේශ ගිවිසුමකට අනුකූලව එවැනි වේලාවක සහ ස්ථානයක දී ගොඩබෑසීම; සහ<br>ඉ) යාත්‍රාව ශ්‍රී ලංකා ජල තීරයේ යම් ස්ථානයක ඇති විට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය හෝ නියමිත ආකාරයට නිරීක්ෂකයින් හෝ වරාය නියැදිකරුවන් සම්බන්ධයෙන් එවැනි වෙනත් අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කිරීම<br>සඳහා ඉඩ දීම සහ සහාය වීම සිදු කරනු ලැබිය යුතු ය.<br><br>2. නිරීක්ෂකයෙකු යොදවනු ලැබ ඇති යම් ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු විසින් ඔහු සඳහා නිලධාරි මට්ටමේ හෝ ඒ හා සමාන අනුමත ප්‍රමිතියකට කෑමබීම, නවාතැන් සහ කිසියම් ඉවුම් පිහුම් සහ වැසිකිළි ප්‍රවේශ පහසුකම් සහ සුවපහසුකම් සෑම විටම නොමිලේ ලබා දෙනු ලැබිය යුතු ය.<br><br>3. නිරීක්ෂකයා මේ පනත මඟින් හෝ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවක් මඟින් නියම කර ඇති රාජකාරී සිදුකළ යුතු ය. |

| | |
|---|---|
| | 4. මේ පනතට අනුකූලව නිරීක්ෂකයෙකු යොදවනු ලැබ ඇති (1) සහ (2) වන උපවගන්තිවලට අනුකූලව කටයුතු නොකරන කිසියම් යාත්‍රාවක හිමිකරු, යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු සහ ගැනියෙකු විසින් වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතු ය.<br><br>5. (3) වන උපවගන්තියට අනුකූලව කටයුතු නොකරන මේ පනතට අනුකූලව කිසියම් යාත්‍රාවක ගමන් ගන්නා යම් නිරීක්ෂකයෙකු වරදක් සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතු ය. |
| **නිරීක්ෂකයින්ගේ පිරිවැය**<br><br>**55 වන වගන්තිය** | 1. මේ පනතට අනුව නිරීක්ෂක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ පිරිවැය, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන මට්ටමින් සහ ආකාරයෙන් මේ පනත යටතේ බලපත්‍රලාභී ඕනෑම යාත්‍රාවක් සම්බන්ධයෙන් යාත්‍රාවල හිමිකරුගෙන් හෝ ක්‍රියාකරුගෙන් නියමිත නියෝග මාලාවක දැක්වෙන ආකාරයට අයකර ගත යුතු ය.<br><br>2. (2) වන උපවගන්තියේ සඳහන් පිරිවැය ගෙවීම අවශ්‍ය වේලාවට, හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය වන පරිදි දින තිහක් (30) ඇතුළත නොගෙවන අවස්ථාකදී, අදාළ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය. |
| | **3 වන පරිච්ඡේදය – යාත්‍රාවක් නොමැතිව ධීවර කටයුතු සිදුකරන ධීවරයන් සඳහා ධීවර බලපත්‍ර** |
| **යාත්‍රාවක් නොමැතිව ධීවර කටයුතු සිදුකරන ධීවරයන් සඳහා ධීවර බලපත්‍ර**<br><br>**56 වන වගන්තිය** | 1. මේ පනතේ විධිවිධාන සහ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගයකට අනුකූලව ප්‍රදානය කර ඇති ධීවර බලපත්‍රයක නියමයන් සහ කොන්දේසි යටතේ හැර, කිසිම තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ නියමිත ධීවර ආම්පන්න භාවිතයෙන් ධීවර මෙහෙයුම්වල නිරත නොවිය යුතු ය.<br><br>2. යැපුම් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් (1) වන උපවගන්තියෙන් බැහැර කරනු ලැබේ.<br><br>3. (1) උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **විදේශීය යාත්‍රාවක ධීවර මෙහෙයුම්වල නිරත වීම සඳහා ධීවරයන්ට ධීවර බලපත්‍ර**<br><br>**57 වන වගන්තිය** | 1. මේ පනතේ (31) වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති සහ විදේශීය ධීවර යාත්‍රාවක සේවය කිරීමට අදහස් කරන ශ්‍රී ලංකාවේ යම් පුරවැසියෙකු, නියමිත ආකෘතියට අනුව බලපත්‍රයක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කළ යුතු ය.<br><br>2. මේ පනතේ හෝ එහි යම් නියෝගමාලාවක විධිවිධානවලට පටහැනිව ධීවර කටයුතුවල නියැලීමට එරෙහිව අදාල තැනැත්තා වරදකරු වී ඇති අවස්ථාවක හෝ ඔහුට එරෙහිව නඩු කටයුත්තක් විභාග වෙමින් පවත්නා විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය. |

3. (1) උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව විදේශීය ධීවර යාත්‍රාවක සේවයේ නිරත යම් ශ්‍රී ලාංකික පුරවැසියෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.

## 4 වන පරිච්ඡේදය – යාත්‍රාධිපතියන් සඳහා බලපත්‍ර

**යාත්‍රාධිපතියන් සඳහා බලපත්‍ර**

**58 වන වගන්තිය**

1. ධීවර මෙහෙයුම්:

   අ) ශ්‍රී ලංකා ජල තීරයෙහි; හෝ,

   ආ) මහ මුහුදෙහි; හෝ,

   ඇ) වෙනත් රාජ්‍යයක ජල තීරයෙහි

   සිදු කිරීම සඳහා ධීවර යාත්‍රාවක යාත්‍රාධිපතියෙකු ලෙස සේවය කිරීමට අදහස් කරන ශ්‍රී ලංකාවේ යම් පුරවැසියෙකු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද පිළිගත් ආයතනයකින් නිකුත් කළ ප්‍රවීණතා සහතිකයක් ලබා ගත යුතු අතර, එම සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යාත්‍රාධිපති වෙත අදාළ බලපත්‍රය නිකුත් කළ යුතු ය.

2. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් :

   අ) (1) වන උපවගන්තියේ සඳහන් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට පටහැනිව කටයුතු කර තිබීමේ;

   ආ) සිය විධානය යටතේ ධීවර කටයුතු සඳහා නිකුත් කරන ලද ධීවර බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති කොන්දේසිවලට පටහැනිව කටයුතු කර තිබීමේ; හෝ,

   ඇ) මේ පනතේ යම් වරදක් සිදුකර ඇති හෝ ඕනෑම විධිවිධානයක් උල්ලංඝනය කර තිබීම හේතුවෙන් වරදකට වරදකරු වී ඇති හෝ එවැනි නඩු කටයුත්තක් විභාග වෙමින් පවත්නා යම් තැනැත්තෙකුගේ බලපත්‍රයක් (1) වන උපවගන්තිය යටතේ අත්හිටුවීම,අවලංගු කිරීම හෝ බලපත්‍රයක් ප්‍රදානය නොකළ යුතු ය.

3. මේ වගන්තිය අනුව නිකුත් කරන ලද ප්‍රවීණතා සහතිකය සහ අදාළ බලපත්‍රය නොමැතිව (1) උපවගන්තියේ සඳහන් වන පරිදි ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති ලෙස සේවය කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.



## 5 වන පරිච්ඡේදය - විනෝදය සඳහා මසුන් ඇල්ලීම

**විනෝදය සඳහා මසුන් ඇල්ලීම**

**59 වන වගන්තිය**

1. විනෝදය සඳහා මසුන් ඇල්ලීමෙහි නියැළී සිටින යම් තැනැත්තෙකු, නියමිත නියෝග මාලාවන්ට අනුකූලව සහ නියමිත ගාස්තුව ගෙවීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ධීවර බලපත්‍රයක නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එවැනි කටයුත්තක නිරත විය යුතු ය.

2. විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ ක්‍රියාකාරකම්, මේ පනතේ පරමාර්ථ සහ කාර්යයන් සහ මේ පනත ප්‍රකාරව පවත්නා යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගමාලාවක් සමග අනුකූල විය යුතු ය.

3. විනෝදය සඳහා ධීවර කටයුතුවලට අදාළ බලපත්‍රලාභීන්, තමන් විසින් එසේ අල්ලා ගනු ලබන මසුන් හෝ ජලජ සම්පත්වලින් කොටසක් හෝ

| | |
|---|---|
| | ඒවා මුළුමනින්ම හෝ විකිණීමට හෝ විකිණීම සඳහා සැලැස්වීම නොකළ යුතු ය.<br><br>4. විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ කාර්යයෙහි ලා කළමනාකරණ සැලසුම් කිසිවක් යටතේ යම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සඳහා අවසර ලබා දෙන අවස්ථාවක දී, එබඳු සැලසුම් යටතේ මසුන් ඇල්ලීම සඳහා වන කොන්දේසි පැනවිය යුතු ය.<br><br>5. (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරනු ලබන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට III වන උපලේඛනයේ දණ්ඩනයකට යටත් විය යුතු ය.<br><br>6. අමාත්‍යවරයාට,ජාතික ජලජ සම්පත් සහ සංවර්ධන නියෝජිතායතනයේ ('නාරා') හෝ වෙනත් පිළිගත් පර්යේෂණ ආයතනයක නිර්දේශය මත පදනම්ව (1) වන උප වගන්තියෙහි සඳහන් බලපත්‍ර විෂයයෙහි කොන්දේසි, ක්‍රියා පටිපාටි සහ අයදුම් පත්‍රය නිශ්චය කිරීම උදෙසා නියෝග සෑදිය හැකි ය. |
| | **6 වන පරිච්ඡේදය - බලපත්‍ර ලේඛනය** |
| **බලපත්‍ර ලේඛනය**<br><br>**60 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ;<br>අ) 40 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජල තීරයේ;<br>ආ) 42 වන වගන්ති යටතේ මහ මුහුදේ;සහ,<br>ඇ) 43 වන වගන්තිය යටතේ වෙනත් රාජ්‍යයක ජල තීරයේ,<br>ධීවර කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවන්හි ධීවර බලපත්‍ර පිළිබඳ විද්‍යුත් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයාට;<br>අ) 32 වන වගන්තිය යටතේ ධීවර ආම්පන්න,නාවික උපකරණ සහ ධීවර ආශ්‍රිත අමතර උපාංග නිෂ්පාදනය සහ ආනයනය ;<br>ආ) (56) සහ (57) වන වගන්තිවල සඳහන් වන ධීවරයින්;<br>ඇ) (58) වන වගන්තිය යටතේ යාත්‍රාධිපතියන් ;<br>ඇ) (59) වන වගන්තියේ සලස්වා ඇති පරිදි විනෝදය සඳහා මසුන් ඇල්ලීම;<br>ඉ) (90) සහ (92) වන වගන්ති යටතේ විද්‍යාත්මක පර්යේෂණ සහ දත්ත රැස් කිරීම සඳහා ධීවර මෙහෙයුම් සිදු කිරීම;<br>ඊ) (91) වන වගන්තිය යටතේ විදේශීය පර්යේෂණ සංවිධානයක් හෝ වෙනත් රාජ්‍යයක් විසින් විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම;<br>උ) (100) වන වගන්තිය යටතේ මත්ස්‍ය පිරිසැකසීම,මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන අපනයනය, ආනයනය හෝ ප්‍රතිඅපනයනය කිරීම;<br>ඌ) (111) වන වගන්තිය යටතේ මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන මුහුදේ දී ප්‍රති නැව්ගත කිරීම;<br>එ) (112) වන වගන්තිය යටතේ මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන ගොඩබෑම; සහ,<br>ඒ) නියම කළ හැකි වෙනත් යම් ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාකාරකම් සඳහා වන බලපත්‍ර ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය හැකි ය.<br><br>3. මේ වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන යම් ලේඛනයක සහතික කළ පිටපතක් හෝ උධෘතයක්, එවැනි ලේඛනයක අන්තර්ගතයන් සහිත බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු අතර එය සියලු කාර්ය සඳහා මෙන්ම මේ පනත යටතේ පවරනු ලබන සියලුම සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලබන බලයලත් නිලධරයකුගේ අත්සන හෝ පත්කිරීම ඔප්පු කිරීමෙන් |

| | |
|---|---|
| | තොරව පිළිගත යුතු ය. |
| | **7 වන පරිච්ඡේදය-අභියාචනා** |
| **අභියාචනා**<br><br>**61 වන වගන්තිය** | 1. ධීවර බලපත්‍රයක් සඳහා වන ඉල්ලීමක්, (40), (42) හෝ (43) වන වගන්ති යටතේ ප්‍රතික්ෂේප කරනු ලබන,(41) හෝ (44) යන වගන්ති යටතේ අලුත් කරනු නොලබන , (45) වන වගන්තිය යටතේ අත්හිටුවනු හෝ අවලංගු කරනු ලබන අවස්ථාවක දී, එබඳු තීරණයකින් අතෘප්තියට පත් ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට, තමා වෙත එම තීරණය දැනුම් දෙන ලද දින සිට දින තිහක් (30) ඇතුළත, නියම කරනු ලැබිය හැකි එවැනි ක්‍රියා පටිපාටි යටතේ, ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.<br><br>2. (56),(57),(58) සහ (59) දක්වා වන වගන්ති යටතේ බලපත්‍රයක් සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවකදී, එබඳු තීරණයකින් අතෘප්තියට පත් ඉල්ලුම්කරුට හෝ බලපත්‍රලාභියාට, තමා වෙත එම තීරණය දැනුම් දෙන ලද දින සිට දින තිහක් (30) ඇතුළත, නියම කරනු ලැබිය හැකි එවැනි ක්‍රියා පටිපාටි යටතේ, ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.<br><br>3. ලේකම්වරයා විසින්, (1) සහ (2) වන උප වගන්ති යටතේ අභියාචනය සැලකිල්ලට භාජනය කර, අභියාචනාකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනය පිළිබඳ දැනුම්දීම ලැබීමෙන් දින තිහක් (30) ඇතුළත, අවසානාත්මක වන ඒ සම්බන්ධ සිය තීරණය,ඒ සඳහා වන හේතු ද සහිතව, එකී අභියාචනාකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.<br><br>4. ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තෙකුට, එකී තීරණය ලැබීමෙන් දින තිහක් (30) ඇතුළත, නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත අභියාචනාධිකරණයට අභියාචනා කළ හැකිය. |
| | **IV වන කොටස - දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශවල ධීවර මෙහෙයුම්** |
| **නියාමනය නොකළ මහ මුහුදේ මත්ස්‍ය විශේෂ**<br><br>**62 වන වගන්තිය** | 1. කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක්(RFMO) විසින් නියාමනය කරනු නොලබන මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් වන ධීවර මෙහෙයුම් මහ මුහුදෙහි සිදු කිරීම සඳහා, එවැනි ධීවර මෙහෙයුම් මේ පනතේ (92) වන වගන්තියට අනුව ගවේෂණාත්මක ධීවර කටයුතු සඳහා දත්ත රැස්කිරීමේ විද්‍යාත්මක වැඩසටහනක කොටසක් වන අවස්ථාවක දී පමණක් ධීවර යාත්‍රාවලට අවසර ලබා දිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියෙහි සඳහන් පරිදි ගවේෂණාත්මක ධීවර කටයුතු සඳහා ධීවර කටයුතු සැලසුම් කරන හිමිකරු හෝ ක්‍රියාකරු විසින් 42 වන වගන්තිය යටතේ ධීවර බලපත්‍රයක් සඳහා වන අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අදාළ අයදුම්පත ලැබීමෙන් පසු, ගවේෂණාත්මක ධීවර කටයුතු සඳහා වන දත්ත රැස්කිරීමේ වැඩසටහනට එම ධීවර යාත්‍රාව ඇතුළත් කිරීම සඳහා අදාළ ධීවර යාත්‍රාවේ තොරතුරු සහ සැලසුම් කළ ධීවර කටයුතු පිළිබඳ තොරතුරු ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') වෙත සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | 4. (2) වන උප වගන්තියෙහි සඳහන් පරිදි ධීවර බලපත්‍රයක් නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කළහොත්, එම ධීවර යාත්‍රාවේ මසුන් ඇල්ලීමේ මෙහෙයුම්, නියාමනය නොකළ මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් මහ මුහුදෙහි සිදු කෙරෙන ගවේෂණාත්මක ධීවර කටයුතු සඳහා දත්ත රැස්කිරීමේ විද්‍යාත්මක වැඩසටහනක කොටසක් බව තමා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.<br><br>5. ගවේෂණාත්මක ධීවර කටයුතු යටතේ රැස් කරන ලද දත්ත පිළිබඳ විශ්ලේෂණයක් 67 වන වගන්තියෙහි සඳහන් ධීවර සම්පත්වල තත්ත්වය පිළිබඳව සකසනු ලබන වාර්ෂික වාර්තාවෙහි, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') විසින් ඇතුළත් කරනු ලැබිය යුතු ය.<br><br>6. නියාමනය නොකළ මත්ස්‍ය විශේෂ ඇල්ලීමෙහි නියැලී සිටින යම් තැනැත්තෙකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ධීවර බලපත්‍රයක නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එවැනි කටයුත්තක නිරත විය යුතු ය.<br><br>7. (6) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට III වන උපලේඛනයේ දණ්ඩනයට යටත් විය යුතු ය. |
| **කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන විසින් නියාමනය කරනු ලබන මත්ස්‍ය විශේෂ(RFMOs)**<br><br>**63 වන වගන්තිය** | 1. ධීවර යාත්‍රා මගින්, කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක්(RFMO) විසින් නියාමනය කරනු ලබන මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් වන ධීවර මෙහෙයුම්, ශ්‍රී ලංකාව එම සංවිධානයේ පාර්ශවයක් වන අවස්ථාවකදී සහ මේ පනතේ (42) වන වගන්තියට අනුව නිකුත් කරන ලද ධීවර බලපත්‍රයක අධිකාරි බලය යටතේ පමණක් සිදු කරනු ලැබිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දණ්ඩනයට යටත්විය යුතු ය.<br><br>3. ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වන කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන (RFMO) විසින් අනුගමනය කරනු ලබන යම් සංරක්ෂණ, කළමනාකරණ සහ පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. |
| **වෙනත් රටකට අයත් ජල තීරයක ප්‍රවේශ ගිවිසුම සහිතව ධීවර කටයුතු සිදු කිරීම**<br><br>**64 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකාව සහ වෙනත් රාජ්‍යයක් අතර පවත්නා ධීවර ප්‍රවේශ ගිවිසුමක හෝ වෙනත් යම් සැලසුමක කාර්යය රාමුවක් යටතේ සහ (43) වන වගන්තිය මගින් නියම කර ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව නිකුත් කරන ලද ධීවර බලපත්‍රයක අධිකාරි බලය යටතේ ධීවර මෙහෙයුම් සිදු කරන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ ධීවර යාත්‍රාවක යාත්‍රාධිපතිට, ක්‍රියාකරුට,කුලියට ගත් තැනැත්තාට, ගැනියන්ට හෝ යාත්‍රාවේ ගමන්ගන්නා යම් වෙනත් තැනැත්තෙකුට එකී රාජ්‍යයක ජල තීරයෙහි ධීවර මෙහෙයුම් සිදු කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දණ්ඩනයට යටත්විය යුතු ය.<br><br>3. අමාත්‍යවරයාට, රජය වෙනුවෙන්, මේ පනතට සහ ශ්‍රී ලංකාව ඇතිකර |

| | |
|---|---|
| | ගෙන තිබෙන්නා වූ යම් ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව සහ අදාළ ප්‍රමිති, ප්‍රතිපත්ති හෝ උපාය මාර්ග සැලකිල්ලට ගනිමින්, ධීවර කටයුතු විෂයයෙහි ප්‍රවේශය සහ / හෝ සහයෝගිතාව සම්බන්ධයෙන් වෙනත් රටවල් සමඟ ප්‍රවේශ ගිවිසුම් සහිතව ද්විපාර්ශ්වික, උප කලාපීය, කලාපීය සහ ජාත්‍යන්තර ගිවිසුම් හෝ ඒ හා සමාන සැලසුම්වලට එළඹිය හැකි ය. |
| **සිය රටට නැවත ගෙන්වා ගනු ලැබීමට ඇති අයිතිය**<br><br>**65 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවල ගැනියන් ලෙස සේවය කරන ශ්‍රී ලාංකික ජාතිකයෝ, පහත සඳහන් අවස්ථානුගත තත්ත්වයන්හී දී උද්ගත වන යම්කිසි තත්ත්වයක් යටතේ;එනම්,<br><br>අ) ගැනි සාමාජිකයාගේ රැකියා ගිවිසුම විදේශගතව සිටියදී කල් ඉකුත් වන්නේ නම්;<br><br>ආ) යාත්‍රා හිමිකරු හෝ ගැනි සාමාජිකයා විසින් සාධාරණ හේතු මත රැකියා ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවක; සහ<br><br>ඇ) ගැනි සාමාජිකයාට රැකියා ගිවිසුම යටතේ තවදුරටත් සිය රාජකාරි ඉටු කිරීමට නොහැකි වූ විට හෝ වෙනත් රටක් විසින් යාත්‍රාව අත්අඩංගුවට ගන්නා අවස්ථා ඇතුළුව විශේෂිත තත්වයන් තුළ ඒවා ඉටු කිරීමට අපේක්ෂා කළ නොහැකි අවස්ථාවක;<br>යාත්‍රා හිමිකරු හෝ ක්‍රියාකරුගේ වියදමින් සිය රටට නැවත ගෙන්වා ගනු ලැබීමට හිමිකම ලබති.<br><br>2. ගැනියන් හට, තම මව් රට වෙත නැවත ගෙන්වා ගනු ලැබීමේ වියදම් වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමක් කරන ලෙස, තම සේවා නියුක්තිය ආරම්භයේ දී නියම කර ඔවුන් වෙතින් ඉල්ලා සිටිනු ලැබීමටත්, ගැනි සාමාජිකයා සිය රැකියාවේ වගකීම් බරපතල ලෙස පැහැර හැර ඇති බව හෙළි වී ඇති අවස්ථාවක දී හැරුනු විට, ඔහු මවු රට වෙත නැවත ගෙන්වා ගැනීමේ දී දැරීමට සිදු වන වියදම් වෙනුවෙන් යම් මුදලක් ඔහුගේ වේතන හෝ වෙනත් හිමිකම් මුදල් කිසිවකින් අයකර ගනු ලැබීමටත් යාත්‍රා හිමිකරුවන් හෝ ක්‍රියාකරුවන් විසින් කටයුතු කරනු නොලැබිය යුතු ය.<br><br>3. අමාත්‍යවරයාට, ධීවර කටයුතු පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සම්මුතියෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස නියෝගමාලා සෑදීමට හැකි ය.<br><br>38 |
| | **V වන කොටස - ධීවර සහ අනෙකුත් ජලජ සම්පත් කළමනාකරණය** |
| **ධීවර කළමනාකරණයේ පොදු මූලධර්ම**<br><br>**66 වන වගන්තිය** | 1. මෙම කොටස යටතේ අනුගමනය කරනු ලබන ධීවර කළමනාකරණය සහ සංරක්ෂණය පිළිබඳ ක්‍රියාමාර්ග, ධීවර හා ජලජ සම්පත්වල සහ ඒවායේ ප්‍රශස්ත උපයෝජනයෙහි දීර්ඝ කාලීන තිරසාර බව සහතික වනු පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලබන, උචිත යැයි සැලකෙන, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') විසින් හෝ වෙනත් අදාළ විද්‍යාත්මක ආයතනයක් විසින් සපයනු ලබන, විශිෂ්ටතම විද්‍යාත්මක සාක්ෂි මත පාදක විය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියෙහි කාර්යය සඳහා, මෙම කොටස යටතේ සහ ඊට අදාළව පවත්නා කාර්යයන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීමේ දී, සියලු තැනැත්තන් (3) (අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ),(උ) සහ (ඒ) වගන්තියේ අරමුණු පිළිපැදිය යුතු ය. |

| | |
|---|---|
| | 3. ප්‍රමාණවත් පරිදි හෝ සෑහෙන තරමේ විද්‍යාත්මක තොරතුරු නොමැති විට, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළිගන්නා වෙනත් අදාළ විද්‍යාත්මක ආයතනයක් විසින්, ඉලක්කගත මත්ස්‍ය විශේෂ හෝ ආශ්‍රිත හෝ අන්තරායට පත් මත්ස්‍ය විශේෂ තිරසාර ලෙස උපයෝජනය කිරීම සහතික කරනු පිණිස සහ ඉලක්කගත නොවන මත්ස්‍ය විශේෂ සහ ඔවුන්ගේ පරිසරය සංරක්ෂණය කිරීම සහතික කරනු පිණිස විකල්ප කළමනාකරණ ක්‍රියාමාර්ග සහ තෝරාගැනීම් යෝජනා කරනු ලැබිය යුතු ය.<br><br>4. (3) වන උප වගන්තියෙහි කාර්ය සඳහා, ධීවර කළමනාකරණය විෂයයෙහි පූර්ව නිවාරණ ප්‍රවේශය යොදා ගැනීමේ කාර්යයෙහි ලා, එහි සඳහන් යම් ආයතනයක් විසින්, මසුන් මරණ අනුපාතය සහ මත්ස්‍ය ජෛව ස්කන්ධවලට සාපේක්ෂ වූ මත්ස්‍යගහනවලට නිශ්චිත යොමු සලකුණු සහ ජාත්‍යන්තරව එකඟ වූ ප්‍රමිතීන්ට අනුකූලව මත්ස්‍ය ආශ්‍රිත අස්වනු පාලනය කිරීමේ නීතිරීති නිශ්චය කරනු ලැබිය යුතු ය. |
| **ධීවර කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා විද්‍යාත්මක උපදේශ**<br><br>**67 වන වගන්තිය** | 1. ජීව විද්‍යාත්මක, ආර්ථික, පාරිසරික, සමාජීය සහ තාක්ෂණික සලකා බැලීම් ඇතුළුව ධීවර හා ජලජ සම්පත් කළමනාකරණයට,විධිමත් කිරීමට, සංරක්ෂණයට සංවර්ධනයට සහ තිරසාර ලෙස භාවිතයට ගැනීම අදාළ කරුණු සම්බන්ධයෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයෙන් ('නාරා') විමසා වරින් වර උපදෙස් ලබා ගත යුතු ය.<br><br>2. මෙම පනතේ IV,V සහ VI දක්වා වන කොටස්වල දැක්වෙන කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳ ඇගයීමක් ඇතුළත් වන්නා වූ ධීවර හා ජලජ සම්පත්වල තත්ත්වය පිළිබඳව වන වාර්ෂික වාර්තාවක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.<br><br>3. මෙම පනත යටතේ ධීවර කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග සහ නියෝගමාලා සකස් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ අමාත්‍යවරයා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය ('නාරා') විසින් දෙනු ලබන උපදෙස් සැලකිල්ලට ගත යුතු ය. |
| **ජාතික ධීවර ප්‍රතිපත්තිය**<br><br>**68 වන වගන්තිය** | 1. ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය,විධිමත් කිරීම,සංරක්ෂණය, සංවර්ධනය සහ තිරසාර ලෙස භාවිතයට ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙන ජාතික ධීවර ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කළ යුතු අතර යටත් පිරිසෙයින් වසර පහකට වරක් සමාලෝචනය කළ යුතු ය.<br><br>2. (3) වන වගන්තියෙහි ස්ථාපිත කර දක්වා ඇති මෙම පනතේ අරමුණු සහ අදාළ ජාතික ප්‍රතිපත්ති සැලකිල්ලට ගනිමින් එකී ප්‍රතිපත්තිය මඟින් ඉලක්ක හඳුනා ගත යුතු ය.<br><br>3. උචිත වන පරිදි, උපදේශක සභාවේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ උපදෙස් සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයාගේ අවධානයට යොමු කිරීම පිණිස ජාතික ධීවර ප්‍රතිපත්තිය සඳහා වන යෝජනාව සකස් කිරීම සඳහා ලේකම්වරයා වගකිව යුතු ය. |

| | |
|---|---|
| | 4. ජාතික ධීවර ප්‍රතිපත්තිය අමාත්‍යවරයා විසින් පිටසන් කරනු ලැබීමෙන් පසු අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. |
| **ධීවර කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග**<br><br>**69 වන වගන්තිය** | ධීවර සම්පත් තිරසාරව නෙලා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග අතර, පහත ක්‍රියාමාර්ග ;<br>අ)ධීවර කළමනාකරණ සැලසුම්;<br>ආ)ධීවර යෙදවුම් ;<br>ඇ)ධීවර යාත්‍රා ඇණිවල ධීවර කටයුතුවල නියැලීමේ ධාරිතාව කළමනාකරණය කිරීම ;<br>ඈ)ධීවර ආම්පන්න සහ ක්‍රම භාවිතය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියාමනය;<br>ඉ)ඇතැම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම තහනම් කිරීම; සහ<br>ඊ) අවකාශීය / සංවෘත කාල සීමා<br>ඇතුළත් විය හැකි ය. |
| **කළමනාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග**<br>**70 වන වගන්තිය** | 1. මෙම පනත යටතේ සහ ඊට අදාළව බලතල ක්‍රියාත්මක කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ධීවර කර්මාන්තයක් සඳහා අවසර ලබා දිය හැකි සමස්ත මත්ස්‍ය අස්වැන්න සහ / හෝ සමස්ත ධීවර යෙදවුම් ප්‍රමාණය තීරණය කළ යුතු අතර ශ්‍රී ලංකා ජල තීරය තුළ පවත්නා සම්පත්වල සංරක්ෂණය සහ දිගු කාලීන තිරසාර බව සහතික කරනු පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියේ කාර්ය සඳහා, ඇතැම් වාණිජ මත්ස්‍ය ගහන හෝ මත්ස්‍ය ගහන කාණ්ඩවල බර ප්‍රමාණය හෝ එක් එක් මත්ස්‍ය විශේෂ සංඛ්‍යාව විෂයයෙහි ධීවර දත්ත ලබා ගැනීමේ ඇති හැකියාව සහ එක් එක් ධීවර කටයුත්තේ ගති ලක්ෂණ මත පදනම්ව, මසුන් ඇල්ලීමේ කාලීනව, වාර්ෂික හෝ අර්ධ වාර්ෂික පදනමක් මත අවසර ලබා දිය හැකි සමස්ත මත්ස්‍ය අස්වැන්න තීරණය කරනු ලැබිය හැකි ය.<br><br>3. වර්ෂය තුළ නෙළා ගත හැකි (1) වන උප වගන්තියෙහි සඳහන් යම් ධීවර කර්මාන්තයක් සඳහා අවසර ලබා දිය හැකි සමස්ත මත්ස්‍ය අස්වැන්න හෝ ධීවර යෙදවුම්වල සම්පූර්ණ ධාරිතාව පිළිබඳ ලැයිස්තුවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සකස් කරනු ලැබිය යුතු ය.<br><br>4. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශයක් මත, අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් අනුව එවැනි ලැයිස්තුවක් ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ යුතු ය.<br><br>5. සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග සකස් කිරීම සහ නිශ්චය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙම පනතට අනුකූලව විනිවිද භාවයෙන් යුත් සහ වගවීමේ ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට හැකි වන අතර, උචිත වන පරිදි, උපදේශක සභාවේ සහ / හෝ ධීවර සම්බන්ධීකරණ කමිටුවල අදාළ නිර්දේශ සැලකිල්ලට ගෙන ධීවර කළමනාකරණ සැලැස්මක් තුළ ස්ථාපනය කරනු ලැබිය හැකි ක්‍රියා පටිපාටි ඔහු විසින් අනුගමනය කරනු ලැබිය යුතු ය.<br><br>6. අමාත්‍යවරයාට (75) වන වගන්තියට අනුව, ධීවර කළමනාකරණ සැලසුම් එ්කක හෝ කිහිපයක කොටසක් ලෙස සංරක්ෂණ සහ |

| | |
|---|---|
| | කළමනාකරණ ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය.<br><br>7. (1) සහ (2) යන උප වගන්තිවල සඳහන් වන සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග මඟින් ශ්‍රී ලංකාව ද පාර්ශවයක් වන කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක් විසින් මහ මුහුදේ ධීවර කටයුතු සඳහා ස්ථාපනය කර ඇති එකම මත්ස්‍ය ගහනය හෝ මත්ස්‍ය ගහන හෝ ආශ්‍රිත හෝ අන්තරායට පත් මත්ස්‍ය විශේෂ සම්බන්ධයෙන් වන ක්‍රියාකාරකම් සැලකිල්ලට ගත යුතු ය. |
| | **1 වන පරිච්ඡේදය – ධීවර සහ -සහභාගීත්වය** |
| **නම් කළ ධීවර කටයුතු**<br><br>**71 වන වගන්තිය** | 1. අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) විසින් ලබා දී ඇති විද්‍යාත්මක වාර්තාවක් මත පදනම්ව මේ පනතට අනුකූලව, ශ්‍රී ලංකා ජල තීරයෙහි සිදු කෙරෙන යම් ධීවර කර්මාන්තයක් හෝ ධීවර කර්මාන්ත, විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මකට යටත් වන ලෙස නම් කළ හැකි අතර, එවැනි නම් කරන ලද ධීවර හෝ ධීවර කටයුතු ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තිය යටතේ නම් කර ඇති ධීවර කටයුතු (75) වන වගන්තිය යටතේ පිළිගත් විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මකට අනුකූලව කළමනාකරණය කළ යුතු ය.<br><br>3. (1) වන උප වගන්තිය යටතේ ගැනෙන යම් ධීවර කර්මාන්තයක් හෝ ධීවර කර්මාන්ත නම් කිරීමට අදාළ විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් සම්මත කිරීමට පෙර හෝ ඒ අවස්ථාවේ දී ම හෝ සිදු විය හැකි ය. |
| **ධීවර කමිටු**<br><br>**72 වන වගන්තිය** | 1. 31 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ධීවරයින්ගෙන් සහ ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ධීවර කමිටුවක් සමන්විත වනු ඇත.<br><br>2. 73 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කරන ලද විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයක් තුළ පදිංචි හෝ ධීවර කටයුතුවල නිරතවන ධීවරයින්ගේ ලේඛනයක් නියමිත ආකාරයෙන් හා ආකෘතියට අනුව සකසා සංශෝධනය කර පවත්වා ගැනීම සෑම ධීවර කමිටුවක් විසින්ම කළ යුතුය.<br><br>3. සෑම ධීවර කමිටුවක් විසින්ම (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ලේඛනයේ යාවත්කාලීන තොරතුරු අඛණ්ඩ පදනමින් සහ යටත් පිරිසෙන් වසරකට වරක් අධ්‍යක්ෂ ජනරාල්වරයාට සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.<br><br>4. II වන උපලේඛනයෙහි සලසා ඇති පරිදි ධීවර කමිටුවෙන් තේරී පත් වූ සාමාජිකයින්ට සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට සහභාගි විය හැකි ය.<br>5. ධීවර කමිටුවේ ඉල්ලීම මත අධ්‍යක්ෂ ජනරාල්වරයාට එවැනි කමිටුවක් ඒ සඳහා වෙන් වී ඇති නමින් ලියාපදිංචි කර, එවැනි ලියාපදිංචි නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.<br><br>6. මෙම පනත යටතේ පිහිටුවා ඇති සෑම ධීවර කමිටුවක්ම, එයට පවරා ඇති නමින්, (4) වන උප වගන්තිය යටතේ ලියාපදිංචි වූ පසු, අවිච්ඡින්න පැවැත්මක් ඇත්තාවූ ද, පොදු මුද්‍රාවක් තබා ගත හැක්කා වූ ද එහි ලියාපදිංචි කරන ලද නාමයෙන් එය විසින්ද එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැක්කාවූ ද සංස්ථාවක් විය හැකි ය. |

| | |
|---|---|
| | 7. යම් ධීවර කමිටුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසු යැයි සළකනු ලබන පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, ඒ ධීවර කමිටුව අක්‍රියව පවතින බවට හෝ ස්වකීය සාමාජිකයින්ගේ යහපත ගෙන දෙන ආකාරයට හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමකට පත් වූ විටක ඒ ධීවර කමිටුවේ ලියාපදිංචිය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය හැකි ය.<br><br>8. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ධීවර කමිටුවක ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී ඒ ධීවර කමිටුවේ ඈවරකරු වශයෙන් ක්‍රියා කිරීමට තැනැත්තෙකු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර ඒ ඈවරකරුට බලය ඇත්තේ ය :-<br><br>අ) ඒ ධීවර කමිටුවේ පොත්පත්, ලිපිලේඛන සහ වත්කම් සන්තකය භාර ගැනීමට;<br>ආ) ඒ ධීවර කමිටුවේ දේපළ විකිණීමට. |
| ධීවර කළමනාකරණ ප්‍රදේශ<br><br>73 වන වගන්තිය | 1. විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මකට අනුව වූ සහ - කළමනාකරණ කාර්යයන් සඳහා, 71 වන වගන්තියට අනුකූලව විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ ස්ථාපිත කළ යුතු ය.<br><br>2. ධීවර කළමනාකරණ ප්‍රදේශයක් පිහිටුවීම සඳහා, උචිත පරිදි, ධීවරයින් විසින් හෝ (72) වන වගන්තියට අනුව ස්ථාපිත කර ඇති අදාළ ධීවර කමිටුවක් සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත, ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.<br><br>3. (2) වන උප වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතු ය:<br>අ) යෝජිත ප්‍රදේශය;<br>ආ) කිසියම් කළමනාකරණ ගැටලු ද ඇතුළුව අයදුම්පත ඉදිරිපත් කරනු ලැබීමට හේතු;<br>ඇ) යෝජිත ප්‍රදේශයේ ධීවර හෝ ජලජ සම්පත් විෂයෙහි විභව ප්‍රතිලාභ;<br>ඈ) ධීවරයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් විෂයෙහි විභව ප්‍රතිලාභ;<br>ඉ) උචිත පරිදි, වෙනත් ප්‍රදේශවල එක හා සමාන මත්ස්‍ය විශේෂ හෝ මත්ස්‍ය ගහන කළමනාකරණය කරන කළමනාකරණ බලධාරීන් සමග යෝජිත සහයෝගිතාව; සහ<br>ඊ) අයදුම්පත්‍රයට සහාය දක්වන සුදුසු විය හැකි හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි වෙනත් යම් කරුණු.<br><br>4. (3) වන උප වගන්තිය ප්‍රකාරව අයදුම්පතක් ලැබීමෙන් පසු, පහත සඳහන් කොන්දේසි සපුරා ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තහවුරු කර ගත යුතු ය:<br>අ) (3) වන උප වගන්තියේ නියමයන් සපුරා ඇති බව ;<br>ආ) ඉල්ලා සිටින පරිදි විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ප්‍රකාශ කිරීම මෙම පනතේ පරමාර්ථය හා මූලධර්මවලට අනුකූල වනු ඇති බව ;<br>ඇ) යෝජිත ධීවර කළමනාකරණ ප්‍රදේශයේ මසුන් ඇල්ලීමේ කාර්යයෙහි නිරත ධීවරයින්ගෙන් බහුතරයක් යෝජිත සහ- සහභාගිත්ව කළමනාකරණයට සහාය දක්වන්නේ ද යන්න හෝ ඊට සහභාගිවේ ද යන වග; සහ<br>ඈ) මෙම පනතට අනුකූල වන සහ- සහභාගිත්ව කළමනාකරණ සැලසුම් හඳුනා ගෙන ඒවාට එකඟවී ඇත් ද යන්න. |

| | |
|---|---|
| | 5. (4) වන උප වගන්තියෙහි කොන්දේසි සපුරා ඇති බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන අවස්ථාවක විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයක් පිහිටුවීම සම්බන්ධයෙන් ඔහු විසින් අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබිය යුතු ය.<br><br>6. අමාත්‍යවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, මෙම වගන්තියට අනුකූලව, ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද නියමයක් මඟින් යම් ප්‍රදේශයක් ධීවර කළමනාකරණ ප්‍රදේශයක් විය යුතු බවට ප්‍රකාශ කළ යුතු අතර, එම නියමයෙහි පහත සඳහන් කරුණු නිශ්චිතව දැක්විය යුතු ය :<br><br>අ) එ ් ප්‍රදේශය විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන අරමුණ / අරමුණු ;<br><br>ආ) (75) වන වගන්තියට අනුව විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් සකසා ක්‍රියාත්මක කිරීම සඳහා වන අවශ්‍යතාවන්; සහ සුදුසු පරිදි සහ-සහභාගීත්ව කළමනාකරණය සහ තීරණ ගැනීම ඇතුළුව කළමනාකරණ සැලසුම් සහ කාර්ය පටිපාටි. |
| **දිස්ත්‍රික් ධීවර කළමනාකරණ සහ - සහභාගීත්ව කමිටු**<br><br>**74 වන වගන්තිය** | 1. සෑම විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයක් සඳහාම දිස්ත්‍රික් ධීවර කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුවක් ("සම්බන්ධීකරණ කමිටුව") පැවතිය යුතු ය.එසේ වුවද, දිස්ත්‍රික්කයක ධීවර කළමනාකරණ ප්‍රදේශ එකකට වඩා වැඩි ගණනක් පිහිටුවා ඇති විට, උපලේඛන II හි දක්වා ඇති සම්බන්ධීකරණ කමිටුවේ ඇති තත්කාර්යය සාමාජිකයන් අදාළ ධීවර සහ ධීවර කටයුතු වල කළමනාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර ලෙස භාවිතයට ගැනීම පිළිබඳ කටයුතු කිරිමට අදාළ නිලධාරීන් පමණක් කැඳවීමට අධ්‍යක්ෂ ජෙනරාල්වරයාට තීරණය කළ යුතු ය.<br><br>2. සම්බන්ධීකරණ කමිටුව II වන උපලේඛනයෙහි දැක්වෙන ස්ථිර සාමාජිකයින්ගෙන් සහ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි තත්කාර්යය සාමාජිකයින් නවදෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.<br><br>3. ධීවර සම්බන්ධීකරණ කමිටුව විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශයේ පාලන අධිකාරිය විය යුතුය. එම විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශය පිහිටුවීමට නියම කරන නියමයක් ප්‍රසිද්ධියට පත්කරන දින සිට වසරක කාලයක් තුළදී විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශය සම්බන්ධයෙන් ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්මක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමේ කාර්යය එයට පැවරෙන්නේ ය. විශේෂිත ධීවර කළමනාකරණ සැලසුම් අනුමත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය 75 වන වගන්තියෙහි සඳහන් වේ.<br><br>4. එම සම්බන්ධීකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලබන තීරණය සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අමාත්‍යවරයාගෙන් විමසා මේ පනතේ II වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් අතරින් සම්බන්ධීකරණ කමිටුව සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.<br><br>5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සම්බන්ධීකරණ කමිටුවේ ලේකම්වරයා හෝ කැඳවුම්කරු II උපලේඛනයේ දක්වා ඇති නිලධාරින් අතරින් පත් කළ යුතු ය.ලේකම්වරයා හෝ කැඳවුම්කරු විසින් විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කර ඇති සම්බන්ධීකරණ කමිටුවේ සියලු රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | 6. විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ සඳහා සංස්ථාපනය කර ඇති සම්බන්ධීකරණ කමිටුව යටත් පිරිසෙයින් සෑම මසකට වරක් හෝ හදිසි අවස්ථාවකදී හෝ රැස්විය යුතු ය.<br><br>7. අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු සම්බන්ධීකරණ කමිටුවේ මුලසුන දැරිය යුතු ය.<br><br>8. අධ්‍යක්ෂ ජනරාල්වරයා පැමිණ නොමැති අවස්ථාවක අදාල දිස්ත්‍රික් ලේකම් සභාපතිවරයා විය යුතු ය.<br><br>9. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුයෝජිතයන්, විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ සීමාව තුළ පවත්වා ගෙන යනු ලබන වෙනත් වාණිජ කටයුතු නියෝජනය කරන සමාගම්වල අනුයෝජිතයන්, ධීවර කාන්තා කණ්ඩායම්වල අනුයෝජිතයන් සහ විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශ සීමාව තුළ ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ ධීවරයින්ගේ සුභසාධක කටයුතුවලට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවල අනුයෝජිතයන් ඇතුළුව සම්බන්ධීකරණ කමිටුවේ වෙනත් තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.<br><br>10. දිස්ත්‍රික් ධීවර සම්බන්ධීකරණ කමිටුවේ කාර්යයන් ලෙස :<br>අ) පහත කරුණු ඇතුළුව, අදාල ධීවර කටයුතු කළමනාකරණයට සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීමට සහ සම්මුතීන් ඇති කරගැනීම සඳහා වන මණ්ඩපයක් සැලසීම :<br>i. අධීක්ෂණ යාන්ත්‍රණයන් ;<br>ii. මුදවා ගැනීම සහ බලාත්මක කිරීමේ ප්‍රමුඛතාවයන්; සහ,<br>iii. ධීවර සම්පත් කළමනාකරණ අරමුණුවලට අනුකූලව පර්යේෂණ ප්‍රමුඛතාවයන්.<br>ආ)ධීවර සම්පත් සඳහා කළමනාකරණ සැලසුම්;<br>ඇ) මේ පනතේ විෂය පථය තුළට ගැනෙනා කරුණුවලට අදාළ තොරතුරු සහ දත්ත රැස්කිරීම කළමනාකරණය කිරීම;<br>ඇ)පාර්ශවකරුවන් අතර තොරතුරු හුවමාරු කර ගැනීමේදී පහසුකම් සැලසීම<br>ඉ) අධ්‍යක්ෂ ජනරාල් විසින් හෝ මෙම පනත යටතේ අනන්‍යකාරයකින් ස්ථාපිත කරන ලද වෙනත් රාජ්‍ය ආයතන ඇතුළු ධීවර කමිටුවේ සාමාජිකයින් නියෝජනය කිරීම;<br><br>44 |
| **විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්ම**<br><br>**75 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ශ්‍රී ලංකා ජල තීරයෙහි යම් ධීවර කර්මාන්තයක් හෝ ධීවර කර්මාන්ත සම්බන්ධයෙන් විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම සඳහා කටයුතු සැලැස්විය හැකි අතර (71) වන වගන්තියට අනුව ධීවර කර්මාන්තයක් නම් කර ඇති අවස්ථාවක දී එසේ කළ යුතු ය.<br><br>2. කිසියම් විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් මේ පනතේ විධිවිධානවලට අනුකූල විය යුතු අතර, එහි පහත සඳහන් අංගයන්:<br>අ) පහත සඳහන් දෑ ඇතුළුව, ධීවර කර්මාන්තයේ අනන්‍යතාවය සහ එහි ගති ලක්ෂණ :<br>i) සම්පත්වල වත්මන් තත්ත්වය;<br>ii) සහභාගිවන්නන්, ධීවර ආම්පන්න, ධීවර මෙහෙයුම්, වෙනත් ක්‍රියාකාරකම් සහ ධීවර කර්මාන්තයට අදාළ ආර්ථික හා සමාජීය සාධක ඇතුළු ධීවර කර්මාන්තයේ වත්මන් තත්ත්වය ; |

| | |
|---|---|
| | iii) ධීවර කර්මාන්තයේ සංවර්ධන මට්ටම ;<br>iv) පරිසර පද්ධතියේ තත්ත්වය සහ මසුන් ඇල්ලීමට සහ ධීවර කර්මාන්තයට අදාළ වෙනත් ක්‍රියාකාරකම් නිසා ඇතිවිය හැකි අහිතකර පාරිසරික බලපෑම් ;<br>v) අදාළ ආයතනික, නීතිමය සහ ප්‍රතිපත්තිමය සලකා බැලීම්; සහ<br>vi) අදාළ කලාපීය සහ ජාත්‍යන්තර බැඳීම්.<br>ආ) ධීවරයින්, ධීවර කමිටු සහ අනෙකුත් පාර්ශවකරුවන් වෙතින් උපදෙස් විමසා බැලීම් පිළිබඳ වාර්තාව ;<br>ඇ) ධීවර කටයුතු සඳහා කළමනාකරණ අරමුණු සහ කාර්ය සාධන දර්ශක සඳහන් කර තිබීම ;<br>ඈ) ධීවර කර්මාන්තය සඳහා යොදා ගත යුතු කළමනාකරණ ක්‍රියාමාර්ග සඳහන් කර තිබීම ;<br>ඉ) ධීවර කළමනාකරණ සැලැස්ම සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම සඳහා වූ ක්‍රියාවලිය සඳහන් කර තිබීම ;<br>ඊ) ධීවර කර්මාන්තයේ ඵලදායී කළමනාකරණය, විධිමත් කිරීම,සංරක්ෂණය, සංවර්ධනය සහ තිරසාර භාවිතය සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් සුදුසු පරිදි විධිවිධාන සම්පාදනය කර තිබීම<br>අන්තර්ගත විය යුතු ය.<br><br>3. විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් මගින්:<br>අ) (72) වන වගන්තිය යටතේ පිහිටුවා ඇති යම් ධීවර කමිටුවකට කළමනාකරණ වගකීම පැවරීම ;<br>ආ) යම් ධීවර කමිටුවක් විසින් සම්මත කරන ලද, විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මට අනුකූල වන තාක් දුරකට වලංගු වන උපකාරක කළමනාකරණ සැලසුම් සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි, විධිවිධාන සැලසීම; සහ<br>ඇ) පොදුවේ පාර්ශවකරුවන් සඳහා වන බැඳියා සහ වගකීම් නිශ්චිතව සඳහන් කිරීම.<br><br>4. සෑම විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් ම සහ එවැනි සැලැස්මකට කෙරෙන සෑම සංශෝධනයක් ම, ඒවායේ අනුමැතිය සඳහාත්, පසුව ඒවා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීම සඳහාත් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි සැලැස්මක් ගැසට් පත්‍රය පළ කිරීමෙන් අනතුරුව එය බලාත්මක විය යුතු ය.<br><br>5. අමාත්‍යවරයා විසින් විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්ම ප්‍රකාශයට පත් නොකරන්නේ නම්, ප්‍රකාශයට පත්නොකිරීමට හේතු සඳහන් කරමින් එම සැලැස්ම සංශෝධනය කිරීම සහ නැවත ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත ආපසු එවිය යුතුය. 45<br><br>6. එකී එක් එක් විශේෂිත ධීවර කළමනාකරණ සැලැස්මක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රය මගින් නිවේදනය කළ යුතු ය. |
| **වෙරළබඩ ප්‍රජාවන් සහ යැපුම් ධීවර කර්මාන්තය ආරක්ෂා කිරීම**<br><br>**76 වන වගන්තිය** | 1. මෙම වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති ක්‍රියාමාර්ග, මේ පනතේ (3) (උ) වන වගන්තිය මගින් නියම කර දක්වා ඇති පරමාර්ථය ක්‍රියාත්මක කිරීම උදෙසා දායකත්වය ලබා දේ.<br><br>2. වෙරළබඩ ප්‍රජාවේ ජීවනෝපාය සහ තිරසාර සංවර්ධනය සඳහා පදනම වන සම්පත්වලට ප්‍රවේශවීමේ සිය අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු ය.<br><br>3. ජාතික ධීවර ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී වෙරළබඩ ධීවර ප්‍රජාවගේ ආරක්ෂාව, යැපුම් සහ ආදිවාසී ජනතාව සඳහා ධීවර කර්මාන්තයේ විශේෂ අවශ්‍යතාව සැලකිල්ලට ගත යුතු අතර, සාම්ප්‍රදායික ධීවර නිෂ්පාදන සහ |

| | |
|---|---|
| | දේශීය අලෙවිය සහ එවැනි නිෂ්පාදනයන්හි දේශීය පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමට ලේකම්වරයා විසින් පරිශ්‍රමයක් දරනු ලැබිය යුතු ය.<br><br>4. වෙරළබඩ ධීවර ප්‍රජාව සහ යැපුම් ධීවර කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා සහ ඔවුන්ගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම උදෙසා වෙන් කළ යුතු ඇතැම් ප්‍රදේශ සහ ක්‍රියාකාරකම් තීරණය කරමින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව යම් නිශ්චිත කොන්දේසි පැනවීම සඳහා නියෝගමාලා සැකසීමට අමාත්‍යවරයාට හැකි ය. |
| | **2 වන පරිච්ඡේදය –මත්ස්‍ය අස්වැන්න වෙන් කිරීමට සමානුපාතික ලෙස ධීවර යෙදවුම් යොදා ගැනීම** |
| **මත්ස්‍ය අස්වැන්න වෙන් කිරීමට සමානුපාතික ලෙස ධීවර යෙදවුම් යොදා ගැනීම**<br><br>**77** වන වගන්තිය | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත පාරදෘශ්‍ය සහ විෂය මූලික නිර්ණායක මත පදනම්ව, ධීවර මෙහෙයුම් බලපත්‍රලාභීන් වෙත, නිශ්චිතව දක්වා ඇති ධීවර කටයුත්තකට හෝ ධීවර කටයුතුවලට වාර්ෂිකව විද්‍යාත්මක වාර්තාවක් මත පදනම්ව මසුන් ඇල්ලීම සමානුපාතික ලෙස වෙන් කර දෙනු ලැබිය යුතු ය.<br><br>2. ධීවර මෙහෙයුම් බලපත්‍රලාභීන්, වෙනත් කරුණු අතර, තනි පුද්ගල ධීවරයින්, ධීවර බලපත්‍ර නිකුත් කරන ලද ධීවර යාත්‍රා, සමුපකාර සහ ධීවර සංවිධාන හෝ විශේෂිත ධීවර කළමනාකරණ ප්‍රදේශවල කළමනාකරණ අධිකාරීන් විය හැකි ය.<br><br>3. ධීවර මෙහෙයුම් බලපත්‍රලාභීන් තමන්ට ධීවර මෙහෙයුම් බලපත්‍රයට අනුව වෙන් කර දී ඇති ධීවර යෙදවුම,මත්ස්‍ය විශේෂ සහ ප්‍රමාණය ඉක්මවා මසුන් ඇල්ලීම නොකළ යුතු ය.<br><br>4. ධීවර යෙදවුම්වලට යටත්ව හෝ යෙදවුම්වලට යටත්ව නොමැතිව පමණ ඉක්මවා මසුන් හෝ ධීවර සම්පත් අල්ලන යම් බලපත්‍රලාභීන් වරදකට වරදකරුවන් වන අතර වරදකරුවන් වූ විට III වන උපලේඛනයේ දක්වා ඇති දණ්ඩනයකට යටත් විය යුතු ය.<br><br>5. තමාට වෙන් කර දී ඇති ධීවර යෙදවුම් හෝ මසුන් ඇල්ලීමේ ප්‍රමාණය ඉක්මවන මසුන් ඇල්ලීම බලපත්‍රලාභියෙකු වරදට වරදකරුවකු වන අතර පමණ ඉක්මවා අල්ලන ලද මසුන් ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, III වන උපලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් වි යුතු ය.<br><br>6. අමාත්‍යවරයාට, ධීවර යෙදවුම් ප්‍රමාණය, මත්ස්‍ය විශේෂ සහ අල්ලාගත් ප්‍රමාණය වෙන් කර දීම සඳහා වන නිර්ණායක පැනවීමටත්, බලපත්‍රලාභීන් අතර ධීවර යෙදවුම් පැවරීම සහ හුවමාරු කිරීමට ,පමණ ඉක්මවා යාම සඳහා වන සීමාව සහ නම්‍යශීලතා සඳහා කොන්දේසි පැනවීමට සහ පමණ ඉක්මවා මසුන් ඇල්ලීම සිදුවුවහොත් අවකරණය කිරීම් සහ නැවත වෙන්කිරීම් සඳහා වූ ක්‍රියා පටිපාටි පනවමින්, නියෝග සෑදිය හැකි ය. |
| **මසුන් ඇල්ලීමේ ධාරිතාවය කළමනාකරණය කිරීම**<br>**78** වන වගන්තිය | 1. මේ කොටසෙහි විධිවිධාන සහ එහි ක්‍රියාත්මක කිරීමේ නියෝගවලට අනුකූලව, තිරසර ලෙස මත්ස්‍ය අස්වනු නෙළාගැනීම සහතික කිරීම සඳහා ධීවර යාත්‍රා ඇණි ධාරිතාව ගලපා ගනු පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබිය යුතු ය.<br><br>2. ධීවර යාත්‍රා ඇණි ධාරිතාව කළමනාකරණය සඳහා වන ක්‍රියාමාර්ගයන්ට, අනෙකුත් කරුණු අතර, පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය: |

| | |
|---|---|
| | අ) නිකුත් කළ යුතු ධීවර බලපත්‍ර සංඛ්‍යාව සීමා කිරීම;<br>ආ) ධීවර යාත්‍රාවේ සමස්ත දිග සීමා කිරීම ;<br>ඇ) මසුන් ඇල්ලීමේ ධාරිතාව සහ පවත්නා ධීවර සම්පත් අතර සමතුලිතතාවක් පිළිබිඹු කෙරෙන, ධීවර යාත්‍රාවේ දළ ටොන්(GT) ප්‍රමාණයෙන් හෝ එහි ප්‍රධාන එන්ජිමේ කිලෝවොට්(Kw) ප්‍රමාණයෙන් ප්‍රකාශිත වන, ධීවර යාත්‍රා ඇණි ධාරිතාවයට හෝ ධීවර කර්මාන්තයට අනුව සැකසූ විමර්ශන මට්ටමක් ස්ථාපිත කිරීම;<br>ඈ) යටත් පිරිසෙයින් එකම මට්ටමේ මසුන් ඇල්ලීමේ ධාරිතාවක් යාත්‍රා ඇණි ලේඛනයෙන් ඉවත් කිරීමත් සමග, නව ඇතුළත් කිරීමක් ලියාපදිංචි කිරීම සහිතව ගලපා ගන්නා ඇතුළු කිරීමේ : බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ / හෝ;<br>ඉ) ධීවර ආම්පන්නවල වර්ගය සහ මසුන් ඇල්ලීමේ හැකියාව වැඩි කළ හැකි යම් උපකරණවල ද , අනෙකුත් කරුණු අතර, ආලෝක ධාරා සහ මසුන් ඒකරාශී කිරීමේ ඇටවුම්(**FADs'**) ද භාවිතය විධිමත් කිරීම.<br><br>3. මේ පනතට අනුකූලව, ධීවර යාත්‍රා ඇණිවල ධාරිතාව කළමනාකරණය කිරීම සඳහා වන යම් යම් කොන්දේසි, රීති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. |
| | **3 වන පරිච්ඡේදය – ධීවර ආම්පන්න සහ මසුන් ඇල්ලීමේ පන්න ක්‍රම විධිමත් කිරීම** |
| **ධීවර ආම්පන්න සහ පන්න ක්‍රම විධිමත් කිරීමේ අරමුණු**<br><br>**79 වන වගන්තිය** | 1. මේ කොටසෙහි ස්ථාපිත කරනු ලැබ ඇති ධීවර ආම්පන්න සහ ධීවර පන්න ක්‍රම භාවිතයට ගැනීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ රීති, පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක විය යුතු ය :<br><br>අ).මසුන්ගේ වර්ධක අවස්ථා ආරක්ෂා කිරීම සඳහා සහ මසුන් ඉවතලෑමේ සහ අනවශ්‍ය මත්ස්‍ය විශේෂ හසුවීම් මට්ටම අවම කිරීම සඳහා ධීවර ආම්පන්න තෝරා ගැනීමේ භාවිතය වැඩි දියුණු කිරීම; සහ,<br><br>ආ) මුහුදු පතුල, සමුද්‍රීය පරිසර පද්ධතිය, සංවේදී ප්‍රදේශ සහ ආරක්ෂිත මත්ස්‍ය විශේෂ කෙරෙහි ධීවර කටයුතුවලින් සිදුවන බලපෑම අවම කිරීම;<br>ඇ) ධීවර ආම්පන්න,නාවික උපකරණ සහ ධීවර කටයුතු ආශ්‍රිත අමතර උපාංග ආනයනය පාලනය කිරීම.<br><br>47<br>2. මසුන්ගේ වර්ධක අවස්ථාවල ආරක්ෂාව සහතික කිරීම සඳහා සමුද්‍රීය මත්ස්‍ය විශේෂවල අවම ප්‍රමාණය,ධීවර දැල්, ධීවර ආම්පන්න සහ පන්න ක්‍රම භාවිතා කිරීම සඳහා මෙන්ම යම් ධීවර දැලකට, ධීවර ආම්පන්නයකට හෝ ධීවර පන්න ක්‍රමයකට අල්ලා ගැනීමට අවසර දී ඇති මත්ස්‍ය විශේෂවල උපරිම ප්‍රතිශතය ක්‍රියාවට නැංවීමේ කාර්ය සඳහාත්, IV සහ V වන කොටස් යටතේ ආරක්ෂිත මත්ස්‍ය විශේෂ ස්ථාපනය කිරීම සඳහා දැනට පවත්නා හොඳම විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව,මේ පනතේ අරමුණු සහ මූලධර්මවලට අනුකූලව, අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. |
| **ධීවර ආම්පන්න සහ ධීවර පන්න ක්‍රම භාවිතය තහනම් කිරීම** | 1. මේ පනත අනුව අවශ්‍යවන්නා හෝ නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල නොවන කිසිදු ධීවර ආම්පන්නයක් හෝ ධීවර පන්න ක්‍රමයක් කිසිදු හිමිකරුවෙකු, යාත්‍රාධිපතියෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින් ශ්‍රී ලංකා ජල තීරයෙහි හෝ මහ මුහුදෙහි ක්‍රියාත්මක යාත්‍රාවක රැගෙන නොයා යුතු ය. |

| | |
|---|---|
| **80** වන වගන්තිය | 2. මේ පනත යටතේ තහනම් කර ඇති කිසිදු ධීවර ආම්පන්නයක් හෝ ධීවර පන්න ක්‍රමයක් කිසිදු අයිතිකරුවෙකු, යාත්‍රාධිපතියෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින් මසුන් ඇල්ලීම සඳහා භාවිතා නොකළ යුතු ය.<br><br>3. පහත සඳහන් ධීවර ආම්පන්න හෝ ධීවර පන්න ක්‍රම:<br><br>අ) 83 වන වගන්තියෙහි දක්වා ඇති යම් රසායනික, විෂ හෝ හිංසක දෙයක් හෝ ද්‍රව්‍යයක්, ඩයිනමයිට්, වෝටර් ජෙල් හෝ පුපුරන ද්‍රව්‍ය හෝ උපකරණ;<br>ආ ස්පියර් තුවක්කුවක් හෝ අතෙහි රඳවන උල් කරන ලද කූරු;<br>ඇ) කිසිදු තල්ලු දැලක්;<br>ඈ) කිසිදු මොක්සි දැලක්;<br>ඉ) කරමල් දැලක් හෝ ත්‍රිත්ව දැලක් කොරල්පර හෝ ගල්පර මත එලීම; සහ,<br>ඊ) කොරල් හෝ සමුද්‍රීය (ස්පොන්ජි) හතු නෙලා ගැනීම සඳහා භාවිතා කරන උපකරණයක්;<br>උ) මේ පනත යටතේ නියම කර නොමැති යම් ධීවර ආම්පන්නයක් හෝ ධීවර ක්‍රමයක්;<br>ඌ) කිසිදු තංගුස් දැලක්;<br>එ) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග මගින් තහනම් කරනු ලැබීමට නියම කරන ලද ධිවර ආම්පන්නයක් හෝ ධීවර පන්න ක්‍රමයක්<br>භාවිතා කරමින් සමුද්‍රීය සම්පත් නෙළා ගැනීම තහනම් කරනු ලැබිය යුත්තේ ය.<br><br>4. කිසිදු තැනැත්තෙකු තංගුස් දැල් සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම හෝ විකිණීම සඳහා භාවිතා නොකළ යුතු ය.<br>5. මේ වගන්තියේ විධිවිධාන ධීවර ආම්පන්න,නාවික/යාත්‍රා කිරීමේ උපකරණ,මත්ස්‍ය ආශ්‍රිත අමතර උපාංග හා අදාළ ගුදම්/ගබඩාවන්,ඒවා ප්‍රවාහනය සහ වෙළඳාම් කිරීම්වල නිරත යම් තැනැත්තෙකුට අදාළ විය යුතු ය.<br><br>6. කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් ඒකරාශි කිරීම සඳහා, යාත්‍රා කිරීමේ නියෝගමාලා මගින් ප්‍රකාශිත නියමිත ආලෝක පහන් සහ යාත්‍රාව මත වැඩ කිරීමේ ආරක්ෂිත සේවා තත්ත්වයන් සඳහා අවැසි ආලෝක පහන් හැර, මතුපිට හෝ ජලයේ ගිල්වූ කෘතිම ආලෝක ධාරා භාවිතා නොකළ යුතු ය.<br><br>7. මේ වගන්තියෙහි විධිවිධානවලට පටහැනිව කළයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදක් සිදු කරන අතර වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. මෙම වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලබන ඕනෑම යාත්රාවක් සහ ධීවර ආම්පන්න, සියලු මත්ස්ය හෝ මත්ස්‍ය නිෂ්පාදන රාජසන්තක කළ යුතු අතර, එම මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන ප්රවාහනය සඳහා භාවිතා කරන ඕනෑම වාහනයක්, මේ පනත යටතේ දෙනු විධිවිධාන සලසන හෝ නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව, රාජසන්තක කරනු ලැබිය හැකි ය. |
| **කිමිදුම් මෙහෙයුම්**<br>**81** වන වගන්තිය | 1. මේ පනත යටතේ වූ ක්‍රියාත්මක කිරීමේ නියෝග මගින් නියම කර ඇති පරිදි, නියමිත දිනයක, නියමිත කාල සීමාවක් තුළ සහ නියමිත යම් ප්‍රදේශයන් තුළ, එක් එක් නියමිත මත්ස්‍ය වර්ගය ඇල්ලීම සඳහා ලබා දී ඇති බලපත්‍රයක අධිකාරිය යටතේ පමණක්, කිමිදුම් මෙහෙයුම් සිදු කළ යුතු ය.<br><br>2. කිමිදුම් ධීවර මෙහෙයුම් සඳහා වූ බලපත්‍රලාභීන් විසින් ශ්‍රී ලංකා ජල |

| | |
|---|---|
| | තීරයේ හක් බෙල්ලන්, මුහුදු කුඩැල්ලන්, පොකිරිස්සන්, වරල් සහිත මසුන් සහ විසිතුරු මසුන් ඇල්ලීමට ඇවුලම් ඊතල සහ බිලී කොකු, උල් කුරු හෝ ස්පියර් තුවක්කු භාවිතා නොකළ යුතු ය.<br><br>3. කිමිදුම් ධීවර මෙහෙයුම් සඳහා වූ බලපත්‍රලාභීන් විසින් , එවැනි බලපත්‍රයක්, කිසිදු ආකාරයක හැඹිලි දැල් මගින් මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල යෙදීම සඳහා භාවිතා නොකළ යුතු ය.<br><br>4. කිමිදුම් ධීවර මෙහෙයුම් සඳහා වූ බලපත්‍රලාභියෙක් විසින්, මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර ඇති බවට විශ්වාස කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට සාධාරණ හේතු තිබේ නම්, ඔහු විසින් එකී බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබිය යුතු ය.<br><br>5. මේ කොටසෙහි විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දණ්ඩනයට යටත්විය යුතු ය. |
| **සීන් දැල්, කරමල් දැල් සහ වෙනත් වර්ගයේ නියමිත දැල් භාවිතය පිළිබඳ නියෝග**<br><br><br>**82 වන වගන්තිය** | 1. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදු කරන හැඹිලි දැල් පන්නයේ ධීවර යාත්‍රාවක යාත්‍රාධිපතියෙකු, ක්ෂීරපායි ගනයේ මසුන් ,මිණිමුතු මෝරුන් , කස මෝරුන් ,පොල්කොළ මෝරුන් , අලි මඩුවන් සහ කැස්බෑවුන් ඇතුලු තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ නිරන්තරව වාසය කරන ප්‍රදේශවල හිතාමතාම දැල් නොදැමිය යුතු ය. අහඹු ලෙස අසුවුවහොත්, ක්ෂීරපායි ගනයේ මසුන් , මිණිමුතු මෝරුන් , කස මෝරුන් ,පොල්කොළ මෝරුන් , අලි මඩුවන් සහ කැස්බෑවුන් මසුන්ට හානියක් සිදු නොවන පරිදි, වහා මුහුදට ආපසු මුදා හරිනු ලැබිය යුතු ය.<br><br>2. හැඹිලි දැල් බෝට්ටු යාත්‍රාධිපතියකු මුහුදින් අල්ලා ගෙන එනු ලබන සියලු ඉලක්කගත මසුන් (ඇස්ගෙඩි කෙලවල්ලා, බලයා සහ කහ වරල් කෙලවල්ලා) සහ ඉලක්කගත නොවන මසුන් ( වෙනත් කෙලවල්ලා මසුන් විශේෂ , ලේන පරවා , වන්නා , කොප්පරා , සප්පරා , තලපත් , අහින්තෝරා , සීලාවා ) ගොඩබිම දක්වා රැගෙන විත් ගොඩබානු ලැබිය යුතුය. මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වන්නේ නම් මිස මෙම මසුන් මුහුදේදී ඉවත නොදැමිය යුතුය .<br><br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය(NARA) විද්‍යාත්මක වාර්තාව මත පදනම්ව කෙළවල්ලා මත්ස්‍ය විශේෂ හැර (Tuna like species), ශ්‍රී ලංකා ජල තීරයේ සහ මහ මුහුදේ මුදු දැල් සංඛ්‍යාව, එහි පිරිවිතර සහ ඉලක්ක ගත මත්ස්‍ය විශේෂ පිළිබඳව තීරණය කළ හැකි ය.<br><br>4. මේ පනතේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති යටතේ, එක් දිස්ත්‍රික්කයක් සඳහා වන ජාකොටු ගණන සහ ඒවා සාදනු ලැබිය හැකි ද්‍රව්‍ය, විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව, දැලෙහි දැල් ඇස්වල අවම ප්‍රමාණය, ඒවා මසුන් ඇල්ලීම සඳහා යෙදවිය හැකි ප්‍රදේශ, එම ජාකොටු අතර දුර ප්‍රමාණය සහ ඒවා හඳුනා ගන්නා ආකාරය පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයාට තීරණය කළ හැකි ය.<br>5. අමාත්‍යවරයාට, පතුලේ අදින ධීවර ආම්පන්න එලිය හැකි උපරිම සිරස් ගැඹුර සම්බන්ධයෙන් සහ ඉලක්ක නොකළ මත්ස්‍ය විශේෂ අහඹු ලෙස අසුවීම සහ පාරිසරික හානි අවම කරනු පිණිස ඒ්වා උපරිම වශයෙන් ජලයේ රඳවා තබා ගැනීමේ කාලය සම්බන්ධයෙන්,නියෝග සෑදිය හැකි ය.<br><br>6. මේ වගන්තියෙහි විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් |

| | |
|---|---|
| | තැනැත්තෙකු වරදකට වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දණ්ඩනයට යටත්විය යුතු ය.මෙම වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලබන සියලු දැල් ,මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන රාජසන්තක කළ යුතු අතර, එම මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන ඇල්ලීම හෝ ප්‍රවාහනය සඳහා භාවිතා කරන ඕනෑම යාත්‍රාවක් හෝ වාහනයක්,මේ පනත යටතේ විධිවිධාන සලසනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව, රාජසන්තක කරනු ලැබිය හැකි ය. |
| **මසුන් ඇල්ලීම සඳහා විෂ සහිත හෝ පුපුරන සුළු ද්‍රව්‍ය භාවිතය තහනම් කිරීම**<br><br>**83 වන වගන්තිය** | 1. කිසිදු තැනැත්තෙකු විසින්, මසුන් මැරීමේ, අල්ලා ගැනීමේ, විසංඥ කිරීමේ හෝ දුබල කිරීමේ හෝ යම් වෙනත් ආකාරයකින් මසුන් පහසුවෙන් අල්ලා ගනු ලැබීමට හැකි වන පරිදි කටයුතු කිරීමේ අදහසින්, යම් රසායනික, විෂ සහිත හෝ හිංසක හෝ අනතුරුකාරී දෙයක්, හෝ ද්‍රව්‍යයක්, ඩයිනමයිට්, වෝටර් ජෙල් හෝ පුපුරන සුලු ද්‍රව්‍ය හෝ උපකරණ කිසිවක්:<br>අ) භාවිතා කිරීම, භාවිතා කිරීමට අවසර දීම හෝ භාවිතා කිරීමට තැත් කිරීම;<br>ආ) රැගෙන යාම, රැගෙන යාමට ඉඩ දීම, තම සන්තකයේ තබා ගැනීම හෝ පාලනය කිරීම; හෝ<br>ඇ) ජලය තුළ තැබීම හෝ ජලය තුළ තැබීමට සහාය වීම,<br>නොකළ යුතු ය.<br><br>2. මේ වගන්තියේ කාර්යයන් සඳහා, යම් ධීවර යාත්‍රාවක තිබී හමුවන ඕනෑම විෂ සහිත, පුපුරන හෝ විසංඥභාවයට පත් කරන යම් ද්‍රව්‍යයක් (ඩයිනමයිට් සහ වෝටර් ජෙල් ඇතුළුව) හෝ වෙනත් හිංසක හෝ හානිකර ද්‍රව්‍යයක් හෝ දෙයක්, මසුන් ඇල්ලීම සඳහා භාවිතා කිරීමට හෝ භාවිතා කිරීම සඳහා තැත් කිරීමට අදහස් කරනු ලබන බව (1) (අ) වන උප වගන්තියෙහි සඳහන් පරිදි පූර්ව නිගමනය කළ යුතු ය.<br><br>3. මේ වගන්තියට පටහැනිව ඕනෑම ආකාරයකින් අල්ලා ගන්නා ලද මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන කිසිවක් ගොඩබෑම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, මිලදී ගැනීම, විකිණීම, ගනුදෙනු කිරීම, ප්‍රවාහනය කිරීම, භාර ගැනීම හෝ තම සන්තකයේ තබා ගැනීම කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.<br><br>4. කිසිදු තැනැත්තෙකු විසින්, යම් මත්ස්‍යයෙකු,මත්ස්‍ය නිෂ්පාදනයක්, ජලජ සම්පතක් හෝ නිෂ්පාදනයක් මේ වගන්තියට පටහැනිව අල්ලා ගෙන ඇති බව දැන දැනම හෝ ඒ බව විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී, යම් බලයලත් නිලධාරියෙකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත:<br>අ) (1) වන උප වගන්තියෙහි විස්තර කර ඇති යම් ක්‍රියාකාරකමක් හෝ එය සනාථ වන යම් ක්‍රියාකාරකමක් හෝ එවැනි ක්‍රියාකාරකමකට දායක වන කිසියම් ක්‍රියාකාරකමක්; හෝ<br>ආ) (1) වන උප වගන්තියෙහි සඳහන් යම් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදනයක් ඔහු හෝ ඇය සපයා ගන්නා මූලාශ්‍රය;<br>පිළිබඳව තොරතුරු සැපයීමට අසමත් නොවිය යුතුවාක් හෝ එම තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.<br><br>5. කිසියම් මත්ස්‍යයෙකුගේ මරණයට හේතුව හෝ එම මත්ස්‍යයාට තුවාල සිදු වීමට හේතුව සඳහන් කරමින් 158 වන වගන්තියට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තෙකු විසින් ලිඛිතව දෙන ලද සහතිකයක්, මේ වගන්තියට එරෙහි වරදක් සඳහා වන යම් පටිපාටියක දී, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එම කාරණය සම්බන්ධයෙන් වූ බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.<br><br>6. (1), (3) හෝ (4) යන උප වගන්තිවලට පටහැනිව කටයුතු කරන යම් |

| | |
|---|---|
| | තැනැත්තෙකු බරපතල වරදක් සිදු කරන අතර වරදට වරදකරු වූ විට, III වන උපලේඛනය යටතේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. තවද, මේ වගන්තිය යටතේ අත්අඩංගුවට ගන්නා ලද සියලුම මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන රාජසන්තක කළ යුතු අතර එවැනි මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන ඇල්ලීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරන ලද ඕනෑම යාත්‍රාවක් හෝ වාහනයක්, මේ පනත යටතේ විධිවිධාන සලසනු ලබන හෝ නියම කළ හැකි වෙනත් යම් දඩයකට අමතරව, රාජසන්තක කළ හැකි ය. |
| **පතුලේ අදින ට්‍රෝල් දැල් දමා මසුන් ඇල්ලීමේ නිරත වීම තහනම් කිරීම**<br><br>**84** වන වගන්තිය | 1. එන්ජින් මගින් හෝ යාන්ත්‍රිකව බල ගැන්වූ පතුලේ අදින ට්‍රෝල් දැල් ධීවර යාත්‍රා මගින් තටු දෙකක් සහිත හෝ රහිත දැල් භාවිතය ඇතුළුව හෝ දැල්වල නිදහස් දෙකෙළවර සිරස් අතට රිටි යොදා ගනිමින් ඇදගෙන යන පතුලේ අදින ට්‍රෝල් දැල් භාවිතා කිරීම තහනම් වේ.<br><br>2. කිසිදු තැනැත්තෙකු විසින්, ශ්‍රී ලංකා ජල තීරයෙහි පතුලේ අදින ට්‍රෝල් දැල් භාවිතයෙන් ධීවර කටයුතුවල නිරතවීම හෝ වෙනත් තැනැත්තෙකු ඒකී කාර්යෙහි නිරත වීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය.<br><br>3. ශ්‍රී ලංකා ජල තීරයෙහි ධීවර කටයුතු සිදු කිරීමෙහි කාර්යය සඳහා, පතුලේ අදින ට්‍රෝල් දැල් කිසිවක් භාවිතා කිරීම, සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිලදී ගැනීම හෝ විකිණීම නොකළ යුතු ය.<br><br>4. ශ්‍රී ලංකා ජල තීරයෙහි එන්ජින් මගින් හෝ යාන්ත්‍රිකව බල ගැන්වූ ධීවර යාත්‍රා මගින් ඇදගෙන යන පතුලේ අදින ට්‍රෝල් දැල් මගින් සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා මේ පනතේ III වන කොටස යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසිදු බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය .<br><br>5. (1) සහ (3) වන උප වගන්තින්හි කුමක් සඳහන් වුවද, සහ ඇතැම් වෙරළබඩ ප්‍රජාව විෂයයෙහි පවත්නා ඉහළ සමාජ ආර්ථික යැපීම සහ පතුලේ අදින ට්‍රෝල් දැල් මගින් සිදු කරන ඉස්සන් ඇල්ලීමේ ධීවර කර්මාන්තය (*Penaeoidea* family) මත ඇතැම් කලාපවල ජීවන යැපුම සඳහා එම කර්මාන්තය යොදා ගැනීම කරනකොට ගෙන, පහත කොන්දේසි:<br>අ) සමස්ත දිග මීටර් 35 වඩා වැඩි නොවන5ළදේශීය යාත්‍රා මගින් ධීවර කටයුතු සිදු කිරීම;<br><br>ආ) ධීවර නියෝගයන්හි මෙහෙයුම් ප්‍රදේශය නියම කළ යුතුවීම ;<br><br>ඇ) දැනට නිකුත් කර ඇති බලපත්‍ර පමණක් අලුත් කල යුතු අතර අලුත් බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු නොකිරීම<br><br>සපුරා ඇති කල්හි, මෙම ආම්පන්න භාවිතයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවසර ලබා දිය හැකි ය.<br><br>6. ට්‍රෝල් දැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම් සිදු කළ හැකි ධීවර භූමි නිශ්චය කිරීම සහ ජාතික ජලජ සම්පත්,පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ (NARA) නිර්දේශ මත මෘදු ට්‍රෝල් ධීවර ආම්පන්න මෙහෙයුම් පාරම්පරික ධීවරයින්ට ලබා දීමට සහ මෙහෙයුම් කරනු ලබන කාල සීමා සහ ට්‍රෝල් දැල් භාවිතයෙන් ධීවර මෙහෙයුම් සිදු |

| | |
|---|---|
| | කිරීම සඳහා වූ වෙනත් යම් අවශ්‍යතාවයන් තීරණය කිරීමට අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය.<br><br>7. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන හෝ ඒවාට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු, බරපතල වරදක් සිදුකරන අතර, ලඝු නඩු විභාගයකින් අනතුරුව එම වරදට වරදකරු වූ විට, III වන උපලේඛනයෙහි දණ්ඩනයට යටත් විය යුතු ය. |
| | **VI වන කොටස- සංරක්ෂණ ක්‍රියාමාර්ග** |
| **සමුද්‍ර පරිසර පද්ධතීන්හි පරිසර දූෂණය පාලනය කිරීම**<br><br>**85 වන වගන්තිය** | 1. කිසිදු තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ මත්ස්‍ය හා ජලජ සම්පත්වලට තර්ජනය වන ආකාරයට දූෂක ද්‍රව්‍යයක් ,අපද්‍රව්‍ය හෝ බාහිර ද්‍රව්‍යයක් සෘජුව හෝ වක්‍රව ශ්‍රී ලංකා ජල තීරයට බැහැර නොකළ යුතු ය.<br><br>2. කිසිදු තැනැත්තෙකු විසින්, මත්ස්‍ය හා ජලජ සම්පත් විනාශ කරන ආකාරයෙන් ශ්‍රී ලංකා ජල තීරයේ පිරවීම් හෝ ගොඩකිරීම් සිදු නොකළ යුතු ය.<br><br>3. කිසිදු තැනැත්තෙකු විසින්, වෙරළ තීරයෙහි හෝ ශ්‍රී ලංකා ජල තීරයේ වැවෙන කඩොලාන පරිසර පද්ධති ඉවත් කිරීම, කපා දැමීම හෝ වෙනස් කිරීමේ ක්‍රියාවන්හි නිරත නොවිය යුතුය.<br><br>4. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට යාබද වෙරළ තීරයේ මත්ස්‍ය විශේෂවල සංරක්ෂණයට තර්ජනයක් වන කිසිදු ක්‍රියාකාරකමක් කිසිදු තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.එසේ වුවද,කිසිදු අහිතකර බලපෑමක් ඇති නොවන යම් ක්‍රියාකාරකමක් සඳහා අනුගමනය කළ යුතු කොන්දේසි ඇතුළත්වන බලපත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.<br><br>5. වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද,, මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර එම වරදට වරදකරුවකු වූ විට, III වන උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| **අතහැර දැමූ, නැතිවූ හෝ ඉවත දැමූ ධීවර ආම්පන්න ආපසු ලබා ගැනීම**<br><br>**86 වන වගන්තිය** | 1. මෙම වගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති ක්‍රියාමාර්ග, මෙම පනතේ 3 වන වගන්තියේ (ඊ) අයිතමයෙහි දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීම පිණිස දායක විය යුතු ය.<br><br>2. ධීවර ආම්පන්න, නැංගුරම් සහ අනෙකුත් දෑ මුහුදෙහි විසිකර දැමීම සහ මුහුදෙහි හෝ මුහුදු පත්ලෙහි ධීවර දැල් සහ උපකරණ අත්හැර දැමීම තහනම් වන්නේ ය.<br><br>3. තම යාත්‍රාවෙහි තිබී මත්ස්‍ය ඒකරාශි උපකරණ (FAD) හෝ කරමල් දැල් නැතිවී තිබීමකදී පහත සඳහන් තොරතුරු ලබා දීම හරහා එසේ නැති වූ දිස්ත්‍රික්කයේ බලයලත් නිලධාරියා වෙත ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති විසින් වාර්තා කළ යුතු ය. |

| | |
|---|---|
| | අ) නැති වූ කරමල් දැල්වල හෝ මත්ස්‍ය ඒකරාශි උපකරණවල (FAD) වර්ගය සහ හඳුනා ගැනීමේ අංකය; සහ,<br>ආ) කරමල් දැල් හෝ මත්ස්‍ය ඒකරාශි උපකරණ (FAD) නැති වූ වේලාව සහ ස්ථාන පිහිටුම.<br><br>4. නැතිවූ, අතහැර දැමූ, හෝ ඉවත දැමූ ධීවර ආම්පන්න සඳහා ඒවාට කෙරෙන විකල්ප ප්‍රතිචක්‍රීකරණය කිරීම් ඇතුළුව අනෙකුත් උපකරණ මුහුදෙන් ආපසු ලබා ගැනීමට ක්‍රියා කරන හෝ ඒ සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරන ධීවර කම්වු වෙත ත්‍යාගයක් ප්‍රදානය කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තීරණය කළ හැකි ය.<br><br>5. (2) වන උප වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර වරදකරු වූ විට III උපලේඛනයෙහි දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතුය |
| **අවකාශීය වසා දැමීම්, විවෘත සහ සංවෘත වාර**<br><br>**87** වන වගන්තිය | 1. අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසා, ජාතික ජලජ සම්පත්, පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) විසින් ලබා දී ඇති හොඳම විද්‍යාත්මක සාක්ෂි පදනම මත පදනම්ව, මත්ස්‍ය විශේෂවල ගහනය ප්‍රතිසාධනය කෙරෙහි දායක වීමේ අරමුණින් මත්ස්‍ය පැටවුන් සහ / හෝ සමුද්‍රීය සම්පත්වලට අයත් මත්ස්‍ය බිත්තර රාශි සමූහන ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, අදාළ ධීවර කටයුතු කරගෙන යාම පිණිස හෝ කිසියම් නිශ්චිත ප්‍රදේශයක යම් ධීවර ආම්පන්න සහ ක්‍රම භාවිතය සීමා කිරීම පිණිස සංවෘත ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කළ හැකි ය.<br><br>2. (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වුවද, තෙල් කාන්දුවක් හෝ වෙනත් ආකාරයක අනතුරුදායක අපද්‍රව්‍ය මුදාහැරීමක් හෝ හඳුන්වාදීමක් හෝ ධීවර කර්මාන්තයට බලපාන සමුද්‍ර ව්‍යසනයක් වැනි හදිසි අවස්ථාවකදී, අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසා ධිවර මෙහෙයුම් සහ ධිවර මෙහෙයුම් සම්බන්ධ කටයුතු සඳහා තහනම් ප්‍රදේශයක් ප්‍රකාශ කළ හැකි ය.<br><br>3. (1) වන උප වගන්තිය යටතේ සඳහන් දැන්වීමෙහි පහත සඳහන් තොරතුරු:<br>අ) වසා දැමීමේ අරමුණ;<br>ආ) ප්‍රදේශයේ භූගෝලීය සමෝච්ඡ රේඛා;<br>ඇ) වසා දැමීමේ කාල සීමාව;<br>ඈ) නිශ්චිත ආම්පන්න මත කෙරෙන සීමා කිරීම්;<br>ඉ) පාලන සහ අධීක්ෂණ විධිවිධාන; සහ,<br>ඊ) ක්‍රියාමාර්ගය පිළබඳ විද්‍යාත්මක නැවත ඇගයීම.<br>අන්තර්ගත විය යුතු ය.<br><br>4.මත්ස්‍ය ගහන ප්‍රතිසාධනය පිණිස කෘත්‍රිම ගල්පර භාවිතය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සිය අවසරය දිය හැකි ය. (1) සහ (2) යන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.<br><br>5. (1) හෝ (3) වන උපවගන්තිවල දක්වා ඇති බැඳීම්වලට යටත්ව ධීවර යාත්‍රා සහ ධීවරයින්, යථා පරිදි එම සංවෘත ප්‍රදේශයේ හෝ කෘත්‍රිම ගල්පර තුළ ධීවර මෙහෙයුම් සිදු නොකළ යුතු ය.<br><br>6. අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විමසා, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා) විසින් ලබා දී ඇති හොඳම විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, ශ්‍රී ලංකා ජල තීරයෙහි ඇතැම් මත්ස්‍ය විශේෂ ඇල්ලීමේ වාර ප්‍රකාශයට පත් කළ හැකි ය. ධීවර යාත්‍රා සහ ධීවරයින් එබඳු මසුන් ඇල්ලීමේ වාරයකට පෙර හෝ පසුව ධීවර |

| | |
|---|---|
| | මෙහෙයුම් සිදු නොකළ යුතු ය.<br>7.වසා දැමූ ප්‍රදේශ, කෘත්‍රිම ගල්පර සහ ධීවර මෙහෙයුම් සිදු කරන කාලය පිළිබඳව ශ්‍රී ලංකාවේ දිනපතා පළවන පුවත්පත් තුනක සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා මාධ්‍යවලින් හෝ වෙනත් යම් විද්‍යුත් සංනිවේදන මාධ්‍යයකින් ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව, ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රය මගින් කෙරෙන දැනුම් දීමකින් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ සඳහා නිසි ප්‍රසිද්ධ දැනුම්දීමක් ලබා දිය යුතු ය.<br><br>8 . (4) හෝ (5) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර වරදකරු වූ විට III වන උපලේඛනයෙහි දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතුය. |
| **ධීවර රක්ෂිතය**<br><br>**88 වන වගන්තිය** | 1. අමාත්‍යවරයා විසින් , අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත සහ වන ජීවී විෂය භාර අමාත්‍යවරයා විමසා සහ යම් ප්‍රදේශයක් සැලකිල්ලට ගනිමින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පහත දැක්වෙන පරිදි කටයුතු කිරීමට විශේෂ ක්‍රියාමාර්ග අවශ්‍ය වෙතැයි තමා සලකන අවස්ථාවේදී ,<br><br>අ) ස්වාභාවික අභිජනන භූමි සහ මත්ස්‍ය හා ජලජ සම්පත් වාසභූමි ඇතුළුව සමුද්‍රීය පාරිසරික තත්ත්වය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීමට;<br><br>ආ) මත්ස්‍ය හා ජලජ සම්පත් සුදුසු පරිදි යථාවත්කරණය හා ප්‍රතිස්ථාපනය කිරීමට;<br><br>ඇ) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාවේ වෙනත් නීති යටතේ වඳවීමේ තර්ජනයට ලක්ව ඇතැයි ප්‍රකාශයට පත් කර ඇති මත්ස්‍ය විශේෂ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීමට;<br><br>ඈ) විද්‍යාත්මක පර්යේෂණ ,වෙනත් අධ්‍යයන ප්‍රවර්ධනය කිරීමට; හෝ<br>ඉ) ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය සඳහා පරිසර පද්ධති ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීමට<br>ශ්‍රී ලංකා ජල තීරයට අයත් යම් ප්‍රදේශයක් හෝ ඊට යාබද ඕනෑම භූමියක්,ධීවර රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.<br><br>1. (1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයාට:<br>අ) ධීවර රක්ෂිතය තුළ නිශ්චිතව සඳහන් ක්‍රියාකාරකම් හෝ මෙහෙයුම් සිදුවීම් වැළැක්වීම තහනම් කිරීම; 54<br>ආ) යම් නිශ්චිත තැනැත්තන්ට හෝ යම් කණ්ඩායමකට අයත් තැනැත්තන්ට ධීවර රක්ෂිතයට ඇතුළුවීමේ තහනම් කිරීම;<br>ඇ) ධීවර රක්ෂිතය තුළ යම් ක්‍රියාකාරකම් හෝ මෙහෙයුම් සිදු කළ යුතු කොන්දේසි නිශ්චිතව සඳහන් කිරීම;<br>ඈ) (3) වන උපවගන්තියට යටත්ව, (2) වන උප වගන්තියේ (අ), (ආ) ,(ඇ) අයිතම වල දක්වා ඇති තහනම් කිරීම් හෝ කොන්දේසි උල්ලංඝනය කිරීම් සඳහා දණ්ඩනය නියම කිරීම<br><br>සිදුකළ හැකි ය.<br>2. ශ්‍රී ලංකාවේ දිනපතා පුවත්පත් තුනක සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා මාධ්‍යවලින් හෝ වෙනත් යම් විද්‍යුත් සංනිවේදන මාධ්‍යයකින් ප්‍රකාශයට පත් කිරීම ඇතුළුව, ගැසට් පත්‍රය මගින් කෙරෙන අදාළ දැනුම් දීමකින් හරහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර සංචිත පිළිබඳව නිසි ප්‍රසිද්ධ දැනුම්දීමක් ලබා දිය යුතු ය.<br><br>**3.** (2) වන උපවගන්තියේ (අ), (ආ),(ඇ) අයිතමයන්ට අනුව නිශ්චිතව |

| | |
|---|---|
| | දක්වා ඇති තහනමක් හෝ කොන්දේසියක් කඩ කරන යම් තැනැත්තෙකු වරදකට වරදක් සිදු කරන අතර වරදකරුවකු වූ විට, III වන උපලේඛනයේ දැක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| **ආරක්ෂිත/තහනම් මත්ස්‍ය විශේෂ**<br><br>**89** වන වගන්තිය | 1. කිසිදු තැනැත්තෙකු ශ්‍රී ලංකා ජල තීරය තුළ ආරක්ෂිත /තහනම් මත්ස්‍ය විශේෂ ලෙස ප්‍රකාශයට පත් කර ඇති යම් මත්ස්‍ය හෝ ජලජ සම්පතක් හෝ එහි නිෂ්පාදන කිසිවක් ඇල්ලීම, ගැනීම, ගොඩබිමට ගෙන ඒම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම, විකිණීම, ගනුදෙනු කිරීම, ප්‍රවාහනය කිරීම, ලබා ගැනීම, මිලදී ගැනීම හෝ සන්තකයේ තබා ගැනීම යන කාර්යයන්හි නිරත නොවිය යුතු ය.<br><br>2. (1) වන උපවගන්තියෙහි කාර්යය සඳහා, මේ පනත ප්‍රකාරව ආරක්ෂිත/තහනම් විශේෂ ලෙස ප්‍රකාශිත මත්ස්‍ය විශේෂ නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.<br><br>3. අමාත්‍යවරයා විසින් යම් මත්ස්‍ය හෝ ජලජ සම්පත් විශේෂ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ශ්‍රී ලංකාව ද පාර්ශවකරුවෙකු වන කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයේ සහ ජාත්‍යන්තර ගිවිසුම්වල ආරක්ෂණ ක්‍රියාමාර්ගවලට යටත්ව සහ මේ පනතේ අරමුණු සහ මූලධර්මවලට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, ආරක්ෂිත / තහනම් මත්ස්‍ය විශේෂ, මත්ස්‍ය විශේෂ හෝ ජලජ සම්පත් ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.<br>4. ආරක්ෂිත/තහනම් මත්ස්‍ය විශේෂයන්ට අදාළව සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග :<br>අ) ධීවර කළමනාකරණ සැලැස්මකට;<br>ආ) නියම කරනු ලැබිය හැකි එබඳු යම් නියෝගයන්ට; සහ<br>ඇ) එසේ නොමැති නම්, මේ පනතට අනුකූලව.<br>ගනු ලැබිය යුතු ය.<br><br>5. (3) වන උපවගන්තිය ප්‍රකාරව කිසියම් අයිතමයක් රාජසන්තක කරනු ලැබුවහොත් හෝ තහනමට ගනු ලැබුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන, එසේ රාජසන්තක කරන ලද හෝ තහනමට ගත් අයිතමයේ ආදේශන වටිනාකම මෙන් තුන් ගුණයකට නොඅඩු මුදලක් හෝ 151 සහ 152 වන වගන්ති වලට අනුව අධිකරණයක් විසින් තීරණය කරනු ලබන යම් මුදලක් තැන්පත් කළහොත් මිස සහ තැන්පත් කරන තෙක්, අදාළ නඩු කටයුත්තෙහි කාල සීමාව තුළ එම අයිතමය කිසිදු අධිකරණයක් විසින් නිදහස් නොකළ යුතු ය.<br><br><br>6. (1) වන උපවගන්තියෙහි විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදක් සිදු කරන අතර වරදකරුවකු වූ විට III වන උප ලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| | **VII වන කොටස- විද්‍යාත්මක පර්යේෂණ සහ දත්ත රැස් කිරීම** |
| **ධීවර යාත්‍රා මගින් කෙරෙන විද්‍යාත්මක පර්යේෂණ**<br><br>**90** වන වගන්තිය | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විදේශීය කටයුතු අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබූ නිලධරයකුගෙන් විමසා පහත සඳහන් කාර්යය සඳහා, විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහනක් හෝ ජාතික ජලජ සම්පත් සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) විසින් වලංගු කරන ලද පර්යේෂණාත්මක ධීවර කටයුත්තක් යටතේ විදේශීය ධීවර යාත්‍රා ඇතුළු ධීවර යාත්‍රා මගින් විද්‍යාත්මක පර්යේෂණ සඳහා මසුන් ඇල්ලීම සිදු කිරීම |

| | |
|---|---|
| | පිණිස අවසර දිය හැකි ය. අනෙකුත් කරුණු අතර;<br><br>අ) කුඩා මත්ස්‍යා පැටවුන් ඇතුළුව අනවශ්‍යා මසුන් ඇල්ලීම් වැළැක්වීම, අවම කිරීම සහ ඉවත් කිරීම සඳහා ධීවර ආම්පන්න, ධීවර ක්‍රම සහ යම් ඉවතලෑම් පිළිබඳව ගවේෂණය කිරීම ;<br><br>ආ) පරිසර පද්ධතියට සහ සංවේදී වාසස්ථානවලට අඩු බලපෑමක් සහිත ධීවර ආම්පන්න සහ ධීවර ක්‍රම පිළිබඳව තක්සේරු කිරීම ;<br><br>ඇ) වාණිජ අරමුණු සඳහා නියාමනය නොකළ මත්ස්‍ය විශේෂ මහ මුහුදේ දී අල්ලා ගැනීම, හෝ ;<br><br>ඈ) වඩා හොඳ ධීවර කළමනාකරණය විධිමත් කිරීම , සංරක්ෂණය සංවර්ධනයට සහ තිරසාර ලෙස යොදා ගැනීම කටයුතු සඳහා දායක වීමේ අරමුණ ඇතිව විද්‍යාත්මක දත්ත රැස් කිරීම හෝ නව ක්‍රම පරීක්ෂා කර බැලීම පෙරදැරි කරගත් වෙනත් යම් විද්‍යාත්මක ව්‍යාපෘති.<br><br>ඉ ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (1) වන උප වගන්තිය යටතේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා මසුන් ඇල්ලීම සිදු කරන ධීවර යාත්‍රා සම්බන්ධයෙන්, ඊට අදාළ ව්‍යාපෘතිය සඳහා ගතවන කාල සීමාව තුළ, මෙම පනත යටතේ පහත සඳහන් කවර හෝ වගන්තියක් යොදා ගනු ලැබීමෙන් නිදහස් කිරීම් ප්‍රදානය කළ හැකි ය :<br><br>අ) (40 ) වන වගන්තිය යටතේ දැක්වෙන ධීවර බලපත්‍ර ;<br>ආ)(75) වන වගන්තිය යටතේ දැක්වෙන ධීවර කළමනාකරණ සැලසුම්;<br>ඇ)(80), (82) සහ (84) යන වගන්ති යටතේ දැක්වෙන ධීවර ආම්පන්න සහ ධීවර ක්‍රම ;<br>ඈ)(87 ) වන වගන්තිය යටතේ දැක්වෙන අවකාශීය / තාවකාලික වසා දැමීම් ;<br>ඉ) (88 ) වන වගන්තිය යටතේ දැක්වෙන ධීවර සංචිත, හෝ;<br>ඊ) (89) වගන්තිය යටතේ දැක්වෙන ආරක්ෂිත/තහනම් මත්ස්‍ය විශේෂ<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, විද්‍යාත්මක පර්යේෂණ සඳහා මසුන් ඇල්ලීමේ යෙදී සිටින ධීවරයින්ට පහසුකම් සැලසීම සඳහා යම් ප්‍රදායක ආයතනවලින්, මෙම පනතේ (107) වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අරමුදල යටතේ අවසර දෙනු නොලබන, යම් මූල්‍ය ආධාර කිසිවක්, එබඳු පර්යේෂණ වැඩසටහනක ප්‍රතිඵල ධීවර කළමනාකරණය, විධිමත් කිරීම , සංරක්ෂණය , සංවර්ධනය සහ තිරසාර ලෙස යොදා ගැනීම හෝ වෙරළබඩ ප්‍රජා සමූහවලට සැලකිය යුතු ප්‍රතිලාභයක් අත්කර දෙන්නේ නම්, ලබා ගත හැකි ය.<br><br>3. (1) වන උප වගන්තියට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, එම වරදට වරදකරුවකු වූ විට III වන උප ලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| **විදේශීය පර්යේෂණ සංවිධානයක් හෝ වෙනත් රටක් විසින් කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ**<br><br>**91 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකා ජල තීරයෙහි විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමට අදහස් කරන විදේශීය පර්යේෂණ සංවිධානයක ප්‍රධානියෙකු හෝ වෙනත් රටක් විසින්, එම සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කිරීමට අපේක්ෂිත දිනට මාස තුනකට (3) කට නොඅඩු කාල සීමාවකට පෙර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. පහත සඳහන් කරුණු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් සහිත පර්යේෂණ සැලැස්මක් එවැනි දැනුම්දීමකට ඇතුළත් විය යුතු ය:<br><br>අ) ව්‍යාපෘතියේ ස්වභාවය සහ පරමාර්ථ; |

| | | |
|---|---|---|
| | | ආ) යාත්‍රාවේ නම, ටොන් ප්‍රමාණය, වර්ගය සහ පන්තිය සහ අදාළ විද්‍යාත්මක උපකරණ පිළිබඳ විස්තරයක් ඇතුළුව භාවිතා කරනු ලබන ක්‍රමය සහ විධිය;<br>ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත නිශ්චිත භූගෝලීය ප්‍රදේශ;<br><br>ඈ) සුදුසු පරිදි, යාත්‍රාව (යාත්‍රා) පැමිණීමට සහ අවසාන වශයෙන් පිටත්වීමට හෝ උපකරණ යෙදවීමට සහ ඉවත් කිරීමට අපේක්ෂිත දිනය;<br><br>ඉ) ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය දක්වන ආයතනයේ නම, එහි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ එය භාර තැනැත්තාගේ නම; සහ,<br><br>ඊ) අදාළ ව්‍යාපෘතියට සහභාගි වීමට හෝ එය නියෝජනය කිරීමට ශ්‍රී ලංකාවට හැකි වෙතැයි සැලකෙන ප්‍රමාණය.<br><br>2. (1) වන උපවගන්තියේ සඳහන් දැනුම්දීම ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යෝජිත විද්‍යාත්මක පර්යේෂණ සැලැස්ම ඇගයීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) වෙතින් විමසිය යුතු අතර, අදාළ වන අවස්ථාවල දී, උපදේශක සභාවට සහ සම්බන්ධීකරණ කමිටුව (කමිටු) වෙත ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.<br><br>3. විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සහ ආරක්ෂක අමාත්‍යාංශයෙන් විමසා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ලබා දෙන නිර්දේශ මත අමාත්‍යවරයා විසින් පහත සඳහන් කොන්දේසි ;<br><br>අ) සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ට පාරිශ්‍රමික කිසිවක් ගෙවීමකින් තොරව සහ එම ව්‍යාපෘතියේ පිරිවැය කෙරෙහි දායක වීම සඳහා වූ බැඳීම් කිසිවකින් තොරව, එබඳු සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියකට, විශේෂයෙන්, පර්යේෂණ යාත්‍රාවන්හි සිට හෝ විද්‍යාත්මක පර්යේෂණ ස්ථාපන නිර්මිතයන්හි සිට කෙරෙන යම් ව්‍යාපෘතියකට, එවැන්නක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි කල්හි, සහභාගි වීම සඳහා හෝ එය නියෝජනය කිරීම සඳහා, එසේ කිරීම අපේක්ෂා කරන්නේ නම්, ශ්‍රී ලංකාවට ඇති අයිතිය;<br>57<br>ආ) විදේශ පර්යේෂණ සංවිධානයකට හෝ වෙනත් රටකට ප්‍රායෝගික ලෙස හැකි ඉක්මනින්, අදාළ මූලික පර්යේෂණ වාර්තා සහ එම පර්යේෂණය අවසන් වූ පසු එහි අවසාන ප්‍රතිඵල සහ නිගමන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සැපයීම පිණිස වූ බැඳීම;<br><br>ඇ) සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියෙන් ලබාගත් සියලු දත්ත සහ නියැදි වෙත, එවැනි දත්තවල අගැයුමක් ද සමග, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ප්‍රවේශය සලසා දීම සඳහා විදේශ පර්යේෂණ සංවිධානයකට හෝ වෙනත් රාජ්‍යයකට ඇති වගකීම;<br><br>ඈ) පර්යේෂණවල ප්‍රතිඵල ප්‍රායෝගික ලෙස හැකි ඉක්මනින් සුදුසු ජාතික හෝ ජාත්‍යන්තර විකාශන මාර්ග හරහා ජාත්‍යන්තරව ලබා ගැනීමට ඉඩ සැලැස්විය යුතු ය;<br><br>ඉ) පර්යේෂණ වැඩසටහනෙහි සිදු වන කිසියම් ප්‍රධාන වෙනසක් |

| | |
|---|---|
| | පිළිබඳව වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දීම සඳහා විදේශ පර්යේෂණ සංවිධානයකට හෝ වෙනත් රාජ්‍යයකට ඇති බැඳීම; සහ,<br><br>ඊ) වෙනත් ආකාරයකින් එකඟ වන්නේ නම් මිස, පර්යේෂණය අවසන් වූ පසු විද්‍යාත්මක පර්යේෂණ ස්ථාපන නිර්මිතයන් හෝ උපකරණ ඉවත් කිරීම<br><br>සපුරනු ලැබුවහොත් යෝජිත විද්‍යාත්මක පර්යේෂණ සැලැස්ම පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් තීරණය කළ හැකිය.<br><br>4. (3) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ඔහු විසින් එම ප්‍රතික්ෂේප කිරීමට හේතු, අදාළ අයදුම්පත ලද දින සිට මාස හතරක (4) උපරිම කාලයක් ඇතුළත අදාළ විදේශ පර්යේෂණ සංවිධානයේ හෝ රාජ්‍යයේ නියෝජිතයාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.<br><br>5. (1) සහ / හෝ (4) යන උපවගන්තියට අනුකූලව මෙම කටයුතු සිදු කර නොමැති ශ්‍රී ලංකා මුහුදේ සිදුවෙමින් පවතින සමුද්‍ර විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාකාරකම් අත්හිටුවීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට තීරණය කළ හැකි අතර ඒ බව විදේශ පර්යේෂණ සංවිධානය හෝ අදාළ වෙනත් රාජ්‍යය වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.<br><br>6. (5) වන උපවගන්තියෙහි දක්වා ඇති එවැනි ක්‍රියාකාරකම් අත්හිටුවීමට තුඩු දුන් තත්ත්වය නියමිත කාල සීමාව තුළ නිවැරදි කර නොමැති අවස්ථාවක දී, අදාළ සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාකාරකම් අවලංගු කිරීම පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.<br><br>7. සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන අතරතුර දී අල්ලා ගනු ලබන මත්ස්‍ය හා සාගර සම්පත් විකිණීම හෝ විකිණීම සඳහා අර්පණය කිරීම තහනම් කළ යුතු ය.<br><br>8. (1), (3) සහ (5) යන උප වගන්තිවල විධිවිධානවලට පටහැනිව කටයුතු කරනු ලබන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු වූ විට, III වන උපලේඛනයේ දණ්ඩනයට යටත් විය යුතු ය.<br>58<br>9. අමාත්‍යවරයා විසින් මේ පනතේ පරමාර්ථ සහ අරමුණුවලට අනුකූලව සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ කටයුතු නියාමනය කිරීම සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ (නාරා) නිර්දේශ මත නියෝග සකස් කළ හැකිය. |
| **ධීවර දත්ත රැස් කිරීමේ වැඩසටහන්**<br><br>**92 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ (නාරා) උපදෙස් විමසා, ධීවර අංශය විෂයයෙහි ජීව විද්‍යාත්මක, පාරිසරික, තාක්ෂණික සහ සමාජ ආර්ථික දත්ත රැස් කිරීම පිළිබඳ වැඩසටහන් ('දත්ත රැස් කිරීමේ වැඩසටහන්') සඳහා, මේ පනතේ (අ) අයිතමයේ (1) වන උප වගන්තියේ (3 ) වන වගන්තියේ දක්වා ඇති පරමාර්ථයට දායක වන තොරතුරු අවශ්‍යතා සලකා බලමින්, ලිඛිතව අවසර ලබාදිය හැකි ය.<br><br>2. දත්ත රැස් කිරීමේ වැඩසටහන්හි දී, රැස් කළ යුතු දත්ත, එසේ කළ යුතු ක්‍රම, එවැනි දත්ත වාර්තා කිරීම සඳහා සම්මත ආකෘති පත්‍රය සහ වෙනත් |

| | |
|---|---|
| | අදාළ තොරතුරු සඳහන් විය යුතු ය.<br><br>3. දත්ත රැස් කිරීමේ වැඩසටහන්වලට, අනෙකුත් කරුණු අතර, පහත දැක්වෙන ක්‍රියාකාරකම්;<br>අ) මුහුදේ සිදුකරන සමීක්ෂණ;<br>ආ) පර්යේෂණාත්මක ධීවර කර්මාන්තය;<br>ඇ) යාත්‍රාවෙහි විද්‍යාත්මක නිරීක්ෂකයින් සිටීම;<br>ඈ) මසුන් ගොඩබාන ස්ථානවලදී මත්ස්‍ය අස්වනු නියැදි පරීක්ෂාව; සහ,<br>ඉ) ධීවර කර්මාන්තය මත රඳා පවත්නා දත්ත<br>ඇතුළත් විය යුතු ය.<br><br>4. ධීවර යාත්‍රාවල විද්‍යාත්මක නිරීක්ෂකයන් රැගෙන යන අවස්ථාවල දී, යාත්‍රාධිපති හෝ ක්‍රියාකරු විසින් නිරීක්ෂකයා සමග, (54) සහ (114) යන වගන්තිවල දක්වා ඇති වෙනත් යම් කොන්දේසි යටතේ කටයුතු කරමින්, අදාළ වැඩසටහන අවසන් වන තෙක් ඔහුට හෝ ඇයට සිය රාජකාරි ඉටු කිරීමට ඉඩ සලසනු පිණිස සහයෝගිතාවය පවත්වා ගැනෙන බවට වග බලා ගත යුතු ය.<br><br>5. දත්ත රැස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පරිත්‍යාගශීලී ආයතනවලින් මූල්‍ය ආධාර ලබා ගත හැකි ය.<br><br>6. (4 ) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරනු ලබන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර වරදකරුවකු වූ විට, III වන උප ලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| **දත්ත රැස් කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ සත්‍යාපනය කිරීම**<br><br>**93 වන වගන්තිය** | 1. (2) වන උප වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති කරුණු ඇතුළුව, මෙම පනතේ විෂය පථය යටතේ ක්‍රියාකාරකම් සිදු කරන යම් තැනැත්තෙකුට, මෙම පනතේ කාර්යයන් සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධාරියෙකු, විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකාරයකට සහ ආකෘතියකට අනුව කරුණු වාර්තා කර ගැනීමට, පවත්වා ගෙන යාමට සහ සම්ප්‍රේෂණය කිරීමට නියම කර සිටිය හැකි ය :<br><br>අ) මසුන් ඇල්ලීම, ගොඩබෑම, ගබඩා කිරීම, ආහාර සුරක්ෂිතතාව, සැකසීම, මිලදී ගැනීම, විකිණීම, අපනයනය, ආනයනය, ප්‍රතිඅපනයනය සහ වෙනත් අදාළ ගනුදෙනු හා සම්බන්ධ දත්ත සහ තොරතුරු ඇතුළු අදාළ සියලු දත්ත සහ තොරතුරු ;<br><br>ආ) මෙම පනතේ විෂය පථය ඇතුළත ගැනෙන ක්‍රියාකාරකම්වලට අදාළ සියලුම ලේඛන, සටහන් තබා ගැනීම්, ගිණුම් වාර්තා, වාර්තා සහ වෙනත් තොරතුරු; සහ<br>ඇ) නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දත්ත, තොරතුරු සහ ලිපි ලේඛන.<br><br>2. පහත සඳහන් තැනැත්තන් විසින් මසුන් අල්ලා ගැනීමේ දත්ත වාර්තා කිරීමේ ලොග් පොත, එවැනි වෙනත් ගිණුම් සටහන් සහ ලේඛන නඩත්තු කළ යුතු අතර, මෙම පනත හෝ එහි ක්‍රියාත්මක කිරීමේ නියෝග යටතේ අවශ්‍ය විය හැකි දත්ත සහ තොරතුරු සම්ප්‍රේෂණය කළ යුතු ය : |

අ) මෙම පනත යටතේ නිකුත් කරන ලද හෝ ප්‍රදානය කර ඇති බලපත්‍ර දරන්නන් හෝ වෙනත් බලධාරීන් ;

ආ) මෙම පනත යටතේ බලපත්‍ර ලද යාත්‍රාවල හිමිකරුවන් හෝ ක්‍රියාකරුවන් ;

ඇ) මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන ලබා ගන්නා, මිලදී ගන්නා, ගබඩා කරන, ප්‍රවාහනය කරන, සකසන, අලෙවි කරන හෝ වෙනත් ආකාරයකින් බැහැර කරන යම් පරිශ්‍රයක හිමිකරුවන් සහ එම පරිශ්‍ර භාරව සිටින තැනැත්තන් ;

ඈ) මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන ලබා ගැනීමෙහි, මිලදී ගැනීමෙහි, ප්‍රවාහනය කිරීමෙහි, සැකසීමෙහි, ගබඩා කිරීමෙහි අලෙවි කිරීමෙහි හෝ බැහැර කිරීමෙහි නිරතව සිටින තැනැත්තන් ;

ඉ) මසුන් අල්ලා ගැනීමට යම් තැනැත්තන් හට හැකි වන අරමුණින් යුතුව යාත්‍රා කුලියට සපයන තැනැත්තන් ;

ඊ) විකිණීමේ අරමුණින් නොව වෙනත් ආකාරයකින් මසුන් ඇල්ලීමේ යෙදී සිටින තැනැත්තන් ;

උ) මෙම පනත යටතේ තම ක්‍රියාකාරකම්, යාත්‍රාව හෝ වෙනත් අයිතම කිසිවක් ලියාපදිංචි කිරීමට නියම කර ඇති තැනැත්තන්; සහ

ඌ) මෙම පනතේ විෂය පථය යටතේ ක්‍රියාකාරකම් කරගෙන යන වෙනත් තැනැත්තන් කිසිවෙකුට, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් එසේ කිරීම සඳහා, මෙම පනත යටතේ නියම කරනු ලැබිය හැකි ය.

3. (1) හෝ (2) යන උප වගන්ති යටතේ අවශ්‍ය වන්නා වූ ගිණුම් දත්ත, ලිපි ලේඛන හෝ තොරතුරු සත්‍යාපනය කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් :

අ) (1) වන උප වගන්තියෙහි විස්තර කර ඇති තොරතුරු විගණනය කරන ලෙස හෝ පරීක්ෂා කරන ලෙස නියම කළ හැකි ය ;

ආ) මෙම පනත යටතේ ක්‍රියාත්මක වන යම් යාත්‍රාවක්, සැකසුම් පිරියතක් හෝ වෙනත් අදාළ පහසුකම් සලසන ස්ථානයක් පිළිබඳව විගණනය කරන ලෙස හෝ පරීක්ෂා කරන ලෙස නියම කළ හැකි ය.

4. මෙම පනත යටතේ සටහන් කර සම්ප්‍රේෂණය කරනු ලබන යම් තොරතුරක් සත්‍ය ලෙසත්, සම්පූර්ණ ලෙසත් සහ නිවැරදි ලෙසත් සැලකිය යුතු ය.

5. යම් තැනැත්තෙකු:

අ) (1) වන උප වගන්තිය යටතේ නියම කර ඇති තොරතුරු සටහන් කිරීමට සහ සම්ප්‍රේෂණය කිරීමට තමාට නියම කර ඇති පරිදි, එසේ නොකර සිටී නම්, හෝ ;

| | |
|---|---|
| | ආ) මෙම පනත මගින් හෝ (2) වන උප වගන්තිය යටතේ නියම කර ඇති පරිදි, යම් ගිණුම් සහ වාර්තා තබා ගැනීමට සහ තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට අපොහොසත් වන්නේ නම්, හෝ ;<br><br>ඇ) (3) වන උප වගන්තිය යටතේ සිදු කරනු ලබන විගණනයක් හෝ පරීක්ෂණයක් සඳහා පහසුකම් සලසා නොදී, සහාය නොවී හෝ අදාළ නියමයන්ට අනුකූල නොවී කටයුතු කරන්නේ නම් ;<br><br>බරපතල වරදක් සිදු කරන්නේ ය. එසේකුදු වුවත්, එක් එක් උප වගන්තිය වෙන වෙනම වූ වරදක සංයුතිය ගන්නා අතර, එම වරදකට වරදකරු වීම මත III වන උප ලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු අතර එබඳු තැනැත්තෙකුට , මෙම පනත ප්‍රකාරව නිකුත් කරන ලද යම් අදාළ බලපත්‍රයක් හෝ ලියාපදිංචි කිරීමක් අත්හිටුවනු ලැබිය යුතු ය, එසේ නැතහොත්, අවලංගු කරනු ලැබිය යුතු ය. චූදිතයා ස්වභාවික පුද්ගලයෙකු නම්, ඔහු හෝ ඇය අදාළ වරදට වරදකරු වීම මත දණ්ඩණ / සිරදඬුවම් වලට යටත් විය යුතු අතර, චූදිතයා සංස්ථාගත ආයතනයක් හෝ පුද්ගල මණ්ඩලයක් නම් දඩයකට යටත් විය යුතු ය.<br><br>6. (4) වන උප වගන්තියට පටහැනිව සත්‍ය නොවන, සම්පූර්ණ සහ නිවැරදි නොවන දත්ත හෝ තොරතුරු සම්ප්‍රේෂණය කරන යම් තැනැත්තෙකු බරපතල වරදක් සිදු කරන අතර, එම විසින් දරනු ලබන, මෙම පනත ප්‍රකාරව නිකුත් කරන ලද යම් අදාළ බලපත්‍රයක් අත්හිටුවනු ලැබිය යුතු ය, එසේ නැතහොත්, අවලංගු කරනු ලැබිය යුතු ය. |
| | **VIII වන කොටස - මත්ස්‍ය ගුණාත්මකභාවය, ආහාර සුරක්ෂිතතාව සහ මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන වෙළඳාම** |
| **පොදු පරමාර්ථය සහ එය යොදා ගැනීම**<br><br>**94** වන වගන්තිය | 1. මෙම වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති ක්‍රියාමාර්ග, ධීවර නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ පරමාර්ථය ක්‍රියාවට නැංවීම සඳහාත්, මෙම පනතේ 3 (ග) වන වගන්තියේ දක්වා ඇති පරිදි පසු අස්වනු අලාභ අවම කර ගැනීම සඳහාත් දායක විය යුතු ය.<br><br>2. මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන මිනිස් පරිභෝජනය පිණිස හෝ නැවුම්, ශීතනය කළ, ටින් කළ ආකාරයෙන් හෝ යම් ආකාරයක සැකසූ හෝ සජීවී ස්වරූපයෙන් ඇමක් ලෙස භාවිතා කිරීම පිණිස මසුන් ඇල්ලීමෙහි, මාළු සැකසීමෙහි , අපනයනය කිරීමෙහි, ආනයනය කිරීමෙහි සහ ප්‍රති අපනයනය කිරීමෙහි නිරතව සිටින ඕනෑම තැනැත්තෙකුට මෙම වගන්තියෙහි විධිවිධාන අදාළ විය යුතු ය. |
| **මත්ස්‍ය ගුණාත්මකභාවය, ආහාර සෞඛ්‍යාරක්ෂිතාව ය සහ ආහාර සුරක්ෂිතතාව**<br><br>**95** වන වගන්තිය | 1. මසුන් ඇල්ලීමේ දීත්, අස්වනු නෙලීමේ දීත්, ධීවර යාත්‍රාවල සිට හැසිරවීමේ දීත් සහ ගබඩා කිරීම, යාත්‍රාවල සිට සැකසුම් කිරීම, මුහුදෙහි සහ ගොඩබිමෙහි ප්‍රවාහනය කිරීම, ගොඩබෑම, වෙන්දේසි කිරීම, ගොඩබිමෙහි සිට සැකසුම් කිරීම, ගබඩා කිරීම සහ තොග සහ සිල්ලර වශයෙන් බෙදා හැරීම ඇතුළුව සැපයුම් දාමය තුළ, ආහාර සුරක්ෂිතතාව සහ එම මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන මිනිස් පරිභෝජනයට සුදුසු බව සහතික කරනු පිණිස, නියමිත නියෝගවලට අනුකූලව, මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ සෞඛ්‍යාරක්ෂිතාවය තහවුරු කළ යුතු ය. |

| | |
|---|---|
| | 2. මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන සන්තකයේ තබා ගන්නා විටත්, ඒවා විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන විටත්, විකුණන විට සහ ප්‍රවාහනය කරන විටත්, එම නිෂ්පාදන, ඒවා මිලදී ගැනීම, විකිණීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම යන සෑම අදියරක දීම, ආහාරවල ගුණාත්මකභාවය පිළිබඳ නියමිත අවම අලෙවිකරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.<br><br>3. කිසිදු තැනැත්තෙකු, ව්‍යාජ කරන ලද, දූෂිත වූ හෝ යම් විෂ සහිත හෝ හානිකර ද්‍රව්‍ය හෝ ව්‍යාධිජනක ක්ෂුද්‍ර ජීවීන් අඩංගු සහ නීත්‍යානුකූල පරීක්ෂණ ප්‍රමිතීන් සපුරා නොමැති හෝ වෙනත් ආකාරයකින් මිනිස් සෞඛ්‍යයට අහිතකර වන මිනිස් පරිභෝජනය සඳහා අදහස් කරන මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන විකිණීම හෝ අපනයනය කිරීම නොකළ යුතු ය.<br><br>4. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>5. මත්ස්‍ය නිෂ්පාදන, මසුන් අල්ලා ගැනීමේ සිට ඒවා සිල්ලරට විකිණීමේ අදියර දක්වා ඊට කෙරෙන පරීක්ෂා කිරීම් ද ඇතුළුව එහි ගුණාත්මකභාවය හා ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය වන සියලු කොන්දේසි නිශ්චය කරනු පිණිස වූ නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **නීති විරෝධී ලෙස ලබාගත් ධීවර නිෂ්පාදන සන්තකයේ තබා ගැනීම සහ එහි වෙළඳාම කිරීම තහනම් කිරීම**<br><br>**96 වන වගන්තිය** | 1. කිසිදු තැනැත්තෙකු විසින්, මෙම පනතට සහ එහි ක්‍රියාත්මක කිරීමේ නියෝග කිසිවකට පටහැනිව ලබාගත් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන හෝ ජලජ සම්පත් මිලදී ගැනීම, විකිණීම, සන්තකයේ තබා ගැනීම, අපනයනය කිරීම හෝ වෙනත් ආකාරයකින් වෙළඳාම් කිරීම නොකළ යුතු ය.<br><br>2. කිසිදු තැනැත්තෙකු, නීති විරෝධී, වාර්තා නොකළ හෝ අවිධිමත් ලෙස මසුන් ඇල්ලීම හේතුවෙන් මූලාරම්භ වූ බවට යම් කළාපීය ධීවර කළමනාකරණ සංවිධානයක් විසින් කාණ්ඩගත කරන ලද හෝ ප්‍රකාශයට පත් කරන ලද මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රති අපනයනය කිරීම නොකළ යුතු ය.<br><br>3. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **ඇතැම් මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම**<br><br>**97 න**<br>**වගන්තිය** | 1. අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා ජල තීරයේ ධීවර සම්පත් ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, වෙළඳ කටයුතු භාර අමාත්‍යවරයාගේ ද උපදෙස් විමසා ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියමයක් මගින්, එම නියමයෙහි නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා ඕනෑම සජීවී මත්ස්‍ය විශේෂයන් හි සජීවී මත්ස්‍යයන්, මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටවු හෝ ඒවායින් පිළියෙළ කරන ලද නිෂ්පාදන කිසිවක් ශ්‍රී ලංකාවේ සිට අපනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව වෙත ආනයනය කිරීම විධිමත් කළ හැකි ය.<br><br>2. හදිසි අවස්ථාවලදී , මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය ,ආනයනය සහ ප්‍රති අපනයනය විධිමත් කිරීම සඳහා ධීවර කර්මාන්තයේ ආරක්ෂාව පිණිස නිවාරණ පියවර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලතල ඇත.<br><br>3. මෙම වගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, රේගු ආඥාපනතේ, වන |

| | |
|---|---|
| | සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥාපනතේ හෝ වෙනත් අදාළ පනත්වල දැක්වෙන විධිවිධානවල කොටසක් ලෙස ගොඩනැගී ඇති සේ සලකා ක්‍රියාත්මක වන අතර, එය, ඒ අනුව අදාළ විය යුතු ය. |
| **අන්වේෂණීය හැකියාව සහ මසුන් අල්ලා ගැනීමේ සහතිකය**<br><br>**98** වන වගන්තිය | 1. අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන, වෙළඳපොළේ විකුණනු ලබන හෝ වෙළඳපොළ වෙත අලෙවියට යවනු ලබන සියලු ධීවර නිෂ්පාදන, මසුන් අල්ලා ගැනීමේ සිට ඒවා සිල්ලරට විකිණීමේ අදියර දක්වා නිෂ්පාදනය කිරීම, සැකසුම් කිරීම සහ බෙදා හැරීම යන සෑම අදියරක දීම නියමිත රෙගුලාසිවලට අනුකූලව ලේබල් කිරීම මගින් හෝ වෙනත් ඊට ආබද්ධව එන ලියකියවිලි මගින්, පැහැදිලිව අන්වේෂණය කළ හැකි විය යුතු ය.<br><br>2. කිසිදු තැනැත්තෙකු, මෙම පනත ප්‍රකාරව නියමිත නියෝගවලට අනුකූලව අල්ලා ගන්නා ලද මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදනවල නීත්‍යානුකූලභාවය තහවුරු කරන වලංගු මසුන් ඇල්ලීමේ සහතිකයක් හෝ, අදාළ වන පරිදි, ඒ සඳහා වූ ලියවිල්ලක් නොමැතිව කිසිදු ධීවර නිෂ්පාදනයක් අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රති අපනයනය කිරීම නොකළ යුතු ය.<br><br>3. නියෝගයක් මගින් නියම කර ඇති පරිදි, අදාළ කළාපීය ධීවර කළමනාකරණ සංවිධානවල සංඛ්‍යා ලේඛන වැඩසටහන් යටතේ, සියලු මත්ස්‍ය විශේෂ පිළිබඳ විස්තර සැපයිය යුතු ය.<br><br>4. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>5. අමාත්‍යවරයාට, මෙම පනත ප්‍රකාරව ධීවර නිෂ්පාදන විෂයයෙහි අන්වේෂණය කිරීමේ නියමයන් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සෑදීම කළ හැකි ය. |
| **මසුන් පිරිසැකසුම් කිරීමේ ආයතන ලියාපදිංචි කිරීම**<br><br>**99** වන වගන්තිය | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් මසුන් පිරිසැකසුමේ කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය. 63<br><br>2.(1) වන උප වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් :<br>අ.) සැලසුම් කරන ලද පිරිසැකසුම් ආයතනයේ සැලසුම් සහ ව්‍යුහයන් තක්සේරු කර අනුමත කිරීම<br>ආ.) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ සාදන ලද ආහාර සුරක්ෂිතතා නියෝගමාලාවන්ට අනුකූලතාවය දක්වන්නේදැයි සොයා බැලීමට අදාල පිරිසැකසුම් ආයතනය පරීක්ෂා කිරීම<br>ඇ.)අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබ ඇති අදාළ අවශ්‍යතාවයන් පිරිසැකසුම් ආයතනය විසින් සපුරා ඇති බව තහවුරු කරනු ලැබිය යුතුය .<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශ මත ;<br>අ.) ධීවර පිරිසැකසුම් ආයතනයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන |

| | |
|---|---|
| | අවශ්‍යතාවයන්<br>ආ.) ධීවර සම්පත් පිරිසැකසුම් ආයතන, ශීතාගාර,අයිස් කර්මාන්තශාලා , ධීවර සම්පත් ප්‍රවාහනය කරනු ලබන වාහන , බෝට්ටු සහ තොටුපළ සඳහා වන පිරිවිතරයන් ;<br>ඇ.)ධීවර සම්පත් සහ ධීවර නිෂ්පාදන ගනුදෙනුකරුවන්ගේ ක්‍රියාකාරකම් සඳහා වන කොන්දේසි ;<br>ඈ.)තත්ත්ව කළමනාකරණ වැඩසටහන් සැකසීම , ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය පිරිසැකසුම් ආයතනය විසින් සිදු කිරීමේ අවශ්‍යතාවය ;<br>ඉ.) පිරිසැකසුම් ආයතනයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා වූ සනීපාරක්ෂක කොන්දේසි .<br><br>නියම කිරීමට අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකිය .<br><br>4.නියම කර ඇති පරිදි, මත්ස්‍ය හා ධීවර නිෂ්පාදන අපනයනකරුවන් සහ ආනයනකරුවන් පිළිබඳ ලේඛනයක් සහ මත්ස්‍ය සැකසුම් ආයතන පිළිබඳ ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.<br>අපනයනකරුවන් ,ආනයනකරුවන් සහ ධීවර පිරිසැකසුම් ආයතනයක් විසින් සිය අපනයන , ආනයන සහ මත්ස්‍ය පිරිසැකසුම් පිළිබඳ මාසික දත්ත මසක කාලයක් තුලදී අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතුය .<br><br>5.(1) වන උප වගන්තිය උල්ලංඝණය කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, එම වරදට වරදකරු වූ පසු, III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන පිරිසැකසුම් කිරීම , අපනයනය, ආනයනය හෝ ප්‍රති අපනයනය සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කිරීම**<br><br>**100 වගන්තිය** | 1. කිසිදු තැනැත්තෙකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අවසරයට සහ වඳවීමේ තර්ජනයට ලක්ව ඇති මත්ස්‍ය විශේෂ පිළිබඳ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) ඇතුළු ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව එමගින් ස්ථාපිත කර ඇති නියමයන් සහ කොන්දේසිවලට සහ රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධානවලට යටත්ව හැර, මසුන් සැකසුම් කිරීම, මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හෝ ප්‍රති අපනයනය කිරීම නොකළ යුතු ය.<br><br>2. බලපත්‍රය කලින් අවලංගු කර හෝ අත්හිටුවා ඇත්නම් මිස, නිකුත් කළ දින සිට එක් වසරක වලංගු කාලයක් එය පැවතිය යුතු ය. එකී බලපත්‍රය, ඊට සමාන කාල සීමා සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.<br><br>3. (1) වන උප වගන්තිය විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>4. බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා වූ ආකෘති පත්‍රය, අලුත් කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම, ගෙවිය යුතු ගාස්තු සහ මසුන් සැකසුම් කිරීම, අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම අරබයා මෙම පනත යටතේ මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන සඳහා බලපත්‍ර ලබා දීමට අදාළ වෙනත් ඕනෑම කරුණක් ඇතුළුව ඊට අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය නිශ්චය කරනු පිණිස නියෝග සම්පාදනය කිරීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **ලියාපදිංචි කිරීමේ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම** | යම් තැනැත්තෙකු බලපත්‍රයේ නියමයන් සහ විධිවිධාන සහ / හෝ මෙම කොටසේ විධිවිධාන උල්ලංඝනය කරන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාට, නියමිත නියෝග වලට අනුකූලව එකී උල්ලංඝනය කිරීම්වල බරපතලකම සැලකිල්ලට ගනිමින්, පිළිවෙළින් 99 සහ 100 වන වගන්තිවල සඳහන් ලියාපදිංචි කිරීම සහ |

| | |
|---|---|
| **101** වන වගන්තිය | බලපත්‍රය, නියමිත නියෝග වලට අනුව, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හැකි ය. |
| අභියාචනා<br><br>**102** වන වගන්තිය | 1. ලියාපදිංචි කිරීමේ සහතිකයක් හෝ බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයෙන් අගතියට පත් යම් තැනැත්තෙකුට, එම තීරණය දැනුම් දුන් දින සිට දින තිහක් (30) ඇතුළත, නියමිත ක්‍රියා පටිපාටි යටතේ, ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.<br>2. ලේකම්වරයා, (2) වන උප වගන්තිය යටතේ අභියාචනයක් සලකා බැලීමේ දී, එම අභියාචනය පිළිබඳ තීරණය, අභියාචක ඉල්ලුම්කරු වෙතින් අදාළ අභියාචන දැනුම්දීම ලැබී දින තිහක් (30) ඇතුළත, ඊට හේතු ද සහිතව, අභියාචක වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.<br>3. ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් තැනැත්තෙකුට එම තීරණය දැනුම් දුන් දින සිට දින තිහක් ඇතුලතදී (30) නීතිය පිළිබඳ ප්‍රශ්නයකදී, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය . |
| ගබඩා සහ මත්ස්‍ය පිරිසැකසුම් ආයතන පරීක්ෂා කිරීම<br><br>**103** වන වගන්තිය | 1. සෑම මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන ආනයනකරුවෙකුම, අපනයනකරුවෙකුම,ප්‍රති අපනයනකරුවෙකුම, හිමිකරුවෙකුම හෝ බලපත්‍රලාභියෙකුම ගබඩා, මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සහ ආනයනය කරන ස්ථානයකට ඕනෑම බලයලත් නිලධාරියෙකු හට පූර්ව දැනුම්දීමකින් තොරව ඇතුළුවීමට, ඒවා පරීක්ෂා කිරීමට, නියැදි, දත්ත සහ ලියකියවිලි එකතු කර ගැනීමට ඉඩ ලබා දී ඒ සඳහා වන පහසුකම් සලසා දිය යුතු ය.<br>2. (1) වන උප වගන්තියෙහි සඳහන් පරීක්ෂා කිරීම සිදු කරන බලයලත් නිලධාරියා විසින් එම පරීක්ෂා කිරීම් නිම වී දින හතක් (7) ඇතුළත පරීක්ෂණ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>3. (1) වන උප වගන්තියේ විධිවිධාන පටහැනිව කටයුතු කරන මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන පිරිසැකසුම් කිරීමේ ආයතනයක යම් ආනයනකරුවෙකු, අපනයනකරුවෙකු, ප්‍රතිඅපනයනකරුවෙකු හිමිකරුවෙකු හෝ බලපත්‍රලාභියෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| නිසි බලධරයා<br><br>**104** වන වගන්තිය | අපනයනය සඳහා ස්වස්ථතා සහතික සහ මසුන් ඇල්ලීමේ සහතික නිකුත් කිරීම ඇතුළු මත්ස්‍ය සහ ධීවර නිෂ්පාදන පරීක්ෂා කිරීමේ සහ සහතික කිරීමේ නිසි බලධරයා අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය. |
| පරීක්ෂා කරන ලද මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදනවලට මැදිහත් වීම<br><br>**105** වන වගන්තිය | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අවසරයකින් හැර, කිසිදු තැනැත්තෙකු;<br>අ) තත් කාර්යය සඳහා බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන ලද කිසියම් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදනයක් අඩංගු බහාලුම් හෝ බහාලුම් පද්ධති ඒකකයකට යොදන ලද වෙළඳ විස්තරයක්, ලාංඡනයක්, මුද්‍රා තැබීමක් හෝ වෙනත් සලකුණක් ඉවත් කිරීම, වෙනස් කිරීම හෝ ඊට යම් මැදිහත්වීමක් සිදු කිරීම ;<br>ආ) තත් කාර්යය සඳහා බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන |

| | |
|---|---|
| | ලද බවට සහතික කර ඇති කිසියම් මත්ස්‍ය තොගයක සංයුතියට යමක් එකතු කිරීම, ඉන් ඉවත් කිරීම හෝ එය වෙනත් ආකාරයකින් වෙනස් කිරීම; හෝ<br>ඇ) තත් කාර්යය සඳහා බලය පවරන ලද නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන ලද ඕනෑම පෙට්ටියක මුද්‍රා ඉවත් කිරීම හෝ එහි මුද්‍රා නොතබා හැරීම<br>නොකළ යුතු ය.<br><br>2. (1) වන උප වගන්තිය විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. ඊට අමතරව, යම් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන කිසිවක් වෙතොත්, එය රාජසන්තක කළ යුතු ය. |
| ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන මත සෙස් බද්දක් පැනවීම<br><br>**106 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදනයක් සම්බන්ධයෙන් , වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවා ඇති යම් බද්දකට අමතරව, පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන අනුප්‍රමාණ අනුව සෙස් බද්දක් පනවා නියම කර අයකරනු ලැබිය යුතු ය.<br><br>2. එකී සෙස් බද්ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කොට 107 වන වගන්තිය ප්‍රකාරව පිහිටුවා ඇති අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.<br><br>3. මෙම වගන්තිය, රේගු ආඥාපනතේ කොටසක් වූ පරිද්දෙන් අදාළ විය යුතු අතර,ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය. |
| | **IX වන කොටස-ධීවර අරමුදල** |
| **ධීවර අරමුදල**<br><br>**107 වන වගන්තිය** | 1. ධීවර අරමුදල ("අරමුදල") මෙයින් පිහිටුවනු ලබන්නේ ය.<br><br>2. අරමුදල වෙත ;<br>අ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවයට යටත්ව අධිකරණය විසින් මේ පනත යටතේ පනවනු ලබන දඩ සහ දණ්ඩන මුදලින් සියයට පනහක් (50%);<br>ආ) 133 වන වගන්තියට අනුව වරදක් සමථයකට පත් කිරීමෙන් ලැබෙන සියලු මුදල්;<br>ඇ) මේ පනත යටතේ රාජසන්තක කරන ලද භාණ්ඩ බැහැර කිරීමෙන් ලැබෙන සියලු මුදල්;<br><br>ඈ) මේ පනතේ 106 වන වගන්තිය අනුව, ප්‍රවේශය ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රැස් කරනු ලබන සියලු මුදල්.<br>ඉ) 72 වන වගන්තිය යටතේ ධීවර කමිටුවක් ඈවර කර වසා දැමීමෙන් පසු ඉතිරිවන යම් අතිරික්ත මුදලක්;<br>ඊ) ධීවර සංවර්ධනය සඳහා පරිත්‍යාග කරන ලද හෝ එකතු කරන ලද සියලු මුදල්,<br>බැර කරනු ලැබිය යුතු ය.<br><br>3. අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු ය.<br><br>4. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කලින් කල: |

| | |
|---|---|
| | අ) 5 වන වගන්තිය යටතේ පත් කරන ලැබූ යම් නිලධාරියෙකුට ත්‍යාග පිරිනැමීම;<br>ආ) කිසියම් තොරතුරු සපයන්නෙකු වෙත මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියමිත උපරිම මුදල් ප්‍රමාණය නොඉක්මවන යම් මුදලක්;<br><br>ඇ) 90 වන වගන්තිය යටතේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා මසුන් ඇල්ලීමේ යෙදී සිටින ධීවරයින්ට යම් වාරික මුදලක් ;<br><br>ඈ) 92 වන වගන්තිය යටතේ දත්ත රැස් කිරීමේ වැඩසටහන් වැඩිදියුණු කිරීම පිණිස ධීවර කමිටු වෙත මූල්‍ය ආධාර සැපයීම;<br><br>ඉ) 86 වන වගන්තිය යටතේ නැතිවූ, අතහැර දැමූ හෝ ඉවත දමන ලද ධීවර ආම්පන්න ආපසු ලබා ගැනීම සඳහා වූ වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සඳහා ධීවර කමිටු වෙත මූල්‍ය ආධාර සැපයීම හෝ;<br>ඊ) මේ පනතේ විෂය පථය තුළට ගැනෙන වෙනත් යම් කරුණක් සඳහා, අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.<br><br>5. අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව, විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු හෝ ඇය විසින් නම් කරනු ලබන විගණකවරයෙකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව, 9 වන වගන්තිය යටතේ නියම කර ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වාර්ෂික පාලන වාර්තාවේ දැක්විය යුතු ය.<br>6. 2 වන උප වගන්තිය යටතේ අරමුදලට ගෙවිය යුතු ප්‍රතිශතය සහ මේ පනතේ විෂය පථය යටතේ මේ විධිවිධානය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් යම් ක්‍රියාමාර්ග නිශ්චය කිරීම සඳහා, මුදල් අමාත්‍යවරයා විමසා, නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **ධීවර සහනාධාර සහ ආධාර**<br><br>**108 වන වගන්තිය** | 1. පහත දැක්වෙන පරිදි කටයුතු කර ඇති යම් පුද්ගලයෙකුට හෝ යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු, කුලියට ගත් තැනැත්තා, බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තෙකුට , අරමුදල හෝ වෙනත් යම් පොදු සම්පතක් යටතේ මූල්‍ය ආධාර ලබා දීම තහනම් කරනු ලැබිය යුත්තේ ය :<br><br>අ) මෙම පනත යටතේ බරපතල උල්ලංඝන කිසිවක් සිදු කර තිබීම; හෝ<br><br>67<br>ආ) ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වන යම් ප්‍රාදේශීය ධීවර කළමනාකරණ සංවිධානයක නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ යාත්‍රා ලැයිස්තුව තුළ ලැයිස්තුගතව ඇතුළත් කර ඇති ධීවර යාත්‍රාවක මෙහෙයුම් කටයුතුවලට, කළමනාකරණ කටයුතුවලට හෝ හිමිකාරිත්වය සඳහා සම්බන්ධ වී තිබීම.<br><br>ඇ) විද්‍යාත්මක වාර්තා පදනම් කරගෙන හඳුනා ගත් මත්ස්‍ය ගහන ගණත්වය ඉක්මවූ මත්ස්‍ය සම්පත අල්ලනු ලබන තැනැත්තෙකුට<br><br>2. (1) වන උප වගන්තිය යටතේ පුද්ගලයෙකුට හෝ මෙහෙයුමකට මූල්‍ය සහය ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක, එබඳු ආධාර අනුබල අදාළ යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු, කුලියට ගත් තැනැත්තා, බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තෙකුගෙන් ප්‍රතිසාධනය කර ගත යුතු වන්නේ ය. |

| | |
|---|---|
| | **X වන කොටස - අධීක්ෂණය,පාලනය,සෝදිසි මෙහෙයුම් සහ බලාත්මක කිරීම** |
| | **1 වන පරිච්ඡේදය – අධීක්ෂණය, පාලනය සහ සෝදිසි මෙහෙයෙටුම්** |
| **වරාය ප්‍රවේශය**<br><br>**109 වන වගන්තිය** | 1. මත්ස්‍ය අස්වැන්න ගොඩබෑමට, ප්‍රති නැව්ගත කිරීමට හෝ ශ්‍රී ලංකාව තුළ වෙනත් වරාය සේවා භාවිතා කිරීමට අපේක්ෂා කරන සියලු යාත්‍රා, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමිත අවසරය ලැබ අදාළ සියලුම ගාස්තු ගෙවීමෙන් පසු, ධීවර කටයුතු සඳහා නම් කරන ලද වරායකට ඇතුළු විය යුතු ය.<br><br>2. (1) වන උපවගන්තිය යටතේ නම් කරන ලද වරායන් වෙත ගොඩබානු නොලබන සියලු කුඩා පරිමාණ ධීවර යාත්‍රා, ධීවර කටයුතු සඳහා නම් කරන ලද තොටුපොළ වෙත හෝ නැංගුරම්පළ වෙත මත්ස්‍ය අස්වනු ගොඩබෑම සිදු කළ යුතු ය.<br><br>3. ශ්‍රී ලංකාවේ ධීවර නොවන වරායන් වෙත ගොඩබසින ධීවර නිෂ්පාදන අඩංගු සියලු බහාලුම්ගත නැව් බඩු යාත්‍රා, සිය යාත්‍රාවේ ඇති භාණ්ඩ ප්‍රමාණයන් අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත හෙළි කළ යුතු අතර ඒවා, මෙම පනතේ (96) සහ (98) යන වගන්තිවලට අනුකූල විය යුතු ය.<br><br>4. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් ධීවර යාත්‍රාවක හෝ සහායක යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා, වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය. |
| **යාත්‍රා අධීක්ෂණ පද්ධතිය**<br><br>**110 වන වගන්තිය** | 1. යාත්‍රාවේ ස්ථානීය පිහිටීම ස්වයංක්‍රීයව සොයා ගැනීමට සහ යාත්‍රාව හඳුනා ගැනීමට, සහ ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය (FMC) වෙත නිත්‍ය කාල පරාසයන් තුළදී ස්ථානීය දත්ත සම්ප්‍රේෂණය කිරීමට ඉඩ ලැබෙන පරිදි පූර්ණ වශයෙන් ක්‍රියාත්මක යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් (VMS) යාත්‍රාවේ සවි කර ඇත්තේ නම් මිස, ශ්‍රී ලංකාවේ ධීවර යාත්‍රාවකට දේශීය අධිකරණ බලසීමාවෙන් පිටත ප්‍රදේශ තුළ, සහ අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් අවස්ථාවක දී ධීවර මෙහෙයුම් සිදුකිරීමට අවසර ලබා නොදිය යුතු ය.<br><br>2. ශ්‍රී ලංකාවේ දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශ තුළ සහ, අවස්ථාවෝචිත පරිදි, වෙනත් යම් අවස්ථාවක දී මසුන් ඇල්ලීම සිදු කරන ධීවර යාත්‍රාවක හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා, විසින්,මේ පනත හෝ නියමිත නියෝගමාලා ප්‍රකාරව, බලපත්‍රයේ කොන්දේසියක් ලෙස, යාත්‍රා අධීක්ෂණ පද්ධතිය (VMS) සවි කර, නඩත්තුව සහ ක්‍රියාත්මක කිරිම කරනු ලැබිය යුතු ය.<br><br>3. යාත්‍රාවේ ස්ථාපනය කර ඇති යාත්‍රා අධීක්ෂණ පද්ධතිය (VMS):<br>අ) සෑම විටම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන බව;<br><br>ආ) වෙනස් කිරීමේ ප්‍රතිරෝධී, ව්‍යාජ ස්ථාන ආදානය හෝ ප්‍රතිදානය වැලැක්වීම සහ අතින්, ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් ආකාරයකින් හෝ බාධා කිරීමේ හැකියාවක් නොතිබිය යුතු අතර,<br><br>i. මුද්‍රා තැබූ ඒකකයක් තුළ පිහිටා ඇති බව; සහ<br><br>ii ඒකකයට ප්‍රවේශ වී තිබේද නැතහොත් විකෘති කර තිබේද යන්න පෙන්නුම් කරන වර්ගයක නිල මුද්‍රා මගින් ආරක්ෂා කර |

ඇති බව යාත්‍රාධිපති , ගැනියන් හෝ ක්‍රියාකරු විසින් සහතික විය යුතුය.

ඇ) අවම වශයෙන් පැය හතරකට වරක් හෝ නියම කර ඇති පරිදි පහත තොරතුරු:

i. මෙම යාත්‍රාව හඳුනා ගැනීම;
ii යාත්‍රාවේ වත්මන් භූගෝලීය පිහිටීම (දේශාංශ, අක්ෂාංශ) ස්ථාන දෝෂයක් සහිත 99% විශ්වාසනීය මට්ටමකින් මීටර් 500 ට අඩු විය යුතුය;
iii. යාත්‍රාවේ සඳහන් ස්ථානය සවි කළ දිනය සහ වේලාව (විශ්ව කාල සම්බන්ධීකරණය (UTC) දක්වා ඇති) ; සහ,
iv. ධීවර යාත්‍රාවේ වේගය සහ ගමන් මග
යාත්‍රා අධීක්ෂණ මධ්‍යස්ථානය සම්ප්‍රේෂණය කළ යුතු ය.

4. ධීවර යාත්‍රාවේ යාත්‍රාධිපති , හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා, විසින්,පහත කරුණු ඇතුළු නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කොන්දේසි හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි කොන්දේසි;
අ) භාවිතා කළ යුතු යාත්‍රා නිරීක්ෂණ පද්ධති උපකරණවල වර්ගය;
ආ) ස්ථාපනය කිරීමේ කාර්ය පටිපාටි;
ඇ) මෙහෙයුම් අවශ්‍යතා;
ඈ) තොරතුරු අවශ්‍යතා;
ඉ) රහස්‍යභාවය; සහ
ඊ) ප්‍රකාශ වාර්තා
සපුරාලනු ලැබිය යුතු ය.

5. ජංගම සම්ප්‍රේෂක ඒකකය (MTU) හෝ වෙනත් උපාංගයක් නියමිත අවශ්‍යතාවලට අනුකූලව ක්‍රියා නොකර අක්‍රිය වූ අවස්ථාවක ධීවර යාත්‍රාවේ යාත්‍රාධිපති , හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් ඒ බව වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අන්‍යාකාරයකින් අවසර දී ඇති අවස්ථාවක දී හැර, මසුන් ඇල්ලීමේ කටයුතුවලින් යාත්‍රාව නතර කරවීමට සැලැස්විය යුතු ය.

6. මෙම වගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියාකරනු ලබන ධීවර යාත්‍රාවේ යාත්‍රාධිපති , හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා බරපතල වරදකට වරදකරු වන අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා තමන්ට සුදුසු යැයි හැඟෙන කාල සීමාවකට අදාල බලපත්‍රය අත්හිටුවිය යුතු ය, සහ වරදකරු වූ විට III වන උපලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතුවාක් මෙන්ම වසරකට නොඉක්මවන කාලයක් සඳහා බන්ධාගාරගත කිරීමක් හෝ එකී දඬුවම් දෙවර්ගයම අදාල විය යුතු ය.ඊට අමතරව යාත්‍රා ධීවර වරාය වෙත පැමිණීමේදී යාත්‍රා අධීක්ෂණ පද්ධතියේ යාත්‍රා ගමන්මඟ දැක්වෙන දත්ත සටහන් සැපයීමට අපොහොසත් වන ධීවර යාත්‍රාවේ යාත්‍රාධිපති , හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා එවැනි මත්ස්‍ය නිෂ්පාදන විකිණීමට හෝ අපනයනය කිරීමට අවසර ලබා නොදිය යුතු ය.

7. මේ පනත යටතේ නියමිත නියෝගමාලා අනුව ධීවර යාත්‍රා අධීක්ෂණය,පාලනය සහ සෝදිසි මෙහෙයුම්, සහ ධීවර යාත්‍රා මෙහෙයුම් කළමනාකරණය කිරීමේ කාර්යයන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් පිහිටුවා ක්‍රියාත්මක කළ යුතු ය.

8. මේ පනතේ විෂය පථය තුළ නියම කර ඇති පරිදි යාත්‍රා අධීක්ෂණ පද්ධති (VMS) ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන්

| | |
|---|---|
| | කොන්දේසි ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **ප්‍රති නැව්ගත කිරීම්**<br><br>**111 වන වගන්තිය** | 1. මේ පනතේ හෝ එහි යම් නියෝගමාලාවක් මඟින් ඉඩ දී ඇතිනම් මිස මුහුදේදී ප්‍රතිනැව්ගත කිරීම තහනම් වේ.<br><br>2. ප්‍රති නැව්ගත කිරීම, නම් කරන ලද වරායන් හෝ ධීවර වරායක් තුළ පමණක්, මේ පනත ප්‍රකාරව සහ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගයකට අනුව නියම කරනු ලබන යම් වේලාවක දී හා ස්ථානයක දී සහ එහි යම් නියමයන් සහ කොන්දේසි මත අවසර දීම සහ සිදු කිරීම කරනු ලැබිය යුතු ය.<br>3. ඉහත (2) වන උප වගන්තියට අනුව ප්‍රති නැව්ගත කිරීමේ කාර්යයෙහි නිරත වීමට අදහස් කරන ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක හෝ සහායක යාත්‍රාවක යාත්‍රාධිපති, හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින්:<br>අ) නියමිත ආකෘති පත්‍රය සහ කොන්දේසිවලට අනුකූලව සහ නියමිත ගාස්තුවක් ගෙවීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ප්‍රති නැව්ගත කිරීමේ බලපත්‍රයක අවසරය යටතේ පමණක් ප්‍රති නැව්ගත කිරීම;<br><br>ආ) මේ පනත ප්‍රකාරව සහ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගයකට අනුව නියම කරනු ලබන යම් වේලාවක දී හා ස්ථානයක දී සහ එහි යම් නියමයන් හා කොන්දේසි මත හෝ අදාළ ජාත්‍යන්තර ගිවිසුමක් යටතේ පමණක් ප්‍රති නැව්ගත කිරීම ;<br><br>ඇ) පැය හතළිස් අටක (48) ට පෙර දැනුම්දීමක් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන වෙනත් පූර්ව දැනුම්දීමක් ලබා දිය යුතු ය. යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින්, යාත්‍රාවේ ඇති කිසියම් හෝ සියලුම ධීවර නිෂ්පාදන ප්‍රමාණය ප්‍රති නැව්ගත කරනු පිණිස ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර, උචිත පරිදි, ධීවර යාත්‍රාවේ ප්‍රති නැව්ගත කිරීමට පෙර ඇති මසුන් ප්‍රමාණය සහ ප්‍රති නැව්ගත කළ යුතු ප්‍රමාණ සහ ප්‍රවාහක යාත්‍රාවේ ප්‍රති නැව්ගත කිරීමට පෙර ඇති මසුන් ප්‍රමාණ පිළිබඳව වාර්තා කිරීම; සහ,<br><br>ඇ) ප්‍රති නැව්ගත කිරීමට පෙර සහ ප්‍රති නැව්ගත කිරීම අතරතුර යාත්‍රාවෙහි ධීවර පරීක්ෂකවරයෙකු හෝ නිරීක්ෂකයෙකු ස්ථානගත කිරීම ඇතුළුව,<br>i. ප්‍රති නැව්ගත කරනු ලබන ප්‍රමාණය සහ මත්ස්‍ය විශේෂ ඇතුළුව අදාළ දත්ත ලබා ගැනීම සහ සත්‍යාපනය කිරීම සඳහා; සහ<br>ii. ප්‍රති නැව්ගත කිරීම අවසන්ව ඇත්තේ කවදාද යන්න සහ නියම කරනු ලැබ ඇති වෙනත් ක්‍රියා පටිපාටි හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අන්‍යාරයකින් නියම කරනු ලබන ක්‍රියා පටිපාටි නිශ්චය කිරීම සඳහා<br>නියම කරනු ලැබ ඇති හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලැබිය හැකි එවැනි ක්‍රියා පටිපාටිවලට අනුකූලව සිදු කළ යුතු ය.<br><br>4. ප්‍රති නැව්ගත කිරීම සිදු කරන ලද ශ්‍රී ලංකා යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින්, වරාය රාජ්‍ය පියවර නියෝග මාලාවේ නියමිත ප්‍රති නැව්ගත කිරීමේ ප්‍රකාශයට අනුකූලව අදාළ සිද්ධිය ලේඛනගත කළ යුතු අතර, එක් එක් ප්‍රති නැව්ගත කිරීමේ ප්‍රකාශය ඇතුළත් වාර්තාවක් යාත්‍රාවෙහි රැගෙන යා යුතු ය. ප්‍රති නැව්ගත කිරීමේ ප්‍රකාශයේ පිටපතක්, ප්‍රවාහක යාත්‍රාවෙහි නැව්ගත කරනු ලබන මසුන් පිළිබඳ වාර්තාව සහිතව රැගෙන යා යුතු ය.<br>5. විදේශීය ධජ සහිත යාත්‍රා මගින් සිදු කෙරෙන ප්‍රති නැව්ගත කිරීමේ |

| | |
|---|---|
| | මෙහෙයුම්, 113 වන වගන්තිය සහ යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගයක් යටතේ වරාය රාජ්‍ය පියවරයන්ට යටත් විය යුතු ය.<br><br>6. මෙම වගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරන යම් යාත්‍රාධිපතියෙකු ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>7. මේ පනතේ විෂය පථය යටතේ හෝ ශ්‍රී ලංකාව බැඳී පවත්නා යම් ජාත්‍යන්තර බැඳීමක් යටතේ, ප්‍රති නැව්ගත කිරීම පිළිබඳ ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය පරිදි නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **මසුන් ගොඩබෑම**<br><br>**112 වන වගන්තිය** | 1. ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටතින් අල්ලා ගත් මසුන් රැගෙන එන යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් මසුන් ගොඩබෑම කළ යුත්තේ, ශ්‍රී ලංකාවෙහි නම් කරන ලද වරායන් හෝ ධීවර වරායන් සහ නැංගුරම් තොටුපොළවල්වල පමණක් වන අතර, එය සිදු කළ යුත්තේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලබන තැනැත්තෙකු විසින්, නියමිත නියෝගමාලාවලට අනුකූලව නිකුත් කරන ලද ගොඩබෑමේ අවසරයක් යටතේ ය.<br><br>2. මසුන් ගොඩබෑමේ අවසරයක් යටතේ ගොඩබෑමේ ප්‍රකාශය අනුව,මසුන් ගොඩබෑම ලේඛනගත කළ යුතු ය.<br><br>3. ශ්‍රී ලංකා මුහුදු සීමාවේ දී අල්ලා ගන්නා ලද මසුන් රැගෙන එන යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා විසින් මසුන් ගොඩබෑම කළ යුත්තේ, නම් කරන ලද ධීවර වරායන්, ගොඩබෑමේ ස්ථාන හෝ නැංගුරම් තොටුපොළවල්වල පමණක් විය යුතු ය.<br><br>4. එවැනි ගොඩබෑම් පාලනය කිරීම සඳහා බලයලත් නිලධාරීන්, නියමිත නියෝගමාලාවලට අනුව, නියෑදීම් සිදු කළ යුතු ය.<br><br>5. විදේශීය ධජ සහිත ධීවර යාත්‍රා මගින් මසුන් ගොඩබෑම 113 වන වගන්තිය යටතේ, වරාය රාජ්‍ය පියවරයන්ට සහ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගවලට යටත් විය යුතු ය.<br><br>6. මෙම වගන්තියෙහි විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් ධීවර යාත්‍රාවක යාත්‍රාධිපතියෙකු ,හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>7. මේ පනතේ විෂය පථය යටතේ හෝ ශ්‍රී ලංකාව බැඳී පවත්නා යම් ජාත්‍යන්තර බැඳීමක් යටතේ,ගොඩබෑමේ නීති රීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකි ය. |
| **විදේශීය යාත්‍රා සඳහා වරාය රාජ්‍ය පිළිබඳ ක්‍රියාමාර්ග** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන ප්‍රසිද්ධ දැනුම්දීමකින් වරායන් නම් කර ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර, ඔහු, එකී නම් කිරීම, අදාළ කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන (RFMOs) සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) වෙත වහාම සම්ප්‍රේෂණය කිරීමට සලස්වනු ලැබ, එම වරායන් නම් කිරීමේ යම් |

| | |
|---|---|
| **113** වන වගන්තිය | වෙනස්කමක් සිදු වේ නම්, එය ද දැනුම් දිය යුතු ය.<br><br>2. විදේශීය යාත්‍රා, කලින් ගොඩබානු නොලැබූ මසුන් ගොඩබෑම, ප්‍රති නැව්ගත කිරීම, ඇසුරුම් කිරීම හෝ මත්ස්‍ය පිරිසැකසුම් කිරීම සඳහා හෝ නැවත ඉන්ධන ලබා ගැනීම සහ නැවත සැපයුම් ලබා ගැනීම, නඩත්තු කිරීම සහ වියළි තටාකාංගනගත කිරීම ඇතුළු අනෙකුත් වරාය සේවා ලබා ගැනීම සඳහා පමණක් ශ්‍රී ලංකාව තුළ නම් කර ඇති වරායන් වෙත ඇතුළු විය යුතු ය.<br><br>3. ශ්‍රී ලංකාවේ නම් කරන ලද වරායකට ඇතුළු වන යම් විදේශීය යාත්‍රාවක් මේ කොටස යටතේ වරාය රාජ්‍ය පියවරයන්ට සහ එහි ක්‍රියාත්මක කිරීමේ නියෝගවලට යටත් විය යුතු ය.<br><br>4. 3 වන උප වගන්තියේ කුමක් සඳහන් වුව ද ,:<br>අ) ධීවර නිෂ්පාදන රැගෙන නොයන අවස්ථාවල දී, හෝ;<br>ආ) මින් පෙර ගොඩබාන ලද ධීවර නිෂ්පාදන රැගෙන යන අවස්ථාවල දී;<br>විදේශීය බහාලුම් යාත්‍රා වරාය රාජ්‍ය පියවරයන්ගෙන් නිදහස් කළ යුතු ය.<br><br>5. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ජාත්‍යන්තර නීතියට අනුකූලව වරාය රාජ්‍ය ක්‍රියාමාර්ග ගනිමින්, ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ගවල සඵලතාවය හැකිතාක් දුරට ප්‍රවර්ධනය කරනු ලැබිය යුතු ය. ඔහු, කිසියම් රාජ්‍යයක යාත්‍රාවලට ඒවායේ ස්වරූපයෙන් හෝ එවා ඇති සැටියෙන් බලා වෙනස්කම් කොට සැලකීම නොකළ යුතු වන අතර, අනෙකුත් කරුණු අතර,:<br>අ) ධීවර යාත්‍රාවල ඇති ලේඛන, ධීවර ආම්පන්න සහ එහි ඇති මත්ස්‍ය අස්වැන්න ස්වේච්ඡාවෙන්ම අදාළ වරායන්හි හෝ ඒවායේ අක්වෙරළ පර්යන්තවල දී පරීක්ෂා කර බැලීමට නියම කිරීම; සහ<br>ආ) ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ගවල සඵලතාවයට හානිදායක වන ආකාරයෙන් සහ ඒ සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් නියමයන්ට අනුව, මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීම සිදු කර ඇති බව තහවුරු වී ඇති කල්හි, ඊට අදාළ ගොඩබෑම සහ ප්‍රති නැව්ගත කිරීම සහ වරාය සේවා භාවිතය තහනම් කිරීම<br>ඔහුට කළ හැකි ය.<br><br>6. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන විදේශීය ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති, හිමිකරු , ක්‍රියාකරු හෝ කුලියට ගත් තැනැත්තා වරදකට වරදකරු වන අතර, එම යාත්‍රාවේ ධජය හිමි රාජ්‍ය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි, වරදකරු කරනු ලැබූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතුය.<br><br>7. මෙම පනතේ විධිවිධාන සහ අදාළ ජාත්‍යන්තර නීතියට අනුකූලව, ශ්‍රී ලංකාවේ නම් කරන ලද වරායන් වෙත ඇතුළු වන විදේශීය ධජය සහිත යාත්‍රා විෂයයෙහි වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවර ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා, අමාත්‍යවරයාට නියෝග සෑදිය හැකි ය. |
| නිරීක්ෂක වැඩසටහන<br><br>**114** වන වගන්තිය | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, විද්‍යාත්මක, අධීක්ෂණමය, කළමනාකරණමය සහ අනුකූලතා කාර්යයන් සඳහා විශ්වාසදායක සහ නිවැරදි තොරතුරු රැස් කිරීම, සටහන් කර ගැනීම සහ වාර්තා කිරීම සඳහා නිරීක්ෂක වැඩසටහනක් ස්ථාපිත කළ යුතු වන්නේ ය.<br><br>2. මේ පනත සහ ඊට අදාළ යම් ජාත්‍යන්තර ගිවිසුම් හෝ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි, ධීවර කටයුතු අධීක්ෂණය, පාලනය සහ සෝදිසි මෙහෙයුම් වෙනත් යම් රාජ්‍යයක් සමග හෝ |

| | |
|---|---|
| | මසුන් ඇල්ලීම, ප්‍රති නැව්ගත කිරීම, ප්‍රවාහනය කිරීම හෝ ශ්‍රී ලංකා ජල තීරයෙහි සහ වරායවල සහ දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශවල මසුන් ඇල්ලීම යන කාර්යයන් සඳහා යොදා ගන්නා කිසියම් යාත්‍රාවක සිට සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග, ඒකාබද්ධව හෝ සහයෝගයෙන් යුතුව ඉටු කිරීමේ සහ මේ පනතේ විෂය පථයට අයත් වන වෙනත් ප්‍රයෝජනවත් භාවිතයන්හි නිරත වීමේ අරමුණ ඇතිව, නිරීක්ෂකයින් යෙදවිය හැකි ය. |
| **නිරීක්ෂකයින් පත් කිරීම සහ හඳුනා ගැනීම**<br><br>**115 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, මේ පනතේ කාර්යයන් සඳහා, නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කිරීම පිණිස, ධීවර යාත්‍රාවේ ගැනියෙකු හෝ සෘජුව හෝ වක්‍රව ධීවර යාත්‍රාවේ සේවකයෙකු වන තැනැත්තෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු හැර වෙනත් යම් තැනැත්තෙකු, ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස ලිඛිතව පත් කළ හැකි ය.<br>2. නිරීක්ෂකයෙකු, තමා පිළිබඳව, තමන් වෙතින් ඉල්ලා සිටි කල්හි, හඳුන්වා දෙමින්, ඔහු විසින් තමා නිරීක්ෂකයෙකු බවට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. |
| **නිරීක්ෂකයන්ගේ කර්තව්‍ය**<br><br>**116 වන වගන්තිය** | නිරීක්ෂකයෙකුගේ කර්තව්‍ය තුළට,<br>අ) අල්ලා ගන්නා ලද මත්ස්‍ය විශේෂ, ප්‍රමාණය, තරම, වයස සහ තත්ත්වය;<br>ආ) මසුන් අල්ලා ගන්නා පන්න ක්‍රම, ප්‍රදේශ සහ එය සිදු වන ජලයේ ගැඹුර;<br>ඇ) මසුන් ඇල්ලීමේ පන්න ක්‍රමවලින් මත්ස්‍යයන්ට සහ පරිසරයට සිදු වන බලපෑම;<br>ඈ) යම් යාත්‍රාවක ක්‍රියාකාරිත්වයේ සියලු අංග;<br>ඉ) කිසියම් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදනයක් පිරිසැකසීම, ප්‍රවාහනය, ප්‍රති නැව්ගත කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම;<br>ඊ) කළමනාකරණ ක්‍රියාමාර්ග සහ අදාළ වන ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම; සහ<br>උ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන හෝ නියෝගමාලා වලින් නියම කරනු ලබන පරිදි වෙනත් යම් කරුණක් ඇතුළුව<br>විද්‍යාත්මක, කළමනාකරණ සහ අනුකූලතාව දැක්වීමේ කාර්යයන් සඳහා වන විශ්වාසදායක සහ නිවැරදි තොරතුරු රැස් කිරීම සහ වාර්තා කිරීම ඇතුළත් විය යුතු ය: |
| | **2 වන පරිච්ඡේදය – බලයලත් නිලධාරීන්** |
| **අධීක්ෂණ, පාලන සහ සෝදිසි මෙහෙයුම් (MCS) කාර්යයන් සඳහා බලයලත් නිලධාරීන් සහ වෙනත් නිලධාරීන් පත් කිරීම**<br><br>**117 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව දැනුම් දෙනු ලැබීම මගින් සහ ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි හෝ නියම කරනු ලැබිය හැකි ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටිවලට අනුව, පහත සඳහන් තැනැත්තන් බලයලත් නිලධාරීන් ලෙස පත් කළ හැකි ය:<br>අ) ධීවර පරීක්ෂකවරුන් සහ ධීවර නිලධාරීන්;<br>ආ) සැරයන් තනතුරට පහල නොවන හෝ ඊට සමාන නිලයක් දරන ශ්‍රී ලංකා යුද හමුදාවේ, ගුවන් හමුදාවේ හෝ පොලිසියේ නිලධාරීන්;<br>ඇ)වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ වෙරළාරක්ෂක නිලධරයෙක්;<br>ඈ) පත් කළ හැකි එවැනි වෙනත් යම් තැනැත්තන්<br><br>2. (1) වන උප වගන්තිය යටතේ වූ බලයලත් නිලධාරියෙකු, 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහයේ අර්ථානුකූල ව සාම නිලධාරියෙකු ලෙස සලකනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | 3. අධ්‍යක්ෂ ජනරාල්වරයාට, අධීක්ෂණ, පාලන, සෝදිසි මෙහෙයුම් සහ විද්‍යාත්මක කාර්යයන් සහ තමාට අවශ්‍ය පරිදි හෝ මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙතැයි තමා විසින් සලකනු ලබන, පහත දැක්වෙන පරිදි වෙනත් යම් තැනැත්තන්:<br>අ) සෝදිසි මෙහෙයුම් සහ විද්‍යාත්මක කටයුතු සඳහා වන නිරීක්ෂකයින්;<br>ආ) වරාය නියැදි පරික්ෂකයින්;<br>ඇ)මත්ස්‍ය තත්ත්ව පාලන කාර්යයන් සඳහා පරීක්ෂකවරුන් සහ විගණකවරුන්; සහ<br>ඇ)අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවශ්‍ය විය හැකි ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව, නියම කළ හැකි වෙනත් යම් සේවක පිරිස් ලිඛිතව කරන දැනුම් දීමක් මගින් පත් කළ හැකි ය.<br>4. (3) වන උපවගන්තිය යටතේ පත් කරන ලද තැනැත්තන්ට, මෙම පනතේ විස්තර කර ඇති පරිදි හෝ ඊට අදාළව සාදන ලද යම් නියෝග අනුව බලතල, අයිතිවාසිකම් සහ කර්තව්‍යයන් තිබිය යුතු ය. |
| බලයලත් නිලධාරීන් හඳුනා ගැනීම<br><br>**118** වන වගන්තිය | 1. 117 වන උප වගන්තිය යටතේ පත් කරන ලද බලයලත් නිලධාරියෙකු සහ වෙනත් තැනැත්තන්, මේ පනත මගින් ලබා දී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී, තමන් පිළිබඳව, තමන් වෙතින් ඉල්ලා සිටි කල්හි, හඳුන්වා දෙමින්, ඔහු / ඇය විසින් තමා බලයලත් නිලධාරියෙකු බවට සාක්ෂි ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.<br>2. යම් බලයලත් නිලධාරියෙකු විසින් ඔහුට / ඇයට නිකුත් කරන ලද කිසියම් හඳුනා ගැනීමේ ලේඛනයක් ඉදිරිපත් කිරීම විෂයයෙහි, ඊට පටහැනි කිසිවක් ඔප්පු වන තාක්, මේ පනත මගින් ඔහුට කිරීමට අවසර දී ඇති යම්කිසි දෙයක් කිරීමට ප්‍රමාණවත් බලයක් එකී බලයලත් නිලධාරියෙකු සතුව තිබිය යුතු ය.<br>3. බලයලත් නිලධාරියා ඔහුගේ / ඇයගේ ධූරය පිළිබඳව ප්‍රකාශ කිරීමට සහ මේ පනතේ කාර්ය විෂයයෙහි තමා බලයලත් නිලධාරියෙකු බව පෙන්වා සිටීමට තරම් සාධාරණ ලෙස ප්‍රමාණවත් අනන්‍යතාවයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම්, බලයලත් නිලධාරියෙකු විසින් කරන ලද ආයාචනය කිරීමකට, ඉල්ලා සිටීමකට හෝ නියෝගයකට අනුකූල වීම ප්‍රතික්ෂේප කිරීම වරදක් නොවන්නේ ය. |
| බලයලත් නිලධාරීන්ගේ සාමාන්‍ය බලතල<br><br>**119** වන වගන්තිය | 1. බලයලත් නිලධාරියෙකුට, මේ පනත යටතේ ඔහු / ඇය සතු බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන සියලු ක්‍රියා සහ දේවල් කළ හැකි අතර අවශ්‍ය වන අදාළ විධාන පැනවිය හැකි ය.<br>2. බලයලත් නිලධාරියෙකුට, මේ පනත යටතේ ඔහුගේ / ඇයගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය වන බලතල භාවිතා කළ හැකි ය.<br>3. ජාත්‍යන්තර ගිවිසුමක් හෝ විධිවිධානයක් මගින් අනන්‍යාකාරයකින් නියම කර ඇත්නම් මිස, දේශීය අධිකරණ බල සීමාවෙන් පිටත ප්‍රදේශවල කර්තව්‍යයන් භාර ගැනීමට බලයලත් නිලධාරියෙකු අවශ්‍ය වන්නේ නම්, මේ පනතේ විධිවිධාන, දේශීය අධිකරණ බල සීමාව යටතේ ඇති ප්‍රදේශ තුළ එකී බලයලත් නිලධාරියා තම රාජකාරි ඉටු |

| | |
|---|---|
| | කරනු ලැබූවා සේ අදාළ විය යුතු ය.<br>4. ශ්‍රී ලංකා රජය සමග ඒකාබද්ධව හෝ සහයෝගයෙන් යුතුව ධීවර අධීක්ෂණ, පාලන සහ සෝදිසි මෙහෙයුම් සිදු කිරීමේ අරමුණ ඇතිව, අදාළ ජාත්‍යන්තර ගිවිසුමක හෝ වැඩපිළිවෙළක පාර්ශවයක් වන වෙනත් යම් රාජ්‍යයකට පත් කරනු ලැබ ඇති හෝ වෙනත් ආකාරයකින් එකී වෙනත් රාජ්‍යයේ අධිකාරිය යටතේ සේවය කරනු ලබන බලයලත් නිලධාරියකු, එසේ පත් කරනු ලැබ ඇති හෝ සේවය කරනු ලබන අවස්ථාවක ඔහු / ඇය, එම ජාත්‍යන්තර ගිවිසුමේ හෝ වැඩපිළිවෙළෙහි නියමයන්ට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වාර්තා ඉදිරිපත් කළ යුතු වන්නේ ය.<br><br>5. බලයලත් නිලධාරියෙකු විසින්, දේශීය අධිකරණ බල සීමාව තුළ වුවද හෝ ඉන් පිටත වුවද , මේ පනතට සහ කිසියම් ජාත්‍යන්තර ගිවිසුමකට බලාත්මකභාවය ලබා දීම සඳහා නියම කළ හැකි වෙනත් යම් බලතල ක්‍රියාත්මක කළ හැකි ය. |
| **සමීපස්ථව លුහුබැඳ යාමේ බලය**<br><br>**120 වන වගන්තිය** | බලයලත් නිලධාරියෙකුට, ශ්‍රී ලංකා ජල තීරයේ සිට ආරම්භ වී, ජාත්‍යන්තර නීතියට අනුකූලව ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත සමීපස්ථ ලුහුබැඳීමක නිරතව, මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා යොදා ගන්නා ලද බවට ඔහුට / ඇයට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඇති මොනයම් හෝ යාත්‍රාවක් ශ්‍රී ලංකා ජල තීරයෙන් පිටත නැවැත්වීමට, ඊට ගොඩවීමට සහ සෝදිසි කිරීමට ද, මේ පනත මගින් ලබා දී ඇති යම් බලතල ක්‍රියාත්මක කර එම යාත්‍රාව සහ එහි සිටින සියලුම තැනැත්තන් සහ එහි තිබෙන දේවල් පෙරළා ශ්‍රී ලංකා ජල තීරය වෙත රැගෙන ඒමට ද හැකි ය. |
| **යාත්‍රාවට ගොඩවීමේ සහ එය පරීක්ෂා කිරීමේ ප්‍රකාශය**<br><br>**121 වන වගන්තිය** | 1. ධීවර යාත්‍රාවට ගොඩවන සහ ඒවා පරීක්ෂා කිරීම සිදුකරන බලයලත් නිලධාරීන් සහ වෙනත් තැනැත්තන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලබන හෝ ඉල්ලා සිටින, අදාළ යාත්‍රාවලට ගොඩවීමේ සහ ඒවා පරීක්ෂා කිරීමේ ආකෘති පත්‍රයට අත්සන් කිරීමෙන්, අදාළ කාර්යය සඳහා සිය ඉදිරිපත්වීම සහතික කළ යුතු ය.<br>2. වරායක දී සිදු කෙරෙන යාත්‍රාවලට ගොඩවීමක් සහ ඒවා සෝදිසි කිරීමක් හැර,ධීවර යාත්‍රාවකට ගොඩවී පරීක්ෂා කිරීමට සහභාගී වී ඇති බලයලත් නිලධාරියා විසින් ගොඩවීමේ සහ පරීක්ෂා කිරීමේ ආකෘති පත්‍රය සම්පූර්ණකර අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දිය යුතු ය. |
| **ඇතුළු වීමේ සහ පරීක්ෂා කිරීමේ බලය**<br><br>**122 වන වගන්තිය** | 1. බලයලත් නිලධාරියෙකුට වරෙන්තුවක් නොමැතිව,<br><br><br><br>අ) මේ පනත යටතේ ඔහුගේ / ඇයගේ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා,:<br>i) මේ පනතට පටහැනිව මසුන් ඇල්ලීම සඳහා හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කර ඇති බවට හෝ ඒ සඳහා යොදා ගනිමින් සිටින බවට හෝ භාවිතා කිරීමට අදහස් කරන බවට ඔහුට / ඇයට විශ්වාස කිරීමට හේතු ඇති ශ්‍රී ලංකා ජල තීරයේ යම් යාත්‍රාවක්;<br>ii) මහ මුහුදේ ඇති ඕනෑම ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක්, හෝ;<br>iii) මේ පනත සහ යම් ජාත්‍යන්තර නීතියක් හෝ ගිවිසුමක් අදාළ වන වෙනත් යම් ධීවර යාත්‍රාවක්<br>නැවැත්වීමට, ඊට ගොඩවීමට, ඇතුල් වීමට, සෝදිසි කිරීමට, පරීක්ෂා කිරීමට සහ එහි රැඳී සිටීමට ;<br><br>ආ) මේ පනතේ විෂය පථය තුළට ගැනෙන යම් ක්‍රියාකාරකමක් සඳහා යොදා ගනු ලැබ ඇති බවට තමා විසින් සාධාරණ ලෙස සැක කරනු |

ලබන, වාසස්ථානයක් ලෙස පමණක් තනිකරවම භාවිතා කරන පරිශ්‍රයක් නොවන, යම් වාසස්ථානයක යම් කොටසක් හෝ ඊට අනුබද්ධ පරිශ්‍රයක් ඇතුළු වෙනත් ඕනෑම පරිශ්‍රයක් හෝ ස්ථානයක් වෙත ඇතුල් වීමට ද, සෝදිසි කිරීමට ද, පරීක්ෂා කිරීමට ද ඔහුට / ඇයට හැකි අතර මේ පනතට අනුකූලව එම කටයුතු ක්‍රියාත්මක වන්නේ ද නැතහොත් ඊට අනුකූලව ක්‍රියාත්මක වී තිබේ ද යන්න නිසැකව තහවුරු කර ගනු පිණිස සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය වේ;

ඇ) මේ පනතේ විෂය පථය තුළට ගැනෙන යම් ක්‍රියාකාරකමක් සඳහා භාවිතා කරන ඕනෑම යාත්‍රාවකින් හෝ පරිශ්‍රයකින්, මේ පනතේ විෂය පථය තුළ ගැනෙන යම් ක්‍රියාකාරකමට අදාළ ලොග් පොත්, ලිපි ලේඛන, බලපත්‍ර, සහ වාර්තා හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කර ලබා ගැනීමට හැකි වන්නේ ය. එසේ වුවත්, මෙම උපවගන්තිය යටතේ, යම් භාණ්ඩයක් ලබා ගන්නා අවස්ථාවක දී ඔහු / ඇය විසින් ඒ වෙනුවෙන් ලදුපතක් සැපයිය යුතු ය;

ඈ) ගොඩබෑමේ සහ ප්‍රති නැව්ගත කිරීමේ මෙහෙයුම් නිරීක්ෂණය කිරීම ද, නිදර්ශක, ඡායාරූප සහ අදාළ ලියකියවිලි ලබා ගැනීම ද කළ හැකි වන්නේ ය;

ඉ) මේ පනත යටතේ සිදු කරන ලදැයි කියන යම් විධිවිධාන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් පවත්වනු ලබන පරීක්ෂණයක හෝ එහි නියෝග ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා කිසියම් තැනැත්තෙකු අවශ්‍ය වෙතැයි නියම කිරීම, ඒ තැනැත්තා ඒ සඳහා කැඳවනු ලැබීම හෝ එසේ කරන ලෙස ඒ තැනැත්තා වෙතින් ඉල්ලා සිටීම සහ ඔහුගෙන් / ඇයගෙන් ඒ සඳහා ප්‍රකාශ ලබා ගැනීමට;

ඊ) යාත්‍රාවක ලොග් පොතෙහි ඔහු / ඇය විසින් දින නියම කර අත්සන් කරන ලද සටහනක් සාදා, යාත්‍රාධිපති ලවා එම සටහන අත්සන් කරවා ගැනීම හෝ එම අවස්ථාව වන විට යාත්‍රාවේ ස්ථානීය පිහිටීම සම්බන්ධයෙන් සටහනක හෝ වෙනත් ලේඛනයක සඳහන් කරවා ගෙන එම සටහන හෝ වෙනත් ලේඛනය මත ඒ අනුව යාත්‍රාධිපතිගේ කෙටි අත්සන තබන ලෙස නියම කිරීමට;

උ) යම් යාත්‍රාවකට ගොඩවී සිට, මේ පනතේ විෂය පථය තුළට ගැනෙන කාර්යයන් සඳහා නියම කර ඇති හෝ භාවිතා කිරීම අවැසි වන ඕනෑම ඉලෙක්ට්‍රොනික උපකරණයක් පිරික්සීම හෝ පරීක්ෂණයට හසු කිරීම කළ හැකි හෝ එසේ පිරික්සීමට හෝ පරීක්ෂණයට හසු කිරීමට සැලැස්විය හැකි අතර මේ පනත යටතේ බලපත්‍රයක් හෝ අවසරයක් අවශ්‍ය වන මසුන් ඇල්ලීම හෝ ඊට අදාළ ක්‍රියාකාරකම් සඳහා හෝ ඒ සම්බන්ධයෙන් යොදා ගනු ලැබ ඇති බවට හෝ යොදා ගනිමින් සිටිනු ලබන බවට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලබන බවට ඔහුට / ඇයට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඇති මොනයම් හෝ යාත්‍රාවක, වාහනයක, පරිශ්‍රයක හෝ ස්ථානයක තිබෙන යම් ආම්පන්නයක්, උපකරණයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට

හැකි වේ.

2. මේ වගන්තියෙහි කාර්යයන් සඳහා, යාත්‍රාවේ උපකරණ, ආම්පන්න, දැව භාණ්ඩ, අමතර උපාංග, ගබඩා භාණ්ඩ සහ යාත්‍රාබඩු එකී යාත්‍රාවේම කොටසක් ලෙස සමන්විත වන බව සැලකිය යුතු ය.

3. මහ මුහුදේ ඇති ඕනෑම ශ්‍රී ලාංකික යාත්‍රාවක යාත්‍රාධිපතියෙකු හෝ

| | |
|---|---|
| | ක්‍රියාකරුවෙකු, ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු ලෙස බැඳී සිටින යම් ජාත්‍යන්තර ගිවිසුමක විධිවිධාන යටතේ, අනන්‍යතාවය සනාථ කර සිටීම මත, යම් විදේශීය ජාතිකත්වයකට අයත් බලයලත් නිලධාරියෙකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා එම ධීවර යාත්‍රාව වෙත ප්‍රවේශ වීම සඳහා ඉඩ ලබා දිය යුතු ය. |
| **තොරතුරු සහ සාක්ෂි සුරක්ෂිතව ලබා ගැනීමේ බලය**<br><br>**123 වන වගන්තිය** | 1. මේ පනත යටතේ නීතිය බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා තොරතුරු සහ සාක්ෂි ලබා ගැනීම පිණිස, වරෙන්තුවක් නොමැතිව;<br><br>අ) මේ පනත යටතේ වරදක් සිදු කර ඇතැයි හේතු තිබෙන බවට තමා විසින් විශ්වාස කරනු ලබන, ඒ බව තමාට පෙනෙන හෝ පෙනෙන ආකාරයේ නැඹුරුවක් පවතින යම් ක්‍රියාකාරකමකට අදාළ කිසියම් යාත්‍රාවකින්, වාහනයකින්, පරිශ්‍රයකින් හෝ වෙනත් ස්ථානයකින් යම් නිදර්ශක, ලොග් පොත්, සටහන්, බලපත්‍ර සහ අවසර පත් හෝ වෙනත් ලිපි ලේඛන, වාර්තා සහ වෙනත් තොරතුරු හෝ ඒවායේ පිටපත් තහනමට ගැනීමට, ලබා ගැනීමට, රඳවා ගැනීමට, ඉවත් කිරීමට සහ සුරක්ෂිත කිරීමට ;<br><br>ආ) මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ගනු ලැබ හෝ යොදා ගනු ලැබ ඇති බවට හෝ යොදා ගනිමින් සිටිනු ලබන බවට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලබන බවට ඔහුට / ඇයට විශ්වාස කිරීමට තරම් හේතු ඇති කිනම් හෝ මත්ස්‍ය විශේෂයක් හෝ මත්ස්‍ය නිෂ්පාදනයක්, ජලජ සම්පතක්, යාත්‍රාවක්, වාහනයක්, ආම්පන්නයක්, උපකරණයක්, ඩයිනමයිට්, හිංසක හෝ අනතුරුකාරී ද්‍රව්‍යයක් හෝ අයිතමයක් තහනමට ගැනීමට, ලබා ගැනීමට, රඳවා ගැනීමට, ඉවත් කිරීමට සහ සුරක්ෂිත කිරීමට;<br><br>ඇ) මේ පනත යටතේ සිදුවන යම් නඩු කාර්ය පටිපාටියක සාක්ෂි වශයෙන් භාවිතා කළ හැකි වෙතැයි ඔහුට / ඇයට විශ්වාස කිරීමට හේතු ඇති ඕනෑම දෙයක් කිරිමට<br>බලයලත් නිලධාරියෙකුට හැකි වන්නේ ය.<br><br>2. 1 වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා ලද යම් මසුන් හෝ වෙනත් ජලජ සම්පත් පිළිගතහැකි විනිවිදභාවයෙන් යුත් ක්‍රියාපටිපාටියක් හෝ ප්‍රයෝගික භාවිතයන් නිරීක්ෂණය සහ අනුගමනය කරමින් ඉක්මනින් නරක්වීමට භාජනය වේනම් ඒ මසුන් හෝ වෙනත් ජලජ සම්පත් බලයලත් නිලධරයෙකු විසින් විකුණනු ලැබිය හැකි අතර ඒ විකිණීමෙන් ලත් මුදල් ඒ මහේස්ත්‍රාත් අධිකරණයේතැන්පත් කළ යුතු ය.<br><br>3. ධීවර පරීක්ෂකවරයෙකුට /ධීවර නිලධාරියෙකුට හෝ බලයලත් නිලධාරි යෙකුට මේ පනත යටතේ හෝ අදාළ ජාත්‍යන්තර ගිවිසුමක් යටතේ බලපත්‍රයක්, ලියාපදිංචි කිරීමක් හෝ වෙනත් අවසරයක් අවශ්‍ය වන ඕනෑම ක්‍රියාකාරකමක නියැලී සිටින හෝ නියැලී සිටි ලේඛනගත තැනැත්තෙකු හට:<br>අ) අදාළ ක්‍රියාකාරකම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වන ලියාපදිංචි කිරීම, බලපත්‍රය, අවසරය හෝ වෙනත් අවසරයක් ඉදිරිපත් කර සිටින ලෙසට;<br><br>ආ) අදාළ ක්‍රියාකාරකම සම්බන්ධයෙන් වෙනත් යම් ලියකියවිලි ඉදිරිපත් කර සිටින ලෙසට;<br>ඇ) වෙනත් යම් අදාළ තොරතුරු ලබා දෙන ලෙසට<br>නියම කළ හැකි ය.<br>එමෙන්ම, ධීවර පරීක්ෂකවරයාට හෝ ධීවර නිලධාරියාට කිසියම් ලේඛනයක පිටපත් ලබා ගැනීම හෝ ඒවායෙන් උපුටා ගැනීම් ලබා |

| | |
|---|---|
| | ගැනීමට හැකි ය.<br><br>4. මේ වගන්තිය ප්‍රකාරව ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද කිසියම් භාණ්ඩයක් හෝ අයිතමයක් සම්බන්ධයෙන්, එහි පාලනය භාරව සිටින හිමිකරුට, ලේඛනගත හිමිකරුට, නියෝජිතයාට හෝ තැනැත්තාට, ඒවා ලද බවට ලිඛිත දැනුම්දීමක් ලබා දිය යුතු අතර එම ගැනීම හෝ රඳවා තබා ගැනීම සඳහා වන හේතු එකී ලිඛිත ලියවිල්ලෙහි සඳහන් කළ යුතු ය. |
| **ධීවර යාත්‍රාවක් නැවැත්වීමේ සහ පාලනයට නතුකර ගැනීමේ බලය**<br><br>**124 වන වගන්තිය** | 1. 122 වන වගන්තියට අනුව යම් ධීවර යාත්‍රාවක් විෂයයෙහි කෙරෙන සම්පස්ථ ලුහුබැඳීමක් ද ඇතුළුව 124 වන වගන්තිය ප්‍රකාරව එම යාත්‍රාව නවත්වන ලෙස කරනු ලබන ඉල්ලීමකින් අනතුරුව, එම යාත්‍රාවේ යාත්‍රාධිපති යම් සාධාරණ කාල වේලාවක් ඇතුළත එකී යාත්‍රාව නොනවත්වා ගමන් කරවන අවස්ථාවක දී, අවස්ථානුගත තත්වයන් යටතේ සාධාරණ ලෙස අවැසි වන පරිදි, ජාත්‍යන්තර නීතියට අනුකූලව බලය පාවිච්චි කර, යම් යුක්ති සහගත විධික්‍රමවලට අනුව, යාත්‍රාව අත් අඩංගුවට ගැනීමට බලයලත් නිලධාරියෙකුට හැකි ය.<br><br>2. බලයලත් නිලධාරියෙකුට, මේ පනත යටතේ වරදක් සිදු කිරීම සඳහා හෝ වරදක් සිදු කිරීමට අදාළව යම් යාත්‍රාවක් යොදා ගෙන ඇති බවට හෝ යොදා ගනිමින් සිටින බවට හෝ යොදා ගැනීමට අදහස් කරනු ලබන බවට ඔහුට / ඇයට විශ්වාස කිරීමට තරම් හේතු ඇති කල්හි හෝ මේ පනත යටතේ යම් යාත්‍රාවක්, සම්පස්ථව ලුහුබැඳීමක නිරත වීමක් ද ඇතුළුව, තහනමට ගනු ලැබ ඇති අවස්ථාවක දී:<br>අ) එම යාත්‍රාව, ඔහු / ඇය විසින් විධානය කරනු ලබන ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක් වෙත රැගෙන ඒමට හෝ එලෙස රැගෙන එන ලෙස නියම කිරීමට හෝ; සහ<br><br>ආ) අදාළ වරදට එරෙහිව නඩු කටයුතු ඉටු කරනු ලබන සහ ඒ සම්බන්ධයෙන් තීරණය කරනු ලබන තෙක් යාත්‍රාව තම පාලනයට නතුව රඳවා තබා ගැනීමට හෝ යාත්‍රාධිපතිට එම ස්ථානයෙන් පිටත්ව යාමට බලයලත් නිලධාරියෙකු විසින් අවසරදෙන තුරු එම ස්ථානයේ සිටිමින් යාත්‍රාවේ පාලනය බාරව කටයුතු කිරීමට ඔහුට / ඇයට නියම කිරීමට හෝ<br>හැකි වන්නේ ය.<br><br>3. බලයලත් නිලධාරියෙකු (2) සහ (4) යන උපවගන්තිවලට අනුකූලව ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් කරා යාත්‍රාවක් රැගෙන එන කල්හි හෝ අත්අඩංගුවට ගැනීමක් ද ඇතුළුව, මේ පනත බලාත්මක කිරීම සඳහා සහාය ලබා ගැනීමේ අවශ්‍යතාව ඉතා යුහුසුළුව සහ දැඩිව පවතින වෙනත් අවස්ථානුගත තත්වයන් යටතේ, ඔහුට / ඇයට සහාය වන ලෙස යම් තැනැත්තෙකුගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එම තැනැත්තා:<br><br>අ) ඔහු / ඇය එසේ ක්‍රියා කිරීමට අවශ්‍ය වන කාර්යයන් සහ ඊට ගතවන කාලය සඳහා බලයලත් නිලධාරියෙකු ලෙස සැලකිය යුතු ය; සහ<br><br>ආ) මේ පනත බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා බලයලත් නිලධාරියාගේ උපදෙස් ක්‍රියාත්මක කළ යුතු ය. |

| | |
|---|---|
| | 4.මේ වගන්තියට සහ 120 වන වගන්තියට අනුව යාත්‍රාවක් රට තුළ ස්ථානයකට රැගෙන එනු ලබන අවස්ථාවක දී සිදු වන කිසියම් මරණයක්, තුවාල වීමක්, පාඩු වීමක් හෝ හානි වීමක් සම්බන්ධයෙන්, බලයලත් නිලධාරයෙකුට සිදුවන මරණයක් හෝ තුවාලවීමක් සම්බන්ධයෙන් හැර, 117 වන වගන්තිය යටතේ පත් කරන ලද බලයලත් නිලධාරියෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට එරෙහිව හිමිකම් පෑමක් සිදු කළ නොහැකි ය.<br><br>5. (2) වන උපවගන්තියේ සඳහන් යාත්‍රාධිපතිට යාත්‍රාවේ පාලනය බාරව සිටීමට නියම කර ඇති කල්හි, යාත්‍රාව නියමිත නම් කරන ලද වරායකට සේන්දු වන තෙක් යාත්‍රාවේ සහ යාත්‍රාවේ සිටින එක් එක් තැනැත්තාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඔහු / ඇය වගකිව යුතු ය.<br><br>6.මේ වගන්තිය ප්‍රකාරව අත් අඩංගුවට ගනු ලබන කිසියම් භාණ්ඩයක් හෝ දෙයක් සම්බන්ධයෙන් එහි අදාළ හිමිකරුට, විද්‍යාමාන හිමිකරුට හෝ හිමිකරු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තාට ඒවා ලද බවට ලිඛිත දැනුම් දීමක් ලබා දිය යුතු අතර, එවැනි අත්පත් කර ගැනීමක් සඳහා පාදක වූ හේතු එකී ලදුපතෙහි සඳහන් කළ යුතු ය. |
| ධීවර යාත්‍රාවක් නිශ්චාලනය කිරීමේ බලය<br><br>**125** වන වගන්තිය | 1. 124 වන වගන්තියට අනුව ධීවර යාත්‍රාවක් අත්අඩංගුවට ගෙන හෝ රඳවා තබාගෙන ඇති අවස්ථාවක දී හෝ 122 වගන්තියට අනුව එය රටේ යම් ස්ථානයකට රැගෙනවිත් ඇති අවස්ථාවක දී, බලයලත් නිලධාරියාට, එකී ධීවර යාත්‍රවේ ක්‍රියාකාරිත්වය නතර කිරීමේ කාර්ය සඳහා, එහි යම් කොටසක් හෝ කොටස් කිසිවක් ඉවත් කිරීම හෝ වෙනත් ආකාරයකින් යාත්‍රාව සුරක්ෂිත කිරීම හෝ කළ හැකි ය.<br><br>2. (1) වන උපවගන්තියට අනුව යාත්‍රාවක යම් කොටසක් හෝ කොටස් කිසිවක් ඉවත් කර ඇති අවස්ථාවක දී, එම කොටස කොටස් ආරක්ෂිතව තබා ගත යුතු අතර, එය අත්අඩංගුවෙන් නීත්‍යානුකූලව නිදහස් වූ වහාම යාත්‍රාව වෙත ආපසු භාරදිය යුතු ය.<br><br>3. එවැනි කොටසක් හෝ කොටස් කිසිවක් සතු කර ගැනීමට හෝ ලබා ගැනීමට කටයුතු පිළියෙළ කර ගැනීමට හෝ එම කොටසක් හෝ කොටස් කිසිවක් මාරු කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් කොටස් ආදේශ කිරීමට කිසිදු තැනැත්තෙකු ක්‍රියා නොකළ යුතු ය. |
| විදේශ ගමන් බලපත්‍ර, යාත්‍රාධිපති බලපත්‍ර සහ නාවිකයින්ගේ පොත් රාජසන්තක කිරීමේ බලය<br><br>**126** වන වගන්තිය | 1. බලයලත් නිලධාරියාට, (2) වන උපවගන්තියට යටත්ව, මේ පනත යටතේ සිදුවන වරදක් විමර්ශනය කරනු පිණිස යම් සාධාරණ කාල සීමාවක් සඳහා යාත්‍රාවක යාත්‍රාධිපතිගේ සහ ගැනියන්ට අයත් විදේශ ගමන් බලපත්‍ර, යාත්‍රාධිපති බලපත්‍ර සහ නාවිකයින්ගේ පොත් යනාදී කිසිවක්, ඒ සම්බන්ධයෙන් වන එවැනි යම් විමර්ශනයක් අවසන් කිරීම හෝ විදේශ ගමන් බලපත්‍ර රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලබාගෙන තිබීම යන කවර හෝ සිද්ධියකට කලින් එළඹෙන අවස්ථාව තෙක්, අත්අඩංගුවට ගෙන රඳවා තබා ගත හැකි ය.<br>2. බලයලත් නිලධාරියාට, වෙනත් යම් නීතියක් යටතේ ඔහුට / ඇයට ලබා දී ඇති වෙනත් බලතල ක්‍රියාත්මක කළ හැකි වන අතර, දේශීය අධිකරණ බල ප්‍රදේශ හෝ ඉන් පිටත ප්‍රදේශ යන කවර හෝ ප්‍රදේශ තුළ වේවා, මේ පනත හෝ අදාළ ජාත්‍යන්තර ගිවිසුම් බලාත්මක කිරීම පිණිස නියම කළ |

| | |
|---|---|
| | හැකි වෙනත් යම් බලතල ක්‍රියාත්මක කළ හැකි ය.<br><br>3. යම් යාත්‍රාධිපතියෙකු සහ ගැනියන් විසින් මේ පනත යටතේ සිදු කරන ලද වරදක් විමර්ශනය කරන කාලය අතරතුර දී, එවැනි යාත්‍රාවක යාත්‍රාධිපතිට සහ ගැනියන්ට අයත් විදේශ ගමන් බලපත්‍ර, යාත්‍රාධිපති බලපත්‍ර සහ නාවිකයින්ගේ පොත් යනාදී කිසිවක් එකී විමර්ශනය අවසන් වීමට පෙර රටින් පිටතට ගමන් කිරීම සඳහා ඔවුනට පහසුකම් සලසන බව පෙනෙන්නට තිබේ නම්, එම විදේශ ගමන් බලපත්‍ර සහ නාවිකයින්ගේ පොත් සතියක කාල සීමාවක් දක්වා රාජසන්තක කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව අනුමත කරනු ලැබිය හැකි ය. |
| **රඳවා ගැනීමේ බලය**<br><br>**127** **වන වගන්තිය** | 1. යම් තැනැත්තෙකු මේ පනත යටතේ හෝ වෙනත් නීතියක් යටතේ වරදක් සිදු කරමින් සිටින බවට හෝ කර ඇති බවට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු තිබේ නම්:<br>අ) එම තැනැත්තාට එසේ කිරීම වහා නතර කරන ලෙසත්, එසේ කිරීමෙන් වැළකී සිටින ලෙස නියෝග කිරීමට;<br>ආ) එම තැනැත්තාගේ නම, උපන් දිනය, අනන්‍යතාව පිළිබඳ සාක්ෂි, පදිංචි ලිපිනය සහ රැකියාව බලයලත් නිලධාරියාට ලබා දෙන ලෙසත්, අවස්ථානුගත කරුණු අනුව එම තැනැත්තාගෙන් එම විස්තර තොරතුරු සත්‍යාපනය කර ගනු පිණිස සපයන මෙන් ඉල්ලා සිටීම සාධාරණ වන බැවින්, එසේ ඒවා සපයන ලෙසත් එම තැනැත්තාගෙන් ඉල්ලා සිටිමට; සහ<br>ඇ) වරෙන්තුවකින් තොරව එම තැනැත්තා රඳවා තබා ගැනීමටත්<br><br>බලයලත් නිලධාරියෙකුට හැකි ය.<br><br>2. බලයලත් නිලධාරියෙකු (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තෙකු වරෙන්තුවක් නොමැතිව රඳවා තබා ගන්නේ නම්, ඔහු / ඇය, එම තැනැත්තා බැඳුම්කරයක් පිට හෝ ඇප පිට හෝ මහේස්ත්‍රාත්වරයකුගේ විශේෂ ලිඛිත ආඥාවක් යටතේ මිස නිදහස් නොකළ යුතුය .<br><br>3. (1) (අ)මේ පනත යටතේ යම් විදේශීය ධීවර බෝට්ටුවක් තහනමට ගෙන රඳවා තබා ගත් අවස්ථාවක දී, සහ<br>(ආ)යම් විදේශීය ධීවර බෝට්ටුවක යාත්‍රධිපතිට,හිමිකරුට ,එය කුලියට ගත් තැනැත්තෙකු හෝ ඒ බෝට්ටුවේ ගමන් කරන යම් තැනැත්තෙකු ඇත්නම් ඔහුට එරෙහව මේ පනත යටතේ යම් නඩු කටයුත්තක් පවරා ඇති අවස්ථාවකදී,<br>විදේශ කටයුතු විෂය පවරා ඇති අමාත්‍යවරයා මඟින් ධීවර බෝට්ටුව අයත් වන්නාවූ රටේ කොන්සල් නිලධරයා වෙත නොපමාව දැන්විමක් භාර දිය යුතු ය.<br><br>(2) බෝට්ටුව තහනමට ගෙන රඳවා ඇත්තේ නැතහොත් නඩු කටයුත පවරනු ලැබ ඇත්තේ කුමන හේතු මතද යන්න (1) වන උපවගන්තිය යටතේ භාර දෙනු ලබන දැන්වීමක නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය. |
| **අත්හැර දැමූ ධීවර යාත්‍රා, ආම්පන්න සහ ධීවර නිෂ්පාදන සම්බන්ධයෙන්…වූ බලය**<br><br>**128** **වගන්තිය** | 1. කිසියම් ධීවර යාත්‍රාවක්, ධීවර ආම්පන්නයක්, මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදනයක් නඩු පැවරීම වැළැක්වීමේ අරමුණින් යුතුව අත්හැර දමා ගොස් ඇති බවට විශ්වාස කිරීමට තරම් හේතු බලයලත් නිලධාරියෙකුට තිබේ නම්, ඔහු / ඇය ඒ පිළිබඳව වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා, එම තොරතුරු ලැබීමෙන් පසුව, එසේ අත්හැර දමා ගොස් ඇති ධීවර යාත්‍රාවේ,ධිවර ආම්පන්නයේ ,මසුන්ගේ හෝ මත්ස්‍ය නිෂ්පාදනයන්හි හිමිකරුට දින තිහක් (30 ක්) ඇතුළත එම අයිතමයන් ඉවත් කර ගන්නා ලෙස නියම කළ යුතු ය. |

| | |
|---|---|
| | 2. (1) වන උපවගන්තියේ සඳහන් නියමිත කාලය අවසන් වන තෙක් යාත්‍රාවේ හිමිකරු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගයට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා අදාළ යාත්‍රාවට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර එසේ නැතහොත්, එකී ධීවර යාත්‍රාව, ධීවර ආම්පන්න, මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන බැහැර කිරීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා නිසි අධිකරණ බලය ඇති අධිකරණයකින් අයද සිටිය යුතු ය.<br><br>3. එම හිමිකරු පලා ගොස් සැඟවී සිටින විට හෝ සොයා ගැනීමට නොහැකි වන අවස්ථාවකදී, කලින් එකී සැකකරුගේ සන්තකයට හෝ භාවිතයට නතුව හෝ පාලනය යටතේ තිබූ ප්‍රදේශය හෝ පරිශ්‍රය සහ දේපළ සම්බන්ධයෙන් විමර්ශන ක්‍රියාමාර්ග ගනු පිණිස කටයුතු සැලැස්වීමට බලයලත් නිලධාරියාට හැකි ය. |
| **බලයලත් තැනැත්තන්ගේ රාජකාරී**<br>**129 වන වගන්තිය** | 1. යාත්‍රා ක්‍රියාකරු හෝ ගැනියෙකු ඇතුළු කිසිදු තැනැත්තෙකු විසින් ;<br><br>අ) යම් බලයලත් තැනැත්තෙකුට;<br><br>i. යාත්‍රාවකට ආරක්ෂිතව ගොඩවීම;<br>ii.යාත්‍රාවේ ප්‍රධාන පාලන මධ්‍යස්ථානය, යාත්‍රාවේ ඇති මත්ස්‍ය සහ මත්ස්‍ය නිෂ්පාදන සහ මසුන් තබා ගැනීමට, සැකසීමට, කිරා මැන බැලීමට හෝ ගබඩා කිරීමට භාවිතා කරනු ලැබිය හැකි ධීවර ආම්පන්න සහ ඉඩ ප්‍රදේශ වෙත පූර්ණ ප්‍රවේශය සලසා ගැනීම ඇතුළුව, තම රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය වේයැයි එකී බලයලත් තැනැත්තා විසින් තීරණය කරනු ලැබිය හැකි යාත්‍රාවෙහි ඇති සියලු පහසුකම්, ආම්පන්න සහ උපකරණ සඳහා මුළුමනින්ම ප්‍රවේශය අත්කර ගැනීම සහ ඒවා භාවිතයට ලබා ගැනීම;<br><br>iii.වාර්තා පරීක්ෂා කිරීම සහ පිටපත් කර ගැනීම සහ ඡායාරූප ගැනීම ඇතුළු මේ පනත යටතේ ගැනෙන කර්තව්‍යයන් ඉටු කිරීමේ සහ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා, යාත්‍රාකිරීමේ සහ සන්නිවේදන උපකරණ ඇතුළු එකී යාත්‍රාවේ ඉඩ ප්‍රදේශ හා ආම්පන්න සහ උපකරණ වැනි මසුන් ඇල්ලීමට අදාළ සහ ඔහුගේ / ඇයගේ භාවිතය සඳහා එම උපකරණ ක්‍රියාත්මක කර තබා ගැනීමට අදාළ අනෙකුත් තොරතුරු සහ ලොග් පොත්, සටහන් සහ ලියකියවිලි ඇතුළු,මේ පනත යටතේ හෝ වෙනත් ආකාරයකින් රැගෙන යාමට සහ නඩත්තු කර පවත්වා ගැනීමට අවශ්‍ය වන්නාවූ ද, යාත්‍රාවට අයත් කවර හෝ වාර්තා සටහන් වෙත පූර්ණ ප්‍රවේශය අත්කර ගැනීම;<br>81<br><br>iv.විද්‍යාත්මක අරමුණු සඳහා අවශ්‍ය විය හැකි යම් මත්ස්‍යයෙකුගේ යුක්ති සහගත සාම්පල හෝ සම්පූර්ණ නිදර්ශක ලබා ගැනීම, මැනීම, ගබඩා කිරීම හෝ යාත්‍රාවෙන් ඉවත් කිරීම;<br>v.යාත්‍රාවකින් ආරක්ෂිතව ගොඩ බැසීම ;<br>සඳහා ඉඩදීමට සහ සහය දීමට අසමත් හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම;<br>ආ) මේ පනත මගින් හෝ ඒ යටතේ බලය පවරන ලද විගණනයක්, පරීක්ෂණයක්, විභාගයක් හෝ සෝදිසි කිරීමක් සිදුකිරීමට ඉඩ අවසර ලබා දීමට අසමත් වීම හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය;<br><br>ඇ) යම් තැනැත්තෙකු හෝ තැනැත්තන්, මේ පනතේ විෂය පථය තුළට ගැනෙන යම් ක්‍රියාකාරකම්වල නියැලෙන ශීතනය සහිත ගබඩා කිරීමේ , අපනයනය කිරීමේ සහ සැකසුම් කිරීමේ, තොටුපල හෝ වෙනත් ස්ථාන සඳහා යොදා ගනු ලබන පරිශ්‍රයක් හෝ පහසුකමක් ඇතුළු යම් |

පරිශ්‍රයකට හෝ පහසුකමකට සම්බන්ධ අවකාශ සහ යම් මත්ස්‍ය හෝ මත්ස්‍ය නිෂ්පාදන, ධීවර ආම්පන්න, උපකරණ හෝ වාර්තා වෙත, මේ පනතට අනුව බලයලත් තැනැත්තෙකු විසින් ප්‍රවේශය අත්කර ගනු ලැබ, ඒවා පරීක්ෂා කිරීම සඳහා සියලු සාධාරණ ක්‍රමවලින් පහසුකම් සලසා දීමට අසමත් වීම හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම;

ඈ) කිසියම් මත්ස්‍ය හෝ වෙනත් ජලජ සම්පතක් ප්‍රවාහනය කරන ඕනෑම වාහනයක් නැවැත්වීමට සහ සෝදිසි කිරීමට ඉඩ අවසර ලබා දීමට අසමත් වීම හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම;

ඉ) බලයලත් තැනැත්තෙකු විසින් දෙනු ලබන සෑම නීත්‍යානුකූල උපදෙසකටම හෝ විධානයකටම යුහුසුළුව සහ පූර්ණ වශයෙන් අනුකූල වීමට අසමත් වීම, එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැරීම;

ඊ) ඔහුගේ / ඇයගේ නම, උපන් දිනය සහ පදිංචි ස්ථානය හෝ වෙනත් යම් තොරතුරු බලයලත් තැනැත්තෙකුට ප්‍රකාශ කිරීමට නීත්‍යානුකූලව නියම කරනු ලැබූ විට, එසේ කිරීමට අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සැලකිය යුතු ආකාරයේ යම් සාවද්‍ය, වැරදි හෝ නොමග යවන සුළු තොරතුරු ලබා දීම;

උ) මේ පනත මගින් තහනම් කරන ලද යම් ක්‍රියාවක් සඳහා නීත්‍යානුකූලව අත්අඩංගුවට ගැනීමට විරුද්ධ වීම;

ඌ) මේ පනත යටතේ ස්වකීය රාජකාරි ඉටු කරන හෝ ස්වකීය බලතල ක්‍රියාත්මක කරන බලයලත් තැනැත්තෙකුට හෝ ධීවර පරීක්ෂකවරයෙකුගේ උපදෙස් හෝ ඔහුගේ / ඇයගේ සහය යටතේ නීත්‍යානුකූලව කටයුතු කරන යම් තැනැත්තෙකුට පහර දීම, බාධා කිරීම, ප්‍රතිරෝධය දැක්වීම, ඔහුව / ඇයව ප්‍රමාද කිරීම, යාත්‍රාවට ගොඩවීම ප්‍රතික්ෂේප කිරීම, ඔහුව / ඇයව බිය ගැන්වීම හෝ පැහැරගෙන යාම හෝ එලෙස ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තෙකුට ආධාර කිරීම, ඔහුව / ඇයව උසිගැන්වීම හෝ දිරිමත් කිරීම;

එ) මේ පනතට පටහැනිව යම් ක්‍රියාවක් සිදු කර ඇති බවට විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඇති වෙනත් තැනැත්තෙකු ග්‍රහණයට ගැනීම හෝ අත්අඩංගුවට ගැනීම සඳහා කවර හෝ ආකාරයකින් මැදිහත් වීම, ප්‍රමාද කිරීම හෝ වැළැක්වීම;

ඒ) බලයලත් තැනැත්තෙකුට අදාළ සියලු රාජකාරි ආරක්ෂිතව ඉටු කිරීම සඳහා හෝ බලයලත් තැනැත්තෙකු ඔහුගේ / ඇයගේ රාජකාරි ඉටු කිරීමේ දී ඔහුගේ / ඇයගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සුදුසු පරිදි සියලු සාධාරණ පියවර ගැනීමට අසමත් වීම හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම ;

ඔ) තමා, බලයලත් තැනැත්තෙකු ලෙස හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ බලයලත් තැනැත්තාගේ උපදෙස් යටතේ හෝ ඔහුගේ / ඇයගේ සහය පිණිස නීත්‍යානුකූලව ක්‍රියා කරන තැනැත්තෙකු ලෙස හැඟවෙන අයුරින් පුද්ගලාරූඪණය වීම හෝ ව්‍යාජ ලෙස පෙනී සිටීම;

ඕ) තමා, ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති හෝ නිලධාරියෙකු ලෙස හෝ යාත්‍රාපති හෝ නිලධාරියෙකු නොවන බව හැඟවෙන අයුරින් පුද්ගලාරූඪණය වීම හෝ ව්‍යාජ ලෙස පෙනී සිටීම;

ක) බලයලත් තැනැත්තෙකුට අල්ලස් දීම හෝ අල්ලස් දීමට උත්සාහ

| | |
|---|---|
| | කිරීම;<br><br>ග) බලයලත් තැනැත්තෙකු විසින් නම් කරන ලද ශ්‍රී ලංකාවේ යම් ස්ථානයක් කරා තහනමට ගත් යාත්‍රාවක් යාත්‍රා කිරීමට අසමත් වීම සහ යාත්‍රාවේ සිටින සියලු දෙනාගේ ආරක්ෂාව සහතික කිරීමට අසමත් වීම;<br><br>ච) බලයලත් තැනැත්තෙකුට ඔහුගේ / ඇයගේ රාජකාරි ඉටු කිරීමේ දී බාධා කිරීම හෝ වෙනත් ආකාරයකින් ක්‍රියා කිරීම ;<br><br>නොකළ යුතු ය.<br>2. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදකට වරදකරුවන අතර වරදකරුවකු වූ විට, III වන උපලේඛනයේ දක්වා ඇති දණ්ඩනයට යටත් විය යුතු ය. |
| | **XI වන කොටස - සමථකරණය, පරිපාලනමය සහ අධිකරණමය ක්‍රියා පටිපාටිය** |
| | **1 වන පරිච්ඡේදය – සමථකරණය** |
| **ධීවර ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය**<br>**130 වන වගන්තිය** | 1. අමාත්‍යවරයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, එක් එක් ධීවර දිස්ත්‍රික්කයක් සඳහා, ධීවර ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයක් (බේරුම් කිරීමේ මණ්ඩලයක්) ස්ථාපිත කළ හැකි අතර, බේරුම් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස තැනැත්තන් නමදෙනෙකුට (9 කට) නොවැඩි සංඛ්‍යාවක් පත් කළ හැකි ය.<br><br>2. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයට;<br>අ) ධීවර නිලධාරීන් තිදෙනෙකු;<br>ආ) අදාළ විෂය පිළිබඳ මනා පළපුරුද්ද සහ ප්‍රවීණත්වය ඇති තැනැත්තන්; සහ / හෝ,<br>ඇ) ප්‍රජා නායකයෙක්,<br>පත් කර ගනු ලැබිය යුතු ය.<br><br>3. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම සඳහා නිර්දේශ කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ධීවර ක්ෂේත්‍රයේ අදාල තාක්ෂණික හැකියාවන්, දැනුම සහ ප්‍රවීණත්වය සැලකිල්ලට ගත යුතු ය.<br><br>4. (131) වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්,තමන් වෙත යොමු කරන ආරවුල් නිරවුල් කිරීම සඳහා ස්වාධීන සහ අපක්ෂපාතී සංවාද මණ්ඩපයක් සැපයීම ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයෙහි කර්තව්‍යය විය යුතු ය.<br><br>5. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය සඳහා පත් කරන ලද සෑම සාමාජිකයෙකුම වසර තුනක (3) කාල පරිච්ඡේදයක් තම ධූරය දරනු ලබන අතර, (6) වන උප වගන්තිය යටතේ කලින් ඉවත් කළහොත් මිස, තව දුරටත් වසර තුනක (3) ධූර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුසුකම් ලබයි.<br><br>6. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ එහි අඛණ්ඩව කටයුතු කිරීම සඳහා පහත සඳහන් ඕනෑම තැනැත්තෙක්:<br>අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙක්;<br>ආ) සිහිවිකල් බවට ප්‍රකාශයට පත්කළ තැනැත්තෙක්;<br>ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක කිසියම් අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් වූ හෝ බුන්වත්භාවයට පත් වූ තැනැත්තකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ තැනැත්තෙකු; |

| | |
|---|---|
| | ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක කිසියම් අධිකරණයක් විසින් පනවන ලද දඬුවමකට යටත්ව බන්ධනාගාරගතව සිටි තැනැත්තෙක්; හෝ<br>ඉ) මේ පනත යටතේ හෝ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගයක් යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු වී ඇති හෝ චෝදනා ලැබ සිටින තැනැත්තෙක්,<br>නුසුදුස්සකු විය යුතු ය.<br><br>7. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයට සිය රැස්වීම් පැවැත්වීම සඳහා තමන්ගේම වූ කාර්ය පටිපාටික රීති අනුගමනය කළ හැකි ය.<br><br>8. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය පිහිටුවීම පිළිබඳව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. |
| **ධීවර ආරවුලක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීම**<br>**131 වන වගන්තිය** | 1. ධීවර ආරවුලට සම්බන්ධ පාර්ශ්වයන්, එවැනි ආරවුලක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමට පෙර දිස්ත්‍රික්ක මට්ටමින් එය බේරුම් කර ගැනීමට උත්සාහ කළ යුතු ය.<br><br>2. යම් ධීවර ආරවුලක් පැන නැගී ඇති අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් :<br>අ) එවැනි ආරවුලක්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් අවශ්‍ය නොවන විට, සමථයකට පත් කිරීම සඳහා ආරවුල් බේරුම් කිරීමේ නිලධාරියෙකු වෙත යොමු කරනු ලැබිය හැකි ය, හෝ ;<br>ආ), ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් අවශ්‍ය වන අවස්ථාවක, එවැනි ආරවුලක් නිශ්චය කිරීම සඳහා ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයට සාමාජිකයන් තිදෙනෙකු (3) නම් කිරීමට පෙර, එකී පරීක්ෂණය පවත්වන ලෙස නියම කළ හැකි ය.<br>ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් (2) (අ) වන උප වගන්තිය යටතේ ධීවර ආරවුලක් යොමු කළ අවස්ථාවක, ආරවුල් බේරුම් කිරීමේ නිලධාරියා ආරවුලට සම්බන්ධ පාර්ශවයන් කැඳවා, අදාළ ආරවුල තමා වෙත යොමු කිරීමෙන් දින තිහක් (30) ඇතුළත එය සමථ කිරීමට උත්සාහ කළ යුතු ය.<br><br>3. ආරවුල් බේරුම් කිරීමේ නිලධාරියා ආරවුල නිරවුල් කරන අවස්ථාවක :<br>අ) ඔහු හෝ ඇය විසින් බේරුම්කරණය පිළිබඳ විස්තර සටහන් කර, එය, අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය. එවැනි ආරවුලක් සම්බන්ධයෙන් බේරුම් කිරීමේ නියමයන්ට එකඟවීමේ සහතිකයක් අත්සන් කිරීම, ආරවුලට සම්බන්ධ සෑම පාර්ශවයකගේම යුතුකම වන්නේ ය ;<br>(ආ) (3) (අ) වන උප වගන්තියට අනුව, එවැනි සහතිකයක් අත්සන් කර ඇති පාර්ශවයක්, අදාළ බේරුම්කරණ නියමයන්ගෙන් බැඳෙනු ඇත.<br><br>4. ආරවුල් බේරුම් කිරීමේ නිලධාරියා, තමා වෙත එකී ආරවුල යොමු කිරීමෙන් දින තිහක් (30) ඇතුළත බේරුම් කිරීමක් ඇති කර ගැනීමට අපොහොසත් වුවහොත්, ඔහු / ඇය, ඒ බව අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය. ඒ අනුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 130 වන වගන්තිය යටතේ ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු (3) නම් කර ඒ බව, පහත දැක්වෙන පරිදි, ගැසට් පත්‍රයෙහි සහ දිනපතා පුවත්පත්වල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ප්‍රකාශයට පත් කරන ලද නිවේදනයක් මගින් ප්‍රසිද්ධියට පත් කළ යුතු ය :<br>අ) ආරවුලෙහි විෂය කරුණ නිශ්චිතව සඳහන් කළ යුතු ය ;<br>ආ) ආරවුල නිශ්චය කිරීම සඳහා නම් කරන ලද තැනැත්තාගේ /තැනැත්තන්ගේ නම / නම් නිශ්චිතව සඳහන් කළ යුතු ය ;<br>ඇ) ආරවුලට අදාළ කරුණු සැලකිරීම්, නිශ්චිත දිනයකට පෙර, |

| | |
|---|---|
| | ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයන් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස, එකී කරුණු සැලකිරීම් සිදු කිරීමට කැමති සියලු තැනැත්තන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය; සහ<br>ඇ) ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ කෘත්‍යයන් ආරම්භ කරන දිනය, වේලාව සහ ස්ථානය දැනුම් දෙනු ලැබිය යුතු ය.<br><br>5. බේරුම් කිරීමේ කෘත්‍යයන් අවසානයේ දී, ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය විසින් ඒ පිළිබඳ සිය තීරණය සහ ඊට හේතු ඇතුළත් වාර්තාවක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු ය.<br><br>6. එම තීරණය ලබා දී දින තිහක් (30) ඇතුළත ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණයට එරෙහිව අභියාචනා කිසිවක් නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්:<br>අ) ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය :<br>ආ) ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණයේ පිටපතක් ධීවර ආරවුලට අදාළ එක් එක් පාර්ශව වෙත යැවිය යුතු ය; සහ,<br>ඇ) ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණයේ පිටපතක් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දිය යුතු ය.<br><br>7. අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලය විසින් ගනු ලබන තීරණය බලාත්මක කළ යුතු අතර, එම තීරණයෙන් ධීවර ආරවුලට සම්බන්ධ පාර්ශවයන් බැඳී සිටිය යුතු ය.<br><br>8. ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ තීරණය පිළිබඳව සෑහීමට පත් නොවන පාර්ශවයකට, තීන්දුව ලබා දුන් දින සිට දින තිහක් (30) ඇතුළත අධිකරණ ක්‍රියාමාර්ගයන්ට එළඹිය හැකි ය.<br><br>9. (7) වන උප වගන්තිය යටතේ විරෝධතාවක් නොමැති අවස්ථාවකදී ආරවුල් බේරුම් කිරීමේ මණ්ඩලයේ හෝ (3) (අ) වන උප වගන්තිය යටතේ ආරවුල් බේරුම් කිරීමේ කිරීමේ නිලධාරියාගේ තීරණයට අනුකූලතාව දැක්වීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ කිරීමට අපොහොසත් වීම යම් පාර්ශ්වයක් විෂයයෙහි වරදක් විය යුත්තේ ය.<br><br>10. (3) (අ) වන උප වගන්තිය සහ (7) වන උප වගන්තිය යටතේ ගනු ලබන තීරණය අවසානාත්මක වේ. එකී තීරණය කිසිදු අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු අතර, එම තීරණය, අධිකරණය සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ලබා දුන් තීන්දුවක ආකාරයෙන්ම බලාත්මක කරනු ලැබිය යුතු ය.<br><br>11. එවැනි තීරණයකට අනුකූලතාව දැක්වීමට අපොහොසත් වන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර, වරදකට වරදකරු වූ විට, III වන උපලේඛනයේ සඳහන් දණ්ඩනයකට සහ අධිකරණය විසින් පනවනු ලැබිය හැකි වෙනත් යම් නියෝගයකට යටත් විය යුතු ය |
| | **2 වන පරිච්ඡේදය – පරිපාලනමය කාර්ය පටිපාටිය** |
| විශේෂඥ මණ්ඩලය<br>**132 වන වගන්තිය** | 1. අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන ධීවර හා ජලජ සම්පත්, නීතිය සහ ගණකාධිකරණය යන ක්ෂේත්‍රවල දැනුම හා පළපුරුද්ද ඇති පුද්ගලයින් තිදෙනෙකුගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයක්, ('මණ්ඩලය') පත්කළ යුතු ය. |

| | |
|---|---|
| | 2. එම මණ්ඩලයේ කර්තව්‍ය විය යුත්තේ යම් තැනැත්තෙකු වෙත මූල්‍යමය දණ්ඩනයක් පැනවිය යුත්තේ කවර පරිවේෂණයක් යටතේද යන්න පිලිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ ලබා දීම ය . |
| **සමථයට පත් කිරීම**<br><br>**133 වන වගන්තිය** | 1. 132 වගන්තිය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ නිර්දේශය මත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්:<br>අ) එකී වරද කුමන පරිවේෂණ යටතේ සිදු කරන ලද්දේදැ යි යන්න සැලකිල්ලට ගනිමින් ;<br>ආ) මේ පනතේ හෝ එහි යම් ක්‍රියාත්මක කිරීමේ නියෝගවල යම් විධිවිධානයකට පටහැනිව යම් තැනැත්තෙකු හෝ ක්‍රියාකරුවෙකු වරදක් කර ඇති බවට විශ්වාස කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඔහු සතුව ඇති අවස්ථාවක ;<br><br>ඇ) අදාළ තැනැත්තා හෝ ක්‍රියාකරු පළමු වරදකරු වන අවස්ථාවක ;<br><br>ඈ) අදාළ වරද, මේ පනත යටතේ බරපතල වරදක් නොවන අවස්ථාවක ; සහ,<br><br>ඉ) එකී තැනැත්තා හෝ ක්‍රියාකරු තමන් විසින් එවැනි වරදක් කර ඇති බව ලිඛිතව පිළිගැනීමෙන් පසුව සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මේ පටිපාටි පිළිබඳව සම්පූර්ණයෙන් දැනුම් දීමෙන් පසු දින දහයක් ඇතුළත සමථකරණ කෘත්‍යයන්ට එම තැනැත්තා එකඟ වී ඇති අවස්ථාවක<br>වරදක් සමථයට පත් කරනු ලැබිය හැකි ය.<br><br>2. මේ පනත යටතේ සමථකරණ කෘත්‍යයන් ආරම්භ කර ඇති අවස්ථාවක දී, තමා වරදක් කළ බව පිළිගන්නා තැනැත්තෙකු හෝ ක්‍රියාකරුවෙකු විසින්:<br>අ) දණ්ඩනය සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තුරු මසුන් ඇල්ලීමෙහි හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල හෝ යම් නීති උල්ලංඝණය කිරීමකට අදාළ කිසිදු ක්‍රියාකාරකමක හෝ නොයෙදිය යුතු ය; සහ<br>ආ) සමථකරණයට යටත් වන වරදට අදාළව මේ පනතට අනුව සිදු වූ කිසියම් තහනමට ගැනීමකට එකඟ වූ බව සලකනු ලැබිය යුතු ය.<br><br>3. (2) (අ) වන උප වගන්තිය අනුව යම් වරදක්, එසේ කිරීම තහනම් කර තිබිය දී මසුන් ඇල්ලීමෙහි හෝ ඒ ආශ්‍රිත වෙනත් ක්‍රියාකාරකම්වල යෙදීමෙහි නියැලෙන හෝ මේ වගන්තියේ නියමයන්ට අනුව වලංගු නියෝගයක් කඩ කරන තැනැත්තෙකු වෙනම වරදක් සිදු කරන අතර, එම තැනැත්තා දණ්ඩනයකට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ මේ පනත යටතේ ගැනෙන යම් වැඩිමනත් නීති කෘත්‍යයන්ට යටත් විය යුතු ය.<br><br>4. වරද සමථයට පත් කිරීම සඳහා මණ්ඩලයේ නිර්දේශය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන මූල්‍යමය දඩය, ඒ හා සම්බන්ධ උපරිම දඩයෙන් තුනෙන් එකකට නොඅඩු දඩයක් හෝ මසුන් ඇල්ලීමට අදාළ වටිනාකමෙන් පස් ගුණයකට නොඅඩු දඩයක් යන ප්‍රමාණයෙන් කවර හෝ ඉහළ ප්‍රමාණයේ වටිනාකමක් සහිත දඩයක් විය යුතු ය.<br><br>5. (4) වන උප වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන දණ්ඩනයට අයත් සම්පූර්ණ මුදල, අදාළ සමථකරණය කිරීමට යටත් වන තැනැත්තා වෙත එවැනි දඩ මුදලක් පිළිබඳව දැනුම් දී දින හැටක් (60) ඇතුළත නොගෙවුවහොත්, එකී කාරණය වහාම නඩු මෙහෙයවන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.<br><br>6. මේ වගන්තිය යටතේ දඩ මුදල සම්පූර්ණයෙන් ගෙවීමෙන් පසු, මේ පනත යටතේ තහනමට ගන්නා ලද යම් අයිතමයක්, භාණ්ඩයක්, මත්ස්‍යයින් හෝ ධීවර නිෂ්පාදන කිසිවක් අදාළ සමථකරණ ගිවිසුමේ ස්ථාපිත කොන්දේසිවලට යටත්ව නිදහස් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නියම |

කළ හැකි ය.

7. මේ වගන්තිය යටතේ ක්‍රියාවලියක් සිදුවෙමින් පවතින අවස්ථාවක දී , අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී ක්‍රියාවලිය පිළිබඳව නඩු මෙහෙයවීමේ අධිකාරිය වෙත දැන්විය යුතු අතර එම අවස්ථාවේදී වරදට නඩු පැවරීමක් සිදු නොකළ යුතු ය.

8. සිදු කර ඇති වරද අධිචෝදනා ලැබිය හැකි වරදක් වුවහොත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතියකින් තොරව (1) වන උප වගන්තිය යටතේ ක්‍රියා නොකළ යුතු ය.

9. මේ පනතට හෝ නියෝගමාලාවකට එරෙහි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට හෝ ක්‍රියාකරුවෙකුට එරෙහිව ගෙන එන ඕනෑම නීති කෘත්‍යකදී, එම තැනැත්තා තමාට චෝදනා කර ඇති වරද මේ පනත යටතේ සමථ කර ඇති බව ඔප්පු කළහොත්, එය ඔහු සඳහා වන විත්ති වාචකයක් විය යුතුය.

10. මෙම වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය කිසිදු අධිකරණයක් හෝ අධිකාරියක් ඉදිරියේ කිසිදු පරීක්ෂණයකට හෝ අභියාචනයකට යටත් නොවිය යුතුය.

## 3 වන පරිච්ඡේදය – අධිකරණමය ක්‍රියා පටිපාටිය, වැරදි සහ දණ්ඩන

**අධිකරණ බලය සහ නඩු පැවරීමේ හිමිකම**

**134** වන වගන්තිය

1. මේ පනතේ විධිවිධාන කිසිවකට පටහැනිව, මේ පනත අදාළ වන කවර වුවද ස්ථානයක් සහ කවර වුවද තැනැත්තෙකු විෂයයෙහි සිදුවන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, එබඳු කිරීමක් හෝ නොකර හැරීමක් සිදු වූ සේ සලකා කටයුතු කළ යුතු අතර :

අ) මහාධිකරණයට ක්‍රියා කිරීමේ අයිතිය ඇති සියලු වැරදි සඳහා මහාධිකරණය සතු; හෝ

ආ) මහ මුහුදේ දී කළ වැරදි ඇතුළු දේශීය අධිකරණ බල ප්‍රදේශයෙන් බැහැරව, කොළඹ මහාධිකරණයට ඇති තනි සහ අනන්‍ය අධිකරණ බලය විෂයයෙහි ගැනෙන යම් වරදක් සම්බන්ධයෙන් විභාග කිරීම සඳහා ඊට ඇති අනන්‍ය අධිකරණ බලය යටතේ පවත්නා වැරදි හැර, මේ පනත යටතේ සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් යම් මහේස්ත්‍රාත් අධිකරණයකට ක්‍රියා කිරීමේ අයිතිය ඇති සියලු වැරදි සඳහා එම අධිකරණය සතු ;

අධිකරණ බල සීමාව තුළ ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතු ය.



2. (1) (ආ) වන උප වගන්තියට අනුව ගැනෙන මුත් ශ්‍රී ලංකා අධිකරණ බලසීමාව තුළ හෝ පිටත මහේස්ත්‍රාත් අධිකරණ බලය ඇති යම් වරදක් සිදුකරන අවස්ථාවක, හැකි සෑම අවස්ථාවකදී ම, නඩුව මෙහෙයවන්නා විසින් තීරණය කරනු ලබන පරිදි, එ් වරද කරනු ලැබූ ස්ථාන විෂයෙහි හෝ ඒ වරද කිරීමෙන් පසු විත්තිකරු ගොඩට එන ස්ථානයට සමීපතම අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට, ඒ වරද පිළිබඳව නඩුව විභාග කිරීමේ අධිකරණ බලය ඇත්තේ ය.

3. අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අදාළ කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තෙකුට මහේස්ත්‍රාත් අධිකරණ බල සීමාව තුළ සිදු කරන ලද යම් කිරීමක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ඕනෑම තැනැත්තෙකුට හෝ යාත්‍රාවකට එරෙහිව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 136(1) ( ආ) වගන්තිය යටතේ අධිකරණ ක්‍රියා පටිපාටි ගැනීමට මේ පනත යටතේ බලය ඇත්තේ ය .

4. මේ පනත යටතේ යම් මහාධිකරණයක දී ගනු ලබන සියලු නඩු

කෘත්‍යයන්, නීතිපතිවරයාගේ අත්සන යටතේ අධිචෝදනා පත්‍රයක් මගින් සිදු කරනු ලැබිය යුතු ය.

5. මේ පනත යටතේ පත් කරන ලද හෝ රාජකාරි ඉටු කරනු ලබන හෝ අදාළ ප්‍රවේශ ගිවිසුමක් හෝ ධීවර කළමනාකරණ ගිවිසුමක් හෝ ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග යටතේ නම් කරන ලද යම් බලයලත් තැනැත්තෙකුට හානි වන්දි, දණ්ඩන, දඩ හෝ වෙනත් ආකාරයක යම් මුදලක් අයකර ගැනීම සඳහා :

අ) (1) වන උප වගන්තියෙහි විස්තර කර ඇති පරිදි මහාධිකරණ අධිකරණ බල සීමාව තුළ උපවය වූ ;

ආ) මේ පනත හෝ ශ්‍රී ලංකාවේ වෙනත් නීතියක් හෝ නීති යටතේ නෛතිකව කටයුතු කළ හැකි; හෝ

ඇ) එකී බලයලත් තැනැත්තාගේ ජාතිකත්වය හෝ ස්ථිර පදිංචිය නොතකා එම තැනැත්තා වෙත පවරනු ලැබ ඇති බලය ප්‍රකාරව වූ යම් ප්‍රවේශ ගිවිසුමක්, ධීවර කළමනාකරණ හෝ ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග උල්ලංඝනය කිරීමක් වන්නා වූ ;

යම් කිරීමක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් කිසියම් තැනැත්තෙකුට හෝ යාත්‍රාවකට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පැවරිය හැකි ය.

6. (5) වන උප වගන්තිය යටතේ දක්වා ඇති සෑම නඩුවක්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමින් හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කරන යම් බලයලත් තැනැත්තෙකුගේ නමින් පවරනු ලැබිය යුතු අතර, එකී එක් එක් නඩු පැවරීම සහ ඒවා විභාග කිරීම විෂයයෙහි, 1990 අංක 02 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (3),(4),(5),(6),(7),(8),(12),(13),(14), (15) සහ (23) දක්වා වන වගන්ති, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.

7. (6) වන උප වගන්තිය යටතේ නඩු කටයුත්තක් පවරා ඇති අවස්ථාවක දී, එවැනි වෙනත් යම් කටයුත්තක් අවසන් කිරීම සඳහා අවශ්‍ය වන යම් පරිවේෂණ තත්ත්වයන්හි දී හැර, එකී නඩු කෘත්‍ය පවරන ලද දින සිට මාස හයක කාලයක් ඇතුළත, එය විභාග කර අවසන් කිරීමට අධිකරණය විසින් ප්‍රමුඛත්වය දෙනු ලැබිය යුතු ය.

**135 වගන්තිය**

**ක්‍රියාපටිපාටිය**

1. මේ පනත යටතේ සිදු කරන ලද වරදකට මහේස්ත්‍රාත් ඉදිරියේ ලඝු පරිපාටියෙන් හෝ එසේ නැතහොත් (133) වන වගන්තිය ප්‍රකාරව ගන්නා ලද සමථ කිරීමේ කෘත්‍යයන් අසාර්ථක වී ඇති අවස්ථාවක දී පමණක් මහාධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබිය යුතු ය.



2. (139) වන වගන්තියෙහි කුමක් සඳහන් වුවද, මේ පනත යටතේ සිදු කරන ලද ධීවර වැරදි සම්බන්ධව කරුණු වාර්තා කිරීමට බලයලත් නිලධාරියෙකුට හැකි ය.

3. මේ පනත යටතේ අයවිය යුතු සහ ගෙවිය යුතු වන්නා වූ ගාස්තු, අයබදු සහ අය කිරීම් නඩු පවරා අයකර ගැනීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි ය.

4. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ ධීවර යාත්‍රාවක සිටින යම් ලියාපදිංචි යාත්‍රා හිමිකරුවෙකු, යම් ක්‍රියාකරුවෙකු හෝ යම් තැනැත්තෙකු එකී යාත්‍රාව ප්‍රථම වරට අත්අඩංගුවට ගත් අවස්ථාවක හෝ එම අත්අඩංගුවට ගැනීමෙන් පසු කිසියම් අවස්ථාවක ශ්‍රී ලංකාවේ වාසිකව හෝ භෞතිකව පෙනී නොසිටින අවස්ථාවක, එකී ලියාපදිංචි හිමිකරු හෝ ක්‍රියාකරු, අධ්‍යක්ෂවරයකු ලෙස සම්බන්ධ වෙනත් එවැනි තැනැත්තෙකු, නිලධාරියකු සහ සේවකයකු වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් සම්බන්ධයක් ඇති ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ක්‍රියාත්මක වන කිසියම් සංස්ථාගත ආයතනයක් එබඳු යාත්‍රාවක ක්‍රියාකරු ලෙස

| | |
|---|---|
| | සලකනු ලැබිය යුතු අතර , ඊට පටහැනිව යමක් ඔප්පු වුවහොත් මිස, එවැනි සංස්ථාගත ආයතනයකට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත හැකිය.<br><br>5. කිසියම් විදේශීය ධීවර යාත්‍රාවක් විසින් ශ්‍රී ලංකා ජල තීරයේදී සිදු කරන ලද යම් වරදකට අදාළ ඕනෑම නඩු කටයුත්තක් මහේස්ත්‍රාත් අධිකරණයේ එවන් නඩුවක් පවරන ලද දින සිට මාස එකක්/මාස තුනක් ඇතුළත දී අවසන් කරනු ලැබිය යුතු ය. |
| **සාමාන්‍ය වරද**<br><br>**136 වන වගන්තිය** | මේ පනත යටතේ වෙනත් දණ්ඩනයක් නිශ්චිතව සලසා නොමැති යම් වරදක් විෂයෙහි:<br><br>අ) දඩයක් හෝ නීති උල්ලංඝනය කරමින් අදාළ තැනැත්තා විසින් අල්ලා ගත් මත්ස්‍ය අස්වැන්නේ වටිනාකමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභය මෙන් දෙගුණය යන දෙයාකාරයෙන් වඩා වැඩි ප්‍රමාණය ගණනය වන දඩ මුදලක් ;<br>ආ) හිතාමතා නීති උල්ලංඝනය කිරීම් හෝ දැඩි නොසැලකිලිමත්කම විෂයයෙහි සිදු වන නීති උල්ලංඝනයන් සඳහා, පහත සඳහන් එක් දණ්ඩනයක් හෝ දණ්ඩන දෙවර්ගයම :<br>i) දඩයක් හෝ නීති උල්ලංඝනය කිරීම මගින් අදාළ තැනැත්තා අල්ලා ගත් මත්ස්‍ය අස්වැන්නේ වටිනාකමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභය මෙන් තෙගුණය යන දෙයාකාරයෙන් වඩා වැඩි ප්‍රමාණය ගණනය වන දඩ මුදල; සහ / හෝ<br>ii) වසර දෙකක් නොඉක්මවන කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීම.<br><br>ඇ) ධීවර සම්පත්වලට හෝ පොදුවේ සමුද්‍ර හෝ ජලජ පරිසරයට හානි වන නීති උල්ලංඝනයන් සඳහා, එම උල්ලංඝනය නිසා වෙළඳපළ තුළ සිදු වන වටිනාකම අඩුවීම මෙන් දෙගුණයකට සමාන ප්‍රමාණය හෝ ධීවර සම්පත් ප්‍රතිස්ථාපනයට පත් කිරීමේ මුළු පිරිවැය මෙන් දෙගුණය හෝ පරිසරය ප්‍රතිස්ථාපනයට පත් කිරීමේ මුළු පිරිවැය මෙන් දෙගුණය යන ප්‍රමාණවලින් වඩා වැඩි ප්‍රමාණය ගණනය වන අතිරේක දඩ මුදලක්<br>අධිකරණය විසින් පනවනු ලැබිය හැකි ය. |
| **දණ්ඩන මට්ටම්**<br><br>**137 වන වගන්තිය** | 1. මේ පනතේ දක්වා ඇති දණ්ඩන මට්ටම III වන උපලේඛනයේ දක්වා ඇති මුදල් ප්‍රමාණයට අනුරූප වේ.<br><br>2. III වන උපලේඛනය, නියෝග මගින් සංශෝධනය කළ හැකි ය.<br><br>3. මේ පනත ප්‍රකාරව අධිකරණමය හෝ පරිපාලනමයපටිපාටින් තුළ නියම කරනු ලබන දඩය හෝ ගනු ලබන තීරණයන්, අදාළ නීති විෂයයෙහි අනුකූලතාව තහවුරු කිරීමටත්, නීති උල්ලංඝනයන් සිදුවන ඕනෑම තැනක ඒවා අධෛර්යමත් කිරීමටත් බලපෑමක් ඇති වන පරිදි ප්‍රබලත්වයෙන් ප්‍රමාණවත් විය යුතු අතර, වැරදිකරුවන්ට තම නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් ලැබෙන ප්‍රතිලාභ අහිමි කරනු පිණිසත්, සහ, විශේෂයෙන්, අදාළ අධිකරණමය හෝ පරිපාලනමය පටිපාටින් ඇතුළු අනෙකුත් කරුණු අතර, පහත සඳහන් නිර්ණායක;එනම්,<br><br>අ) වරදෙහි බරපතලකම ;<br>ආ) අදාළ තැනැත්තා නැවත නැවතත් වැරදිකරුවෙකු බවට පත්ව සිටින්නේ ද නැද්ද යන්න, ඔහු / ඇය තනිව හෝ හවුලේ ක්‍රියා කළේ ද යන්න සහ ඉන් අත්කර ගත් ප්‍රතිලාභය යන කාරණා ඇතුළු වරදකරුගේ තත්ත්වය ;<br>ඇ) බලයලත් නිලධාරියෙකුට හෝ මේ පනත යටතේ බලතල හෝ වගකීම් ඉටු කරන යම් තැනැත්තෙකුට පහර දීම, ඔහුට / ඇයට බාධා කිරීම හෝ අල්ලස් දීම සහ ආම්පන්නවලට හෝ යාත්‍රාවලට හානි |

| | |
|---|---|
| | කිරීම, ශාරීරික තුවාල සිදු කිරීම, ජීවිත හානි කිරීම, නීති විරෝධී මසුන් ඇල්ලීම හෝ පරිසරයට හානි සිදු කිරීම සම්බන්ධ වැරදි සඳහා දැඩි දඬ මුදලක් හෝ දණ්ඩනයක් නියම කළ යුතු ය; සහ,<br>ඇ) මේ පනතට එරෙහි කිසියම් වරදක්, අන්තර්ජාතික සාපරාධී ක්‍රියාකාරකමකට සම්බන්ධ බව හෝ වෙනත් අන්තර්ජාතික අපරාධමය ක්‍රියාකාරකම් ඇසුරෙහි හවුලේ සිදු කර ඇති බව පෙනෙන්නට තිබේ නම්, දැඩි දඬ මුදලක් හෝ දණ්ඩනයක් නියම කළ යුතු ය,<br>යන්න සැලකිල්ලට ගත යුතු ය. |
| අඛණ්ඩව සිදු කරන වැරදි<br><br>**138** වන වගන්තිය | අඛණ්ඩව සිදු කරන වරදක සෑම දිනක්ම වෙනම වරදක් ලෙස සැලකිය යුතු ය. |
| පුනරාගත වැරදිකරුවන්<br><br>**139** වන වගන්තිය | 1. එක් වරකට වඩා එකම වරදකට වරදකරු වූ යම් තැනැත්තෙකු සඳහා නියම කරනු ලබන කිසියම් දඩ මුදලක් හෝ දණ්ඩනයක් හෝ ඒ දෙකම, පළමු අවස්ථාවේ දී පනවන ලද ප්‍රමාණයට වඩා සැලකිය යුතු ඉහළ මට්ටමක තිබිය යුතු ය.<br><br>2. (1) වන උපවගන්තියේ දැක්වෙන දණ්ඩනයට අමතරව,බලපත්‍රය අවම වශයෙන් මාස තුනක (3) කාලයක් සඳහා අත්හිටුවනු ලැබිය හැකිය. |
| රජය විසින් දරනු ලබන පිරිවැය<br><br>**140** වන වගන්තිය | 1. විදේශ ධීවර යාත්‍රාවක හිමිකරු හෝ එය කුලියට ගත් තැනැත්තා විසින්, යම් වරදකට වරදකරුවකු වූ පසු, අධිකරණය විසින් තීරණය කරනු ලබන පරිදි, එහිලා රජය විසින් වැය කරනු ලබන යම් පිරිවැයක් හෝ වියදමක් පහත සඳහන් සෑම හෝ කවර වුවද අවස්ථාවක දී;එනම්,<br>අ) යාත්‍රාවක් ලුහුබැඳීමේ අදාළ වියදම් ඇතුළුව, මේ පනත යටතේ වරදක් සඳහා විදේශීය යාත්‍රාව තහනමට ගනු ලබන කල්හි ;<br><br>ආ) මේ පනතට අනුව යම් වරදක් සම්බන්ධයෙන් නඩු පවරනු ලබන කල්හි; සහ<br><br>ඇ) මේ පනත යටතේ තහනමට ගනු ලබන යම් යාත්‍රාවක යාත්‍රාධිපති හෝ ගැනියන් සිය රට වෙත පෙරලා ගෙන්වා ගනු ලබන කල්හි<br><br>ඒ වෙනුවෙන් රජය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ කල්හි, දරනු ලැබිය යුතු ය.<br>90<br><br>2. (1) වන උප වගන්තිය යටතේ අධිකරණය විසින් පිරිනමනු ලබන යම් පිරිවැයක් සහ / හෝ වියදම් ප්‍රමාණයක් දඩ මුදලක් ලෙස අයකර ගත හැකි අතර, අධිකරණය විසින් දැනටමත් තීරණය කර ඇති වෙනත් යම් දඩයකට හෝ දඬුවමකට අමතරව පනවනු ලැබිය හැකි ය.<br><br>3. (1) වන උප වගන්තියේ ඇති කිසිවක්, මේ පනත යටතේ කරන ලද වෙනත් යම් නියෝගයකට අනුව දැනටමත් අයකරගෙන ඇති කිසියම් පිරිවැයක් සහ /හෝ වියදම් ප්‍රමාණයක් අයකර ගැනීම සඳහා අවසර දෙනු ලැබෙතැයි නොසැලකිය යුතු ය.<br><br>4. (1) (අ) වන උප වගන්තියට අනුව ලුහුබැඳීමේ පිරිවැය ඉල්ලීමට අදහස් කරන්නේ නම්, එම වරද සම්බන්ධයෙන් අසනු ලබන නඩු විභාගයකට දින දාහතරකට (14) පෙර, එවැනි වියදම් පිළිබඳ ලිඛිත විස්තර, රජය විසින්, චූදිත වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. |

| | |
|---|---|
| | |
| තහනම් නියෝගය<br><br>**141** වන වගන්තිය | 1. මේ පනත යටතේ හෝ මගින් විධිවිධාන සලසා ඇති වෙනත් යම් දඩ මුදලකට හෝ දණ්ඩනයකට අමතරව, ඕනෑම ස්වභාවික තැනැත්තෙකු විෂයයෙහි, අවස්ථාවෝචිත පරිදි, අධිකරණයකට හෝ පරිපාලන මණ්ඩලයකට, එකී තැනැත්තා විසින්:<br>අ) මෙම පනත යටතේ III වන උපලේඛනයේ දැක්වෙන බරපතල වරදක් කර ඇත්නම්; හෝ<br>ආ) මෙම පනත යටතේ බහුවිධ වැරදි කර ඇත්නම්; සහ<br>ඇ) මේ පනත යටතේ යම් වරදක් හෝ වැරදි සඳහා එම තැනැත්තා අධිකරණයක් විසින් අවස්ථා තුනක දී වරදකට වරදකරු කොට ඇති අවස්ථාවක දී ;<br>ශ්‍රී ලංකා ජල තීරයෙහි මසුන් ඇල්ලීම වසර දෙකක කාලයක් දක්වා තහනම් කළ හැකි ය.<br><br>2. (1) වන උප වගන්තිය යටතේ තහනම් කරන ලද තැනැත්තෙකුට ධීවර යාත්‍රාවක ගමන් කිරීමට හෝ එහි රැඳී සිටීමට දැන දැනම අවසර දෙන ධීවර යාත්‍රාවක ක්‍රියාකරු හෝ යාත්‍රාධිපති වරදක් සිදු කරන අතර, එම වරදට වරදකරු වූ විට III වන උපලේඛනයේ දැක්වෙන දණ්ඩනයකට යටත් විය යුතු ය. |
| ගෙවීම් පැහැර හැරීම<br><br>**142** වන වගන්තිය | 1. මේ පනත යටතේ තීරණය කර ඇති යම් දඩ මුදලකට හෝ දණ්ඩනයකට අමතරව, දඩ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අධිකරණය විසින් පැහැර හැරීමේ දණ්ඩනයක් නියම කරනු ලැබිය හැකි අතර, එය, මුළු දඩ මුදලෙන් දිනකට සියයට එකක් [1%] හෝ තීන්දු ප්‍රමාණය හෝ නොඉක්මවිය යුතු ය.<br>2. (අ). යම් ධීවර යාත්‍රාවක්, එන්ජිමක් ,ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්න හෝ උපකරණ කිසිවක් සම්බන්ධයෙන් ආණ්ඩුව සහ යම් තැනැත්තෙකු අතර ඇති කර ගන්නා ලද යම් ගිවිසුමක් මත ආණ්ඩුවට අය විය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම ඒ තැනැත්තා විසින් පැහැර හරින ලද අවස්ථාවකදී, ඒ ධීවර යාත්‍රාව , එන්ජිම , ධීවර දැල හෝ වෙනත් ධීවර ආම්පන්න හෝ උපකරණ තහනමට ගෙන ඉවත් කිරීමට ලිඛිත බලය , අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලයලත් නිලධරයකුට දෙනු ලැබිය හැකිය .<br><br>(ආ). යම් ධීවර යාත්‍රාවක් , එන්ජිමක්, ධීවර දැලක් හෝ වෙනත් ධීවර ආම්පන්නයක් හෝ උපකරණයක් 2(අ ) උප වගන්තිය යටතේ තහනමට ගැනීමේ කාර්යය සඳහා ධීවර යාත්‍රාව , එන්ජිම , ධීවර දැල හෝ වෙනත් ධීවර ආම්පන්නය හෝ උපකරණය තබා ඇත්තේ යයි විශ්වාස කිරීමට බලයලත් නිලධරයකුට හේතු ඇති යම් ස්ථානයකට ඇතුළු වී ඒ ස්ථානය බලය ලත් නිලධරයා විසින් ඕසෝදිසි කරනු ලැබිය හැකි ය .<br><br>(ඇ) . 2 (අ ) උපවගන්තියේ සඳහන් යම් ගිවිසුමක් මත ආණ්ඩුවට ලැබිය යුතු යම් මුදලක් , තත් කාලයේ බලපවත්නා වෙනත් යම් නීතියක විධි විධාන වලට අනුකූලව අය කර ගැනීම , මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් වළක්වනු ලබන්නේ යයි නොසැලකිය යුතු ය . |
| දඩ නොගෙවීම සම්බන්ධව ඇති බැඳියාව<br><br>**143** වන වගන්තිය | 1. සුළු හිමිකම් අධිකරණ හෝ නිසි අධිකරණ බලය සහිත දිස්ත්‍රික් උසාවියක නඩුකරයක් මගින් හෝ වෙනත් සුදුසු සිවිල් නීති මගින් පහත සඳහන් :<br>අ) දඩ මුදල් ලෙස නිශ්චිතව නම් කර නොමැති මූල්‍යමය දඩුවම් ;<br>ආ) සියලුම කුලී, ගාස්තු, වියදම් සහ තීරු බදු; සහ<br>ඇ) මේ පනත යටතේ ගෙවිය යුතු අනෙකුත් සියලු මුදල් ප්‍රමාණ;<br>විෂයයෙහි නඩු පැවරීම, ඒ පිළිබඳව තීරණය කිරීම, එය බලාත්මක කිරීම |

| | |
|---|---|
| | සහ<br>අයකර ගැනීම සිදු කළ හැකි ය.<br><br>2. (1) වන උප වගන්තිය යටතේ දක්වා ඇති සෑම නඩුවක්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නමින් පැවරිය යුතු අතර, එකී එක් එක් නඩුවක් පැවරීම සහ ඒවා විභාග කිරීම විෂයයෙහි, 1990 අංක 02 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (3) (4), (5), (6), (7) , (8), (12), (13), (14), (15) සහ (23) දක්වා වන වගන්ති, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය. |
| **අලාභයක් හෝ හානියක් සඳහා වන බැදියාව**<br><br>**144** වන වගන්තිය | 1. මේ පනත යටතේ වරදක් සිදු කරන තැනැත්තෙකු, එම වරදට වරදකරු වූ පසු, ඉන් සිදු වූ යම් අලාභයක හෝ හානියක වටිනාකම ගෙවීමට යටත් වන අතර එම අලාභයේ හෝ හානියේ වටිනාකම යථා තත්ත්වයට පමුණුවීම වශයෙන් ගැනෙන මුදලක් අධිකරණය විසින් ප්‍රදානය කළ හැකි අතර එය එම වරද සම්බන්ධයෙන් වූ දඩ මුදලට අමතරව සහ ඒ ආකාරයෙන්ම අයකරගත හැකි ය.<br><br>2. (1) වන උප වගන්තියේ සඳහන් වරද නිසා සිදු වූ යම් අලාභයක් හෝ හානියක් තුළ :<br>3.<br>අ) වරද හඳුනා ගැනීම, අත්තඩංගුවට ගැනීම, විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම සම්බන්ධ වූ හෝ ඒ වෙනුවෙන් දරන ලද යම් පිරිවැයක්; සහ<br>ආ) එම වරදට අදාළව යම් දේපළක්, මසුන් කිසිවක්, භාණ්ඩයක් හෝ දෙයක් රඳවා තබා ගැනීම හෝ තහනමට ගැනීම සම්බන්ධ වූ හෝ ඒ වෙනුවෙන් දරන ලද යම් පිරිවැයක් ;<br>අදාළ වන පරිදි, ඇතුළත් විය යුතු ය. |
| **සමාගම්වල නිලධාරීන්ගේ සහ යාත්‍රාධිපතියන්ගේ බැදියාව**<br><br>**145** වන වගන්තිය | 1. මේ වගන්තියේ විධිවිධාන සලසා ඇති අවස්ථාවක හැර, මේ පනත මගින් පාලනය වන ක්‍රියාකාරකම්වල නියැලී සිටින හවුල් ව්‍යාපාරයක සෑම හවුල්කරුවෙකුම, කිසියම් සංස්ථාවක, ව්‍යාපාර ආයතනයක, සමාගමක හෝ වෙනත් යම් වෙළෙඳ ව්‍යවසායක සෑම අධ්‍යක්ෂකවරයෙකුම සහ ලේකම්වරයෙකුම, ස්වකීය සාමාජිකයෙකු හෝ සේවකයෙකු විසින් මේ පනත යටතේ සිදු කරන ලද වරදක් හෝ යම් නීති උල්ලංඝනය කිරීමක් විෂයයෙහි පුද්ගලිකව වගකිව යුතු ය.<br><br>2. මේ පනතේ කාර්යයන් සඳහා :<br><br>අ) යම් සමාගමක හෝ වෙනත් තැනැත්තෙකුගේ කිසියම් නිලධාරියෙකු හෝ සේවකයෙකු විසින්; හෝ<br>ආ) ධීවර කටයුතු හෝ ධීවර කටයුතු ආශ්‍රිත ක්‍රියුාකාරකම් සඳහා යම් සමාගමකට අයත් හෝ කුලියට හෝ බද්දට සපයා ගත් යාත්‍රාවක යාත්‍රාධිපති හෝ යම් සාමාජිකයෙකු විසින් ;<br>සිදු කරනු ලබන සෑම කිරීමක් හෝ නොකර හැරීමක්ම, එබඳු සංස්ථාවක හෝ වෙනත් තැනැත්තෙකුගේ කිරීමක් හෝ නොකර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.<br><br>3. මේ පනතට අනුකූලතාව දක්වමින් තමන් කටයුතු කළ බවට සමාගමක නිලධාරියෙකු හෝ යාත්‍රාවක යාත්‍රාධිපතියෙකු විසින් ඔප්පු කරනු ලැබීම සඳහා මේ පනතට අනුකූලතාවය දැක්වීම තහවුරු කිරීමට අනලස්ව කටයුතුකල බව හෝ අදාළ නීති උල්ලංඝනය කිරීම හෝ වරද සිදුකිරීම, එම නිලධාරියාගේ හෝ යාත්‍රාධිපතිගේ අනුදැනුම, කැමැත්ත, සහායකත්වය හෝ සහයෝගිතාවය නොමැතිව සිදු කර ඇති බව ඔප්පු කිරීම සමාගමක නිලධරයෙකු හෝ යාත්‍රාවක යාත්‍රාධිපතියකුට මේ වගන්තිය යටතේ සිය බැදියාව වෙනුවෙන් ඇති විත්ති වාචකයක් වනු ඇත. |

| | |
|---|---|
| **ක්‍රියාකරුවන්ගේ බැඳියාව**<br><br>**146 වන වගන්තිය** | 1. මේ පනත යටතේ සිදු කෙරෙන යම් පටිපාටින්හි දී, අනන්‍යාකරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලසා ඇත්නම් මිස, ධීවර යාත්‍රාවක ගැනියෙකු හෝ ධීවර යාත්‍රාවක් ආශ්‍රිතව කරන ලද යම් කිරීමක් හෝ නොකර හැරීමක්, යාත්‍රාවේ ක්‍රියාකරුගේ කිරීමක් හෝ නොකර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.<br><br>2. මේ පනත යටතේ යාත්‍රාවක් යම් බැඳියාවන්ට යටත් වන අවස්ථාවක දී, එවැනි බැඳියාවක් යාත්‍රාවේ ක්‍රියාකරුගේ බැඳියාවක් ලෙස සැලකිය යුතු ය. |
| **පුරවැසියා විසින් නඩු පැවරීම සහ සිවිල් බලාත්මකභාවය**<br><br>**147 වන වගන්තිය** | මේ පනතේ යම් විධිවිධානයක් හෝ එහි ක්‍රියාත්මක නියෝගයක් උල්ලංඝණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හානියට පත් යම් තැනැත්තෙකුට, ඊට වගකිව යුතු යම් තැනැත්තෙකුට එරෙහිව නඩු ක්‍රියාමාර්ගයකට අවතීර්ණ විය හැකි අතර ඊට ප්‍රතිචාර වශයෙන්, අධිකරණය විසින්, ඊට සුදුසු යැයි සලකන සිවිල් හානි වන්දි සහ ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය. එසේකුදු වුවත්, රජයට හෝ කිසිදු රාජ්‍ය නිලධාරියෙකුට එරෙහිව එවැනි නඩු පැවරීමක් සිදු කළ නොහැක. |
| **ඉන්ජන්ෂන් තහනම**<br><br>**148 වන වගන්තිය** | 147 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි යම් තැනැත්තෙකුට එරෙහිව මේ පනතේ ඕනෑම විධිවිධානයක් බලාත්මක කිරීම සඳහා අධිකරණයට ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කළ හැකි ය. |
| **නොපමාව නිදහස් කිරීම**<br><br>**149 වන වගන්තිය** | 1. විදේශීය ධීවර යාත්‍රා අත්අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීමක් සිදු වූ අවස්ථාවක දී ඒ සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ පසුව පනවන ලද යම් දණ්ඩණ කිසිවක් පිළිබඳව සුදුසු සන්නිවේදන ක්‍රමයන් මගින් අදාළ ධජය හිමි රාජ්‍යය වෙත වහා දැනුම් දෙනු ලැබිය යුතු ය.<br><br>2. මේ පනතට අනුව අත්අඩංගුවට ගනු ලබන යම් විදේශීය ධීවර යාත්‍රාවක් සහ එහි ගැනියන්, යම් සාධාරණ බැඳුම්කරයක් හෝ වෙනත් ඇපයක් තැබීමෙන් පසු වහා නිදහස් කර හැරිය යුතු ය.<br><br>3. යම් තැනැත්තෙකුට, මේ වගන්තිය යටතේ යාත්‍රාවක් හෝ වෙනත් දේපළක් තහනමට ගැනීමෙන් දින හැටක් (60) ක් ඇතුළත යාත්‍රාව හෝ දේපළ නිදහස් කර ගැනීම සඳහා කොළඹ මහාධිකරණයෙන් අයදීමක් සිදු කළ හැකි ය.<br><br>4. (3) වන උප වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු සහ එය, විදේශීය යාත්‍රාවක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය විසින් :<br>93<br><br>අ) අදාළ යාත්‍රාවේ වර්තමාන වෙළඳපළ වටිනාකමේ මුළු මුදලට හෝ අදාළ දේපළෙහි සහ / හෝ යාත්‍රාවේ ඇති මත්ස්‍ය අස්වැන්න සහ / හෝ පරිශ්‍රයේ ඇති මත්ස්‍ය සහ / හෝ ධීවර නිෂ්පාදන මෙන් තුන් ගුණයක වටිනාකමට සරිලන බැඳුම්කරයකට එළඹීම හෝ වෙනත් ආකාරයක ඇපයක් සැපයීම, හෝ;<br><br>ආ) පහත සඳහන් යම් කිසිවක්, එනම් :<br>i) යාත්‍රාවේ හෝ දේපළවල සහ යාත්‍රාවේ ඇති මත්ස්‍ය අස්වැන්න සහ පරිශ්‍රයේ ඇති මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදනවල සාධාරණ වෙළඳපළ වටිනාකම ;<br>ii) චෝදනා කරනු ලබන හෝ චෝදනා කරනු ලැබිය හැකි වැරදි සඳහා විධිවිධාන සලසා ඇති උපරිම දඩ මුදල් ප්‍රමාණය හෝ දඩ මුදල් ප්‍රමාණ; හෝ<br>iii) වරදකරු කරනු ලැබුවහොත්, පැමිණිලි පක්ෂය විසින් අයකර ගනු ලැබිය හැකි වියදම; සහ |

| | |
|---|---|
| | ඇ) 4 (අ) උප වගන්තියෙහි සඳහන් බැඳුම්කර ලැබීමෙන් පසු යාත්‍රාව හෝ දේපළ මුදා හැරීම ;<br>නියෝග කරනු ලැබිය යුතු ය.<br><br>5. රාජසන්තක කිරීමේ නියෝගයක් සම්බන්ධයෙන් අභියාචනයක් කළහොත්, ඊට අදාළ අභියාචනය ඇසීම සහ නැවත නඩු විභාග කිරීම හෝ රක්ෂිත බන්ධනාගාරගත කිරීම මත නැවත නඩුව ඇසීම සිදු වෙමින් පවතින කාලය තුළ, (2) වන උප වගන්තියට අනුව තැන්පත් කර ඇති එබඳු යම් බැඳුම්කරයක්, ඇපකරයක් හෝ වෙනත් ඇපයක් නොකඩවා පවත්වා ගෙන යාමට හෝ ඒ සඳහා අතිරේක ඇපයක් අධිකරණයෙහි තැන්පත් කරන ලෙස නියම කිරීමට අධිකරණයට හැකි ය.<br><br>6. එවැනි බැඳුම්කරයක්, ඇපකරයක් හෝ වෙනත් ඇපයක් නිදොස් කොට නිදහස් කිරීම, එකී මුදා හරින ලද දේපළ කිසිදු හානියට පත්වීමකින් තොරව උසාවියට නැවත භාරදීම හෝ පනත යටතේ, යම් අවසන් නඩු පටිපාටියක් ඉවතලන හෝ අවසන් කරන තෙක් සහ යම් දඩ මුදලක් , දණ්ඩණයක් හෝ වෙනත් අවසන් තීන්දු කිරීම් ගෙවනු ලබන තෙක්, ඒවා අධිකරණය භාරයෙහි තබා ගැනීමේ කොන්දේසියට යටත් විය යුතු ය.<br><br>7. මේ පනත යටතේ තහනමට ගත් යාත්‍රාවක් හෝ දේපළක් සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ ඇපයක් තබනු ලැබ ඇති අවස්ථාවක දී, මේ පනත යටතේ යම් අවසන් නඩු පටිපාටියක් ඉවත ලන හෝ අවසන් කරන තෙක් සහ යම් දඩ මුදලක් , දණ්ඩණයක් හෝ පනවන ලද වෙනත් අවසන් තීන්දු කිරීම් ගෙවනු ලබන තෙක් ඒවා අධිකරණය භාරයෙහි තබා ගත යුතු ය.<br><br>8. (2) වන උප වගන්තිය යටතේ බැඳුම්කරයක් තබා, යාත්‍රාව හෝ දේපළ මුදා හරිනු ලැබ ඇති අවස්ථාවක දී :<br>අ) මේ පනත යටතේ ගැනෙන යම් රාජසන්තක කිරීමේ නියෝගයක්, එකී යාත්‍රාවේ හෝ දේපළෙහි වටිනාකමට අදාළව ගෙවන ලද මුදල සඳහා වූ රාජසන්තක කිරීමේ නියෝගයක් ලෙස ක්‍රියාත්මක විය යුතු ය ;<br>ආ) වරදකරු කිරීමෙන් පසු, නියම කරන ලද යම් දඩ මුදලක් හෝ දණ්ඩනයක්, අදාළ ඇපයෙන් ගෙවනු ලැබිය යුතු ය; සහ<br>ඇ) පිරිවැය සඳහා වන කිසියම් නියෝගයක්, එකී ඇපයෙන් ආවරණය කර ගත යුතු ය. |
| **ඇප ලබාදීම**<br><br>**150 වන වගන්තිය** | 1. මේ පනතේ (83) වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින කිසිදු තැනැත්තෙකුට මහේස්ත්‍රාත්වරයා විසින් ඇප ලබා නොදිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියේ සඳහන් විධිවිධානය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (154) (ජ) වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති පළාත් බඳ මහාධිකරණයට, අධිකරණය සෑහීමකට පත් වන පරිදි ගෙන හැර දක්වන සුවිශේෂී අවස්ථා විෂයයෙහි ඉඩ දෙනු ලැබිය යුතුයැයි යන කාරණයට අගතියක් නොවන පරිදි, මේ පනතේ (83) වන වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින එබඳු යම් තැනැත්තෙකුට ඇප ලබා දිය හැකි ය. |
| **රාජසන්තක කිරීම**<br><br>**151 වන වගන්තිය** | 1. මේ පනතට එරෙහි හෝ මේ වගන්තියේ කාර්යයන් සඳහා නියම කරනු ලැබිය හැකි වරදක් හෝ වෙනත් යම් වැරදි සම්බන්ධයෙන් අධිකරණයක් විසින් යම් තැනැත්තෙකු වරදකට වරදකරු කරනු ලැබුවහොත්, රජය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, පහත සඳහන් කවර වුවද;<br><br>අ) වරද සිදු කිරීම සඳහා යොදා ගන්නා ලද, භාවිතා කරන ලද හෝ වෙනත් අයුරකින් සම්බන්ධ කර ගන්නා ලද කිසියම් මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදනයක්, යාත්‍රාවක් (එහි ආම්පන්න, දැව භාණ්ඩ, අමතර |

| | |
|---|---|
| | උපාංග, ගබඩා භාණ්ඩ, යාත්‍රා බඩු සහ ගුවන් යානා ඇතුළුව) වාහනයක්, ගුවන් යානයක්, ආම්පන්නයක් උපකරණයක්, පුපුරණ ද්‍රව්‍යයක් හෝ විසංඥතාවයට පත් කරන ද්‍රව්‍යයක් ;<br>ආ) වරද සිදු කිරීමෙහිලා යාත්‍රාවක්, වාහනයක් හෝ ගුවන් යානයක් භාවිතා කර ඇති අවස්ථාවක දී, එම වරද සිදු කරන ලද අවස්ථාවේ යාත්‍රාවේ, වාහනයේ හෝ ගුවන් යානයේ ඇති යම් මත්ස්‍ය ප්‍රමාණයක්;<br>ඇ) වරද සිදු කිරීමෙහිලා ආනයන හෝ අපනයන පහසුකම් ස්ථානයක් භාවිතා කරන ලද අවස්ථාවක දී, එම වරද සිදු කරන ලද අවස්ථාවේ එකී ආනයන හෝ අපනයන පහසුකම් ස්ථානයේ ඇති යම් මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන කිසිවක් ;<br>ඈ) (152) වන වගන්තිය යටතේ යම් මසුන් කිසිවක් අලෙවි කර ඇත්නම්, එම මසුන් විකිණීමෙන් ලත් මුදල් කිසිවක්; හෝ<br>ඉ) අවශ්‍ය වෙතැයි සළකනු ලබන වෙනත් යම් අයිතමයක් හෝ අයිතම කිසිවක්<br>රාජසන්තක කිරීමට අධිකරණයට නියෝග කළ හැකි ය.<br><br>2. මෙම වගන්තිය අනුව රාජසන්තක කරන ලද භාණ්ඩ අලෙවි කළ හැකි වන අතර එයින් ලැබෙන මුදල්, (107) වන වගන්තියේ සඳහන් අරමුදලෙහි තැන්පත් කළ යුතු ය. |
| **තහනම් කළ හෝ රාජසන්තක කළ දේපල බැහැර කිරීම**<br><br>**152 වන වගන්තිය** | 1. මේ පනත යටතේ රාජසන්තක කරන ලද යම් යාත්‍රාවක් හෝ වෙනත් දේපළක් හෝ ඇපයක් රජයේ දේපළ බවට පත් වන්නේ ය.<br><br>2. මේ පනත යටතේ රාජසන්තක කරන ලද යම් යාත්‍රාවක් හෝ වෙනත් දේපළක් :<br>අ) රඳවා තබා ගත හැකි ය ;<br>ආ) බඳු දීමට හැකි ය; හෝ<br>ඇ) ටෙන්ඩර් මගින් හෝ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ගිවිසුමක් මගින්, රජය විසින් විකුණනු ලැබිය හැකි ය. එතෙකුදු වුවත්, එවැනි රාජසන්තක කරන ලද දේපළ රජය විසින් විකුණනු ලබන කල්හි, එසේ එම දේපළ රාජසන්තක කිරීමට පෙර, ඒවායේ අදාළ හිමිකරුට හෝ ලේඛනගත හිමිකරුට ඒ සඳහා ලංසු තැබීමට හෝ ඒවා මිල දී ගැනීමට සාධාරණ අවස්ථාවක් සලසා දිය යුතු ය.<br><br>3. මේ පනත ප්‍රකාරව තහනමට ගෙන ඇති හෝ රාජසන්තක කර ඇති යම් නරක් වන සුළු මත්ස්‍ය හෝ ධීවර නිෂ්පාදන, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බැහැර කිරීමේ තීරණයට යටත් විය යුතු අතර ඔහුට:<br><br>අ) එබඳු නරක් වන සුළු මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන විකිණීමට හෝ විකිණීමට අවසර නොදීමට තීරණය කළ හැකි අතර, එවැනි තීරණයක් හේතුවෙන් දරනු ලබන වියදම් සඳහා කිසිදු ආකාරයකින් ඔහු වගකිව යුතු නොවන්නේ ය ;<br><br>ආ) එම මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන විකිණීමට හෝ විකිණීමට අවසර දීම හෝ ඔහු විසින් සුදුසු යයි සලකනු ලබන වෙනත් ආකාරයකට ඒවා බැහැර කිරීම කළ හැකි අතර, ඒවා විකිණීමෙන් ලැබෙන මුදල් කිසිවක් වෙතොත්, එම මුදල්, මේ පනත යටතේ යම් නඩු පටිපාටියක් මගින් එකී මසුන් හෝ මත්ස්‍ය නිෂ්පාදන සම්බන්ධයෙන් අවසන් බැහැර කිරීමේ තීරණය ලැබෙන තෙක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ භාරයේ තැබිය යුතු ය.<br><br>4. අධ්‍යක්ෂ ජනරාල්වරයා, (3) වන උප වගන්තියට අනුව තහනමට ගන්නා ලද නරක් වන සුළු භාණ්ඩවල කිසියම් විකුණුමක් සම්බන්ධයෙන් එකී භාණ්ඩ අයත් හිමිකරුට හෝ ලේඛනගත හිමිකරුට දැනුම් දිය යුතු අතර, |

| | |
|---|---|
| | එම හිමිකරු හෝ නාමිකයා එකී විකුණුම් අවස්ථාවට පැමිණ සිටිය යුතු ය.<br><br>5. මේ පනත අනුව තහනමට ගන්නා ලද යම් යාත්‍රාවක් හෝ වෙනත් දේපළක් හෝ යාත්‍රාව සම්බන්ධයෙන් ගෙවන ලද යම් බැඳුම්කරයක්, ඇපයක් හෝ වෙනත් ඇපකරයක් හෝ රාජසන්තක නොකරන දේපළක් :<br>අ) මේ පනත යටතේ පනවන ලද සියලුම දඩ මුදල්, දණ්ඩන හෝ වියදම් විෂයයෙහි නියෝග කළ මුදල් සහ අනෙකුත් තීරණයන්ට අදාළ දෑ ගෙවනු ලබන තෙක් රඳවා තබා ගත යුතු අතර, ඉඩ දී ඇති කාලය තුළ ඒවා ගෙවීමට අපොහොසත් වුවහොත්, එකී දේපළ විකුණා, මේ පනත යටතේ ගැනෙන සියලුම දඩ මුදල්, දණ්ඩන හෝ වියදම් විෂයයෙහි නියෝග කළ මුදල් සහ අනෙකුත් තීරණවලට අදාළ දෑ සහ එම විකුණුම වෙනුවෙන් දරන ලද වියදම අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල, මේ පනතට අනුව අදාළ හිමිකරුට හෝ ඔහුගේ නාමිකයාට හෝ හිමිකරු හෝ ඔහුගේ නාමිකයා නොපැමිණෙන අවස්ථාවක දී, අදාළ ලේඛනගත හිමිකරුට, ආපසු භාර දිය යුතු ය; සහ<br>ආ) 5(අ) වන උපවගන්තියේ විස්තර කර ඇති දඩ මුදල්, දණ්ඩන හෝ වියදම් විෂයයෙහි නියෝග කළ මුදල් කිසිවක් නොමැති විට, අදාළ හිමිකරුට හෝ ඔහුගේ නාමිකයාට හෝ එකී හිමිකරු හෝ, ඔහුගේ නාමිකයා නොපැමිණෙන අවස්ථාවක දී, ඊට නීතියෙන් හිමිකම් දරන තැනැත්තා ලබා දිය යුතු ය. |
| | **4 වන පරිච්ඡේදය – සාක්ෂි සහ පූර්ව නිගමන** |
| **සාක්ෂි සහතිකය**<br><br>**153 වන වගන්තිය** | අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව නම් කරන ලද ධීවර පරීක්ෂක නිලයට පහළ නොවූ යම් නිලධරයෙකු හෝ යම් තැනැත්තෙකු විසින්, මේ පනත ප්‍රකාරව :<br>අ) යම් නිශ්චිත යාත්‍රාවක්, නිශ්චිත දිනයක දී හෝ දිනවල දී, ශ්‍රී ලංකා ධීවර යාත්‍රාවක්ව හෝ විදේශීය ධීවර යාත්‍රාවක්ව තිබූ හෝ නොතිබූ බව ;<br><br>ආ) යම් නිශ්චිත යාත්‍රාවක් හෝ තැනැත්තෙකු, නිශ්චිත දිනයක දී හෝ දිනවල දී, වලංගු බලපත්‍රලාභී, අවසරයක් හෝ ලියාපදිංචි සහතිකයක් දරන්නෙකුව සිටි හෝ නොසිටි බව ;<br><br>ඇ) යම් යාකරන ලද ලේඛනයක්, යම් නිශ්චිත යාත්‍රාවක් හෝ තැනැත්තෙකු විෂයයෙහි අදාළ වන්නා වූ බලපත්‍රයේ, අවසර පත්‍රයේ හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් වන බව සහ එම ලේඛනයට නිශ්චිත කොන්දේසි අමුණා තිබූ බව ;<br><br>ඈ) යම් විශේෂිත ස්ථානයක් හෝ ජල ප්‍රදේශයක්, නිශ්චිත දිනයක දී හෝ දිනවල දී, ශ්‍රී ලංකා ජල තීරය තුළ හෝ ශ්‍රී ලංකා ජල තීරයේ සංවෘත, සීමාකෘත, සීමිත හෝ වෙනත් ආකාරයකින් පාලනය කරන ලද ප්‍රදේශයක් තුළ හෝ යම් නිශ්චිත කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා ජල තීරයට අයත් ස්ථානයක් තුළ පිහිටා තිබූ බව ;<br><br>ඉ) යම් යාකරන ලද සටහනක්, නිශ්චිත දිනයක දී හෝ දිනවල දී, ශ්‍රී ලංකා ජල තීරයට අයත් සංවෘත හෝ සීමිත ප්‍රදේශ හෝ කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා නීති ප්‍රකාරව නිරූපිත වෙනත් ප්‍රදේශ හෝ කලාපවල සීමා මායිම් පෙන්වන බව ;<br><br>ඊ) යම් විශේෂිත අයිතමයක් හෝ උපකරණ කොටසක්, ධීවර ආම්පන්න බව;<br><br>උ) කිසියම් මත්ස්‍ය හෝ ජලජ සම්පතක අභාවයට හෝ හානි සිදු වීමට හේතුව සහ එය සිදු වූ ආකාරය ; |

ඎ) යම් යාකරන ලද ලේඛනයක්, අනුමත කුලී යාත්‍රා ගිවිසුමක, ප්‍රවේශ ගිවිසුමක හෝ ධීවර කළමනාකරණ ගිවිසුමක සත්‍ය පිටපතක් වන බව;

එ) යම් ඇමතුම් සංඥාවක් හෝ අංකයක්, යම් විශේෂිත යාත්‍රාවක් සඳහා යාත්‍රා නම් කිරීම හෝ අංකනය කිරීමේ ක්‍රමයකට අයත් වන හෝ ඒ යටතේ වෙන් කරනු ලැබ ඇති බව ;

ඒ) යම් නිශ්චිත යාත්‍රාවකට අදාළ වන්නා වූ යාකරන ලද ස්ථානීය පිහිටුම හෝ මසුන් අල්ලා ගැනීම පිළිබඳ වාර්තාවක් ලබා දී ඇති බව ;

ඔ) යම් නිශ්චිත යාත්‍රාවක්, ස්වයංක්‍රීය ස්ථාන පද්ධතියක් හෝ වෙනත් අයිතමයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්සන් කරන ලද යාකළ පිටපතක ප්‍රකාශ කර ඇති පරිදි, මේ පනත යටතේ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා හෝ (ආ) වන වගන්තියෙහි නිශ්චිතව දක්වා ඇති දෑ හැර, යම් අදාළ ප්‍රවේශ ගිවිසුමක් හෝ වෙනත් ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග කිසිවක් සපුරන බව හෝ නොසපුරන බව ;

ඕ) යම් යාකරන ලද ලේඛනයක්, නිශ්චිත මිනුම් උපකරණයක ක්‍රමාංකනය පිළිබඳ සත්‍ය සහතිකයක් බව;

ක) මේ පනත යටතේ ලබා දී ඇති මසුන්ගේ තත්ත්වය පිළිබඳ සහතික කිරීමක්, මේ පනතට අනුව දෙනු ලැබූවක් බව සහ එය, සහතිකයේ අත්සන්කරු විසින් සිදු කරනු ලැබූවක් බව ;

ග) යාකරන ලද ස්ථානීය පිහිටුම හෝ මසුන් අල්ලා ගැනීම පිළිබඳ වාර්තාව, යම් නිශ්චිත යාත්‍රාවක් සඳහා ලබා දී ඇති බව ;

ච) යම් ඡායාරූපයක්, එය නිරූපණය කිරීමට අදහස් කරන දෑ පිළිබඳව සත්‍ය සහ නිවැරදි නියෝජනයක් බව ;

ජ) යම් ඡායාරූපයක්, නිශ්චිත සෝදිසි මෙහෙයුම් නිලධාරියෙකු විසින් ගන්නා ලද බව;

ට) වෙනත් රාජ්‍යයක නිසි බලධාරීන් විසින් අත්සන් කරන ලද ප්‍රකාශයකට යාකර ඇති පිටපතක ප්‍රකාශ කර ඇති පරිදි, එකී වෙනත් රාජ්‍යයේ නීති අණ පනත්වලට එරෙහිව වරදක් සිදු කරනු ලැබ ඇති බව; සහ



ඩ) යම් නිශ්චිත ධීවර යාත්‍රාවක්, නීති විරෝධී, වාර්තා නොවූ හෝ අවිධිමත් ධීවර යාත්‍රා පිළිබඳ හෝ කලාපීය ධීවර කළමනාකරණ සංවිධානයක් විසින් හෝ ජාත්‍යන්තර ගිවිසුමකට අනුව ස්ථාපිත කරන ලද බලයලත් ධීවර යාත්‍රා පිළිබඳ ලැයිස්තුවක ඇතුළත් වන බව ;

සඳහන් වන සහතිකයක් ලබා දිය යුතු ය.

**සහතිකවල වලංගුභාවය සහ එහි ක්‍රියා පටිපාටි**

**154 වන වගන්තිය**

1. යම් පටහැනිතාවක් ඔප්පු වුවහොත් මිස, 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් යැයි අදහස් කරනු ලබන ලියවිල්ලක්, එම වගන්තිය යටතේ නිසි පරිදි නිකුත් කරන ලද සහතිකයක් ලෙස සැලකිය යුතු ය.

2. 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් මේ පනත යටතේ යම් නඩු පටිපාටියක් සඳහා උසාවියට ඉදිරිපත් කිරීමට දින හතකට (7) නොඅඩු කාලයක් තුළ වූදිතයෙකු හෝ විත්තිකරුවෙකු වෙත යවනු ලබන්නේ නම්, එම සහතිකය, ඊට යම් පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, එහි ප්‍රකාශිත සියලුම කරුණු සඳහා ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.

| | |
|---|---|
| | 3. 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් මේ පනත යටතේ යම් නඩු පටිපාටිකරයක් සඳහා උසාවියට ඉදිරිපත් කිරීමට දින දාහතරකට (14) කට නොඅඩු කාලයක් තුළ චූදිතයෙකු හෝ විත්තිකරුවෙකු වෙත යවනු ලබන්නේ නම් සහ, එසේ එය යවන ලද දිනයේ සිට දින හතක් (7) ඇතුළත එකී චූදිතයා හෝ විත්තිකරු විසින් නඩු පවරන්නා වෙත ලිඛිතව විරෝධතා දැනුම්දීමක්, ඒ පිළිබඳව හේතු ද ඇතුළත්ව ඉදිරිපත් කරනු නොලැබුවහොත්, එම සහතිකය, එකී චූදිතයා හෝ විත්තිකරු, ඊට විරුද්ධ වීමට යම් අපොහොසත් වීමක් හේතුවෙන් අයුතු ලෙස අගතියට පත් වී ඇති බව උසාවිය නිරීක්ෂණය කරතොත් මිස, එහි ප්‍රකාශිත සියලු කරුණු පිළිබඳ තීරණාත්මක සාධකය විය යුතු ය.<br><br>4. 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් "2023 අංක (xx) දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නිකුත් කරන ලද සහතිකය" ලෙස නම් කරනු ලැබිය යුතු ය.<br><br>5. 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක සිදු වූ යම් බැහැර කිරීමක් හෝ ඉන් සිදු වූ යම් අතපසුවීමක්, අදාළ නඩු පරිපාටියේ කිසියම් කරුණකට අදාළව එබඳු බැහැර කිරීමක් හෝ අතපසුවීමක් වැදගත් වෙතැයි අධිකරණය සලකන්නේ නම් හෝ චූදිතයාට හෝ විත්තිකරුට අනිසි ලෙස ඉන් අගතියක් සිදු වන්නේ නම් මිස, අවලංගු භාවයට පත් නොවිය යුතු ය.<br><br>6. යම් නඩු කටයුත්තක දී 153 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් උසාවියට ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම සහතිකය නිකුත් කළ නිලධාරියා කැඳවීමට නඩු පවරනු ලබන පාර්ශවය බැඳී නොසිටින අතර, අවශ්‍ය අවස්ථාවක දී, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, අධිකරණය එහි ඇති කරුණු මත විශ්වාසය තබා කටයුතු කරනු ලැබේ. |
| **යාත්‍රාවක ස්ථානීය පිහිටීම පිළිබඳ සහතිකය**<br><br>**155** වන වගන්තිය | 1. මේ පනත යටතේ සිදුවන යම් නඩු කටයුත්තක දී, යාත්‍රාවක් යම් දිනයක සහ වේලාවක හෝ යම් කාල සීමාවක් තුළ ස්ථානගතව සිටි බවට චෝදනා කරනු ලබන ස්ථානයක් හෝ යම් චෝදනා කරනු ලබන වරදක් විෂයයෙහි වැදගත් අවස්ථාවක දී, බලයලත් නිලධාරියෙකු විසින් දෙන ලද සහතිකයක සඳහන් ස්ථානයක් හෝ ප්‍රදේශයක්, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, යාත්‍රාව ස්ථානගතව තිබූ බවට ප්‍රකාශිත දිනය සහ වේලාව හෝ එය එසේ ස්ථානගතව තිබූ කාල සීමාව සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.<br><br>2. බලයලත් නිලධාරියෙකු විසින් , (1) වන උප වගන්තිය අනුව සාදනු ලැබ ඇති යම් සහතිකයක :<br><br>අ) ඔහුගේ නම, ලිපිනය, නිල තනතුර, පත් කළ රට සහ ඔහු කුමන විධිවිධාන යටතේ පත් කරන ලද්දේ ද යන්න පිළිබඳව ;<br><br>ආ) අදාළ ධීවර යාත්‍රාවේ නම සහ, දන්නේ නම්, එහි ඇමතුම් සංඥාව පිළිබඳව ;<br><br>ඇ) යාත්‍රාව එම ස්ථානයේ හෝ ප්‍රදේශයේ තිබූ දිනය සහ වේලාව හෝ එය තිබූ කාල සීමාව පිළිබඳව ;<br><br>ඈ) යාත්‍රාව ස්ථානගතව තිබුනේ යැයි චෝදනා කරන ස්ථානය හෝ ප්‍රදේශය පිළිබඳව ;<br><br>ඉ) සඳහන් කර ඇති ස්ථානය හෝ ප්‍රදේශය නියම කර ගැනීම සඳහා භාවිතා කරන ස්ථාන නියමාකාරව දක්වන උපකරණ සහ නිශ්චිත සීමාවන් තුළ ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳව ;<br><br>ඊ) ඔහු අදාළ ස්ථාන නියමාකාරව දක්වන උපකරණ භාවිතා කිරීමට |

පෙරාතුව සහ පසුව සාධාරණ වේලාවක් තුළ ඒවා නිවැරදිව ක්‍රියා කරන බව පෙනෙන්නට තිබුණේ දැයි පරීක්ෂා කළ බව; සහ

උ) විනිශ්චයක වශයෙන් නිවැරදි යැයි පිළිනොගත් ස්ථාන නියමාකාරව දක්වන යම් ස්ථාපනයක් හෝ නම් කළ යන්ත්‍රයක් භාවිතා කර ඇත්දැයි යන්න දැන ගැනීම සඳහා, අදාළ උපකරණය, නියමිත වේලාවෙන් පසු හැකි තාක් ඉක්මනින්, එකී උපකරණය ඔහු විසින් පරීක්ෂා කරන ලද්දේ ද යන්න පිළිබඳව

සඳහන් කරනු ලැබිය යුතු ය.

3. 155 වන වගන්තිය, 154 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් ආකාරයටම, මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් කෙරෙහි අදාළ විය යුතු අතර, එහි ඇති 154 වන වගන්තියට අදාළ කිසියම් යොමුවක් මේ වගන්තියට අදාළව කරන ලද යොමුවක් ලෙස කියවිය යුතු ය.

4. මේ වගන්තියේ කාර්යයන් සඳහා, "බලයලත් නිලධාරියා" යන්නට, වෙනත් රටවල සමාන වගකීම් භාරව සිටින තැනැත්තන් ඇතුළත් විය යුතු ය.

**ස්වයංක්‍රීය පිහිටීම් ස්ථාන පද්ධතිය, පූර්ව නිගමන සහ සහතිකය**

**156 වන වගන්තිය**

1. මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි පිහිටි ස්ථාන පද්ධතියක් භාවිතය මගින් ලබාගත් හෝ තහවුරු කරගත් සියලු තොරතුරු හෝ දත්ත, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස :

අ) එසේ හඳුනාගත් යාත්‍රාවෙන් පැමිණෙන බවට ;

ආ) නිවැරදිව සන්නිදෙනය කළ හෝ මාරු කළ බවට ;

ඇ) යාත්‍රාවේ යාත්‍රාධිපති, හිමිකරු හෝ එය කුලියට ගත් තැනැත්තා විසින් ලබා දෙන ලද බවට සහ, එසේ ලබාගත් හෝ තහවුරු කරගත් තොරතුරු සහ දත්ත, මුද්‍රිත පිටපතක් මගින් හෝ දෘශ්‍ය සංදර්ශක ඒකකයකින් ලබා ගත් ඒවා වුවද නොවුව ද, ඒ පිළිබඳව දෙනු ලැබිය හැකි සාක්ෂි බවට ;

උපකල්පනය කරනු ලැබිය යුතු ය.

2. (1) වන උපවගන්තියට අදාළ උපකල්පනය, කිසියම් සම්ප්‍රේෂණයකට හෝ මාරු කිරීමකට පෙරාතුව හෝ පසුව අදාළ තොරතුරු ගබඩා කළේ ද නැද්ද යන්න නොසලකා අදාළ විය යුතු ය.

3. මේ පනතට අනුව ස්ථාපනය කර ක්‍රියාත්මක වන ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියක් නිවැරදි යයි විනිශ්චයක වශයෙන් පිළිගත යුතු ය.

4. යම් බලයලත් නිලධාරියෙකු විසින් :

අ) සිය නම, ලිපිනය සහ නිල තනතුර සඳහන් කර ;

ආ) ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියකින් තොරතුරු ලබා ගැනීමට හෝ ඒවා තහවුරු කර ගැනීමට හැකියාව ඇති ඕනෑම යන්ත්‍රයක මුද්‍රිත පිටපත හෝ දෘශ්‍ය සංදර්ශක ඒකකය කියවීමට ඔහුට නිසි ප්‍රවීනතාවක් ඇති බව සඳහන් කර ;

ඇ) ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියෙන් තොරතුරු ලබාගත් හෝ තහවුරු කරගත් දිනය සහ වේලාව සහ එහි විස්තර සඳහන් කර ;

ඇ) ඔහු දන්නා පරිදි හෝ යම් නිල ලේඛනයකින්, වාර්තාවකින් හෝ වෙනත් ලියවිල්ලකින් තහවුරු කර ඇති පරිදි, ස්වයංක්‍රීය පිහිටි

ස්ථාන පද්ධතිය පිහිටා ඇති හෝ පිහිටා තිබූ යාත්‍රාවේ නම සහ ඇමතුම් සංඥාව සඳහන් කර; සහ

ඉ) ස්වයංක්‍රීය පිහිටි ස්ථාන ස්ථානගත කිරීමේ පද්ධතියේ හෝ එහි සම්ප්‍රේෂණයන්හි හෝ තොරතුරු ලබා ගැනීම හෝ තහවුරු කිරීම සඳහා භාවිතා කරන අනෙකුත් යන්ත්‍රවල කිසිදු දෝෂයක් නොමැති බවට ප්‍රකාශයක් කර ;

සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

5. 153 වන වගන්තිය, 154 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් ආකාරයටම, මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් කෙරෙහි අදාළ විය යුතු අතර, එහි ඇති 154 වන වගන්තියට අදාළ කිසියම් යොමුවක් මේ වගන්තියට අදාළව කරන ලද යොමුවක් ලෙස කියවිය යුතු ය.

**ඡායාරූපමය සාක්ෂි**

**157 වන වගන්තිය**

1. මසුන් ඇල්ලීම හෝ මසුන් ඇල්ලීම ආශ්‍රිත යම් ක්‍රියාකාරකමක ඡායාරූපයක් ගන්නා විට සහ ඊට සමගාමීව, එම ඡායාරූපය ගත් දිනය, වේලාව සහ කවර ස්ථානීය පිහිටුමක සිට එය ගත්තේ ද යන්න එකී ඡායාරූපයේ අධිස්ථාපනය කර ඇති විට, එම ඡායාරූපය, එකී අදාළ දිනයේ දී, වේලාවේ දී, සහ එය එසේ දිස්වන ස්ථානයේ ස්ථානීය පිහිටුමේ දී ගනු ලැබ ඇති බව, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, උපකල්පනය කළ යුතු ය.

2. (1) වන උප වගන්තියෙහි දක්වා ඇති පූර්ව නිගමනය:

අ) ඡායාරූපය ගන්නා කැමරාව අදාළ දිනය, වේලාව සහ පිහිටි ස්ථානය දක්වන උපකරණවලට ඍජුවම සම්බන්ධ කර ඇත්නම්; සහ

ආ) ඡායාරූපය, සාක්ෂි ආඥා පනත යටතේ පිළිගත හැකි සාක්ෂියක් ලෙස බලයලත් නිලධාරියෙකු විසින් ගනු ලැබ ඇත්නම් ;

පමණක් පැන නගිනු ලැබිය යුතු ය.

3. (1) වන උප වගන්තියෙහි විස්තර කර ඇති ආකාරයේ ඡායාරූපයක් ගන්නා යම් බලයලත් නිලධාරියෙකු විසින්, ඒ සම්බන්ධ සහතිකයක්, අදාළ ඡායාරූපයට යාකර, එහි :

අ) ඔහුගේ නම, ලිපිනය, නිල තනතුර, පත් කළ රට සහ ඔහු පත් කරනු ලබන අධිකාරය සඳහන් කරමින් ;

ආ) ඡායාරූපයේ දැක්වෙන කිසියම් ධීවර යාත්‍රාවක නම සහ ඇමතුම් සංඥාව දන්නේ නම්, ඒ බව සඳහන් කරමින් ;



ඇ) දිනය සහ වේලාව සහ පිහිටි ස්ථානය නියමකර දක්වන උපකරණය සපයන කැමරාවේ, අත් ඔරලෝසුවේ හෝ හෝරා යන්ත්‍රයෙහි හෝ වෙනත් උපකරණවල නම් සඳහන් කරමින් සහ, ඔහු, එම උපකරණ ඡායාරූපය ගැනීමට පෙරාතුව සහ පසුව, සාධාරණ වේලාවක් තුළ ඒවා පරීක්ෂා කළ බවටත්, ඒවා සියල්ල නිවැරදිව ක්‍රියා කරන බව පෙනෙන්නනට තිබූ බවටත් ප්‍රකාශයක් කරමින් ;

(ඈ) 2 (අ) සහ (ආ) වන උප වගන්තිවල දක්වා ඇති කරුණු සඳහන් කරමින්; සහ

ඉ) ස්ථානය නියමකර දක්වන උපකරණය, නිශ්චිත සීමාවන් තුළ භාවිතා කර තිබීමේ නිරවද්‍යතාවය සඳහන් කරමින් ;

ලබා දෙනු ලැබිය හැකි ය.

4. මේ වගන්තියෙහි කාර්යයන් සඳහා, කිසියම් චන්ද්‍රිකා දත්ත මත පාදක වූ

| | |
|---|---|
| | නාවික චලනාංග පද්ධතියක් හෝ ගෝලීය ස්ථාන පද්ධතියක් ඇතුළුත් මුත් ඒවාට සීමා නොවන, අදාළ ස්ථානය නියමකර දක්වන යම් උපකරණයක්, යාත්‍රාවක ස්ථානීය පිහිටීම පෙන්නුම් කරන කිසියම් මෙවලමක් ලෙස සලකනු ලැබිය යුතු ය.<br><br>5. 154 වන වගන්තිය, 155 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සහතිකයක් ආකාරයටම, මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක් කෙරෙහි අදාළ විය යුතු අතර, එහි ඇති 155 වන වගන්තියට අදාළ කිසියම් යොමුවක් මේ වගන්තියට අදාළව කරන ලද යොමුවක් ලෙස කියවිය යුතු ය. |
| **විශේෂඥ සාක්ෂි**<br><br>**158 වන වගන්තිය** | සාක්ෂි ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව ධීවර පරීක්ෂකවරයෙකුගේ නිලයට පහළ නොවූ තැනැත්තෙකු විශේෂඥයෙකු ලෙස නම් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි ය. |
| **පූර්ව නිගමන**<br><br>**159 වන වගන්තිය** | 1. මේ පනත යටතේ කිසියම් වරදක් සිදු කිරීම සඳහා යොදාගෙන ඇති යම් ධීවර යාත්‍රාවක තිබී හමුවන සියලු මසුන්, ඊට පටහැනි තත්ත්වය ඔප්පු කළහොත් මිස, එම වරද සිදු කිරීමේ දී අල්ලා ගෙන ඇති මසුන් බවට පූර්ව නිගමනය කළ යුතු ය.<br><br>2. මේ පනත යටතේ සිදුවන කිසියම් නෛතික පටිපාටියක දී අදාළ කාරණය සම්බන්ධයෙන් යම් සිදුවීමක් සිදු වූ බවට චෝදනා ලද ස්ථානය ගැටළුකාරී වන අවස්ථාවක දී, කිසියම් බලාත්මක කිරීමේ යාත්‍රාවකට හෝ ගුවන් යානයකට අයත් ලොග් පොතක හෝ වෙනත් යම් නිල ලේඛණයක ඇතුලත් එකී සිද්ධිය සිදු වූ ස්ථානය බවට අදාළ සටහනක සඳහන් කර ඇති ස්ථානය, එම සිද්ධිය සිදු වූ ස්ථානය ලෙස පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය<br><br>3. බලයලත් නිලධාරියෙකු විසින් නිවැරදි උධෘතයක් බවට සහතික කරන ලද අදාළ සටහනෙහි ලිඛිත පිටපතක් හෝ උධෘතයක් ඉදිරිපත් කිරීම, බලාත්මක කිරීමේ යාත්‍රාවකට හෝ ගුවන් යානයකට අයත් ලොග් පොතක හෝ වෙනත් නිල වාර්තාවක ඇතුළත් පිවිසුම් සටහනක මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.<br><br>4. මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් සිදු කෙරෙන යම් නීතිමය පටිපාටියක දී:<br><br>අ) ශ්‍රී ලංකා ජල තීරයේ නිශ්චිත ප්‍රදේශයක දී චෝදනාවට අදාළ මසුන් අල්ලා ගෙන ඇති බවට, බලයලත් නිලධාරියකු, විශ්වාස කළ හැකි සාධාරණ හේතු මත, සාක්ෂි ලබා දෙන අවස්ථාවක දී; සහ<br><br>ආ) එම සාක්‍ෂි සැලකිල්ලට ගෙන, ඒවායේ සාධාරණ පදනමක් ඇතැයි අධිකරණය විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, එම සියලු මසුන් එසේ අල්ලා ගෙන ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.<br><br>5. මේ පනත යටතේ, ධීවර යාත්‍රාවක් සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් හෝ ධීවර යාත්‍රාවක කිසියම් ධීවර කටයුත්තක් සම්බන්ධයෙන් ප්‍රවේශ ගිවිසුමක් සපයන අවස්ථාවක දී, එය, අදාළ යාත්‍රාවේ යාත්‍රාධිපති, හිමිකරු හෝ යාත්‍රාව කුලියට ගත් තැනැත්තා විසින් ලබා දුන් බවට, එය ඔවුන්ගෙන් කිසිවෙකු විසින් ලබා දී හෝ ලබා දීමට අවසර දී හෝ නොමැති බව ඔප්පු කරන්නේ නම් මිස, පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.<br><br>6. මේ පනත යටතේ නඩත්තු කර පවත්වා ගෙනයාමට හෝ ධීවර යාත්‍රාවක |

| | |
|---|---|
| | කටයුතු වාර්තා කිරීමට භාවිතා කිරීමට නියම කරනු ලැබ ඇති ඕනෑම ලොග් පොතක්, සටහනක් හෝ වෙනත් ලේඛනයක් තුළ හෝ ඒ මත ඇති යම් ලිඛිත පිවිසුම් සටහනක් හෝ වෙනත් ලකුණක් යාත්‍රාධිපතිගේ, හිමිකරුගේ හෝ යාත්‍රාව කුලියට ගත් තැනැත්තාගේ විය යුතු යයි සැලකිය යුතු ය.<br><br>7. මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා භාවිතා කරන යාත්‍රාවක හෝ ගුවන් යානයක ඇති, කිසියම් චන්ද්‍රිකා දත්ත මත පාදක වූ නාවික චලනාංග පද්ධතියක් හෝ ගෝලීය ස්ථාන පද්ධතියක් ඇතුළත් මුත් ඒවාට සීමා නොවන, යාත්‍රාවක ස්ථානීය පිහිටීම පෙන්නුම් කරන කිසියම් උපකරණයක් නිවැරදි යැයි පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.<br><br>8. ධීවර කටයුතුවල නියැලී සිටිය දී, යාත්‍රා නිරීක්ෂණ මධ්‍යස්ථානය හා සම්බන්ධ වීමට අපොහොසත් වන හෝ එකී ධීවර මෙහෙයුමේ දී පැයක කාල වේලාවක් තුළ අදාළ යාත්‍රා නිරීකෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වන, එකී ධීවර කටයුතුවල නියැලී සිටින යම් තැනැත්තෙකු, ඊට පටහැනිතාවක් ඔහු විසින් ඔප්පු කරනු ලබන තෙක්, 110 වගන්තියේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කර ඇති බවට පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.<br><br>9. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට ආසන්නව පුපුරණ ද්‍රව්‍ය, විෂ හෝ පිපිරීම් හෝ විදුලි කම්පන ඇති කළ හැකි දඟර ජ්වලක වැනි උපකරණ තම සන්තකයේ තබාගෙන සිටිය දී හසුවන ඕනෑම තැනැත්තෙකු, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු කරන බවට පූර්ව නිගමනය කළ යුතු ය.<br>10. ශ්‍රී ලංකා ජල තීරයේ හෝ ඊට ආසන්නව කිසියම් නීති විරෝධී ධීවර ආම්පන්නයක් සන්තකයේ තබාගෙන සිටිය දී හසුවන කිසියම් තැනැත්තෙකු, ඊට පටහැනිතාවක් ඔප්පු කළහොත් මිස, මේ පනතේ (80), (82) සහ (84) යන වගන්ති උල්ලංඝනය කරමින් නීති විරෝධී ක්‍රියාකාරකමක නිරතව සිට ඇතැයි පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය. |
| **ඔප්පු කිරීමේ භාරය**<br><br>**160 වන වගන්තිය** | 1. මේ පනත යටතේ සිදුවන කිසියම් නඩු පටිපාටියක දී, බලපත්‍රයක් හෝ වෙනත් අවසරයක් අවශ්‍ය වන ක්‍රියාවක් සම්බන්ධ වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තෙකු චෝදනා ලැබුවහොත්, එකී අවශ්‍ය බලපත්‍රය හෝ අවසරය අදාළ වේලාවේ දී දැරූ බවට ඔප්පු කිරීමේ භාරය, එම තැනැත්තා මත පැවරෙන්නේය.<br><br>102<br><br>2. 93 වන වගන්තියට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට චෝදනා එල්ල වන අවස්ථාවක දී, දෙනු ලැබ ඇති තොරතුරු සත්‍ය බවටත්, සම්පූර්ණ බවටත්, නිවැරදි බවටත් ඔප්පු කිරීමේ භාරය, එම තැනැත්තා මත පැවරෙන්නේය. |
| **සාක්ෂිවලට මැදිහත්වීම හෝ වෙනස්කම් සිදු කිරීම**<br><br>**161 වන වගන්තිය** | 1. කිසිදු තැනැත්තෙකු, මේ පනත යටතේ වරදකට අදාළ කර ගනු ලැබිය හැකි සාක්ෂි කිසිවක් විනාශ කිරීම, ඒවාට හානි පැමිණවීම, සැඟවීම හෝ අන්‍යාකාරයකින් ඊට මැදිහත් වීම නොකළ යුතු ය.<br><br>2. කිසිදු තැනැත්තෙකු, විශේෂයෙන් , (1) වන උප වගන්තියේ සාමාන්‍යභාවය විෂයයෙහි සීමා නොවන පරිදි :<br><br>අ) ශ්‍රී ලංකා ජල තීරය හෝ මහ මුහුද යන කවරක දී වුව ද, යම් යාත්‍රාවක ගමන් කරමින් සිටිය දී, එම යාත්‍රාව ලුහුබැඳ යාමට පාත්‍ර කොට, අදාළ බලයලත් නිලධාරියෙකු එකී යාත්‍රාවට ගොඩ වීමට |

ආසන්නවත්ම හෝ ඊට ගොඩ වන බව දැනුම්දෙත්ම, මේ පනත හෝ වෙනත් යම් අදාළ වන දේශීය හෝ ජාත්‍යන්තර නීතිය යටතේ එකී තැනැත්තා විසින් සිදු කරන ලද කිසියම් වරදක් සම්බන්ධයෙන් ඒවා තහනමට ගැනීම හෝ ඒ වරද අනාවරණය කර ගැනීම වැළැක්වීමේ අරමුණින්, යාත්‍රාවේ ඇති මසුන්, උපකරණ, ලිපිලේඛන, පුපුරණ ද්‍රව්‍ය හෝ හිංසක ද්‍රව්‍ය කිසිවක් හෝ වෙනත් යම් දෙයක් යාත්‍රාවෙන් ඉවතට විසි කිරීම හෝ විනාශ කිරීම නොකළ යුතු ය ;

ආ) මේ කොටස යටතේ භාරයේ ඇති යාත්‍රාවක්, මසුන්, උපකරණ හෝ වෙනත් භාණ්ඩ කිසිවක භාරකාරත්වය ඉවත් කිරීම හෝ මේ පනත යටතේ භාරයේ ඇති යාත්‍රාවක්, මසුන්, උපකරණ හෝ වෙනත් භාණ්ඩ කිසිවක් සම්බන්ධව භාරකාරත්වයෙන් ඉවත් කළ හැකි වන පරිදි ක්‍රියා කිරීම හෝ ක්‍රියා කිරීම පැහැර හැරීම, එකී යාත්‍රාව, මසුන්, උපකරණ හෝ වෙනත් භාණ්ඩ කිසිවක් අත්අඩංගුවට යටත්ව තබා ගනු ලැබ ඇති බව ඔහු දැන සිටිය ද නොදැන සිටිය ද, එසේ නොකළ යුතු ය ;

ඇ) මෙම පනත යටතේ බලපත්‍ර ලබා දී ඇති යම් පරිශ්‍ර හෝ පහසුකම් කිසිවකට හිතාමතාම, නොසැලකිලිමත් ලෙස හෝ චේතනාවක් නොමැතිව විනාශ කිරීම, හානි කිරීම, අක්‍රිය කිරීම හෝ අන්‍යාකාරයකින් ඒවාට අයුතු බාධා සිදුකිරීම් නොකළ යුතු ය ;

ඈ) ශ්‍රී ලංකාව හෝ ශ්‍රී ලංකා ජල තීරය යන කවර වුවද ස්ථානයක දී හෝ මේ පනත යටතේ, පිහිටි ස්ථාන පද්ධතියක් අවශ්‍ය වන දේශීය අධිකරණ බලසීමාවෙන් බැහැර ප්‍රදේශයක දී, යාත්‍රාවක සවිකර ඇති එබඳු ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියක කිසියම් කොටසක් හිතාමතාම, නොසැලකිලිමත් ලෙස හෝ චේතනාවක් නොමැතිව විනාශ කිරීම, ඊට හානි කිරීම, එය ක්‍රියා විරහිත කිරීම හෝ ඊට අන්‍යාකාරයකින් අයුතු බාධා පැමිණවීම හෝ යම් ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියකට හෝ අදාළ යාත්‍රා නිරීක්ෂණ පද්ධතියකට නිල වශයෙන් අවශ්‍ය නොවන හෝ අර්ථවත් නොවන තොරතුරු හෝ දත්ත හිතාමතා සැපයීම හෝ ඇතුළත් කිරීම නොකළ යුතු ය ;

ඉ) මේ පනත යටතේ අවශ්‍ය වන හෝ අවසර දී ඇති ස්වයංක්‍රීය පිහිටි ස්ථාන පද්ධතියකින් හෝ යාත්‍රා නිරීක්ෂණ පද්ධතියකින් හෝ වාර්තා කිරීමේ හෝ පටිගත කිරීමේ පද්ධතියකින් ලබාගත් තොරතුරු හෝ දත්ත හිතාමතාම, නොසැලකිලිමත් ලෙස හෝ අනවධානී ලෙස, එකී තොරතුරු හෝ දත්ත රාජකාරි ඉටු කරන අතරතුර දී ලබා ගැනීමට හිමිකම් ඇති තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ස්වකීය රාජකාරි ඉටු කරන අතරතුර දී ලබා දීම හැර, හෙළිදරව් කිරීම නොකළ යුතු ය; හෝ

ඊ) යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක වන පරිශ්‍රයකට අනවසරයෙන් ප්‍රවේශ වීමට ඉඩ හැරීම හෝ මේ පනත යටතේ ක්‍රියාත්මක වන යාත්‍රා නිරීක්ෂණ පද්ධතියකින් ලැබෙන තොරතුරු හෝ දත්ත වෙත අනවසරයෙන් ප්‍රවේශ වීමට ඉඩ ලබා නොදිය යුතු ය.

3. මේ වගන්තියෙහි (1) වන හෝ (2) වන උප වගන්තිවල විධිවිධානවලට පටහැනිව කටයුතු කරන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට III වන උපලේඛනයේ දණ්ඩනයට යටත් විය යුතු ය.

| | **XII** වන කොටස – සාමාන්‍ය |
|---|---|
| **පළාත් සභා වෙතින් විමසීම**<br><br>**162 වන වගන්තිය** | මේ පනතේ දැක්වෙන විධිවිධාන පරිපාලනය කිරීමේ දී, සෑම පළාත් අමාත්‍ය මණ්ඩලයකට අයත් ධීවර කටයුතු භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ධීවර විෂයයෙහි ලා එකී එක් එක් පළාත තුළ බලපාන කරුණු පිළිබඳව උපදෙස් විමසා කටයුතු කරනු පිණිස වග බලා ගැනීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ යුතුකම විය යුතු ය. |
| **නිවේදන**<br><br>**163 වන වගන්තිය** | 1. මේ පනතේ අන්‍යාකාරයකින් නිශ්චිතව දක්වා ඇති පරිදි හැර, මේ පනත යටතේ යම් දැනුම්දීමක් හෝ වෙනත් ලියවිල්ලක් කිසියම් තැනැත්තෙකුට දීමට, ඒ තැනැත්තා වෙත භාර දීමට හෝ ඉදිරිපත් කිරීමට නියමිතව තිබේ නම්, එබඳු දැනුම්දීමක් හෝ වෙනත් ලියවිල්ලක් :<br><br>අ) එකී තැනැත්තා වෙත පෞද්ගලිකව ලබා දිය හැකි ය ;<br><br>ආ) එකී තැනැත්තා වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය ලත් වෙනත් යම් තැනැත්තෙකු වෙත පෞද්ගලිකව ලබා දිය හැකි ය ;<br><br>ඇ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වන නඩු පටිපාටි කිසිවක් සිදු වෙමින් පවතින අතරතුර දී හෝ ඊට අදාළ කාර්යයන් සඳහා ලබා දීමට හෝ භාර දීමට නියමිත යම් දැනුම්දීමක් හෝ ලියවිල්ලක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය විසින් නියම කරනු ලබන යම් තැනැත්තෙකු වෙත ලබා දිය හැකි ය ;<br><br>ඈ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වන නඩු පටිපාටි කිසිවක් සිදු වෙමින් පවතින අතරතුර දී හෝ ඊට අදාළ කාර්යයන් සඳහා ලබා දීමට හෝ භාර දීමට නියමිත යම් දැනුම්දීමක් හෝ ලියවිල්ලක් සම්බන්ධයෙන් වන විට හැර, එය, එම තැනැත්තා හෝ එම තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීමේ බලයලත් වෙනත් යම් තැනැත්තෙකු වෙත, එකී තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තාගේ සාමාන්‍ය සුපුරුදු හෝ අවසන් වරට දන්නා ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානයට ලියාපදිංචි තැපෑලෙන්, යැවිය යුතු ය ;<br><br>ඉ) මේ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වන නඩු පටිපාටි කිසිවක් සිදු වෙමින් පවතින අතරතුර දී හෝ ඊට අදාළ කාර්යයන් සඳහා ලබා දීමට හෝ භාර දීමට නියමිත යම් දැනුම්දීමක් හෝ ලියවිල්ලක් සම්බන්ධයෙන් වන විට හැර, එය, එම තැනැත්තා හෝ එම තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීමේ බලයලත් වෙනත් යම් තැනැත්තෙකු වෙත, එකී තැනැත්තාගේ හෝ වෙනත් තැනැත්තෙකුගේ ෆැක්ස් අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුළු ඔහුගේ සුපුරුදු හෝ අවසන් වරට දන්නා 104 ලිපිනයට, විද්‍යුත් සම්ප්‍රේෂණය මගින් යැවිය යුතු ය.<br><br>2. විදේශීය ධීවර යාත්‍රාවක යාත්‍රාධිපති ,හිමිකරු , ක්‍රියාකරු, කුලියට ගත් තැනැත්තා, බෝට්ටුවේ ගමන් කරනු ලබන හෝ ගමන් කළ බවට සැක කරනු ලබන යම් තැනැත්තෙකුට මේ පනතට එරෙහිව සිදු කළ යම් වරදක් සම්බන්ධයෙන් නඩු පටිපාටි කිසිවක විත්තිකරුවෙකු වන අවස්ථාවක දී, වෙනත් යම් නීතියක් නොතකා, සිතාසි හෝ වෙනත් ලියකියවිලි කිසිවක් එකී විත්තිකරු වෙත ර භාර දීම :<br><br>අ) විත්තිකරු වෙනුවෙන් අදාළ යාත්‍රාවේ නියෝජිතයා වෙත පුද්ගලිකව භාරදීම මගින් හෝ විත්තිකරු වෙනුවෙන් එම නියෝජිතයා එය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එකී නියෝජිතයාගේ අවධානයට එය යොමු කිරීම මගින් ද ;<br><br>ආ) විත්තිකරු වෙනුවෙන් එකී යාත්‍රාවේ නියෝජිතයා වෙත, එම නියෝජිතයාගේ අවසන් වරට දන්නා හෝ සාමාන්‍ය සුපුරුදු පදිංචි ස්ථානයට හෝ එම නියෝජිතයාගේ ව්‍යාපාරික ස්ථානයට |

| | |
|---|---|
| | ලියාපදිංචි තැපෑලෙන් යැවීම මගින් ද, සිදු කළ හැකි ය; හෝ<br><br>ඇ) කිසියම් විදේශීය යාත්‍රාවක් සම්බන්ධයෙන් කිසිදු නියෝජිතයෙකු නම් කර නොමැති අවස්ථාක දී, යාත්‍රාවේ යාත්‍රාධිපති, ඊට අදාළ නියෝජිතයා ලෙස සැලකිය යුතු ය. |
| **රහස්‍ය තොරතුරු නම් කිරීම**<br><br>**164 වන වගන්තිය** | 1. අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු මේ පනත යටතේ රාජකාරි හෝ වගකීම් ඉටු කරන යම් තැනැත්තෙකු, මේ පනතට අනුකූලව බලය පවරනු ලැබුවහොත් මිස, ස්වකීය බලධාරිත්වය, රාජකාරි සහ වගකීම්හි ප්‍රතිඵලයක් ලෙස තමන්ට දැන ගැනීමට ලැබෙන රහසිගත ස්වභාවයේ තොරතුරු හෝ වෙනත් දත්ත හෝ මේ පනතට අනුව රහසිගත බවට නම් කර ඇති තොරතුරු, එවැනි යම් අධිකාරි බලයක් නොමැති හෝ එවැනි යම් රාජකාරි සහ වගකීම් ඉටු නොකරන තැනැත්තන් කිසිවෙකු වෙත හෙළිදරව් නොකළ යුතු ය.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්වරයාට යම් තොරතුරක් රහසිගත තත්ත්වයේ ලා වර්ගීකරණය කළ හැකි අතර, එසේ කිරීමේ දී, රහස්‍යත්ව අවශ්‍යතා මගින් රැස්කර ගත් තොරතුරුවල සාමාන්‍ය සාරාංශයන් නිදහස් කළ හැකි ය.<br><br>3. අධ්‍යක්ෂ ජනරාල්වරයාට කිසියම් තැනැත්තෙකු වෙත :<br>අ) රහස්‍ය තොරතුරු ලබා ගැනීම හෝ ඒවා වෙත ප්‍රවේශ වීම සඳහා, හෝ;<br><br>ආ) ඔහු විසින් නම් කරනු ලබන රහස්‍ය තොරතුරු තබාගෙන සිටින පරිශ්‍ර කිසිවක් වෙත ප්‍රවේශ වීම සඳහා හෝ ඒවා වෙත ප්‍රවේශ වීම සීමා කිරීම සඳහා;<br><br>ලිඛිතව බලය දිය හැකි ය.<br><br>4. (2) වන උප වගන්තියෙහි කුමක් සඳහන් වුව ද, පහත දැක්වෙන තොරතුරු රහසිගත විය යුතු ය; එනම්<br><br>අ) මේ පනත යටතේ නියමිත වන ලේඛන, වාර්තා, හෝ වෙනත් ලියකියවිලිවල සපයා ඇති වාණිජමය ස්වභාවයෙන් යුත් කිසියම් තොරතුරු හෝ දත්ත ;<br><br>ආ) මේ පනතට අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධතියක් හෝ එහි කොටසක් මගින් සපයනු ලබන කිසියම් තොරතුරු හෝ දත්ත ;<br><br>ඇ) කලින් කලට නියම කළ හැකි වෙනත් යම් තොරතුරු හෝ දත්ත.<br><br>5. තොරතුරු අනාවරණය කිරීම :<br><br>අ) මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ හෙළිදරව් කිරීම සඳහා අවසර දෙනු ලබන හෝ අවශ්‍ය වන ප්‍රමාණය ට ;<br><br>ආ) තොරතුරු සපයන තැනැත්තාට හෙළිදරව් කිරීම සඳහා අවසරය ඇති ප්‍රමාණය ට ;<br><br>ඇ) ධීවර ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යා ලේඛනමය තොරතුරු ප්‍රකාශයට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි වනු පිණිස අවශ්‍ය වන ප්‍රමාණය ට ;<br><br>ඈ) ශ්‍රී ලංකා රජයේ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන විසින් ශ්‍රී |

| | |
|---|---|
| | ලංකාවේ නීති බලාත්මක කරනු ලැබීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණය ට ;<br><br>ඉ) කලාපීය හෝ ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීමට හෝ අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය, පාලනය සහ සෝදිසි මෙහෙයුම් කිරීමෙහි ලා කලාපීය සහ ජාත්‍යන්තර සහයෝගිතාව හෝ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණය ට; සහ,<br><br>ඊ) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අමාත්‍යවරයාට උපදෙස් ලබා දීමට හැකි වනු පිණිස අවශ්‍ය වන ප්‍රමාණය ට<br>සිදුකළ හැකිය.<br><br>6. අධ්‍යක්ෂ ජනරාල්වරයාට රහසිගත බවට නම් කර ඇති :<br>අ) සෝදිසි මෙහෙයුම් සහ මුදවා ගැනීම සහ වෙනත් හදිසි අවස්ථා ඇතුළු කාර්යයන් සඳහා, වගකිවයුතු බලධරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, යම් යාත්‍රාවක තථ්‍ය කාලීන පිහිටීම හෝ වෙනත් ස්ථානයක පිහිටීමට අදාළ වන ;<br><br>ආ) තීරණ ගැනීමේ දී තිබිය යුතු සාධාරණ විනිවිදභාවය ඇතුළුව, මේ පනතේ පරමාර්ථ සහ ඒවා බලාත්මක කිරීම විෂයයෙහි උපකාර වනු ඇතැයි ඔහු විසින් සළකනු ලබන කාර්යයන් සඳහා වන; හෝ<br><br>ඇ) අමාත්‍යවරයා විසින් ලිඛිතව අනුමත කරනු ලබන හෝ නියම කරනු ලැබිය හැකි එවැනි කාර්යයන් සඳහා වන ;<br>යම් තොරතුරක් නිකුත් කිරීමට අවසර දිය හැකි ය.<br><br>7. රහසිගත බවට වර්ගීකරණය කරන ලද ඕනෑම තොරතුරක්, එවැනි නම් කිරීමක සිට වසර තුනක (3) කාලයක් සඳහා, ඊට අදාළ එකී වර්ගීකරණය පවත්වා ගෙන යා යුතු අතර, එම වසර තුනක (3) කාලපරිච්ඡේදය ඉකුත් වූ කල්හි, එම වර්ගීකරණය, මෙම පනතේ පරමාර්ථ සහ ඒවා බලාත්මක කිරීම විෂයයෙහි අවශ්‍ය වනු ඇතැයි හැඟෙන කාර්යයන් සඳහා වසර තුනකට (3) හෝ ඊට වැඩි කාලයක් සඳහා තවදුරටත් දීර්ඝ කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි ය.<br><br>8. (3) වන, (5) වන හෝ (6) වන උප වගන්තිවලට අනුව හෙළිදරව් කරනු පිණිස අවසර ලබා දී ඇති අවස්ථාවක දී හැර, (1) වන උප වගන්තියේ අවශ්‍යතාවලට අනුකූල නොවන තැනැත්තෙකු වරදක් සිදු කරන අතර වරදකට වරදකරු වූ විට III වන උපලේඛනයේ දණ්ඩනයට යටත් විය යුතු ය.<br>106 |
| තොරතුරුවල අයිතිය<br><br>**165** වන වගන්තිය | 1. මේ පනත යටතේ රජයට වාර්තා කිරීමට, දැනුම් දීමට හෝ වෙනත් ආකාරයකින් ලබා දීමට නියම කරනු ලැබ ඇති සියලු තොරතුරුවල අයිතිය රජය වෙත පැවරේ.<br><br>2. මේ පනත යටතේ නියම කරනු ලැබ ඇති ස්වයංක්‍රීය ස්ථාන පද්ධති මගින් ජනනය කෙරෙන සියලු තොරතුරුවල අයිතිය රජය වෙත පැවරේ. |
| ධීවරයින් සඳහා අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ | මේ පනත යටතේ සාදන ලද නියෝග සහ ඉන්දියන් සාගර ටූනා කොමිසම විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ පිළිබඳව ධීවරයින් දැනුවත් කිරීම සඳහාත්, මත්ස්‍ය ගහන සංරක්ෂණය කිරීම සහ පරිසර දූෂණය අවම කිරීම සඳහා රජය |

| | |
|---|---|
| වැඩසටහන්<br><br>**166** වන වගන්තිය | විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව ධීවරයින් තුළ අවබෝධාත්මක දැනුමක් ඇති කිරීම සඳහාත්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පවතින අරමුදල් ප්‍රමාණයට යටත්ව, දිගු කාලීන අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් පැවැත්විය යුතු ය. |
| නියෝග<br><br>**167** වන වගන්තිය | 1.මේ පනත යටතේ සහ පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය ;<br><br>අ) 72 වන වගන්තිය යටතේ, ධීවර කමිටු රීති ක්‍රියාත්මක කිරීම සඳහා සහ ග්‍රාමීය සහ දිස්ත්‍රික් මට්ටමින් ධීවර සංවිධාන පිහිටුවීම සඳහා ;<br><br>ආ) 11 වන වගන්තිය යටතේ, ධීවර යාත්‍රා සලකුණු කිරීම ඇතුළුව, ධීවර යාත්‍රා සහ විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ යාත්‍රා ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කිරීමේ කාර්ය පටිපාටිය සහ ආකෘති පත්‍රය, ගෙවිය යුතු ගාස්තු සහ ඊට අදාළ වෙනත් යම් කරුණක් සඳහා ;<br><br>ඇ) 20,21,22,23,24,25, සහ 26 දක්වා වන වගන්ති යටතේ උකස් සාධන පත්‍රවලට අදාළව අවශ්‍ය වන්නා වූ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ;<br><br>ඈ) 31 වන වගන්තිය යටතේ, හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා වන කොන්දේසි සහ ඊට අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ ධීවරයන් පිළිබඳ ලේඛනය පිළියෙල කිරීම සහ සංශෝධනය කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටිය නියාමනය කිරීම පිණිස;<br><br>ඉ) 40,42,43,56,57,58 සහ 59 වන වගන්ති යටතේ, ධීවර යාත්‍රාවලට සහ ධීවරයින්ට ධීවර කටයුතු වල නියැලීම සඳහා සහ විදේශීය යාත්‍රාවක මසුන් ඇල්ලීම සඳහා ධීවරයින්ට බලපත්‍ර ලබාදීම සඳහා වන ඉල්ලුම්පත්‍රය සහ ඊට ගෙවිය යුතු ගාස්තු සහ යාත්‍රාධිපතිවරුන් සඳහා ප්‍රවීණතා සහතිකය සහ බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් වන කොන්දේසි සහ ක්‍රියා පටිපාටි සහ අයදුම්පත්‍රය නිශ්චය කිරීම සඳහා ;<br><br>ඊ) 53 වන වගන්තිය යටතේ, ධීවර ආම්පන්න ලියාපදිංචි කිරීම සහ සලකුණු කිරීම සහ ඒවායේ හිමිකරුවන් ලියාපදිංචි කිරීම, කවර නිලධාරින් විසින් ඔවුන් ලියාපදිංචි කළ යුතු ද යන්න සම්බන්ධයෙන් සහ ඊට ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් කොන්දේසි ක්‍රියාත්මක කිරීමට ;<br><br>උ) 59 වන වගන්තිය යටතේ, විනෝදය සඳහා මසුන් ඇල්ලීම සිදු කිරීම සඳහා කොන්දේසි ස්ථාපනය කිරීමට සහ විනෝදය සඳහා මසුන් ඇල්ලීම සිදු කිරීම සඳහා වන බලපත්‍රය සඳහා කොන්දේසි, කාර්ය පටිපාටි සහ අයදුම්පත් ආකෘති පත්‍රය සෑදීමට ;<br><br>ඌ) 63 වන වගන්තිය යටතේ, ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු වන කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන විසින් පිළිගත් සංරක්ෂණ, කළමනාකරණ සහ පාලන ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සහ ශ්‍රී ලංකාව බැඳී සිටින සම්මුතීන් සහ ගිවිසුම් සඳහා ;<br><br>එ) 65 වන වගන්තිය යටතේ, ගැනියන් නැවත සිය රටවල් කරා ගෙන්වා ගැනීම පිණිස හිමිකම් ලබන අවස්ථානුගත තත්ත්වයන් තීරණය කරමින් ඊට සුදුසු විධිවිධාන නියම කිරීම සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ධීවර සම්මුති හෝ අනෙකුත් ධීවර සම්මුතීන් පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට ;<br><br>ඒ) 76 වන වගන්තිය යටතේ, වෙරළබඩ ධීවර ප්‍රජාව සහ ඔවුන්ගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම උදෙසා වන යැපුම් ධීවර කර්මාන්තය |

ආරක්ෂා කිරීම සඳහා නිශ්චිත කොන්දේසි පැනවීමට ;

ඔ) 77 වන වගන්තිය යටතේ, ධීවර යෙදවුම් සහ යෙදවුම වෙන්කිරීම සඳහා වන නිර්ණායක, බලපත්‍රලාභීන් අතර ධීවර යෙදවුම් සහ යෙදවුම පැවරීම් සහ හුවමාරු කිරීම් සඳහා වන කොන්දේසි, සීමාව ඉක්මවා ධීවර යෙදවුම් භාවිතා කිරීම සම්බන්ධව නම්‍යශීලීතාවයේ සීමාව, සහ පමණ ඉක්මවා මසුන් ඇල්ලීමක් සිදුවුවහොත් අදාළ ප්‍රමාණය අඩු කිරීම් හා නැවත වෙන් කිරීම් පිණිස වූ කාර්ය පටිපාටි පනවා නියම කිරීමට ;

ඖ) 78 වන වගන්තිය යටතේ, ධීවර යාත්‍රා ඇණි ධාරිතාව කළමනාකරණය කිරීම සඳහා කොන්දේසි, රීති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට ;

ක) 79 වන වගන්තිය යටතේ, සමුද්‍රීය ජීවී විශේෂවල අවම ප්‍රමාණය සහ ධීවර දැල්, ආම්පන්න සහ ධීවර පන්න ක්‍රම භාවිතය සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන රීති සහ අතුරු අස්වැන්න නෙලා ගැනුමේ උපරිම ප්‍රතිශත ප්‍රමාණය සහ ආරක්ෂිත මසුන් විශේෂ ස්ථාපිත කිරීමට ;

ග) 90 වන වගන්තිය යටතේ, සමුද්‍රීය විද්‍යාත්මක පර්යේෂණ කටයුතු නියාමනය කර විධිමත් කිරීමට ;

ච) 95 වගන්තිය යටතේ, පරීක්ෂා කිරීම් සිදු කිරීම ඇතුළුව, මසුන් ඇල්ලීමේ සිට ඒවායේ සිල්ලර අලෙවි මට්ටම දක්වා ධීවර නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කරනු පිණිස අවශ්‍ය කොන්දේසි තීරණය කිරීම සඳහා;

ජ) 97 වන වගන්තිය යටතේ, සකස් කරන ලද මත්ස්‍ය විශේෂයක සජීවී මසුන් හෝ මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටවු ඒවායින් පිළියෙල කරනු ලබන යම් නිෂ්පාදනයක් ශ්‍රී ලංකාවේ සිට අපනයනය කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව වෙත ආනයනය කිරීම සඳහා රීති පනවා නියම කිරීමට ;

ට) 98 වන වගන්තිය යටතේ, ධීවර නිෂ්පාදන විෂයයෙහි පැහැදිලි අන්වේක්ෂණ හැකියාව පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට;

ඩ) 100 වන වගන්තිය යටතේ, මත්ස්‍ය පිරිසැකසුම් කිරීම, මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීම පිණිස, ඊට අදාළ අලුත් කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම, ගෙවිය යුතු ගාස්තු සහ වෙනත් කවර වුවද කරුණක් ඇතුළුව ඒ සඳහා වූ ඉල්ලුම්පත්‍රය සහ ඉල්ලුම් කිරීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් තීරණය කිරීමට ;

න) 110 වන වගන්තිය යටතේ යාත්‍රා ඇණිවල සහ ඊට අදාළ කරුණුවල නිසි අධීක්ෂණය සහතික කිරීම සඳහා,ගෝලීය ස්ථාන පද්ධතියක (GPS), යාත්‍රා අධීක්ෂණ පද්ධතියක (VMS) හෝ වෙනත් යම් බලයලත් ස්වයංක්‍රීය පිහිටි ස්ථාන දක්වන සන්නිවේදන පද්ධතියක ක්‍රියාකාරිත්වයට අදාළ කොන්දේසි ක්‍රියාත්මක කිරීමට ;

ත) 111 වන වගන්තිය යටතේ, ප්‍රතිනැව්ගත කිරීම පිළිබඳ නියෝග ක්‍රියාත්මක කිරීමට ;

ද) 112 වන වගන්තිය යටතේ, මසුන් ගොඩබෑම් විෂයයෙහි රීති පැනවීම ;

න) 113 වන වගන්තිය යටතේ, ශ්‍රී ලංකාවේ නම් කරන ලද වරායන් වෙත ඇතුලු වන විදේශීය ධජය සහිත යාත්‍රා විෂයයෙහි වරාය රාජ්‍ය පියවර ක්‍රියාත්මක කිරීමට; සහ,

ප) 114 වන වගන්තිය යටතේ, යාත්‍රාවේ ගමන් කරන නිරීක්ෂකයින් පිළිබඳව නියෝග ක්‍රියාත්මක කිරීම ;

බ) 32 වන වගන්තිය යටතේ, ධීවර බෝට්ටුවල ආරක්ෂාව (සැලැස්ම,ඉදි කිරීම සහ උපකරණ) යාත්‍රා කිරීමේ අවම ප්‍රමිති, මිනිසුන් ගෙන යාමේ අවම ප්‍රමිති සහ ආරක්ෂිත උපකරණ ;

ම) 8 වන වගන්තිය යටතේ, ජාතික ධීවර සම්මේලනයේ ක්‍රියාකාරීත්වය, මූල්‍යනය,විගණනය සහ ඒ හා අදාල ආනුෂංගික කරුණුවලට අදාළව නියෝග සෑදීම;

ය) මේ පනත යටතේ සඳහන් කර ඇති හෝ පැනවිය යුතු යයි නියම කර ඇති හෝ මේ පනත යටතේ සෑදිය යුතු යයි අවසරය දී ඇති හෝ නියම කර ඇති නියෝග සම්බන්ධයෙන් අවශ්‍ය සියලු කරුණු

සම්බන්ධව නියෝග සෑදිය හැකි ය.

2.අමාත්‍යවරයා විසින් (1) වන අප වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර , එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කර ඇති යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතුය.

3. අමාත්‍යයවරයා විසින් සාදන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත හැකි තාක් ඉක්මණින් ඉදිරිපත් කළ යුතුය.එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එසේ අනුමත නොකළ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.එහෙත් එය යටතේ කලින් කරනු ලැබූ යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය.

4. යම් නියෝගයක් (3) වන උප වගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය.



**අර්ථ නිරූපණය**

**168 වන වගන්තිය**

යම් පටහැනි අර්ථ නිරූපණයක් දිස් වන්නේ නම් මිස ,මේ පනතේ

- **'අතහැර දැමූ, නැතිවූ හෝ ඉවත දැමූ ධීවර ආම්පන්න'** යන්නෙන්, -:

අ) අතහැර දැමූ ධීවර ආම්පන්න යන්නෙන්, අදාළ හිමිකරු හෝ නියාමක සතු පාලනයක් තිබෙන සහ එකී හිමිකරුට හෝ නියාමකට ආපසු ගොඩට ගත හැකි මුත්, මැඩලිය නොහැකි අනුපාතික බලපෑම් හෝ වෙනත් අනපේක්ෂිත තත්වයන් කරණකොට ගෙන හිතාමතාම මුහුදේ අත්හැර දමා පැමිණි ධීවර ආම්පන්න අදහස් වේ ;

ආ) නැතිවූ ධීවර ආම්පන්න යන්නෙන්, අදාළ හිමිකරුට හෝ නියාමකට අහම්බෙන් පාලනය අහිමි වූ සහ අදාළ හිමිකරුට හෝ නියාමකට නියමිත ඒවායේ ස්ථානය සොයා ගැනීමට සහ / හෝ ආපසු ගොඩට ගත නොහැකි ධීවර ආම්පන්න අදහස් වේ ;

ඇ) ඉවත දැමූ ධීවර ආම්පන්න යන්නෙන්, තවදුරටත් පාලනය කිරීම හෝ ආපසු ලබා ගැනීම සඳහා කිසිදු උත්සාහයක් නොගෙන අදාළ හිමිකරු හෝ නියාමක විසින් මුහුදට මුදා හරිනු ලබන ධීවර ආම්පන්න ;

අදහස් වේ ;

- **'ජාතික අධිකරණ බලසීමාවෙන් බැහැර ප්‍රදේශ'** යන්නෙන්, ශ්‍රී ලංකා ජල තීරයෙන් පරිබාහිර ප්‍රදේශ සහ ජාත්‍යන්තර නීතිය මගින් පිළිගත් වෙනත් රාජ්‍යවල ජාතික අධිකරණ බලසීමාව යටතේ ඇති ඊට සමාන ප්‍රදේශ අදහස් වේ ;

- **'බලයලත් නිලධාරීන්'** යන්නෙන්, 117 (1) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධීක්ෂණ, පාලන, සෝදිසි මෙහෙයුම් සහ බලාත්මක කිරීමේ කටයුතු පිළිබඳ කාර්යයන් සඳහා පත් කරන ලද නිලධාරීන් අදහස් වේ ;

- **'ස්වයංක්‍රීය හඳුනා ගැනීමේ පද්ධතිය (AIS)'** යන්නෙන්, ට්‍රාන්ස්පෝන්ඩර උපකරණයක් රැගෙන යන යාත්‍රා මගින් විකාශනය කරන ලද පණිවිඩ මත පදනම් වූ හඳුනා ගැනීම, ස්ථානීය පිහිටීම, ගමන් මාර්ගය සහ වේගය ඇතුළුව නෞකා වාර්තාකරණය සබැඳි දත්ත පද්ධතියක් අදහස් වේ ;

- **'ස්වයංක්‍රීය පිහිටි ස්ථාන සන්නිවේදකය'** යන්නෙන්, යාත්‍රාවේ ස්ථානීය පිහිටීම, ධීවර කටයුතු පිළිබඳ තොරතුරු සහ, ගෝලීය ස්ථාන පද්ධතියක් සහ යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් ද ඇතුළුව අවශ්‍ය විය හැකි එකී යාත්‍රාවේ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු, ස්වාධීනව හෝ වෙනත් යම් උපකරණයක් හෝ උපකරණ හා සහසම්බන්ධව ක්‍රියා කරන්නේ හෝ නොකරන්නේ වුව ද, සම්ප්‍රේෂණය කිරීමට සැලසුම් කර ඇති, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබ ධීවර යාත්‍රාවක තබා ඇති උපකරණයක් ;

- **'ප්‍රතිලාභී හිමිකරු'** යන්නෙන්, දේපලෙහි නීත්‍යානුකූල හිමිකම වෙනත් පුද්ගලයෙකුට අයත් වුවද, යම් කොටස්වල නිශ්චිත දේපල අයිතිය අයත් පුද්ගලයා අදහස් වේ ;

- **'පතුලේ අදින ට්‍රෝල් දැල'** යන්නෙන්, කේතු හැඩැති දැල් වියමනක් සහිත වූ ද, එකී දැලේ එක් කෙළවරකට තටු දෙකක් සහිතව හෝ රහිතව සවි කොට, එහි අග්‍රයට මල්ලක් හෙවත් මඩියක් සම්බන්ධ කරන ලද්දාවූ ද, මසුන් රංචු ගස්වා සහ ඊට පෙරහන් වීමට සලස්වා, එන්ජින් සවි කළ ධීවර යාත්‍රා එකක් හෝ දෙකක් මගින් එම මාළු ඇල්ලීම සඳහා ඇදගෙන යන්නාවූ ද දැලක් අදහස් වේ ;

- **'සංරක්ෂණ සහ කළමනාකරණ පියවර'** යන්නෙන්, 1982 එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතිය සහ 1995 එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය ගහන ගිවිසුම ඇතුළු ජාත්‍යන්තර නීතියේ අදාළ නීති රීතිවලට අනුකූලව අනුගමනය කරනු ලබන සහ අදාළ කර ගනු ලබන ජීවී සමුද්‍ර සම්පත් විශේෂ එකක් හෝ ඊට වැඩි ගණනක් සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග අදහස් වේ ;

- **'පාවෙන කරමල් දැල්'** යන්නෙන්, මුහුදු පත්ලේ සවි කර නොමැති නමුත් දිය වැල් ධාරාව සමග පා වීමට ඉඩ සලසන කරමල් දැල් වර්ගයක් අදහස් වේ ;

- **'ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති පදනම් කරගත් ප්‍රවේශය'** යන්නෙන්, පරිසර පද්ධතිවලට අයත් ජෛව, අජෛව සහ අනෙකුත් මානව සංරචකයන් හා සබැඳි දැනුම සහ අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින්, බලපෑමට ලක් වන්නා වූ පරිසර පද්ධතියට අයත් වාසස්ථානවල සංයුතිය, ව්‍යුහය සහ ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීමට අවශ්‍ය ජීව විද්‍යාත්මක වස්තු

සම්භාරය සහ ජීව විද්‍යාත්මක ක්‍රියාවලි යන ද්වයම රැක ගන්නා අතරතුර, ස්වභාවික සම්පත් භාවිතය කළමනාකරණය කිරීම අපේක්ෂා කරන පරිසර විද්‍යාත්මකව අර්ථවත් වූ සීමා මායිම් තුළ, මසුන් ඇල්ලීම සහ වෙනත් මිනිස් ක්‍රියාකාරකම් පිළිබඳව අවධානය යොමු කරමින්, ධීවර කටයුතු කළමනාකරණය කිරීම උදෙසා වන ඒකාබද්ධ ප්‍රවේශයක් අදහස් වේ ;

- **'ධීවර යෙදවුම්'** යන්නෙන්, නියම කරනු ලැබ ඇති පරමාර්ථවලට සහ පාරදෘශ්‍ය නිර්ණායකවලට අනුකූලව විවිධ ධීවර යෙදවුම්ලාභීන්ට වෙන් කරදෙනු ලැබ ඇති යම් නියමිත කාල සීමාවක් තුළ නියමිත මත්ස්‍ය ගහනයක් හෝ මත්ස්‍ය ගහන සමූහයක් සඳහා වූ අවසර දිය හැකි සමස්ථ මසුන් ඇල්ලීමේ ප්‍රමාණය(TAC), අදහස් වේ ;

- **'ඉලෙක්ට්‍රොනික ලොග් පොත් පද්ධතිය (ERS)'** යන්නෙන්, ධීවර යාත්‍රාවක ක්‍රියාකරු විසින් බලයලත් නිලධාරියා වෙත සම්ප්‍රේෂණය කරනු ලබන, කිසියම් ජාත්‍යන්තර සංරක්ෂණ සහ කළමනාකරණ ක්‍රියාමාර්ග (ක්‍රියාමාර්ගවලට) අනුව යවන වාර්තා ඇතුළු, මසුන් ඇල්ලීම හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධ තොරතුරු සහ දත්ත පිළිබඳව පරිගණකගත කර යවන සහ යම් නියම කරනු ලැබිය හැකි නිදර්ශක මගින් යවන වාර්තාවක් අදහස් වේ ;

- **'අනන්‍ය ආර්ථික කලාපය'** යන්නෙන්, 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 5 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයකින් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් වේ.

- **'මසුන්'** යන්නෙන්, ජීවත්ව සිටින හෝ ජීවත් නොවන, ජලයේ වසය කරන ඕනෑම ජලජ හෝ සමුද්‍රීය සතෙකු අදහස් වන අතර, ඊට ඔවුන්ගේ බිත්තර පැටව්,ඇස්වටයන් සහ එම සතුන්ගේ වර්ධන අවස්ථාවන් සහ ඔවුන්ගේ කොටස් ද,එසේ ම එක් ස්ථානයක වාසය කරන සත්ව විශේෂවලට අයත් සියළු ජීවීන්ද ඊට ඇතුළත් වේ;

- **'මසුන් ඒකරාශි කිරීමේ ඇටවුම් (FAD)'** යන්නෙන්, වෙනත් වර්ගවල උපකරණ හෝ ආම්පන්න භාවිතයෙන් යම් ව්‍යුහ ඉදිකිරීම්වල සෙවන යට නවාතැන් ගන්නා මසුන් අල්ලා ගැනීමට හැකි වන පරිදි ජලය මත පාකර හරිනු ලබන හෝ ජලය යට පිහිටුවනු ලබන හෝ ගිල්වනු ලබන ව්‍යුහයන් අදහස් වේ;

- **'මත්ස්‍ය පිරිසැකසුම** යන්නට, කැපීම, අවයව කපා ඉවත් කිරීම, පිරිසිදු කිරීම, වර්ග කිරීම, කැපීම, අයිස් දැමීම, අධිශීතණය, ටින්වල ඇසිරීම, දුමායනය,වියලීම, කැබලිවලට වෙන් කිරීම, ලුණු දැමීම සහ කල් තබා ගැනීම වැනි ඕනෑම ක්‍රමයක් මඟින් ධීවර සම්පත්වලින් ලබා ගන්නා යම් ද්‍රව්‍යයක නිෂ්පාදනයක් ඇතුළත් වේ ;

- **'මත්ස්‍ය පිරිසැකසුම් ආයතනය'** යන්නෙන්, වාණිජමය භාවිතය සඳහා මසුන් හසුරුවනු ලබන සහ ඒවා පිරිසැකසුම් කරන යම් ගොඩනැගිල්ලක් හෝ යාත්‍රාවක් හෝ ප්‍රදේශයක් අදහස් වේ ;

- **'මත්ස්‍ය නිෂ්පාදන'** යන්නෙන්, අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් පිරිසැකසුම් කර ඇති මසුන් කිසිවක් අදහස් වේ;

-**'ධීවරයා'** යන්නෙන්, ධීවරයින්, ගැනියන් සහ යාත්‍රාවේ යාත්‍රාධිපති ඇතුළුවන නමුත් ඊට සීමා නොවන සහ 31 වන වගන්තිය යටතේ ධීවරයින් ලියාපදිංචි

කිරීමේ ලේඛනයේ ලියාපදිංචි වී ඇති ඍජුව මසුන් ඇල්ලීමේ කටයුතු වල නියැලෙන යම් තැනැත්තෙකු අදහස් වේ ;

-**'ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලෙන තැනැත්තෙකු'** යන්නෙන්, ධීවර කර්මාන්තයේ වක්‍රව නියැලෙන 31 වන වගන්තිය යටතේ ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නියැලෙන තැනැත්තන් වශයෙන් ලියාපදිංචි කිරීමේ ලේඛනයේ ලියාපදිංචි වී ඇති යම් තැනැත්තෙකු අදහස් වේ ;

- **'ධීවර ආරවුල'** යන්නෙන්, ශ්‍රී ලංකා ජල තීරයේ කවර වුව ද ප්‍රදේශයක මසුන් ඇල්ලීමේ අයිතිය, මසුන් ඇල්ලීමේ කාලය, ආකාරය හෝ ස්ථානය සම්බන්ධයෙන් මසුන් ඇල්ලීමේ යෙදී සිටින පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් හෝ කණ්ඩායම් අතර උද්ගත වන යම් ආරවුලක් අදහස් වේ ;

- **'කලාපීය ධීවර සංවිධාන (RFMO)'** යන්නෙන් කලාපීය ධීවර සංවිධාන මගින් සකස්කරන ලද ශ්‍රී ලංකාව පාර්ශවකරුවෙකු ලෙස ගිවිසුම්ගත ගිවිසුම් සහ බැඳීම් අදහස් වේ.

- **'ධීවර මෙහෙයුම්'** යන්නෙන්, මසුන් ගැවසෙන ස්ථාන පිළිබඳ සොයා බැලීම, මසුන් ආකර්ෂණය කර ගැනීම,මසුන් ගැවසෙන ස්ථාන නිශ්චය කර ගැනීම, මසුන් ඇල්ලීම, මසුන් එකතු කිරීම, මසුන් ගැනීම හෝ මත්ස්‍ය අසවැන්න නෙලා ගැනීම, හෝ මසුන් ආකර්ෂණය කර ගැනීම, මසුන් ගැවසෙන ස්ථාන නිශ්චය කර ගැනීම, මසුන් ගැනීම හෝ මත්ස්‍ය අසවැන්න නෙලා ගැනීම යන කාර්යයන්හි දී සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි කිසියම් ක්‍රියාකාරකමක් අදහස් වේ ;

- **'ධීවර මෙහෙයුම් ප්‍රදේශය** යන්නෙන්, ධීවර මෙහෙයුම් බලපත්‍රයක් මගින් ධීවර මෙහෙයුම් සඳහා නිරත වීමට අවසර ලබා දෙන ප්‍රදේශය අදහස් වේ;

- **'මසුන් ඇල්ලීමේ අවසරය'** යන්නෙන්, මේ පනත යටතේ නියම කර ඇති යම් අවසරයක්, බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ පිටසන් කිරීමක් අදහස් වේ ;

- **'මසුන් ඇල්ලීමේ ප්‍රයත්නය'** යන්නෙන්, නියම කරන ලද කාල ඒකකයක් තුළ ධීවර භූමි ප්‍රදේශයේ භාවිතා කරන විශේෂිත වර්ගයක ධීවර ආම්පන්න ප්‍රමාණය,



- **ධීවර ආම්පන්න'** යන්නෙන්, සමුද්‍ර ජීවීන් අල්ලා ගැනීම හෝ අල්ලා ගැනීමෙන් පසුව පාලනය කර ගැනීම හෝ සමුද්‍රීය ජීවී අස්වැන්න නෙලා ගැනීම යන කාර්යයන් සඳහා වන අපේක්ෂිත අරමුණක් ඇතිව, නෞකාවලින් සිදුවන දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියේ (MARPOL) V වන ඇමුණුමට අනුකූලව, ජලයේ හෝ මුහුදු පත්ලේ හෝ තැන්පත් කරනු ලබන යම් භෞතික උපකරණයක් හෝ එහි කොටසක් හෝ එම අයිතම සංයෝග කිසිවක් අදහස් වේ. ;

- **'මසුන් ඇල්ලීම ආශ්‍රිත ක්‍රියාකාරකම්'** යන්නෙන්, කලින් අවස්ථාවක වරායකට ගොඩබස්වා නොතිබූ මත්ස්‍ය සහ / හෝ ධීවර නිෂ්පාදන ගොඩබෑම, ඇසුරුම් කිරීම, පිරිසැකසුම් කිරීම, ප්‍රතිනැව්ගත කිරීම හෝ ප්‍රවාහනය කිරීම මෙන්ම සේවක පිරිස්, ඉන්ධන, ආම්පන්න, ආහාර සහ මුහුදේ දී අවැසි

| | |
|---|---|
| | අනෙකුත් සැපයුම් සැපයීම ද ඇතුළුව මසුන් ඇල්ලීම පිණිස උපකාර වන හෝ ඒ සඳහා සූදානම් කෙරෙන කිසියම් මෙහෙයුමක් අදහස් වේ ; - ;<br><br>- **'මසුන් ඇල්ලීමේ ගමන'** යන්නෙන්, යම් ධීවර යාත්‍රාවක් වරායකින් පිටත්ව යන මොහොතේ සිට ආරම්භ වී පෙරළා වරායට සේන්දු වී අවසන් වන මොහොත දක්වා කාලය තුළ දී, එකී ධීවර යාත්‍රාව විසින් සිදු කරන ලද ධීවර ක්‍රියාකාරකම් හා සම්බන්ධ යම් මුහුදු ගමනක් අදහස් වේ ; -<br><br>- **'ඉලක්කගත මතස්‍ය විශේෂ'** යන්නෙන්, ධීවර මෙහෙයුම් බලපත්‍රය මගින් අල්ලීමට අවසර ලබා දී ඇති මතස්‍ය විශේෂ අදහස් වේ. -<br>- **'ධීවර යාත්‍රාව'** යන්නෙන්, ධීවර කටයුතු හෝ යම් ධීවර මෙහෙයුම්වලට අදාළ කටයුත්තක් සඳහා භාවිතා කරන හෝ භාවිතා කරනු ලැබීමට සූදානම් කරනු ලබන කිසියම් යාත්‍රාවක් හෝ ඒ සඳහා සාමාන්‍යයෙන් භාවිතා කෙරෙන මාදිලියක් අදහස් වේ.-<br><br>- **'ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය'** යන්නෙන්, යාත්‍රා **අධීක්ෂණ** පද්ධතිය මගින් ජනනය කරනු ලබන ලුහුබැඳ යාමේ වාර්තා, අනෙකුත් දෑ අතර, ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිහිටුවන ලද මෙහෙයුම් මධ්‍යස්ථානයක් අදහස් වේ.; -<br><br>- **'විදේශීය ධීවර යාත්‍රාව'** යන්නෙන්, මසුන් ඇල්ලීම හෝ මසුන් ඇල්ලීම ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට හෝ සාමාන්‍යයෙන් භාවිතා කරන වර්ගයට අයත් ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවක් නොවන වෙනත් ඕනෑම යාත්‍රාවක් අදහස් වේ; -<br><br>- **'කරමල් දැල්'** යන්නෙන්, අවුරා පටලවා ගැනීම මගින්, කූඤ්ඤ කර පටලවා ගැනීම මගින්, උල් ඇනී පටලවා ගැනීම මගින්, උගුලක පටලවා ගැනීම මගින් හෝ පසුම්බිවල උගුලට හසුකර ගැනීම මගින් ඕනෑම ජල ගැඹුරක, ජල මතුපිටක හෝ ජලය මැද හෝ ජල පතුල් ස්ථරවල සවි කර අටවන දිගටි ඍජුකෝණාස්‍රාකාර දැල් බැම්මක් අදහස් වේ ; -<br><br>- **'මහ මුහුද'** යන්නෙන්, එක්සත් ජාතීන්ගේ සාගර නීතිය පිළිබඳ සම්මුතියේ 86 වන වගන්තිය මගින් අර්ථ දක්වා ඇති පරිදි යම් රටක දේශීය අධිකරණ බල සීමාව යටතේ ඇති ප්‍රදේශවලට ඇතුළත් නොවන මුහුදේ සියලු ප්‍රදේශ අදහස් වේ ; -<br><br><br>- **'නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු ('IUU' මසුන් ඇල්ලීම)'** යන්නෙන්, මේ පනතේ IV වන උපලේඛනයෙහි අර්ථනිරූපණය අදහස් වේ. ;<br><br>- **'ඇතුළත එන්ජින් සවිකරන ලද ධීවර යාත්‍රා'** යන්නෙන් එන්ජිම ඇතුළත සවිකරන ලද ධීවර යාත්‍රා අදහස් වේ. -'<br><br>- **'ඉන්දීය සාගර ටූනා කොමිසම (IOTC)'** යන්නෙන්, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධාන (FAO) ව්‍යවස්ථාවේ XIV වන වගන්තිය යටතේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධාන කවුන්සිලයේ 105 වන සැසි වාරය මගින් 1993 දී පිහිටුවන ලද ඉන්දීය සාගර ටූනා කොමිසම අදහස් වේ ; -<br><br>- **'අභ්‍යන්තර ජල තීරය'** යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ පිහිටි කිසියම් පොදු ගංගා, විල්, මෝය, කලපු, ඔයවල්, වැව්, ජල තටාක, ඇළ දොළ මාර්ග සහ ශ්‍රී ලංකාවේ |

මිරිදිය හෝ කිවුල් දිය ඇති වෙනත් පොදු ප්‍රදේශ අදහස් වේ; -

- **'කිලෝවොට් / අශ්ව බලය'** (එන්ජිමක) යන්නෙන්, එන්ජින් බලය ප්‍රකාශ කරන ඒකකය අදහස් වේ ; -;

- **'ගොඩබෑම'** යන්නෙන්, එක් යාත්‍රාවක සිට තවත් යාත්‍රාවක් කරා වරාය පහසුකම් ස්ථානයක් හරහා හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයක් මගින් මසුන් මාරු කිරීම ඇතුළු ප්‍රතිනැව්ගත කිරීම සහ යම් යාත්‍රාවක සිට කන්ටේනර බහලුමකට, ට්‍රක් රථයකට, දුම්රියකට, ගුවන් යානයකට හෝ වෙනත් ප්‍රවාහන මාධ්‍යයකට මසුන් මාරු කිරීම හැර, යම් යාත්‍රාවක ඇති මසුන් ප්‍රමාණ කිසිවක් එම යාත්‍රාවේ සිට ලේඛනගතව මාරු කිරීම හෝ ගොඩබෑම අදහස් වේ ; -

-**'බලපත්‍ර දීමේ නිලධාරියා'** යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කය තුළ ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද යම් ධීවර නිලධාරියෙකු හෝ ධීවර පරීක්ෂකවරයෙකු අදහස් වේ ;

- **"ලොග් පොත"** යන්නෙන්, ශ්‍රී ලංකාව විසින් නිකුත් කරන ලද සහ ඉවත් කළ නොහැකි පිටු සහිත වූ ද, ඒ සෑම පිටුවක්ම එකිනෙකට සමගාමීව අංකනය කර අදාළ අනුක්‍රමික අංකයක් සමග මුද්‍රණය කොට ස්ථිරව බඳිනු ලැබූවා වූ ද, මසුන් ඇල්ලීම හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධ කිසියම් කාර්යයක් සඳහා නියම කරන ලද ලොග් පොතක් අදහස් වේ ;–

- **'මරු වැල්'** යන්නෙන්, ප්‍රධාන යොතකට සවි කළ ශාඛා රැහැන් සංඛ්‍යාවක් නියමිත ඉඩ පරතරයකින් ගැටගසා ඇති, ඒ සෑම ශාඛා රැහැනකටම ඇමක් සහිතව හෝ රහිතව කොකු ඇමුණූ, ධීවර ආම්පන්නයක් අදහස් වේ. දිග යොතක්, ජලය මතුපිට, ජලය මැද හෝ ජල පතුලට සමීපව නිදහසේ පාවීමට සලස්වනු ලැබූ විට, එය හඳුන්වනු ලබනුයේ : 'දිගු ඉපිල් යොත' සහ, එය, ජල පතුලට ආසන්නව හෝ ජල පතුලේ නැංගුරම් ලා ඇති විට හඳුන්වනු ලබනුයේ : 'දිගු පතුල් යොත' යනුවෙනි ; -

- **'මුහුදු පරිසර පද්ධතිය'** යන්නෙන්, විවෘත සාගර, ගැඹුරු මුහුදු සාගරය සහ මෝය, බොකු, කලපු, ලුණු වගුරු බිම්, කඩොලාන වනාන්තර, කොරල්පර වැනි වෙරළබඩ සාගර පරිසර පද්ධතිය ඇතුළත් ඉහළ දියවන ලුණු සහිත ජලජ පරිසරය අදහස් වේ; -

- **'යාත්‍රාධිපති'** යන්නෙන්, යම් ධීවර යාත්‍රාවක නියමිත කවර වුවද වේලාවක සිටින වඩාත්ම වගකිවයුතු තනතුර දරන නියමුවා ඇතුළු යම් තැනැත්තෙකු අදහස් වේ ;

- **'දැල් ඇසෙහි ප්‍රමාණය'** යන්නෙන්, යම් දැලක් සම්පූර්ණයෙන් දිග හරින ලද විට, එහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ ගැට අනුව සිරිත් ප්‍රකාරව මනිනු ලබන දැල් ඇසක ප්‍රමාණය, අදහස් වේ. නිශ්චිතව දක්වා නොමැති විට, එය, ගැටවල මධ්‍ය මැනුම අනුව සාමාන්‍යයෙන් සලකා බැලේ ; -

- **'ජංගම සම්ප්‍රේෂක ඒකකය' (MTU)** යන්නෙන්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබ ධීවර යාත්‍රාවක තබා ඇති සහ ස්වාධීනව හෝ වෙනත් යම් උපකරණයක් හෝ උපකරණ හා සහසම්බන්ධව ක්‍රියා කරන්නේ හෝ නොකරන්නේ වුව ද, යාත්‍රාවේ ස්ථානීය පිහිටීම, ධීවර කටයුතු සහ එහි මසුන් නෙලා ගැනුම පිළිබඳව සහ අවශ්‍ය විය හැකි වෙනත් යම් ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු සම්ප්‍රේෂණය කරන උපකරණයක් අදහස් වේ ;

**"බහු දින ධීවර යාත්‍රා"යන්නෙන්** ,ශ්‍රී ලංකා ජල තීරයේ හෝ මහ මුහුදේ මසුන් ඇල්ලීමේ යෙදෙන ධීවර බෝට්ටුවේ ප්‍රදර්ශනය කර ඇති ලියාපදිංචි අංකය සමග **(IMUL)** සංකේත අකුර සලකුණු කර ඇති ධීවර යාත්‍රා අදහස් වේ .

- **'ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය'**

| | |
|---|---|
| | **(NARA)** යන්නෙන්, 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත මගින් පිහිටුවන ලද ජාතික ජලජ සම්පත් සහ සංවර්ධන නියෝජිතායතනය අදහස් වේ ;<br><br>- **'හිමිකරු'** යන්නෙන්, යාත්‍රාවක හිමිකරු ලෙස ලියාපදිංචි කරන ලද ස්වභාවික හෝ නෛතික තැනැත්තෙකු අදහස් වේ ; -<br><br>- **'ක්‍රියාකරු'** යන්නෙන්, යාත්‍රාවේ මෙහෙයුම්වල ආර්ථික හෝ මූල්‍ය ප්‍රතිලාභවල හිමිකරුවකු, යාත්‍රාව කුලියට ගත් තැනැත්තෙකු, යාත්‍රාධිපතියෙකු සහ ප්‍රතිලාභියෙකු ඇතුළුව එම යාත්‍රාව භාරව සිටින, එහි මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වග කියන, එය මෙහෙයවන හෝ පාලනය කරන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තෙකු අදහස් වන්නේ ය ; -'<br><br>- **'වරාය රාජ්‍ය පියවර'** යන්නෙන් 2009 වර්ෂයේ රෝමයේ පැවති ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ 36 වන සැසිවාරය මඟින් අනුමත කරන ලද නීති විරෝධි, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට සහ පිටු දැකීමට ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ වරාය තුළ වූ රාජ්‍යයේ පියවරවල් පිළිබඳ ගිවිසුම ක්‍රියාත්මක කෙරෙන ක්‍රියාමාර්ග අදහස් වන්නේ ය; - '**Port State Measure**'; .<br><br>- **'නියමිත'** යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබ ඇතැයි යන්න අදහස් වේ ; -<br><br>- **'ධීවර කළමනාකරණය විෂයයෙහි පූර්වාරක්ෂක ප්‍රවේශය'** යන්නෙන්, එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය ගහන ගිවිසුමේ 6 වන වගන්තියෙහි සඳහන් පරිදි, ඉලක්කගත මත්ස්‍ය විශේෂ, ඒ ආශ්‍රිත හෝ ඉන් යැපෙන විශේෂ සහ ඉලක්කගත නොවන විශේෂ සහ ඒවායේ පරිසරය සංරක්ෂණය කිරීම විෂයයෙහි කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම සංරක්ෂණය කිරීමට කල් දැමීම හෝ කළමනාකරණ පියවර ගැනීමට අපොහොසත් වීම සාධාරණීකරණය නොකළ යුතු ප්‍රවේශය අදහස් වේ;<br><br>- **'රාජ්‍ය සංස්ථාව'** යන්නෙන්, ප්‍රදාන හෝ ණය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් රජය විසින් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සපයනු ලබන අරමුදල් හෝ ප්‍රාග්ධනය සහිතව, සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ ස්ථාපිත කර ඇති හෝ ස්ථාපිත කරනු ලබන කිසියම් සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ; <br><br>- **'විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ යාත්‍රාව'** යන්නෙන්, මෙම පනත යටතේ විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ යාත්‍රාවක් ලෙස ලියාපදිංචි සිදුකරන විනෝදය සඳහා මසුන් ඇල්ලීමට භාවිතා කරනු ලබන යාත්‍රාවක් අදහස් වේ ;<br><br>- **'විනෝදය සඳහා මසුන් ඇල්ලීම'** යන්නෙන්, විනෝදාශ්වාදය, සංචාරක හෝ ක්‍රීඩාව සඳහා 'අල්ලා ගනු ලැබ මුදා හැරීම' ඇතුළුව ධීවර සහ සමුද්‍රීය ජලජ සම්පත් වාණිජමය ලෙස සූරාකෑමට ලක් නොවන ධීවර ක්‍රියාකාරකම් අදහස් වේ ;<br><br>- **'අමාත්‍යාංශ ලේකම්'** යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට පත් කරන ලද ලේකම්වරයා අදහස් වේ ;<br><br>- **'සීන් දැල්' (හෙවත් මාදැල් හෝ ඩැනිෂ් සීන් දැල්)** යන්නෙන්, යම් ජල ස්කන්ධයක් ආවරණය වන සහ දෙකෙළවර කඹ දෙකකින් ගැට ගැසූ මැද මඩියක් සහිත හෝ රහිත ගොඩබිම දෙසට ලණු ආධාරයෙන් යාත්‍රාවක් වෙත |

අදිනු ලබන දැලක් අදහස් වන්නේ ය ;

- **'ශ්‍රී ලංකා ධීවර යාත්‍රාව'** යන්නෙන් -
අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට හෝ ශ්‍රී ලංකාවේ යම් නීතියක් මඟින් හෝ ඒ යටතේ පිහිටුවන ලද යම් රාජ්‍ය සංස්ථාවකට සම්පූර්ණයෙන්ම අයත් වන ; හෝ
ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන තැනැත්තන් එක් අයෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට සම්පූර්ණයෙන්ම අයත් වෙන ; හෝ
ඇ) ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගත කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ද ඡන්ද බලය හිමි කොටස් අතුරින් බහුතර සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට අයත්ව ඇත්තාවූ ද, යම් සමාගමකට, සමිතියකට හෝ තැනැත්තන්ගේ යම් සංගමයකට සම්පූර්ණයෙන්ම අයත්වන ධීවර යාත්‍රාවක් අදහස් වේ ;

- **'වටකරන දැල'** යන්නෙන්, ජලය මතුපිට හැර අනෙක් සියලු පැති ආවරණය වන පරිදි ජලය තුළ අටවා මසුන් රැනක් වටකර මසුන් අල්ලා ගන්නා දැලක් අදහස් වන්නේ ය ;

- **'කට්වු දැල'** යන්නෙන්, රාමු සහිතව හෝ රහිතව දැල් වලින් සමන්විත සිලින්ඩරාකාර හෝ කේතු අකාර උගුල් ද මසුන් උගුල තුළට යොමු කිරීම සඳහා ආම්පන්නයකින් ද සමන්විත දැලක් අදහස් වේ ;

- **'ශ්‍රී ලංකා ජල තීරය'** යන්නෙන් :
අ) 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ දේශීය මුහුද,යාබද කලාපය, අනන්‍ය ආර්ථික කලාපය සහ ඓතිහාසික ජලය තීරය ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ;
ආ) සියලු පොදු බොකු, ගංගා, විල්, කලපු, මෝය, ඔයවල්, වැව්, තටාක, ඇළ මාර්ග සහ අනෙකුත් සියලුම පොදු මිරිදිය හෝ අභ්‍යන්තර ජල තීර,

අදහස් වේ ;

**'යැපුම් මත්ස්‍ය කර්මාන්තය'** යන්නෙන්, මසුන් විකිනීම වැනි වානිජ අරමුණු වලින් තොරව ධීවරයින්ගේ පවුල් විසින් පරිභෝජනය කිරීම සඳහා පමණක් මසුන් අල්ලා ගැනීම අදහස් වේ ;

- **'ටොන් ප්‍රමාණය'** (යාත්‍රාවක) යන්නෙන්, නැව්වල ටොන් ප්‍රමාණය මැනීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ ඇමුණුම I හි නිශ්චිතව දක්වා ඇති දළ ටොන් ප්‍රමාණය අදහස් වේ ;



- **'මුළු අවසර දිය හැකි මසුන් ඇල්ලීම'** යන්නෙන්, යම් අදාළ කාල සීමාවක් තුළ අල්ලා ගත හැකි එක් එක් මත්ස්‍ය ගහනයේ මුළු අවසර දිය හැකි මසුන් ඇල්ලීමේ ප්‍රමාණය අදහස් වේ;

- **'පාරම්පරික සංක්‍රමණික ධීවරයා'** යන්නෙන්, මෝසම් දේශගුණික තත්ත්වය මත පදනම්ව තමා හෝ තම අතීත පරම්පරාව පසුගිය වසර පහ මුළුල්ලේ විශේෂ ධීවර ප්‍රදේශයක් තුළ සංක්‍රමණික ධීවර කටයුතුවල නිරතව සිටි බව සහ මේ පනත යටතේ එවැනි කාර්යයක් වෙනුවෙන් ලියාපදිංචිව ඇති බව තහවුරු කිරීමට හැකිවන තැනැත්තෙකු අදහස් වේ ;

- **'ත්‍රිත්ව දැල'** යන්නෙන්, කුඩා ඇස් ඇති දැලක් මැදට තබා එම දැලට උඩින් සහ යටින් ඊට සාපේක්ෂව විශාල ඇස් සහිත දැල දෙකක්ද තබා දැල් තුනකින් සමන්විතව සාදනු ලැබ ඇති දැලක් අදහස් වේ ;

| | |
|---|---|
| | -**'ප්‍රතිනැව්ගත කිරීම'** යන්නෙන්, මාළු ගොඩබෑම ලෙස සටහන් නොවී, එක් යාත්‍රාවක සිට තවත් යාත්‍රාවකට ඕනෑම මාළු ප්‍රමාණයක් සෘජුවම මාරු කිරීම අදහස් වේ ;<br><br>- **'යාත්‍රා අධීක්ෂන පද්ධතිය' (VMS)** යන්නෙන්, ධීවර කර්මාන්තයේ ඵලදායි කළමනාකරණ කාර්යයන් සඳහා ධීවර යාත්‍රාවල ස්ථානීය පිහිටීම සහ ක්‍රියාකාරකම් අධීක්ෂනය කිරීම පිණිස චන්ද්‍රිකා පාදක වාර්තාකරණ පද්ධතියක් අදහස් වේ. |
| **පනත බලපැවැත්විය යුතු බව**<br><br>**169 වන වගන්තිය** | 1. 1. මේ පනතේ විධිවිධාන (469 අධිකාරිය වන) වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතේ සහ (451 අධිකාරිය වන) කැලෑ ආඥා පනතේ විධිවිධාන හෝ ශ්‍රී ලංකා ජල තීරයේ මසුන් ඇල්ලීමට හෝ මසුන් ඇල්ලීමේ ක්‍රමවලට අදාලව එකී ආඥා පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් හෝ රීතියක් බලහීනවන ආකාරයෙන් නොව, ඒවාට අමතරව අදාල කරගනු ලැබිය යුතු ය.<br><br>2. (1) වන උප වගන්තියට යටත්ව, මේ පනතේ විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කිසිවක් තිබුණේද යන්න නොසලකා, බලාත්මක විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ එබඳු යම් වෙනත් නීතියක විධිවිධාන අතර කිසියම් සට්ටනයක් හෝ අනනුකූලතාවයක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. |
| **පරිච්චින්න කිරීම්**<br><br>**170 වන වගන්තිය** | 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ 1979 අංක 59 දරන විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ පනත හා ඒ යටතේ සිදු කරන ලද සංශෝධන මෙයින් පරිච්චින්න කරනු ලැබේ. |
